**BILLS OFFICE** - Mr. D.D.U.K. Munasinghe (Assistant Director - Administration); Mr. A.S. De Silva (Principal Officer); Mr. J. Naseerdeen (Deputy Principal Officer); Mrs. K.C.K. Peiris, Mrs. R.A.D.N. Geyowanee (Assistant Principal Officers); Mr. J.T.L.P. Sameera, Miss. D.R.K. Ranasinghe (Parliamentary Officers)

**COMMITTEE OFFICE** - Mrs. C.I. Dissanayake, (Assistant Director - Administration); Mr. K. P. Chandana (Principal Officer); Mrs. U. N. Panditha (Deputy Principal Officer); Mr. R.C. Wijeyathilake, Mr. D.G.M.S.M. Dehigahalanda, Mrs. W.M.L.M. Weerasinghe (Assistant Principal Officers); Mrs. H.N. Fernandopulle (Parliamentary Officer)

**PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE** - Mrs. N.S. Wickramarathne, Mrs. A.C.P. Suriyapperuma (Assistant Directors - Administration); Mrs. C.M. Bulathsinhala, Mrs. C.M. Subashinghe (Principal Officers); Mrs. B.J. Abeysinghe, Mr. S.A.M. Shaheed (Deputy Principal Officers); Mrs. G.R.U. Gamage, Mrs. W. L. S. D. de Alwis, Mr. K.M.G.K. Jayawardana, Mrs. U.M.S. Prabashini (Assistant Principal Officers); Mrs. J.M.S. Nirmani, Miss G.K.C. Thilakarathna, Mrs. R.C. Kulathilaka, Mrs. G.M.H.S. Gamlath, Miss. H.M.D. Lakmali , Mrs. M. S. Bandulahewa (Parliamentary Officers)

**PUBLIC PETITIONS COMMITTEE OFFICE** - Mrs. K.T.C.K. Peiris (Assistant Director - Administration); Miss. S.R.M.H.G. Samaradiwakara (Principal Officer); Mrs. S.W.T.R. de Silva, Mrs. J.A.D. Jayasinghe (Deputy Principal Officers); Mr. K.T.L.A. Chandrasiri (Assistant principal Officer); Mrs. B.S. Rangika, (Parliamentary Officer)

**MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE** - Mr. A.A.S.P. Perera (Assistant Director - Administration); Mr. W.W.N.N.C. Fernando, (Principal Officer); Mrs. M. K. S. D. Alwis, Mrs. I.K. Samarasekera, Mrs. D.V.O. Weerakoon (Deputy Principal Officers); Miss R.M.D.K. Priyadarshani (Assistant Principal Officer); Miss D.I.T. Sarathchandra (Parliamentary Officer)

**LIBRARIAN** - Mr. S.L. Siyath Ahemed

**DEPUTY LIBRARIAN** - Miss. K.D.S. Wijenayake

**ASSISTANT LIBRARIAN** - Mr. G. Ratnayake

**JUNIOR ASSISTANT LIBRARIAN GRADE I** - Mr. W.A. Gunarathna

**JUNIOR ASSISTANT LIBRARIAN** - Mr. H.A.S.S. Perera

**CHIEF RESEARCH OFFICER** - Mrs. G.R.A. Godagama

**SENIOR RESEARCH OFFICERS**- Mr. M. Ajiwadeen, Mrs. P.L.T. Erandathi

**RESEARCH OFFICERS** - Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas

**CHIEF PARLIAMENTARY INTERPRETER** - Mr. W.M.U. Bandara

**DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS** - Mr. J.A.S.P. Perera, Mr. C.J. Karunaratne

**SENIOR PARLIAMENTARY INTERPRETERS** - Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan, Mr. A.G. Mohamed Fiqrhi, Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mrs. H.V.S. Heendeniya, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis, Mrs. A.L.A.D. Thiumini, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake

**PARLIAMENTARY INTERPRETERS** - Mr. D.D.V.N. Dhammage, Mr. M.Z.M. Azka, Mr. M.I.M. Fazi, Mr. N.J. Wickramage, Mr. P.M.A. Hussain, Mr. B.M. Razeel, Mr. S. Pradeep

# DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

**DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT)** - Mr. H.M.C. Perera

**SYSTEMS ENGINEER** - Mr. N.B.U. Nawagamuwa

**SYSTEMS ANALYST** - Mr. C.J. Willoraarachchi

**COMMUNICATION / SECURITY ENGINEER** - Mr. G.N. Lakmahal

**SYSTEMS DESIGNER** - Mr. M.N.C. Wickramasinghe

**SYSTEMS ADMINISTRATOR -** Mr. A.S.D.M. Wickramaratne

**WEB AND NETWORK ADMINISTRATOR -** Mr. N.G.L.S. Karunathilaka

**DATA BASE ADMINISTRATOR-** Mr. N.M.P.U. Premachandra

**SENIOR COMPUTER PROGRAMMERS**- Mr. D. Panditha, Miss P.M.M. Chandima

**COMPUTER PROGRAMMER -** Mrs. S.A.A.B. Athukorala

**SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) -** Mr. U.L. Geeganage

**SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) -** Mr. M.N.M. Shifaq

**SENIOR ASSISTANT COMPUTER PROGRAMMER -** Mrs. P.L.I.G. Cooray

**SENIOR HELP DESK CO-ORDINATOR** - Mrs. B.N.H. Thissera

**ASSISTANT PRINCIPAL OFFICER** – Mr. W.V.R. Wickramaratne

**SENIOR COMPUTER OPERATORS** - Mrs. P. Jehanya, Mr. J.S. Colombage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyatunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Aly, Mr. A.R.M. Rikaz Ali, Mr. A.M. Fowsul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS -** Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

# DEPARTMENT OF COMMUNICATION

**PUBLIC OUTREACH OFFICER -** Mrs. Y.L.R. Nootan

**MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) -** Mr. U.G.N. Duminda

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (SINHALA) -**

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (TAMIL) -** Mr. S. Jeyaprakash

**MEDIA OFFICE COORDINATOR (SINHALA) -** Mr. S.A.S.K. Silva

# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

නවවන පාර්ලිමේන්තුව - දෙවැනි සභා වාරය

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

ஒன்பதாவது பாராளுமன்றம் - இரண்டாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**NINTH PARLIAMENT - SECOND SESSION**

**294** වන කාණ්ඩය | **தொகுதி 294** | **VOLUME 294**


## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2022 ජූලි 27වන බදාදා***

*2022 யூலை 27, புதன்கிழமை*

*Wednesday, 27th July, 2022*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப.10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.00 a.m., MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ප්‍රතිඥාව: ගරු වජිර අබේවර්ධන මහතා
## உறுதிப்பிரமாணம்: மாண்புமிகு வஜிர அபேவர்தன
## AFFIRMATION: HON. WAJIRA ABEYWARDENA

***ගරු වජිර අබේවර්ධන මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.***

*மாண்புமிகு வஜிர அபேவர்தன சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து, சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.*

*The Hon. Wajira Abeywardena made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ
## சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்
## MESSAGES FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත දැක්වෙන සන්දේශ අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/13/14

2022 ජූලි මස 17 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වගන්තිය යටතේ 2022.07.17 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මගින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජූලි මස 18 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාව ගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ 4 වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - හිතවත්.

**රනිල් වික්‍රමසිංහ**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව වැඩ බලන ජනාධිපති

II

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2022 ජූලි මස 21 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**රනිල් වික්‍රමසිංහ**
ජනාධිපති

# නිවේදන
# அறிவிப்புக்கள்
# ANNOUNCEMENTS

## පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ ඉල්ලා අස්වීම
## பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹவினது இராஜினாமா
## RESIGNATION OF HON. RANIL WICKREMESINGHE, MEMBER OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත භාර දී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවනු ලැබේ.

*අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:*
*அதன்பிறகு, செயலாளர் நாயகம் பின்வரும் கடிதத்தை வாசித்தார்:*
*Whereupon the Secretary-General read the following letter:*

2022 ජූලි මස 21 වන දින

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වී එම පාර්ලිමේන්තු අසුන හිස් කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වශයෙන් අද දින එනම්, 2022 ජූලි මස 21 වැනි දින මා විසින් ජනාධිපති ධුරය භාර ගන්නා ලද බැවින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 66(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් මේ දක්වා දරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වී එම පාර්ලිමේන්තු අසුන හිස් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

**රනිල් වික්‍රමසිංහ**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

II

## පාර්ලිමේන්තුවේ සභානායක සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක
## பாராளுமன்றச் சபை முதல்வர் மற்றும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசான்
## LEADER OF THE HOUSE OF PARLIAMENT AND THE CHIEF GOVERNMENT WHIP

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නවවැනි පාර්ලිමේන්තුව සඳහා 2022 ජූලි 22 දින සිට බලපැවැත්වෙන පරිදි සභානායක ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා ද, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රසන්න රණතුංග මහතා ද පත් කරනු ලැබ ඇති බව දන්වනු කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

A

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ 2018 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවේ මූල්‍ය කළමනාකරණය සහ රාජ්‍ය ණය පාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ දහවැනි කාණ්ඩයේ IV කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha -Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## B

## I

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXIV සහ XXV කොටස්; සහ
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXII කොටස, පස්වැනි කාණ්ඩයේ VI කොටස සහ හයවැනි කාණ්ඩයේ XI, XII හා XIII කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ පළාත් පාලන ආයතන වැඩි දියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම සම්බන්ධ කාර්ය සාධන වාර්තාවේ - VIII කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියෝග සහ වාර්තාව ඉදිරිපත් කරමි.

(1) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජුනි 03 දිනැති අංක 2282/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(2) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5, 7 සහ 8 වගන්ති සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජුනි 03 දිනැති අංක 2282/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(3) 2022 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව.

මෙම නියෝග සහ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- 2021 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්;
- 2021 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;
- 2021 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;
- 2021 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

- 2021 වර්ෂය සඳහා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;
- 2021 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;
- 2021 වර්ෂය සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ
- 2021 වර්ෂය සඳහා තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2021 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - சுகாதார அமைச்சரும் நீர் வழங்கல் அமைச்சரும்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health and Minister of Water Supply)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and Minister of Wildlife and Forest Resources Conservation)

ගරු කථානායකතුමනි, 2018 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ගරු මහින්ද අමරවීර මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, මාලඹේ, හෝකන්දර උතුර, කහන්තොට පාර, අංක 259/2ඊ දරන ස්ථානයෙහි පදිංචි ජේ.කේ.එම්. දර්ශනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල, අඹදණ්ඩේගම, කොටුවේ ගෙදර යන ලිපිනයෙහි පදිංචි බී.ඩබ්ලිව්. ඥානවතී මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු කථානායකතුමනි, නුගේගොඩ, ගංගොඩවිල, පරණ කැස්බෑව පාර, අංක 103/8 දරන ස්ථානයෙහි පදිංචි යූ.ඩී. ජනක ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පාලටුව, ගොඩගම, ලේනදූව හන්දිය යන ලිපිනයෙහි පදිංචි එන්.ඩී. කරුණාදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

Hon. Speaker, I present a petition from Mr. I.B. Somapala of No. 192/1, Embaraluwa, Weliweriya.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)

ගරු කථානායකතුමනි, බඩල්කුඹුර, කෙලින් වීදිය, අංක 124/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්. උපුල් නිශාන්ත ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, අභිනව අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට මේ අවස්ථාවේදී අපගේ සුබපැතුම් පිරිනමනවා. ගරු අගමැතිතුමනි, මේ උත්තරීතර සභාවේ ගරුත්වය වාගේම සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආරක්ෂාව සහ ගරුත්වය ආරක්ෂා කිරීමටත්, මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී ගරු අග්‍රාමාත්‍යවරයා හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සියලු කටයුතු කිරීමටත් ඔබතුමාට ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවායි කියා අප ප්‍රාර්ථනා කරනවා.

දීර්ඝ කාලීන දේශපාලන ඉතිහාසයක් තිබෙන පරපුරකින් තමයි ඔබතුමා පැවත එන්නේ. මේ රටේ වාමාංශික ප්‍රගතිශීලී දේශපාලනයේ 1930, 1940, 1950, 1960 දශකවලින් මෙපිටට පැමිණ, ඔබතුමා 1970 දශකයේ ඉඳලා අද දක්වා ආපු ගමන් මාර්ගයේ, ඔබතුමා අද ගරු අග්‍රාමාත්‍යවරයා හැටියට පත්ව තිබෙනවා. ඒ සියලු අත්දැකීම් සමඟ අග්‍රාමාත්‍ය ධුරයේ කටයුතු කිරීමට ඔබතුමාට වාසනාව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අපත් ගරු අග්‍රාමාත්‍යතුමාට සුබ පතනවා. මොකද, අපි රාජකීය විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ ඉඳලා ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කළා. එතුමාට මතකද දන්නේ නැහැ, මම එතුමාගේ මහල් ගෙදරටත් ගියා. මේ තනතුර, පාර්ලිමේන්තුව තුළ දීර්ඝ කාලීන සටනක් කළ එතුමාට ලැබිය යුතු තනතුරක් කියලා අපි විශ්වාස කරනවා. ඉදිරියටත් පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කිරීමට එතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාවේ විශේෂ අවසරය ඇතිව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය.

## ගරු අග්‍රාමාත්‍යතුමාගේ විශේෂ ප්‍රකාශය
## மாண்புமிகு பிரதம அமைச்சரினது விசேட கூற்று
## SPECIAL STATEMENT BY HON. PRIME MINISTER

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයේ කේන්ද්‍රස්ථානයයි. ව්‍යවස්ථාදායකය පමණක් නොව, අපේ රටේ සංවර්ධන ක්‍රියාදාමයන්ට උචිත වන මූල්‍ය පාලනය හා එදිනෙදා තීරණ ගැනීමේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඉටු කර තිබෙන කාර්ය භාරය මේ අවස්ථාවේ මම යළිත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

රටේ විවිධ පළාත්වලින් අපේ ගරු මහජන මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව නියෝජනය කරන අවස්ථාවක, ගරු කථානායකතුමා හැටියට අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමය ආරක්ෂා කිරීමට හා ශක්තිමත් කිරීමට ඔබතුමා ගෙන ඇති පියවරවලට පළමුකොට අපේ ගෞරවය පුද කරනවා.

පසුගිය මාස කිහිපයේ, සති කිහිපයේ ලංකා දේශපාලනය, ලංකා ආර්ථිකය හා සමාජය අන් කිසි දවසක නොවූ විරූ වෙනස්කම් රාශියකට පරිවර්තනය වෙමින් ගමන් කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජනාධිපති ධුරයේ කටයුතු කළ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එයින් ඉවත් වීම නිසා ඒ ඇති වුණු පුරප්පාඩුවට අපේ පාර්ලිමේන්තුව ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාව විධායක ජනාධිපති ධුරයේ ඉතිරි කාල පරිච්ඡේදය සඳහා පත් කර ගත්තා. පාර්ලිමේන්තුවේ එම සම්ප්‍රදායන් ආරක්ෂා කර ගනිමින්, අපේ පාර්ලිමේන්තු ක්‍රමය අර්බුදයෙන් අර්බුදයට හැසිරෙන්නට හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පෙන්නුම් කර තිබෙනවා.

විවිධ දේශපාලන මත තිබෙන්නට පුළුවන්. එසේ විවිධ දේශපාලන මත දැරුවත්, ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමය ආරක්ෂා කර ගනිමින් රට ඉදිරියට ගෙන යාම සඳහා අපි බැඳී සිටිනවා.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ අප සියලුදෙනා එක්ව, අත්වැල් බැඳගෙන කටයුතු කළ යුතු අවස්ථාවක් පැමිණ තිබෙන බව අග්‍රාමාත්‍යතුමා හැටියට මා යළිත් ප්‍රකාශ කරන්න කැමැතියි. පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු ගරු මන්ත්‍රීවරු, පාර්ශ්ව මේ අර්බුදය අවස්ථාවේ එලෙස කටයුතු කරනු ඇතැයි මා අපේක්ෂා කරනවා. ගරු ජනාධිපතිතුමාද ඒ බව ප්‍රකාශයට පත් කළා.

ගරු කථානායකතුමනි, වර්තමානයේ රට මුහුණ දෙන අර්බුදය දෙස මහ ජනතාවගේ පැත්තෙන් අපි බැලිය යුතුයි. පාර්ලිමේන්තුවාදියකු හැටියට මා අවිහිංසාවාදී, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ අවුරුදු පණහක් සම්පූර්ණ කරන අවස්ථාවට පැමිණ තිබෙනවා. මහජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරයකු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

වශයෙන් මා පාර්ලිමේන්තුව නියෝජනය කරන්න 1983දී පත් වූ අවස්ථාවේ සිට අද දක්වා ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්න මට පුළුවන්කම ලැබුණා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු හැටියට, අමාත්‍යවරු හැටියට අප කටයුතු කළා. ගරු කථානායකතුමනි, අතුරු මැතිවරණයකින් ඔබතුමාටත්, මටත් එකම දවසේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන්කම ලැබුණා. අප පාර්ලිමේන්තු ක්‍රමයේ විවිධ අවස්ථා පසුකර තිබෙනවා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳවත්, ඒ වාගේම රටේ ජනතාවගේ අපේක්ෂා මුදුන්පත් කිරීමටත් කටයුතු කළ යුතු සුවිශේෂ අවස්ථාවකට යළිත් වරක් අප පැමිණ තිබෙනවා.

අපේ මූල්‍ය අර්බුදයත්, ආර්ථික අර්බුදයත් ඉතාම උත්සන්න තත්ත්වයකට පරිවර්තනය වුණා. එයට මුහුණ දීම සඳහා වූ ක්‍රියාමාර්ගයේදී මහ ජනතාවගේ පැත්තෙනුත් දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාර සහ බලපෑම් ඇති වුණා. ගරු කථානායකතුමනි, දේශපාලන ක්‍රියාදාමය, දේශපාලනය යන්ත්‍රණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් වෙනස් කිරීමේ කර්තව්‍යයට අපේ පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම අදහස් රාශියක් ඉදිරිපත් කරලා යම් යම් එකඟතාවලට පැමිණිය හැකි ක්‍රියාමාර්ගවලට සහ ව්‍යවස්ථාවේ සංශෝධනවලට පිවිසෙන්න අවශ්‍ය ක්‍රියාදාමය අපි ආරම්භ කර තිබෙනවා. එය එසේ විය යුතු බව ඔබතුමාත් පිළිගනීවි. එය කරන බවට අපි මේ පාර්ලිමේන්තුවට ප්‍රතිඥා දෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරු එම කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සහයෝගය ඉදිරි දවස්වල ලබා දෙයි කියා මම විශ්වාස කරනවා. ඒ වාගේම, අපේ ආණ්ඩු ක්‍රමයට අනුව පාර්ලිමේන්තුව තුළ විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම සඳහා අපි ප්‍රතිඥා දෙනවා. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මාර්ගයෙන් ඒවා වහාම ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අපේ ආණ්ඩුව කැප වන බවත්, ජනාධිපතිතුමා විසින් ඒ සඳහා අවශ්‍ය කෙටුම්පතක් ද ඉදිරිපත් කර ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ අවස්ථාව ද අද ඇති කර තිබෙන බවත් මා ප්‍රකාශ කළ යුතුයි. විධායක ජනාධිපති ක්‍රමය ගැන සාකච්ඡා කරන විට, කාරක සභා විධායක කාරක සභා ක්‍රමයට පරිවර්තනය කිරීමෙන් ඒ සඳහා වැදගත් කර්තව්‍යයක් ඉටු කරන්න පුළුවන් වෙයි කියා අපි හිතනවා.

හැම මන්ත්‍රීවරයෙකුටම තමන් නියෝජනය කරන කාරක සභාවේ කටයුතු කරන්න පුළුවන්කම ලැබීමෙන් ජාතික වශයෙන් තිබෙන අභියෝග, ජාතික වශයෙන් අවශ්‍ය සංවර්ධන කටයුතු, ඒ වාගේම රටට ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි අණ පනත් සම්මත කිරීම යනාදිය එකඟතාවකින් යුතුව කරන්න පුළුවන්කම ලැබෙනවා.

මේ අවස්ථාවේදී මම සිහිපත් කරනවා, 1931 වසරේදී මෙරටට සර්ව ජන ඡන්ද බලය ලැබීමෙන් පසු ඇති කළ විධායක කාරක සභා මඟින් අපේ රටට ඉතාම සාර්ථක ප්‍රතිඵල ගෙනා බව. මගේ ආදරණීය පියා වන පිලිප් ගුණවර්ධන මැතිතුමා (අවිස්සාවේල්ල මන්ත්‍රීතුමා) ඒ අවස්ථාවේදී එම විධායක කාරක සභා නියෝජනය කළා. ඒ වාගේම ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමාට (රුවන්වැල්ල මන්ත්‍රීතුමා) එවක තරුණ මන්ත්‍රී කණ්ඩායම නියෝජනය කරන්න පුළුවන්කම ලැබුණා. ඒ තුළින් ඇති කළ විවිධ වෙනස්කම් තවමත් නීති පොතේ එලෙසම ක්‍රියාත්මක වෙනවා. ඒවාට කවුරුවත් අත තියලා නැහැ. එතරම් දුරට ඉදිරිය බලා එකඟතාවන්ට පැමිණෙන්න එදා පුළුවන් වෙලා තිබෙනවා.

ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ ආදරණීය පියාත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. මොකද, නිදහස් අධ්‍යාපන පනත සම්මත කරන අවස්ථාවේදී ඉතාම තීරණාත්මක වැඩ කොටසක් එම කාරක සභා යෝජනා කරන වෙලාවේදි සටහන් කළා. මෙවැනි උදාහරණ රාශියක් මේ අවස්ථාවේදී මට සිහිපත් කරන්න පුළුවන්. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමා වූ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා පළමු කෘෂිකර්ම සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා හැටියට ආරම්භ කළ ඒ ක්‍රියාදාමය අද කාරක සභා හරහා ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළවලට හොඳාකාර උදාහරණයි. ඒ වාගේම උතුරේ මන්ත්‍රීවරු ගැනත් මේ අවස්ථාවේදී මා සිහිපත් කළ යුතු වෙනවා. ඒ අතර ගරු ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා වැනි මන්ත්‍රීවරුත් ඉන්නවා. එතුමාගේ ආදරණීය මුණුබුරා අද මේ ගරු සභාවේ ඉන්නවා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා ඒ කාරක සභාවක සභාපතිවරයකු හැටියටත් කටයුතු කළා. එතුමා ජාතික වූ සංවර්ධන වැඩසටහන් ඇති කරන්න ක්‍රියාකාරි දායකත්වය ලබා දුන්නා. මම ඒ පිළිබඳ වැඩි විස්තර කියන්න යන්නේ නැහැ. මගේ ආදරණීය පියා, පිලිප් ගුණවර්ධන මැතිතුමාත්, කුසුමා ගුණවර්ධන මගේ ආදරණීය මවත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. අපේ සභානායකතුමාත් සඳහන් කළ පරිදි, වමේ දේශපාලන නායකයන්ගේ පන්නරය තුළින් අපි පොදුජන අරගළයට සහභාගී වී ඇදී ආවා. ගරු කථානායකතුමනි, බොහොම සාධාරණත්වයෙන් සැබෑව පිළිගන්නා මහජන නියෝජිතයකු හැටියට මම කියන්න ඕනෑ, අදත් අපේ රටේ ඇත්තන් හා නැත්තන් අතර තිබෙන පරතරය වැඩි වෙමින් පවතින බව. මෙය බරපතළ ප්‍රශ්නයක්. එයට අපි අවධානය යොමු කළ යුතුයි. ඒ නිසාම ඇති විය හැකි සමාජ උද්ඝෝෂණ හා සමාජ ඉල්ලීම් වැඩි වෙනවා. ඒ නිසාම ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළ ඇති කිරීමේ අවශ්‍යතාව මතුව තිබෙනවා.

මේ රටේ ගම්බද කෘෂි ජනතාව අපේ රටේ ආර්ථිකයේ හා ආහාර ආර්ථිකයේ කොඳු නාරටියයි. ඒ කොඳු නාරටිය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පහසුකම්, සේවා හා සම්පත් ලබාදීම තුළින් අභිරින් ස්වයංපෝෂිත ලංකාවක් අනාගතයේ ගොඩ නැඟීම සඳහා වූ කර්තව්‍යයට අපි සැමදෙනාම එකතු වෙමු. ඒ වෙනුවෙන් මේ ගන්නා වූ දුෂ්කර ක්‍රියා මාර්ගයට සැවොම එක්වන අවස්ථාව බවට අපි මේ අවස්ථාව කර ගනිමු. අපේ කර්මාන්ත ක්ෂේත්‍රයට ආයෝජකයන් ගෙන්වා ගැනීම සඳහා අපි රජය හැටියට ආයෝජකයන්ට ආරාධනය කරනවා.

ගරු කථානායකතුමනි, අද ලෝක ආර්ථිකය වෙනසකට පරිවර්තනය වෙමින් තිබෙනවා. අලුත් ආර්ථික ප්‍රගතියේ දැවැන්ත පියවර ලෝකය පුරාම ඇති වෙමින් පවතිනවා. බටහිර ආර්ථිකය පමණක් නොව, ආසියාවේ ආර්ථිකය ද ලෝකයේ ප්‍රධානතම ආර්ථිකයක් බවට පරිවර්තනය වෙමින් තිබෙන අනාගතය දිහා අපි බැලිය යුතුයි. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් කිරීමට මම උත්සාහ දරන්නේ නැත්තේ, ඉදිරි දවස්වල මේ විශේෂ කරුණු පිළිබඳ සාකච්ඡා කරන්නට අපට හැකියාවක් පවතින නිසායි.

අපි මුහුණ දුන් පොහොර අර්බුදය ගනිමු. ඒ පිළිබඳ ප්‍රතිපත්තිය වෙනස් කරමින් අද එය සහනයකට පරිවර්තනය කරන්න පුළුවන් අවස්ථාවකයි අපි ඉන්නේ. පසුගිය සති ගණනාවකට පෙර පැවැති නිවාසයෙන් නිවාසයට නැඟුණු ගෑස් පිළිබඳ අර්බුදය, යම් කිසි වැඩ පිළිවෙළක් හරහා බොහෝදුරට සමනය කරන්නට ජනාධිපතිතුමා ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම විදුලිය බෙදා හැරීම හා නිෂ්පාදනය පිළිබඳව පැවැති ඒ අභියෝගද ප්‍රමාණාත්මකව ජයග්‍රහණය කරන්නට අපට පුළුවන්කමක් ලැබුණා. ඒ වෙනුවෙන් අපේ විදුලිබල හා බලශක්ති ඇමතිතුමාට මේ අවස්ථාවේ සුවිශේෂ ගෞරවයක් පිරිනමන්නට අවශ්‍යයි.

නමුත්, අපේ රටේ විවිධ පළාත්වල තවමත් ඉන්ධන අර්බුදය පවතිනවා; භූමිතෙල් අර්බුදය පවතිනවා. ස්ථාවර වැඩසටහනක් තුළින් ඒවාට අපි විසඳුම් සෙවිය යුතුයි. අපි තෙල් නිෂ්පාදනය කරන රටක් නොවෙයි.

අපි තෙල් ආනයනය කරන රටක්. බොරතෙල් වශයෙන් හෝ අපි තෙල් ආනයනය කරන රටක්. අපි ඒකට ඩොලර් වියදම් කරන්න ඕනෑ. අපි ඩොලර් අර්බුදයකට මුහුණ දී තිබෙන බව මුළු පාර්ලිමේන්තුවම දන්නවා. ඒ නිසා තෙල් බෙදා හැරීමේ අලුත් වැඩසටහන සාර්ථක කර ගන්නට දරන හැම උත්සාහයකදීම අපි අත්වැල් බැඳගෙන කටයුතු කරමු. ඒ සඳහා ආරම්භ කර තිබෙන වැඩ පිළිවෙළට අතිරේකව, අපේ රටේ පොදු ජනතාවගේ, අඩු ආදායම් ලබන ජනතාවගේ ආහාර අර්බුදය පිළිබඳ නැඟෙන හඬට සහනයක් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගෙන කටයුතු කරන්නට අද පුළුවන්කම ලැබී තිබෙන අතර, පෙර පැවැති වැඩ පිළිවෙළ වෙනසකට භාජන කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ක්‍රියාමාර්ග අවශ්‍ය වන්නේ රජය ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන රජයක් නිසායි. රජය මහජන විරෝධතාවලට සවන් දෙන්න සූදානම්. ප්‍රජාතන්ත්‍රවාදී විරෝධතාවලට සවන් දෙන්න සූදානම්. අවිහිංසාවාදීව කටයුතු කරන ජනතාවගේ අවිහිංසාවාදී හඬට රජයක් හැටියට අපි එක්ව සවන් දීමට කටයුතු කරනවා. නමුත් ත්‍රස්තවාදීව කටයුතු කිරීම අපට පිළිගන්න බැහැ. ප්‍රජාතන්ත්‍රවාදයට ඇති ලොකුම තර්ජනය වන ත්‍රස්තවාදය ඇති කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි සහාය නොවනු ඇතැයි මා විශ්වාස කරනවා.

විවිධ දේශපාලන මත තිබෙන්න පුළුවන්. ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සියලු දෙනා එක්ව කටයුතු කළ යුතු වෙනවා. ගරු කථානායකතුමනි, අපේ රටේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදීව තීරණ රාශියක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ තීරණ රාශිය හරහා ආණ්ඩු පෙරළි ඇති කරලා තිබෙනවා. ඒ වාගේම මහජන ආණ්ඩුවලට බල කරලා රටේ ඉදිරි ගමන වෙනුවෙන් ආර්ථික ක්ෂේත්‍රය සහ ව්‍යවස්ථාව තුළ විශාල පරිවර්තන ඇති කරලා තිබෙනවා. අද අපට තිබෙන අභියෝගය මේ මූල්‍ය හා ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමයි. අපිත් එක්ක කටයුතු කරන අපේ මිත්‍ර රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ මිත්‍රත්වයෙන් කටයුතු කර මෙම අර්බුදයෙන් ගොඩ ඒමට අප ක්‍රියා කළ යුතුයි. ඒ සඳහා ඔබ සියලු දෙනාගේ සහාය ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

පසුගිය කාල පරිච්ඡේදයේ ලෝකය දුෂ්කරතා රැසකට මුහුණ දුන්නා. ඒ වාගේම ලොව වෙළා ගත් දරුණුතම වසංගත තත්ත්වය මඟ හරවා, එය ජය ගන්න අපට පුළුවන්කම ලැබුණා. The global community faced the pandemic. We have faced financial breakdowns and wars in different parts of the world, but the whole world including Sri Lanka has been able to move forward overcoming those problems.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අප ජීවත් වෙන මෙම කාල පරිච්ඡේදය අභියෝගවලින් පිරුණු සමයක්.

අපේ රටේ තරුණයා අපට අමතක කළ හැකි නොවේ. අපේ රටේ නිෂ්පාදනයේ නිරත ගම්බද ජනතාවත්, අපේ රටේ නිෂ්පාදනයේ යෙදෙන අනෙක් ජනතාවත් අපට අමතක කළ හැකි නොවේ. අපේ ගෙදර දොරේ, රට පුරා ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන කාන්තාවන් ද අපට අමතක කළ නොහැකියි. ඒ නිසා ඉදිරි වෙනස්කම් සඳහා කටයුතු කරන රජයක් හැටියට අප රජය සමඟ අත්වැල් බැඳගෙන, පොදු එකඟතා ඇති කරුණු සාර්ථක කරගන්න, මේ අභියෝගය ජයගන්න එකතු වෙන්න කියා විරුද්ධ පක්ෂයේ සෑම දේශපාලන පක්ෂයකටම හා සෑම මන්ත්‍රීවරයකුටම මා ආරාධනා කරනවා. පාර්ලිමේන්තුව තුළත්, ආණ්ඩු ක්‍රමය තුළත්, ආර්ථික ක්ෂේත්‍රය තුළත් මේ වෙනස්කම් ඇති කර අපි ඉදිරියට ගමන් කරමු. බෙහෙත් වේවා, ආහාර ද්‍රව්‍ය වේවා, ඉන්ධන වේවා ඒ ඕනෑම ප්‍රශ්නයකදී අපි එලෙස කටයුතු කරමු.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවට පැහැදිලි බලශක්ති ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඒ බව මම මීට ප්‍රථම මෙම සභාවේ සඳහන් කර තිබෙනවා. පැහැදිලි බලශක්ති ප්‍රතිපත්තියක් ජාතික වශයෙන් තිබෙනවා නම්, අපි මුහුණ දෙන නාස්තිකාර වියදම්, දූෂිත වියදම් ඉවත් කරන්න පුළුවන්. එසේ තිබුණා නම් බලශක්ති ක්ෂේත්‍රය කිසි ලෙසකින් මෙවැනි අර්බුදකාරී අවස්ථාවකට පැමිණෙන්නේත් නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බුද්ධිමතුන්ගේ -උගතුන්ගේ- සහයෝගය ලබාගෙන, තරුණයන්ගේ අලුත් අදහස්වලට ඉඩ ඇති ක්‍රියාමාර්ගවලට ගමන් කළ හැකි ලෙස මේ බලාපොරොත්තු වන වෙනස්කම් තුළ අපි කටයුතු කරමු.

ගරු කථානායකතුමනි, අපේ සංස්කෘතියේ අමතක නොවන, අවුරුදු දහස් ගණනක් තිස්සේ යළි යළි සිහිපත් කරන කරුණක් නැවත සිහිපත් කරමින් මම මගේ කථාව අවසන් කරන්නම්.

මිහිඳු මහරහතන් වහන්සේට දේවානම්පියතිස්ස රජතුමා හමු වූ අවස්ථාවේදී කළ ප්‍රකාශය, ඒ සුවිශේෂී කාරණාව පරම්පරාවෙන් පරම්පරාවට අප සිහිපත් කරනවා. "මහරජ, ඔබ මේ භූමියේ අයිතිකරු නොවේ. භාරකරු පමණක් වේ" යන්න එම ප්‍රකාශයයි. ඒ වදන් තුළ ගැබ්ව ඇති පරිදි සමස්ත පරිසරයට, මිනිසාට සහ සතා සිවුපාවාට යන සියල්ලට එක ලෙස රැකවරණය සලසා, අනාගත පරම්පරාවට මේ රට භාරදීමේ කාර්ය භාරයට කැපවීම මේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උත්තරීතරම කාරණාව බවට පරිවර්තනය කරන්න අපි එක්ව කටයුතු කරමු. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1.

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනා සම්මතය
## பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

[පූ.භා. 10.37]

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ වැඩබලන ජනාධිපතිතුමා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව) විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන සඳහා වන හදිසි නීති රෙගුලාසි 2022 ජූලි 18 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වූ ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වීමට මත්තෙන්, මාගේ කෘතඥතාව පළ කිරීම සඳහා මා සුළු වෙලාවක් ගන්නවා.

2000 වසරේ ඔක්තෝබර් මස 10වන දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙනයි මා මෙම ගරු පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේත්, එවකට ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේත් ආශීර්වාදයෙන් තමයි එදා මට ගම්පහ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා අවස්ථාව ලැබුණේ. මා බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ධුරය දරමින් සිටි අවධියේදී ඒ කරපු යෝජනාව අනුව තමයි ගම්පහ දිස්ත්‍රික්කයෙන් මම තරග කළේ. මට ඒ අවස්ථාව ලබා දීම ගැන මේ මොහොතේදී ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියටත්, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවටත් මා කෘතඥ වනවා. ඒ වාගේම දිවංගත ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් මේ වෙලාවේ මම ගෞරවයෙන් සිහිපත් කරනවා. එදා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව ඒ ජනවරම ලබා දුන් නිසා තමයි, මට මේ උත්තරීතර සභාවට එන්න පුළුවන්කම ලැබුණේ. හැබැයි, ඒ මැතිවරණය පැවැත්වූ දිනයේම තමයි ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අභාවප්‍රාප්ත වුණේ. ගරු කථානායකතුමනි, ඉන් පසුව දැන් ඔබතුමා අසුන්ගෙන සිටින ගෞරවනීය ආසනයේ අසුන් ගත්තේ ගරු අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමායි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ගෙනාපු අවස්ථාවේ මගේ කථාව කළාට පස්සේ, "Susil, excellent speech!" කියා සඳහන් කරලා අනුර බණ්ඩාරනායක මැතිතුමා මට තුණ්ඩුවක් එව්වා මට අද වාගේ මතකයි. එයින් පැහැදිලි වන්නේ එදා අපි මේ පාර්ලිමේන්තුව තුළ කටයුතු කළ ආකාරයයි. ඇත්තටම මට මේ පාර්ලිමේන්තුවට එන්න ලැබීම සම්බන්ධයෙන් සියලු දෙනාටම මගේ ප්‍රණාමය පුද කරනවා.

ගරු කථානායකතුමනි, නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයෙන් තමයි මා අධ්‍යාපනය ලැබුවේ. ඒ විදුහලටත් මගේ ස්තුතිය පුද කළ යුතුයි. පළමුවෙන්ම කෝට්ටේ නගර සභාවටත්, ඉන් පසුව පළාත් සභාවටත්, පළාත් සභාවේ මහ ඇමති ධුරයටත් මා තේරී පත් වුණා. ඉන් පසුව, පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජයග්‍රහණය කරලා මම පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. 2000 වසරේ සිට මේ දක්වා ආපු ගමන් මගේදී පාර්ලිමේන්තු මැතිවරණ හයකට මා ඉදිරිපත් වුණා. කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව පාර්ලිමේන්තුව නියෝජනය කරන්න මට ජන වරම ලබා දුන්නා. ඒ සියලු දෙනාට වාගේම ඉන් පස්සේ ජනාධිපති ධුරයට පත් වූ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, එදා පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයටත්, ඉන් පසුව දැන් තිබෙන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරන අතර, මා මේ ධුරයට පත් කිරීම සඳහා ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ පියාණන් තමයි මගේ විවාහයේ සාක්ෂිකරු. ඒ නිසා අප අතරත් දීර්ඝ සම්බන්ධතාවක් තිබෙනවා. ඒ වාගේම භීෂණ යුගයේදී කොළඹ මහාධිකරණයේ අපරාධ නඩු සම්බන්ධයෙන් මා කටයුතු කළේ විපක්ෂයේ අසුන් ගෙන සිටින අපේ ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ පියාත් එක්කයි. ඒ විතරක් නොවෙයි. අනුර දිසානායක මැතිතුමාත් අවුරුදු කිහිපයක් එක්සත් ජනතා නිදහස් සන්ධානය තුළ අප සමඟ එක්ව කටයුතු කළා. විපක්ෂයේ සිටින මේ මන්ත්‍රීවරු හැමදෙනාම පාහේ අප සමඟ කටයුතු කර තිබෙනවා. මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ සභානායකවරයා ලෙස මේ කටයුතු පවත්වාගෙන යෑම සඳහා ඔබ සියලුදෙනාගේම සහයෝගය මට ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, සභානායක ඉතිහාසය ගැන පමණක් කියා මගේ කථාවේ ඒ කොටස මා අවසන් කරනවා. මුලින්ම සභානායක ධුරය දැරුවේ 1931දී, සර් ඩී.බී. ජයතිලක මැතිතුමා. ඉන් පස්සේ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා සභානායක ධුරය දැරුවා.

එහෙම පටන් අරගෙන ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා, ගරු සර් ජෝන් කොතලාවල මැතිතුමා, ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ගරු සී.පී. ද සිල්වා මැතිතුමා, ගරු මෛත්‍රීපාල සේනානායක මැතිතුමා, ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ගරු විජයපාල මෙන්ඩිස් මැතිතුමා, ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා, ගරු රිචර්ඩ් පතිරණ මැතිතුමා, ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා එම ධුරයේ කටයුතු කළා. දහසය වැනි සභානායකතුමා තමයි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. මම දහහත් වැනි සභානායකවරයා ලෙස පත්වීම දෛවෝපගත සිද්ධියක්. ඒ සඳහා සහයෝගය දැක් වූ සියලුදෙනාට මගේ ස්තුතිය පිරිනමනවා.

ගරු කථානායකතුමනි, දැන් මම අද දවසේ මාතෘකාවට එන්නම්. විෂයභාර අමාත්‍යතුමා අසනීප තත්ත්වයෙන් පසුවන නිසා සභානායකවරයා හැටියට මම හදිසි නීතිය පිළිබඳ යෝජනාව අද දින සභාවට ඉදිරිපත් කළා. මෙම හදිසි නීතිය පැනවීම සම්බන්ධයෙන් තිබෙන්නා වූ නෛතික ප්‍රතිපාදනය තමයි මහජන ආරක්ෂක ආඥාපනත. මහජන ආරක්ෂක ආඥාපනත අනුවයි හදිසි නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාට අවකාශ ලැබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76වන ව්‍යවස්ථාව යටතේ පැහැදිලිව දක්වා තිබෙනවා, මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන ක්‍රියාත්මක වන ආකාරය.

ඊළඟට, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගත්තොත්, එය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවේ 1977 ජූලි 21වන දිනයි. එය පූර්විකාවේ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. එහි III වැනි පරිච්ඡේදය යටතේයි මූලික අයිතිවාසිකම් පිළිබඳව සඳහන් වන්නේ. ඒ යටතේ තිබෙන 15(1) වන ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් කරනවා මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා. මහජන ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගත් එයට ඇතුළත් වන බවත් සඳහන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (1) ව්‍යවස්ථාවේ එය සඳහන් වන්නේ මෙසේයි:

> "13 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනුව්‍යවස්ථාවලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට පමණක් යටත්ව ය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එහෙමයි සඳහන් වන්නේ.

මහජන ආරක්ෂක ආඥාපනත අනුව හදිසි නීතිය ක්‍රියාත්මක වීම පිළිබඳව ව්‍යවස්ථානුකූල තත්ත්වයයි මම මේ අවස්ථාවේ පැහැදිලි කළේ. ඊළඟට, 2022 ජූලි මස 18 වන දින නිකුත් කර තිබුණු 2289/07 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ මේ පිළිබඳව වූ නියෝග, රෙගුලාසි ආදී සියල්ල පිළිබඳව දීර්ඝ වශයෙන් සඳහන් වෙනවා.

මේ හදිසි නීති රෙගුලාසි මේ ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ඇයි? මීට පෙරත් අපේ රටේ ඉතිහාසයේ වරින් වර හදිසි නීති රෙගුලාසි ක්‍රියාත්මක වුණා. ඒක අපට මතකයි. දැන් සමහර අය කථා කරලා අහනවා, අවුරුදු 74ක් මේ පාර්ලිමේන්තුව මොනවාද කළේ කියලා. 1971 වසරේ මම පාසල් ශිෂ්‍යයෙක්. මගේ මතකයේ හැටියට, 1971දී ඇති වූ තරුණ නැඟිටීමත් එක්ක මේ රටේ හදිසි නීතිය ක්‍රියාත්මක වුණා. එදා තරුණ ජීවිත දසදහසකට ආසන්න සංඛ්‍යාවක් විනාශ වුණා, දහහතර දහසක් පුනරුත්ථාපනය කළා. එදා පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකක් තිබුණා. එකක් තමයි, එදා තිබුණු විද්‍යෝදය විශ්වවිද්‍යාල භූමිය. ඒකට අපේ නිවසේ ඉඳලා කිලෝමීටරයක්වත් දුර නැහැ. ඒකයි මට මේ සිද්ධි මතක තිබෙන්නේ. අනෙක් එක, එදා තිබුණු විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. අද ඒ දෙකේම නම් දෙකත් වෙනස් වෙලා. ඒවායේ පුනරුත්ථාපනය වෙච්ච සමහර තරුණයන් මේ ගරු පාර්ලිමේන්තුව නියෝජනය කළා; ඇමතිවරුන් බවට පත් වුණා. මගේ විශ්වාසය, අදත් නියෝජනය වනවා කියන එකයි, ගරු අගමැතිතුමනි. දැන් නම් පෙනෙන්නට නැහැ. අද එතුමන්ලා ඇවිල්ලා නැහැ. එවැනි යුගයක් තිබුණා. එය, ව්‍යවස්ථානුකූලව, සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවම පත් වෙච්ච ආණ්ඩුව - තුනෙන් දෙකක ඡන්දයෙන් පත් වෙච්ච ආණ්ඩුව- ආයුධ සන්නද්ධ අරගළයකින් වෙනස් කිරීමට දරපු ප්‍රයත්නයක්. තමන් විශ්වාස කරන ප්‍රතිපත්ති, අනුගමනය කරන ප්‍රතිපත්ති, න්‍යායන් අනුව තමයි එදා ඒ තත්ත්වයට ආවේ. එතැනින් රට ආපස්සට ගියේ නැද්ද? එතැනින් ආර්ථිකයට බලපෑමක් වුණේ නැද්ද?

1973දීත් ලෝක තෙල් අර්බුදයත් එක්ක අපේ රටේ පෝලිම් යුගයක් ආවා. ඒවා පසුව දේශපාලන වාසි බවට පරිවර්තනය කරගත්තා. එදාත් සීමා කිරීම් තිබුණා. එතකොට අප පාසල් යන කාලය නිසා ඒ මතකය අපට තිබෙනවා. ඊට වඩා හොඳින් මතක කාලයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ තමයි, 88, 89, 90 යුගය. එදා මම කොළඹ මහාධිකරණයේ සේවය කළේ. එදා ඒක තුම්මුල්ලට ගෙනිහින් තිබුණා. මහාධිකරණ ශාලා පහක් එහි තිබුණා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත්, හදිසි නීති රෙගුලාසිත් කියන දෙකම එදා ක්‍රියාත්මක වුණා. හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගත් තරුණ තරුණියන් සියදහස් ගණනක් වෙනුවෙන් මා පෙනී සිට තිබෙනවා. අපි අද දකිනවා, මගේම වෘත්තියේ සිටින සමහර පිරිස් සිය ගණනින් අධිකරණ ශාලාවලට යනවා. ඒක හොඳයි. හැබැයි, මේ කාරණයත් මා කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. 88, 89, 90 යුගයේ අපේ සමකාලීනයන් හැටියට හිටපු, අද මේ නීති කෘත්‍යයන්ට එළැඹෙන, මත ප්‍රකාශ කරන අය කිසිම කෙනෙක් එදා ඒ තරුණයන් සිය දහස් ගණන වෙනුවෙන් පෙනී සිටියේ නැහැ. ඒ විතරක් නොවෙයි, ප්‍රින්ස් ගුණසේකර, පරාක්‍රම රණසිංහ ඇතුළු නීතිඥයෝ අටදෙනෙක් එදා රට හැර ගියා. ඔවුන් රට හැර ගිහිල්ලා බ්‍රිතාන්‍යය ඇතුළු රටවල asylum පැතුවා; අනාථයන් බවට පත් වුණා. එහෙම තමයි නීති වෘත්තියේ යෙදී හිටපු අයට 88, 89, 90 යුගයේ සැලකුවේ. අප එදා නඩුවලට පෙනී ඉන්නකොට අපේ පසුපසින් CID එක ආවා. අප එදා නීතිඥ වෘත්තියේ යෙදෙන කොට අපේ අයිතිවාසිකම් ගැන කථා කරන්න කවුරුවත් හිටියේ නැහැ.

එදා මේ පාර්ලිමේන්තුවේ කමිටු ශාලා අංක 01 දී බෝම්බයක් පිපිරුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි එහි පැවැති රැස්වීමේ මූලාසනයේ සිටියේ. එහිදී දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා බරපතළ තුවාල ලැබුවා; මාතර දෙනියායේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කීර්ති අබේවික්‍රම මැතිතුමා ඝාතනයට ලක් වුණා; පාර්ලිමේන්තුවේ තවත් සේවකයෙකු ඝාතනයට ලක් වුණා. එදා ඒ බෝම්බ ප්‍රහාරය එල්ල වුණේ ඇයි? දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම සඳහා එදා හිටපු ජනාධිපතිතුමා කටයුතු කළා. එතුමා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමට කටයුතු කළ අවස්ථාවේදී කමිටු ශාලා අංක 01දී ඒ ප්‍රහාරය එල්ල වුණේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීම වැළැක්වීම සඳහා වන විරෝධතාවේ කොටසක් හැටියටයි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේ ප්‍රතිලාභ ආවේ කොහේටද? එය ගෙන ආවේ ඇයි? ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හා රජීව් ගාන්ධි මැතිතුමා ඇති කරගත් ඉන්දු-ලංකා ගිවිසුම අනුව ලංකාවේ උතුර සහ නැගෙනහිර ඇතුළු ප්‍රදේශවලට පළාත් සභා ක්‍රමය, පළාත් සභා නවය හඳුන්වා දීම සඳහා තමයි එදා එය ගෙන ආවේ. අපි ඒ ඉතිහාසය මතක් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට බෝම්බ ගැසීම සම්බන්ධ නඩුවේ විත්තිකාරයෝ පස්දෙනෙක් සිටියා. ඒ පස්දෙනාම මේ පාර්ලිමේන්තුවේ සේවකයෝ. ඒ පස්දෙනාගෙන් පළමුවැනියා වෙනුවෙන් දිවංගත ජනාධිපති නීතිඥ ආර්.අයි. ඔබේසේකර මහතාට කනිෂ්ඨ නීතිඥයෙකු හැටියටත්, තුන්වන විත්තිකාර වික්‍රමාරච්චි වෙනුවෙන් තනිවමත් මා එදා පෙනී හිටියා. ඒ වෙලාවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, හදිසි නීති රෙගුලාසි, දණ්ඩ නීති සංග්‍රහය කියන මේ තුනේම තිබෙන අපරාධ නීති, වලංගු නීති ක්‍රියාත්මක වුණා. අතුරු සාක්ෂි විභාග තිබුණා. ඒක තමයි ලංකාවේ දෙවැනි trial-at-bar එක - ත්‍රිපුද්ගල විනිශ්චයාසනය. අතුරු සාක්ෂි විභාගය, *voir dire*. ඒ කියන්නේ, කරන ලද ප්‍රකාශය ඔහුට එරෙහිව භාවිත කරන්න පුළුවන්, PTA එක යටතේ. ඒක කළේ ස්වේච්ඡාවෙන්ද නැද්ද කියන එක පරීක්ෂා කිරීමේ අතුරු විභාගය තමයි, අතුරු සාක්ෂි විභාගය.

ඒ අතුරු සාක්ෂි විභාගය අවස්ථාවේදී ඔප්පු කරගන්න බැරි වුණා, එය ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයක් කියලා. ඒ හේතුව මතම තමයි විත්තිකරුවන් නිදහස් වුණේ. ගරු කථානායකතුමනි, එදා විත්තිකරුවන් නිදහස් වුණා. නිදහස් වීමෙන් පස්සේ, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරපු appeal එකෙනුත් පස්සේ එදා හදිසි නීතිය යටතේ detention orders දීලා ඒ විත්තිකාරයන් පස්දෙනා අවුරුදු තුනක් රිමාන්ඩ් භාරයේ සිටියා. මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයේදී කවුද ඒ අය වෙනුවෙන් පෙනී

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සිටියේ? බෝම්බ ප්‍රහාරයෙන් තුවාල ලබපු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා තමයි අමාත්‍ය ධුරයෙන් එළියට ගියාට පස්සේ ඒ detention order එක ඉවත් කර ගන්න FR case එකට පෙනී සිටියේ. ඒක ඉවත් කරගෙන නිවසට යන ගමන් එහි පළමුවැනි විත්තිකරු ත්‍රිරෝද රථයකින් අපේ ගෙදරට ඇවිල්ලා මට ස්තුති කරලා ගියා. මම මේ කියන්නේ ඉතිහාසය. එදා රැඳවුම් නියෝග - detention orders - දැම්මාම අපි පෙත්සම යොමු කළේ කොහේටද? එදා විශ්‍රාමලත් විනිශ්චයකාරවරයන්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් තිබුණා. අපි ඒ කමිටුවට තමයි ඉස්සෙල්ලාම ඒ පෙත්සම යවන්න ඕනෑ. ඒ කමිටුවේ නිර්දේශ මත තමයි ඇප දීම හෝ නොදීම නිර්දේශ කරන්නේ, මහෙස්ත්‍රාත් අධිකරණයට හෝ මහාධිකරණයට. එහෙම තත්ත්වයක් තමයි එදා තිබුණේ. 88, 89, 90 කාලය වන විට මේ අරගළ භූමිවල ඉන්න බොහෝ තරුණයෝ ඉපදිලා නැහැ. අවුරුදු 35ට නොවෙයි, අවුරුදු 40ට වැඩි අයට තමයි ඒ මතකය තිබෙන්නේ. ඒ කාලයේ හැටදාහක් තරුණයන් ඝාතනය වුණා කියලා සඳහන් වෙනවා.

මේ දවස්වල කියනවා, "ම්ලේච්ඡ ප්‍රහාර" ගැන. "ම්ලේච්ඡ" කියන වචනයට Oxford Dictionary එකේ ඉංග්‍රීසි වචන කිහිපයක් තිබෙනවා: "barbaric", "merciless", "ruthless", "savage", "ferocious". ඒ ඕනෑම වචනයක් ගන්න පුළුවන්. වඩාත්ම හොඳයි කියලා මම හිතනවා, "merciless" නැත්නම් "ruthless" කියන වචන. ම්ලේච්ඡ ප්‍රහාර ගැන කියද්දී, අපි මේ උදාහරණය ගනිමු. අප ඉස්සරහා ඉන්නවා, ගරු කුමාර වෙල්ගම මැතිතුමා. එතුමාට එල්ල වුණු ප්‍රහාරය මොකක්ද? එයට මේවායෙන් කොයි අර්ථ නිරූපණයද ගන්නේ, ගරු කථානායකතුමනි? එතුමා පවත්වපු විරෝධතාව මොකක්ද? එතුමා එහෙම කිසි දෙයක් කළේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට, ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙකු හැටියට, 1989 සිට පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා තමන්ගේ දේශපාලන ප්‍රතිපත්තිය වෙනුවෙන් පෙනී සිටියා විතරක් නොවෙයි, හිටපු ජනාධිපතිතුමාගේ අපේක්ෂකත්වයට එරෙහිව ඒ කඳවුර තුළ සිටිමින්ම ඍජුව කරුණු දැක්වීමත් කළා. හැබැයි, එතුමාට අමානුෂික ප්‍රහාරයක් එල්ල වුණා.

ඒ ප්‍රහාරය මොකක්ද? එතුමාට වුණේ සුළු තුවාලද, බරපතළ තුවාලද? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දවස් කීයක් ICU එකේ හිටියාද? *[බාධා කිරීමක්]* දවස් 11ක් ICU එකේ හිටියා නේ. ඔබතුමාගේ වාහනයටත් ගිනි තිබ්බා. ඔබතුමාව වාහනය ඇතුළට දාලා ගිනි තියන්නයි හැදුවේ. එහෙම නේ කරන්න හැදුවේ? ඔබතුමා මැරුණාද කියන විමසීම දුරකථන සංවාදවලින් එහේට මෙහේට කෙරිලා තිබෙනවා. ඒ ප්‍රහාරය මොකක්ද? කවුද මේ සභාවේ කිව්වේ, ඒ ප්‍රහාරය "ම්ලේච්ඡ ප්‍රහාරයක්" කියලා. ඒකට දිව නැමෙන්නේ නැහැ. හැබැයි, යම් සුළු තුවාලයක් වුණාම, තල්ලු කිරීමකදී වැටුණාම කියනවා, "ම්ලේච්ඡ ප්‍රහාරයක්" කියලා. ත්‍රස්තවාදීන් විසින් ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාව ඝාතනය කරනු ලැබුවා, කිරුළපන පිට්ටනියකදී. ඒක ම්ලේච්ඡ ප්‍රහාරයක් නොවෙයිද? දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ත්‍රස්තවාදීන් අතින් මහ මඟදී ඝාතනයට ලක් වුණා. ඒක ම්ලේච්ඡ ප්‍රහාරයක් නොවෙයිද? එහෙම නම් "ම්ලේච්ඡ ප්‍රහාරය" කියන එකේ අර්ථ නිරූපණය දැන් කොතැනටද ගෙන එන්නේ? මම මේක කිව්වේ, මාධ්‍ය -පුවත් පත් සාකච්ඡා- තුළින් කරන ප්‍රකාශවලින් මේ වාගේ වචන යොදන ආකාරයක් පෙනෙන නිසායි. මම ඒ ගැන ඊට වඩා කියන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අපි අවුරුදු 28ක් මේ රටේ ත්‍රස්තවාදී යුද්ධයකට මුහුණ දුන්නා. නිදහසින් පසු ගත වුණු අවුරුදු 74න් ඒ අවුරුදු 28 අඩු කරන්න. ඒකෙන් ආපහු අඩු කරන්න, 88, 89, 90 කාලය. එදා දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "දෙකොන පත්තු වෙන විලක්කුවක් තමයි මම භාර ගත්තේ" කියලා. උඩිනුත් ගිනි, යටිනුත් ගිනි; උතුර සහ නැඟෙනහිර එහෙන්; දකුණේ මෙහෙන්. රට පුරා බෝම්බ පිපිරීම්, වෙඩි තැබීම්, ඝාතන, රාජ්‍ය දේපළ හානි කිරීම්. ඒ සියල්ල සිදු වුණා. අපි එවැනි යුග පහු කරලා තිබෙනවා.

මට අද්දැකීම් තිබෙනවා, කොළඹ මහාධිකරණයේ අපරාධ නඩු පිළිබඳව කටයුතු කළ නීතිඥයෙකු හැටියට. අපේ ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ දිවංගත පියාණන් ඒ කාලයේ මහාධිකරණයේ අපරාධ නඩුවලට පෙනී සිටියා, උතුරේ තරුණයන් වෙනුවෙන්, PTA එක යටතේ. අපි පෙනී සිටියා, දකුණේ තරුණයන් වෙනුවෙන්. මම ඒකයි කිව්වේ, අද නීතිඥ මහත්වරුන් දෙතුන් සියය උසාවිවලට ගිහින් තිබෙනවා, ඒක හොඳයි, හැබැයි, එදා දකුණේ තරුණයන් වෙනුවෙන් අප පෙනී සිටින කොට මේ විධියට පිරිස් පෙනී සිටියේ නැහැ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, වෙලාව,-

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මට තව මිනිත්තු 5ක් ලබා දෙන්න.

මම ඉතිහාසය ගැනයි කිව්වේ. අපි මේවා හොඳින් වටහා ගන්න ඕනෑ. අපේ රටේ නීතියක් තිබෙනවා. මූලික නීතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ඊට ආනුෂංගික නීති තිබෙනවා. අපරාධ නීතිය තිබෙනවා, සිවිල් නීතිය තිබෙනවා. ඒ සියල්ල තිබෙනවා. මේ නීති පනවා තිබෙන්නේ අවශ්‍ය අවස්ථාවේ ඒවා ක්‍රියාත්මක කරන්නයි.

දැන් අපි විමසා බලමු, මෑත කාලීනව වෙච්ච සිදුවීම් පිළිබඳව. රටක පාලනය වෙනස් කරනවා නම්, ඒකට ක්‍රමවේදය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. මැතිවරණයක් පැවැත්වීම හෝ පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම හෝ කරන්න පුළුවන්.

ඒ සියල්ල ව්‍යවස්ථාගතයි. මේ වර්තමාන ව්‍යවස්ථාව සම්පාදනය කළේ වෙන කවුරුවත් නොවෙයි. ගරු ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාත්, ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාත් -ඒ ආණ්ඩුවේ හිටපු අගමැතිවරයාත්- තමයි මේ ව්‍යවස්ථාව සම්පාදනය කළේ. මේ ව්‍යවස්ථාවට අද වනවිට සංශෝධන 19ක් සිදු වී තිබෙනවා. දැන් 22 වන සංශෝධනයටත් අපි ඇවිල්ලා තිබෙනවා.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතිහාසය දිවෙනවා, 1833 දී පැවති කෝල්බෲක් කැමරන් ආණ්ඩු ක්‍රමයට. ඒ අනුව මේ තිබෙන්නේ හයවැනි ව්‍යවස්ථාව. මම ඒ ගැන දීර්ඝ වශයෙන් කියන්න යන්නේ නැහැ. එහෙම කරන්න ඕනෑ නම් ව්‍යවස්ථාවක යම් ප්‍රතිපාදන තිබෙනවා. හැබැයි, ව්‍යවස්ථාවට පිටින් ගිහිල්ලා ආණ්ඩු වෙනස් කරන්න, පාලනය වෙනස් කරන්න බැහැ.

ඊළඟට, ජන මතය උරගා බලන්නේ කොහොමද? ඒ සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නේ මොකක්ද? "ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද, ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුත්තේ ය" කියලා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. මෙන්න

මෙච්චරයි අපට තිබෙන්නේ. පාර්ලිමේන්තු මැතිවරණයකදී ජන මතය උරගා බලන්න පුළුවන්. ජනාධිපතිවරණය, විධායක බලය ගැන ඊළඟට තිබෙන ව්‍යවස්ථාවේ තිබෙනවා. එහෙම නැත්නම් ජනමත විචාරණය. ඔය ක්‍රම දෙකෙන් පිට ඉඳගෙන, ජන මතය සියයට 80යි, සියයට 20යි කියලා කාටවත් කියන්න බැහැ; එහෙම කියන්න බැහැ.

1970 ආණ්ඩුව තුනෙන් දෙකක ඡන්දයක් ලබාගෙන බලයට ආවේ. හැබැයි, 1977දී ඒක ආසන අටට බැස්සා. එහෙම නේද, අපේ හිටපු ජනාධිපතිතුමනි? එදා තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමගි පෙරමුණු ආණ්ඩුව. 1977දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා හයෙන් පහක බලයක් ලබා ගත්තා. ජනමතයක් තිබුණේ නැහැ, ජනමත විචාරණයක් පැවැත්වුවා. ඒක තිබුණු හැටි අපි දන්නවා. හැබැයි, ඊට පසුව පාර්ලිමේන්තුව එක දිගට අවුරුදු 12ක් ගෙන ගියා. ඒ ආපු මන්ත්‍රීවරු අවුරුදු 12ක් එක දිගට බලයේ සිටියා. එදා මූලික අයිතිවාසිකම් ගැන කථා කළේ නැහැ. විදේශ රටවල තානාපතිවරු කවුරුවත් ඒවා ගැන කථා කළේ නැහැ. ඒ මොනවත් සිදු වුණේ නැහැ. හැබැයි, රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාට මම එක දෙයකට ගරු කරනවා, ගරු විපක්ෂ නායකතුමනි. ජනාධිපතිවරයා හැටියට එතුමාට හයිය තිබුණා ශ්‍රී ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය තානාපති ඩේවිඩ් ග්ලැඩ්ස්ටන්ට කියන්න, "අපේ අභ්‍යන්තර දේවල්වලට ඇඟිලි ගහන්න එන්න එපා" කියලා. එහෙම කියලා පැය 48න් ඔහුව ආපසු යැව්වා. එහෙම තමයි රටක ජනතාව වෙනුවෙන් රටේ ස්වෛරීත්වය ආරක්ෂා කරමින් රටේ පාලකයෝ, නායකයෝ කටයුතු කළ යුත්තේ. අපි ඒවා අගය කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ ඉතිහාසය ගැන කිව්වේ අද අපි කොතැනටද ඇවිල්ලා තිබෙන්නේ කියන එක ගැන කියන්න. පසුගිය අප්‍රේල් මාසයේ ඉඳලා මේ දක්වා -මාස හතරක් වැනි කාලයක් තුළ- සංසිද්ධි ගණනාවක් සිදු වුණා. ඒවා එකින් එක පෙළ ගස්වා ගෙන ගියාම සිද්ධි රාශියක් තිබෙනවා.

හිටපු ජනාධිපතිතුමාගේ නිවස ඉදිරිපිට සිදු වූ විරෝධතාවේ සිට විවිධ අවස්ථාවල විවිධ සිදුවීම් වුණා. මම ඒවා ගැන දීර්ඝ වශයෙන් කියන්න යන්නේ නැහැ. අපේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් හැත්තෑහතර දෙනෙකුට වැඩි සංඛ්‍යාවකගේ නිවාස - පෞද්ගලික දේපළ- ගිනි තැබුවා. සත්‍ය වශයෙන්ම ඒවා සිදු කළේ අරගළකරුවන්ද, වෙනත් කවුරුවත්ද කියා අපි දන්නේ නැහැ. සමහර තැන්වලට ඇවිල්ලා සමහර අය කිව්වා, "ඔය අපේ සල්ලිවලින් හදලා තිබෙන දේපළ" කියලා. සමහර මන්ත්‍රීවරුන්ගේ ගේවල් ඒ අයගේ සීයලා හදපු ගෙවල්. ඒකවත් වෙනස් කර ගන්න වත්කමක් ඒ මන්ත්‍රීතුමන්ලාට තිබුණේ නැහැ. හැබැයි, ඒවාත් ගිනි තැබුවා. ගීතා කුමාරසිංහ මැතිනිය කලාකාරියක් හැටියට වසර ගණනාවක් තිස්සේ උපයා ගත්ත සම්මාන සියල්ල නැති වුණා. අවසාන වශයෙන් හිටපු අගමැතිතුමාගේ ගෙදරටත් ගිනි තැබුවා. ඒ විතරක් නොවෙයි. එතුමාගේ ගෙදර තිබුණු බුදු පිළිමයත් විනාශ කරලා. මේ ළඟදී තමයි එතුමා ඒ ගැන සඳහන් කළේ. ඒ බුදු පිළිමය කවුරු හරි ගෙන ගිහිල්ලා කොහේ හරි පන්සලක හෝ, ගෙදරක හෝ තියාගෙන වැන්දා නම් කමක් නැහැ. නමුත් ඒ බුදු පිළිමයටත් හානි කරලා. මොකක්ද අරමුණ? මේවා ගැන අපි සූක්ෂම ලෙස බලන්න ඕනෑ.

අරගළ භූමිය තුළින් ආරම්භයේ දී නිර්ව්‍යාජ ලෙස මේ රටේ තරුණයන්ගේ හඬ ආවා. ඒ නිර්ව්‍යාජ හඬට අප ඇහුම්කන් දිය යුතුයි. හැබැයි, මේ තුළ දැන් අපට සැකයක් මතු වෙනවා, එල්ටීටීඊ එකේ සෙවණැලි තිබෙනවාද, පාස්කු ප්‍රහාරයේ සෙවණැලි තිබෙනවාද, විදේශ බලවේගවල කවුරු හරි එතැන ඉන්නවාද, කවුරු හරි ඒවාට මුදල් දෙනවාද කියලා. ජාතික රූපවාහිනී සංස්ථාව කියන්නේ රාජ්‍ය දේපළක්. ජාතික රූපවාහිනී සංස්ථාවට ඇතුළු වෙලා රූපවාහිනී විකාශය නවත්වපු, ඒකට සම්බන්ධ වූ අය තමන්ගේ රැවුලත් වෙනස් කරගෙන ඊයේ විදේශගත වෙන්න ගිය අවස්ථාවේ ගුවන් යානයේදී අත්අඩංගුවට ගත්තා, අපි දැක්කා. අන්න ඒ වාගේ සිද්ධි නිසා තමයි මේ හදිසි නීතිය අවශ්‍ය වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා -අපි- අඩු වැඩි වශයෙන් මේ පාර්ලිමේන්තුවේ අවුරුදු ගණනාවක් තිස්සේ ඉන්නවා. ගරු අගමැතිතුමා නම් 1983දී තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. එතුමා දීර්ඝ කාලයක් තිස්සේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපි කවුරුත් දන්නවා, මේ පාර්ලිමේන්තුව තමයි නීති සම්පාදනය කරන තැන. මේ පාර්ලිමේන්තුව තමයි මහජන නියෝජිතයන්ගේ දෙවොල. අපි ක්‍රියාත්මක කරන්නේ මොකක්ද? නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය. මිලියන විසිදෙකක ජනතාවට මෙතැනට එන්න බැරි නිසා දෙසියවිසිපස්දෙනෙකු මෙතැනට එවලා තිබෙනවා. ඒ අයට තමයි මහජන නියෝජිතයා - representative - කියන්නේ. Democracy, ඒකට අපි ගරු කළ යුතුයි. මේ පාර්ලිමේන්තුවට මොකක්ද කිව්වේ? පොලීසියේ වාර්තාවලට අනුව, එදා පොල්දූව හන්දියේ ඉඳලා මෙතැනට හාරදහසක පමණ පිරිසක් ඇවිල්ලා තිබෙනවා. මොකටද ඒ ආවේ? පාර්ලිමේන්තුව අත්පත් කර ගන්න. ජනාධිපති මන්දිරය අත්පත් කර ගත්තා. ජනාධිපති ලේකම් කාර්යාලය අත්පත් කර ගත්තා. Temple Trees අත්පත් කර ගත්තා. අගමැති ලේකම් කාර්යාලයත් අත්පත් කර ගත්තා. විධායකය අත්පත් කරගෙන ඉවරයි. පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - අත්පත් කර ගත්තාම එතැනින් එහාට මොකක්ද වෙන්නේ?

ඒ වෙලාවේ අපේ හමුදාවේ එක සෙබළෙකුට, ගරු වෙල්ගම මන්ත්‍රීතුමාට එල්ල කළා වගේ දැඩි ප්‍රහාරයක් එල්ල කළා. අන්න ඒවාට තමයි ම්ලේච්ඡ ප්‍රහාර කියන්නේ. තුවක්කුව අතේ තිබියදී ඒ හමුදා සෙබළාට ම්ලේච්ඡ ප්‍රහාරයක් එල්ල කළා. ඒ සොල්දාදුවාටත් තිබුණා නේ, වෙඩි තියන්න. ගරු සරත් ෆොන්සේකා මැතිතුමනි, ඒ හමුදා හටයාට අපි ගරු කරන්න ඕනෑ. එච්චර හානියක් කරද්දීත්, විනයගරුක හමුදාවක් හැටියට අපේ හමුදාව ජීවිත හානියක් කරන්න පෙළඹුණේ නැහැ. එදා මොකක්ද වුණේ? හමුදා හටයින් ගණනාවක් රෝහල්ගත කළා. නමුත්, ඔවුන් වෙඩි තැබුවේ නැහැ. පිරිසක් බැකෝ යන්ත්‍රයක් අරගෙන barriers කඩාගෙන මෙතැනට එන්න උත්සාහ කළා. එදා ඒ අය මෙතැනට ආවා නම් අද අපට මෙහෙම රැස් වෙන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒ හටයින් ඒ විධියට කටයුතු කරපු නිසා අපි බේරුණා.

ගරු කථානායකතුමනි, අමරකීර්ති අතුකෝරළ මැතිතුමා කියන්නේ කූඹියෙකුටවත් හිංසාවක් නොකරපු, ඉතාම අහිංසක මන්ත්‍රීවරයෙක්. එතුමා නියෝජනය කළේ පොළොන්නරුව දිස්ත්‍රික්කය. එතුමාට පහර දීලා, පඩිපෙළ දිගේ ඇදගෙන ඇවිල්ලා යට ඇඳුම පිටින් පාරට දැම්මා. ඒ, අපේම සහෘද මන්ත්‍රීවරයෙක්. ඒක ම්ලේච්ඡ ප්‍රහාරයක් කියලා කවුරුවත් කිව්වේ නැහැ. ඒකයි මම අහන්නේ, මේක අර්ථ නිරූපණය කරන්නේ කොහොමද කියලා.

අද මේ අරගළ කරන තරුණ තරුණියෝ දන්නේ නැතිව ඇති, එදා භීෂණ යුගයේ "බිල්ලෝ" කියලා කට්ටියක් සිටි බව. මේ,"බිල්ලෝ" කියන්නේ කවුද? ඒ අයගේ ඔළුවට ගෝනියක් දමලා තිබෙන්නේ. ඇස් දෙක විතරක් පේන විධියට ඒකේ හිල් දෙකක් තිබෙනවා. ඒ අය ඔළුව උඩටයි පහළටයි කරලා, "ඔව්" කියලා කිව්වොත් ඒ අල්ලාගෙන යන කෙනා ඉවරයි. එහෙම නැත්නම් මේ බිල්ලෝ කියන අය ඔළුව දෙපැත්තට වනලා "නැහැ" කියන එක කිව්වොත් ඒ පුද්ගලයාට බේරිලා යන්න පුළුවන්. එහෙම යුගයක් තිබුණා. කොහොමද, ඒ කාලයේ ලබා දුන් වධ හිංසා? ගරු කථානායකතුමනි, මේ ළඟදී විශ්වවිද්‍යාලයක

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

- in University of Ruhuna - වුණු සිදුවීමක් සම්බන්ධයෙන්, "වැට මාර කථාවක් තිබෙනවා" කියලා මට කිව්වා. මම කිව්වා, "මොනවාද ළමයෝ, වැට මාර කථා? එස්-ලෝන් බට නේ කථා" කියලා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලා නේ ඒ වෙලාවේ බලයේ හිටියේ. මම කියන්නේ, සිද්ධීන් විතරයි. කවුද වග කියන්න ඕනෑ කියන එක නොවෙයි මම කියන්නේ. සිද්ධීන් සංසන්දනය කිරීමක් මම මේ කරන්නේ. එදා එහෙම තමයි වුණේ. තරුණ තරුණියෝ සිය දහස් ගණනකගේ ප්‍රකාශ කියවන කොට, නීතිඥයෝ හැටියට අපි ඒ ගොල්ලන් මුණ ගැහුණාම ඒ කියපු කරුණුත් එක්ක අපි දන්නවා මොනවාද සිදු වුණේ කියලා. නීතිඥයෝ 8දෙනෙක් රට හැරදමා ගියා කියන එකත්, එදා රටේ තිබුණු තත්ත්වයත් අපේම සමහර නීතිඥයන්ට අද අමතක වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම ඉහත කාරණා ටික සඳහන් කළේ මෙන්න මෙතැනට එන්නයි. මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන යටතේ ව්‍යවස්ථානුකූලව තිබෙන නීතිමය තත්ත්වය මොකක්ද කියලා මම දැන් පැහැදිලි කළා. හදිසි නීති රෙගුලාසි ගැසට් කරලා තිබෙනවා. මේ සියලු බලතල දීලා තිබෙන්නේ තාවකාලිකවයි. එක යුගයක, හදිසි නීති විවාදය සඳහා මාසයකට සැරයක් පාර්ලිමේන්තුවේ එක දිනයක් වෙන් කළා. මතකයි නේද? අපි අවුරුදු ගණනාවක් එහෙම කළා. ඒක සම්ප්‍රදායක් වෙලා තිබුණා. පසුව ඒ තත්ත්වය නැති වුණා. කවදාද ඒක නැති වුණේ? 2009 මැයි 19වන දායින් පසුව. ඒකත් අපේ අයට අමතකයි.

ගරු කථානායකතුමනි, මේ කරුණු ටිකත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. අපට හදිසි නීතිය පනවන්න වුණේ ඇයි කියන එකත් අපි හිතා බලන්න ඕනෑ. මේක අපි නොදන්නා කාරණයක් නොවෙයි. මේ කරුණු CID එකෙන් පරීක්ෂණ කරලා ගන්න ඕනෑ කරුණු නොවෙයි. මේවා අපි ඇස් දෙකෙන් දකිනවා. අපට පාර්ලිමේන්තුවේදීම මේ සම්බන්ධයෙන් අත්දැකීම් ලැබී තිබෙනවා.

හදිසි නීතිය පැනවීමට ප්‍රධාන කරුණු කිහිපයක් බලපානවා. එකක් තමයි, සමාජ මාධ්‍ය අවභාවිත කරමින් අසත්‍ය තොරතුරු පැතිරවීම, කට කථා පැතිරවීම, ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන ආකාරයේ පළ කිරීම් සිදුකිරීම වැළැක්වීම. නව තාක්ෂණයත් එක්ක ඉතාම වේගයෙන් මේවා ප්‍රචලිත වෙනවා. සමහර රටවල් දින ගණනාවකට සම්පූර්ණයෙන්ම සමාජ මාධ්‍ය භාවිතය නවත්වා තිබුණා. තුර්කිය ගත්තොත්, ජනාධිපතිවරණයට සතියකට කලින් මේ සියල්ල භාවිත කිරීම නැවැත්වුවා.

දෙවැනි කාරණය, අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යෑම සඳහා ප්‍රතිපාදන සැලසීම. රඹුක්කන සිද්ධියේදී එතැන තිබුණු පෙට්‍රල් බවුසරය ගිනි ගත්තා නම් වෙන්නේ මොකක්ද? එහෙම වුණා නම් දහස් ගණනක් මිය යනවා. ඒ සිද්ධිය වළක්වන්න ගිය නිලධාරියා තවමත් රිමාන්ඩ්. ඊළඟ කාරණාව තමයි, මහජනතාව ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම, ශරීරය සහ දේපොළ පිළිබඳ ඇතැම් වැරදි. පොදු දේපොළවලට හානිවීම්, පෞද්ගලික දේපොළවලට හානිවීම්, ජීවිත හානි යනාදී මේ සියල්ලත් මේකට අයිති වෙලා තිබෙනවා. පසුගිය කාලය තුළ අපි ඒ සියල්ල අත්වින්දා. ඊළඟ කාරණාව තමයි, අයුතු ජනරාශි සහ නීතිවිරෝධී රැස්වීම් විසුරුවා හැරීම සඳහා ලිහිල් නෛතික ක්‍රමවේද පැනවීම. භාෂණයේ නිදහස, රැස්වීමේ නිදහස අපේ මූලික අයිතිවාසිකම්වල තිබෙනවා. මේ තුළින් ඒවාට හානියක් වෙන්නේ නැහැ. නමුත්, අපි රටේ සාමාන්‍ය නීතිය පවත්වා ගෙන යන්න ඕනෑ. ඊළඟ කාරණය තමයි, මහජන සාමය පවත්වා ගෙන යෑම සඳහා ත්‍රිවිධ හමුදාව වෙත ඇතැම් බලතල පැවරීම. හොඳම උදාහරණය තමයි, පාර්ලිමේන්තුව ආරක්ෂා කිරීමට හමුදාව යෙදවීම. එසේ නොකළා නම් අද පාර්ලිමේන්තුව ඉතිරි වන්නේ නැහැ. එහෙම නම් සමහර කණ්ඩායම් විසින් පාර්ලිමේන්තුව අත්පත් කර ගන්නවා. එතකොට රටේ විධායකයත් නැහැ, ව්‍යවස්ථාදායකයත් නැහැ. එහෙම වුණා නම්, අධිකරණයට ක්‍රියාත්මක වෙන්නත් බැහැ. මේ සියල්ල අතර රූපවාහිනී සංස්ථාවත් අල්ලා ගත්තා නම් මොකක්ද වෙන්නේ? එම නිසා මේවා ගැන අපි බලන්න ඕනෑ හැඟීම්වලින් නොවෙයි, දේශපාලන කෝණයෙන් නොවෙයි. ප්‍රබුද්ධ දේශපාලනඥයෝ හැටියට, නායකත්වයක් දෙන පිරිසක් හැටියට නායකත්වයක් දෙන්න නම් ඒ නායකත්වයේ ගතිගුණ අපි පැහැදිලි කරන්න ඕනෑ. මම ඒ ගැන වැඩිය කියන්න යන්නේ නැහැ.

ඊළඟ කාරණය තමයි, විමර්ශන කටයුතු සඳහා යම් පුද්ගලයන් රඳවා තබා ගැනීමේ කාලය දීර්ඝ කිරීම. පසුගිය දවස්වල Presidential Secretariat එකේ හිටපු පිරිස ඉවත් කිරීමේදී නව දෙනෙක් අත්අඩංගුවට ගත්තත්, ඒ අයට DO ගැහුවේ නැහැ. නමුත්, ඔවුන්ට DO ගැසීමේ අවස්ථාව තිබුණා.

මේ රෙගුලාසි යටතේ රැඳවුම් නියෝග - DOs - දාන්න තිබුණා. එහෙම දැම්මා නම් කොහේවත් උසාවියකට යන්නේ නැහැ. ඒ කාලයේ එහෙමයි කළේ. ඒ කාලයේ උසාවියකට ඉදිරිපත් කිරීමක් කළේ නැහැ. අත්අඩංගුවට ගත්තා; ආරක්ෂක ලේකම් DO ගැහුවා; කෙළින්ම යැව්වා. යැව්වේ කොහාටද කියලාවත් දන්නේ නැහැ. මේ ඉතිහාසය අපි මතක් කරලා දෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මෙන්න මේ හේතු නිසා තමයි හදිසි නීතිය පනවන්න ඕනෑ වෙලා තිබෙන්නේ. අපේ රටේ ව්‍යවස්ථාපිත නීති, ව්‍යවස්ථාපිත ආයතන තිබෙනවා. අපි අපේ රටේ තරුණයන්ගේ නිර්ව්‍යාජ හඬට ඇහුම්කන් දෙන්න ඕනෑ. අපි ඒකට සූදානම්. ඒ සම්බන්ධයෙන් මම යෝජනාවකුත් කළා. අපි ඉදිරියේදී විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගේනවා. "VIIඅ පරිච්ඡේදය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යටතේ Schedule I තිබෙනවා. ඒ යටතේ ස්වාධීන කොමිෂන් සභා තිබෙනවා. ජාතික උපදේශක සභාවත් ඒකට ඇතුළත් කරන්න අපට පුළුවන්. කිසිම ප්‍රශ්නයක් නැහැ, එකහතාවෙන් ඒක කරන්න පුළුවන්. ඊට පස්සේ ඒ අයටත් අවස්ථාව දෙන්න පුළුවන්, ඒ අයගේ අදහස් පළ කරන්න. ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේදී එයට සම්බන්ධ වෙන්න ඒ අයටත් අවස්ථාව දෙන්න පුළුවන්. මේ ටික කරලා රට යථා තත්ත්වයට පත් වුණාට පස්සේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙන ආකාරයට, ජන මතය උරගා බලන්න ජනතාව අතරට යන්න පුළුවන්. ඒකයි, ව්‍යවස්ථාපිත ක්‍රමය. ගරු කථානායකතුමනි, ඒක පවත්වාගෙන යෑම සඳහා, ඒක රැක ගැනීම සඳහා තමයි මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන යටතේ මේ හදිසි නීති රෙගුලාසි නිකුත් කරලා තිබෙන්නේ. එය දීර්ඝ කාලයක් පුරා ගෙන යන දෙයක් නොවෙයි. ඉතාම කෙටි කාලයකදී මේ රට යථා තත්ත්වයට පත් වුණාම ඒවා ඉවත් වෙනවා. නමුත්, ඒවා තිබියදී වුණත් කෙනෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන්. ඒ නිසා මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ගරු සභාවේ පක්ෂ, විපක්ෂ සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.11]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ගරු සුසිල් ප්‍රේමජයන්ත සභානායකතුමාට අපි සුබ පතනවා. හදිසි නීතියේ ඉතිහාසය ගැන එතුමා දැන් කිව්වා. නමුත්, අද ඉදිරිපත් කරන රෙගුලාසි ගැන එතුමා වචනයක්වත් කථා කෙරුවේ නැහැ.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගොඩක් කිව්වා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභානායකතුමනි, ඔබතුමා අවශ්‍ය දේ කිව්වේ නැහැ. මොකද, මේ රෙගුලාසි ඉතාම බැරෑරුම්. ඒ කියන්නේ, ඕනෑම හමුදා නිලධාරියෙකුට, ඕනෑම පොලිස් නිලධාරියෙකුට වරෙන්තුවක් නැතිව ඕනෑම කෙනෙකු අත්අඩංගුවට ගන්න පුළුවන්. ගෙදරකට ගියාට පස්සේ ඒ ගෙදර වසා තිබුණත්, දොරවල් කඩලා ඒ ගෙදරට ඇතුළු වෙන්න පුළුවන්; දේපළ අත්පත් කර ගන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම මේ වාගේ දරුණු නීති-රීතිවලට විරුද්ධව තමයි අපි හැම දාම මේ පාර්ලිමේන්තුවේ කථා කළේ.

අපි ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කරනකොට යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය හැම දාම කිව්වේ මේ දරුණු නීති-රීති ඉවත් කරන්න කියලායි. ගරු කථානායකතුමනි, යම් පුද්ගලයකු අත්අඩංගුවට ගත්තාම එම පුද්ගලයා අධිකරණයකට ඉදිරිපත් නොකර, රැඳවුම් නියෝගයක් යටතේ දින අනූවක් රඳවා තබා ගන්න පුළුවන්. ඒ ආකාරයට යම් පුද්ගලයකු අධිකරණයට ඉදිරිපත් නොකර අවුරුද්දක් දක්වාම රඳවා තබා ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ලෝකයම අපේ රට දිහා බලාගෙන ඉන්න වෙලාවක ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම මේ කාරණයත් කියන්න ඕනෑ. පාස්කු ප්‍රහාරයෙන් පසු, 2019.04.22වන දින හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා. ඒ වාගේම ඒක ඉවත් කළා, 2019.08.22වන දා. 2019න් පසු මේ රටේ හදිසි නීතිය ප්‍රකාශයට පත් කර තිබුණේ නැහැ. අපේ Research Unit එකෙන් මට දැන්වුවා, 2019.08.22වන දායින් පසු මේ ආකාරයට හදිසි නීතිය ප්‍රකාශයට පත් කර නැහැ කියලා. එහෙම නම්, දැන් තිබෙන මේ හදිසිය මොකක්ද? මේ මොහොතේ මුළු ලෝකයම අපේ රට දිහා බලාගෙන ඉන්නවා. එවැනි මොහොතක හදිසි නීති තත්ත්වයක් ප්‍රකාශයට පත් කළාම "රට අස්ථාවරයි" කියන පණිවුඩය තමයි ජාත්‍යන්තරයට යන්නේ. ඒ වාගේම තමයි, අරගළ භූමියට පහර දීම. ඒ අවස්ථාව වෙනකොට ඒ අරගළය සාමකාමී තත්ත්වයකට පත් වෙලා තිබුණා. ඔවුන් පැය 24ක් තුළ අරගළ භූමියෙන් ඉවත්ව යන බවත් කියලා තිබුණා. එවැනි අවස්ථාවක කළ මේ පහර දීම ගැන ඇත්ත වශයෙන්ම මට කනගාටුයි. මොකද, ඒ තුළින් අපේ රට අනතුරේ දැම්මා. ගෙවල් පිච්චුණු මන්ත්‍රීවරුන්ට හිතේ අමාරුවක් ඇති, අරගළකරුවන්ට පාඩමක් උගන්වන්න ඕනෑ කියලා. ඒක වෙනම කථාවක්. නමුත්, මුළු ලෝකයම අපේ රට දිහා බලාගෙන ඉන්න අවස්ථාවක මේ ප්‍රහාරය නිසා අපේ රට අනතුරේ දැම්මක් තමයි වුණේ. අන්න ඒකයි මම කියන්නේ. මේ සිදුවීම ගැන මම පුදුම වුණා. මොකද, ගරු ජනාධිපතිතුමා සමඟ අපි වැඩ කළ කාලයේදී එතුමා හැම දාම කිව්වේ, ජාත්‍යන්තර නීති-රීති අනුව කටයුතු කරන්න කියලායි. GSP සහනය ලබා ගන්න, යහ පාලන ආණ්ඩුව පැවැති කාලයේ ජාත්‍යන්තරයත් එක්ක අපි සම්බන්ධකම් ඇති කර ගත්තා. මේ නීති-රීති ආරක්ෂා කර ගනිමින් තමයි අපි ඒ කටයුතු කළේ. ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා වැඩ භාරගෙන පැය 24ක් යන්න කලින් මේ වාගේ ප්‍රහාරයක් දියත් කිරීම ගැන මම පුදුම වුණා. ඒ ප්‍රහාරයෙන් අපේ රට අනතුරේ දැම්මා. අන්න ඒකයි මේ රටේ ජනතාවත් කියන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය, යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය සහ ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය ඇතුළු හැම රටක්ම වාගේ ඒ ප්‍රහාරය හෙළා දැක තිබෙනවා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ මන්ත්‍රීවරු අද තානාපතිවරුන්ට බණිනවා. මම දැක්කා එක ඇමතිවරයෙක් තානාපතිවරුන්ට බණිනවා, "මන්ත්‍රීවරුන්ගේ ගෙවල් ගිනි තැබුවාම තානාපතිවරු tweets නිකුත් කළේ නැහැ" කියලා.

ගරු කථානායකතුමනි, ඇත්තෙන්ම ඒ රාජ්‍ය තාන්ත්‍රිකභාවය ගැන දන්නේ නැතිකම. තානාපතිවරු රට අභ්‍යන්තරයේ ඇති වෙන කැරලි ගැන, ත්‍රස්තවාදී ක්‍රියා ගැන කවදාවත් නිවේදන නිකුත් කරන්නේ නැහැ. අපේ රටේ අවුරුදු 30ක් ත්‍රස්තවාදී යුද්ධය තිබුණා. නමුත් කවදාවත් රට අභ්‍යන්තරයේ සිද්ධ වෙන දේවල් ගැන ඒ අය නිවේදන නිකුත් කළේ නැහැ. ඒක තමයි රාජ්‍ය තාන්ත්‍රිකභාවය කියන්නේ. තානාපතිවරු උනන්දු වෙන්නේ ආණ්ඩුවක් කරන දේවල් ගැන; they are only concerned about the actions of the Government. ඒක තමයි ජාත්‍යන්තර නීතිය. ඒක තමයි ජාත්‍යන්තර සම්ප්‍රදාය. ඒක දන්නේ නැති අය මේ විධියට තානාපතිවරු දෝෂ දර්ශනයට ලක් කිරීම විශාල වරදක් කියලායි මම හිතන්නේ. මේක තේරුම් ගන්න ඕනෑ. මේ ගැන විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අහන්න. කවදාවත් රටක අභ්‍යන්තර ප්‍රශ්න ගැන තානාපතිවරු කථා කරන්නේ නැහැ. They are only concerned about the rights and wrongs of the Government. ඉතින්, මේ වාගේ සරල දෙයක්වත් දන්නේ නැති අය අද අපේ ජාත්‍යන්තර සම්බන්ධතා කබලෙන් ලිපට වට්ටලා තිබෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

අපට ලැබී තිබෙන තොරතුරු අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අත්සන් කරන්න ගිය staff-level agreement එක දැන් මාස දෙක තුනකින් කල් ගිහින් තිබෙනවා. ඉතින්, මේක රට අනතුරේ දැමීමක් නොවෙයිද ගරු කථානායකතුමනි? මේ කළේ රට අනතුරේ දැමීමක් නොවෙයිද? ඒකයි මම කිව්වේ ඒ අවස්ථාවේ ඉවසන්න තිබුණා කියලා. මොකද, අරගළයේ අවසාන කාලයට ඇවිත් තිබුණේ. ඒ අය කිව්වා, "අපි පැය 24න් ඉවත් වෙනවා" කියලා. එහෙම කියද්දී ඒ අයට ම්ලේච්ඡ ප්‍රහාරයක් එල්ල කළා. අපි දන්නේ නැහැ ඒකට කවුරු ආවාද කියලා. ඇත්ත වශයෙන්ම ඒකට ත්‍රිවිධ හමුදාව ආවාද, නැත්නම් වෙන කුලී හමුදාවක් ආවාද කියලා අපි දන්නේ නැහැ. නමුත් පොලිස් ප්‍රකාශක ඒ ප්‍රහාරය පිළිගත්තා.

ගරු කථානායකතුමනි, දැන් අලුත් ජනාධිපතිවරයෙක් පත් වෙලා තිබෙනවා. අපි හිතුවා එතුමා අලුත් ගමනක් - a new journey - ආරම්භ කරයි කියලා. නමුත් අවාසනාවකට වාගේ අපි හිතපු නැති ආකාරයට පැය 24ක් ඇතුළත මේ රටේ ජනතාවගේ විතරක් නොවෙයි, අපි සියලුදෙනාගේම බලාපොරොත්තු විනාශ මුඛයට අරගෙන ගියා.

දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් සල්ලි ලැබුණේ නැත්නම් අපි මොකද කරන්නේ? දැන් ඒකත් ප්‍රමාද වෙනවා. අනිවාර්යයෙන්ම ප්‍රමාද වෙනවා. එදා මහ බැංකුවේ අධිපතිතුමා කිව්වා, දෙසැම්බර් මාසයේ මේ මුදල් ලැබෙයි කියලා. නමුත් අපිට ලබන අවුරුද්දේ මැද භාගය වෙනකම්වත් මේ මුදල් ලැබෙයි කියලා මම නම් හිතන්නේ නැහැ, මේ යන විධියට.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ගරු කථානායකතුමනි, අද අපේ රටට අවශ්‍ය මොකක්ද? දැන් බලන්න, ජනාධිපතිතුමා තනතුරින් යන්න ගියා; අගමැතිතුමා යන්න ගියා; කැබිනට් මණ්ඩලයත් තනතුරු දාලා ගියා.

එතකොට මොකක්ද මේ ආණ්ඩුව? මේක පිළුණු වෙච්ච ආණ්ඩුවක් නේ. බැහැ කියලා දාලා ගියාට නැවත ඒ ගොල්ලන්ම ඇවිල්ලා වෙන කණ්ඩායමක් පත් කර ගත්තා. පරණ වයින් අලුත් බෝතල්වල; ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "old wine in new bottles" කියලා. ඉතින් මොකක්ද ආණ්ඩුව කෙරෙහි ඇති වන විශ්වාසය? ගරු කථානායකතුමනි, මෙහෙම ආණ්ඩු කරන්න පුළුවන්ද? මේ වාගේ ආණ්ඩු ජාත්‍යන්තරය පිළිගන්නේ නැහැ. ඒක ආණ්ඩුව දැන ගන්න ඕනෑ. ජාත්‍යන්තරය හැමදාම කියන්නේ, ජනමතයකින් පසුව බලයට පත් වෙන අලුත් ආණ්ඩුවක් එක්ක අපි වැඩ කරන්න සූදානම් කියලායි. දැන් අපට IMF එකේ සල්ලි ලැබෙනතුරු අත මාරුවට bridging finance හම්බ වෙනවා ද? කොහෙන්ද හම්බ වෙන්නේ? එක රටකින්වත් අත මාරුවට bridging finance හම්බ වෙන්නේ නැහැ. අපේ රට ඉස්සරහට යන්න නම් මොකක්ද වෙන්න ඕනෑ?

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ ජන වරම අහෝසියි. ජනාධිපතිතුමා පැනලා ගියාම, අගමැතිතුමා පැනලා ගියාම, කැබිනට් මණ්ඩලය අස් වුණාම ඒ ජන වරම අහෝසියි. ඔබතුමා ඒක දන්නවා. මේ සිද්ධ වෙච්ච කටයුතු නීත්‍යනුකූල වෙන්න පුළුවන්. ව්‍යවස්ථාවට අනුව අලුත් ජනාධිපතිවරයෙක් පත් කළා. ඒක නීත්‍යනුකූල වෙන්න පුළුවන්. නමුත් එසේ පත් වෙන අයට ජන වරමක් තිබෙනවා ද? පාර්ලිමේන්තුවෙන් එළියේ මේ ගැන තිබෙන මතය මොකක්ද? එම නිසා අද අපේ රටට අවශ්‍ය මොකක්ද?

පළාත් සභා මැතිවරණය කල් දැම්මා. ප්‍රාදේශීය සභා මැතිවරණය කල් දැම්මා. ආණ්ඩුවට තුනෙන් දෙකක් තිබිලත් ඒ අඩුපාඩුව හදා ගන්න බැරි වුණා. මේ විධියට තමයි රජය මේ රට පාලනය කරන්නේ.

අලුත් ආණ්ඩුවක් ආවාම ඩොලර් ගලා ගෙන එනවා කිව්වා නේ. ආවාද? ඊයේ ගරු කංචන විජේසේකර ඇමතිතුමා කියලා තිබුණා, මේ ඉන්ධන අර්බුදය අවුරුද්දක් යනතෙක් විසඳන්න බැහැ කියලා. එතුමා ඒක පැහැදිලිව කියලා තිබුණා. ඉතින් ගරු කථානායකතුමනි, අපේ රටේ ජනතාවට අලුත් ආණ්ඩුවක් අවශ්‍යයි. ඒක තේරුම් ගන්නේ නැත්නම් රට දවසින් දවස අගාධයට යනවා. මට මහනුවරින් දිනපතා calls එනවා. ඊයේ රාත්‍රියේත් ඇමතුමක් ආවා, අපේ ප්‍රාදේශීය සභාවක හිටපු සභාපති නිමල් චන්ද්‍රසිරි මැතිතුමාගෙන්. එතුමා පෝලිමේ පැය හතක් අටක් ඉඳලාත් ඩීසල් ලීටර 20යි හම්බ වෙලා තිබෙන්නේ. බස් එකකට දෙන්නේ ඩීසල් ලීටර් 40යි. ඒකත් සතියට එක වතාවයි දෙන්නේ. හැම තැනම තත්ත්වය මෙහෙමයි. මම අහනවා, ඉදිරි මාස කිහිපය සඳහා රජයේ සැලැස්ම මොකක්ද කියලා. අපි කැමැතියි, රජය මේ රට ගොඩගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්. නමුත් මොකක්ද සැලැස්ම? ඔළුගෙඩි මාරු කරලා ආණ්ඩු හදන එකද එළියේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ?

අද අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනයක් නැහැ, ගරු කථානායකතුමනි. ඒවා හිතෙන හිතෙන ගණන්. ඉන්ධන ප්‍රශ්නය, විදුලිය ප්‍රශ්නය, දරුවන්ගේ පාසල් ප්‍රශ්නය කියන මේ හැම ප්‍රශ්නයක්ම අද ගොඩ ගැසී තිබෙනවා. මේ ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව ආණ්ඩුවක් නොමැතිවීමයි, ගරු කථානායකතුමනි. මේ ආණ්ඩුවේ ජීවයක් - spirit එකක් - නැහැ. ආණ්ඩුවක් පත් වුණාම ජීවය තිබෙන්න ඕනෑ; spirit එකක් තිබෙන්න ඕනෑ. ඒක දැන් තිබෙනවාද? මම අවංකවම අහන්නේ තමුන්නාන්සේලාට ඒක තිබෙනවාද කියලායි.

ගරු කථානායකතුමනි, අපේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. එදා එතුමා කිව්වේ මොකක්ද? "මහ දවල් මහ බැංකුවේ මහා මංකොල්ලයේ මහ මොළකරු" කියලා. අපේ බුදුන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, ලජ්ජා, බය ගැන. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලජ්ජා, බය නැද්ද? ලජ්ජාවක් නැද්ද? ඔබතුමාගෙන් දරුවන් ඇහුවේ නැද්ද, ඔබතුමා එහෙම කියලා ඇයි මේ ඇමතිකම භාරගත්තේ කියලා? මට නම් මේක අදහගන්න බැහැ. අපි ඔක්කොම තනතුරුවලට ආසයි. නමුත් අපි ඒවා භාරගන්නකොට යම් යම් සාරධර්මවලට අනුකූලව කටයුතු කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ජනතාව අපෙන් බලාපොරොත්තු වෙන්නේ අන්න ඒකයි. අපි කිව්වේ නැහැ, ඒ කථා. ඒ කථා කිව්වේ ඔබතුමන්ලාගේ පැත්තෙන්. දැන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති කරලා ඒ සියලු චෝදනාවලින් නිදහස් කරලා තිබෙනවා. ඒ නිසා ආයෙත් ඒ කථාව කියන්න එපා. අපි ඒ කාලයේ කිව්වා, එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ කියලා. ඔබතුමන්ලා තමයි කිව්වේ එහෙම දෙයක් සිද්ධ වුණා කියලා. දැන් එතුමා ජනාධිපති කරලා ඒ චෝදනාවලින් එතුමා නිදහස් කර තිබෙනවා. ආණ්ඩු කරන්න ඕනෑ. නමුත් අපි පිළිගන්නා සාරධර්මවලට, ප්‍රතිපත්තිවලට අනුකූලව ආණ්ඩු කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. සාරධර්ම නැති වුණාම, අරමුණක් නැති වුණාම ආණ්ඩු කරන්න බැහැ.

මම අලුත් අගමැතිතුමාට මේ කාරණය කියනවා. ඔබතුමා 1983 ඉඳන් පාර්ලිමේන්තුවේ ඉන්න ගරු මන්ත්‍රීවරයෙක්. ඔබතුමා මේ තත්ත්වය තේරුම් අරගෙන තිබෙනවා. We need a new mandate. ගරු කථානායකතුමනි, අලුත් ආණ්ඩුවක් බලයට පත් වුණාම ඒ ආණ්ඩුවට ජනතාව අවුරුද්දක්, එකහමාරක් කල් දෙනවා, ප්‍රශ්න විසඳන්න. ජාත්‍යන්තර ප්‍රජාවත් අපට උදවු කරන්න සූදානම්. අලුත් ආණ්ඩුවකට උදවු කරන්න සූදානම්. නමුත් ඔළුගෙඩි මාරු කරලා හදන මේ ආණ්ඩු, පරණ වයින් අලුත් බෝතල්වලට දමලා - old wine in new bottles - හදන ආණ්ඩුවලට ජාත්‍යන්තර උදවු නැහැ. ඒ ගොල්ලන් කෙළින්ම අපට ඒ බව කියලා තිබෙනවා. ඒ ගොල්ලන් ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකළාට අපි ඒ ගොල්ලන් හම්බ වෙන්න ගියාම ඒ ගොල්ලන් අපට ඒ බව කියලා තිබෙනවා. එම නිසා අපි අහනවා, ආණ්ඩුවේ ඉදිරි ගමන මොකක්ද කියලා. ආණ්ඩුවේ ඉදිරි ගමන ගැන වචනයක්වත් කියන්නේ නැහැ. දිනපතා කියන්නේ කැබිනට් ඇමතිකම් 20ක් දෙනවා, 30ක් දෙනවා, 40ක් දෙනවා කියලායි. සර්ව පාක්ෂික ආණ්ඩුවක් ගැන වේදිකාවල කථා කළාට අපේ පක්ෂයටවත්, අපේ පක්ෂයේ නායකතුමාටවත් නිල වශයෙන් සර්ව පාක්ෂික ආණ්ඩුවකට ආරාධනාවක් කරලා නැහැ. ඉතින් මේකයි තත්ත්වය.

ගරු කථානායකතුමනි, මීට සති දෙකකට විතර කලින් මගේ ප්‍රධානත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කරලා, දේශපාලන වැඩ පිළිවෙළක් සහ ආර්ථික වැඩ පිළිවෙළක් හදන්න විපක්ෂයේ ඉන්න සියලු දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කළා. විපක්ෂයේ ඉන්න සියලු දේශපාලන පක්ෂ ඒකට කැමති වුණා. ඒ අනුව, විපක්ෂයේ ඉන්න සියලු දේශපාලන පක්ෂවල කැමැත්ත අරගෙන අපි වැඩ පිළිවෙළක් හැදුවා. ඉතින්, ආණ්ඩුවටත් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මොකක්ද ආණ්ඩුවේ වැඩ පිළිවෙළ? අපි දන්න තරමට ආණ්ඩුවට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

අපේ ගරු අගමැතිතුමා කිව්වා, පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදයට යොමු කරන්න ඕනෑ කියලා. මම ඒක අගය කරනවා. නමුත් ආණ්ඩුව අවුරුදු දෙකක් මොකක්ද කළේ? ඔබතුමාත් ඒකේ කොටස්කාරයෙක්. ඔබතුමා ආංශික අධීක්ෂණ කාරක සභා අත්හිටෙව්වා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දෙන්න හැදුවාම ස්ථාවර නියෝග අත්හිටුවලා ඔබතුමා ඒක නැවැත්වූවා.

ඔබතුමා කිව්වා, එය තීරණය කරන්නේ පාර්ලිමේන්තුව කියලා. නමුත්, ඒ යෝජනාව න්‍යාය පුස්තකයට ඇතුළත් කළේ ඔබතුමා නේ. ස්ථාවර නියෝග අත්හිටුවන්න කියන ඒ යෝජනාව ගෙනැල්ලා, ස්ථාවර නියෝග අත්හිටවපු නිසා තමයි අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දෙන්න බැරි වුණේ. ඔබතුමන්ලා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒ ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන කල් අපි දැනගෙන හිටියේ නැහැ මොනවා ද ඒකේ තිබෙන සංශෝධන කියලා. ඒක ගෙනෙනතුරු අපි දන්නේ නැහැ! හිටපු ජනාධිපතිතුමාගේ පෞද්ගලික නීතිඥ මහත්වරු ලවා ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් හදලා, ඒක ඉදිරිපත් කළා. එහෙම ද වැඩ කරන්නේ, ගරු කථානායකතුමනි? දැන් කථා කරනවා, එකතුවෙලා වැඩ කරමු කියලා. ඒකට ප්‍රමාද වැඩියි. අශ්වයා පැනලා ගියාට පස්සේ දැන් කියනවා, පාර්ලිමේන්තුව හැටියට අපි ඔක්කෝම එකට වැඩ කරන්න ඕනෑ කියලා. It is too late. දැන් රටට අවශ්‍ය අලුත් ආණ්ඩුවක්. ඒ සඳහා මැතිවරණයකට යන්න අපි ඉදිරි කාලය තුළ වැඩ කරන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Prasanna Ranatunga.

Before that, the Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] *took the Chair.*

[පූ.භා. 11.27]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කථා කරපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කථාව මම අහගෙන හිටියා. එතුමා සහ මගේ පියා සමකාලීන දේශපාලනඥයන්. එතුමාට අපේ ලොකු ගෞරවයක් තිබුණා. හැබැයි, මම අද එක දෙයක් ඉගෙන ගත්තා. එතුමාගේ කථාවේදී එක්කෝ එතුමා තමන්ගේ වාසියට, ඉතිහාසය වුවමනාවෙන් අමතක කරලා තමන්ට වුවමනා දේ කිව්වා. එහෙම නැත්නම් ඉතිහාසය අමතක කරලා කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අද එතුමාගේ කථාව අහගෙන සිටි මම තීන්දු කළා රටේ මිනිස්සු හිනස්සන්නේ නැතිව එතුමා අද ඉන්න වයසට මම එන කොට, මට අමතක වීමේ රෝගය තිබෙනවා නම් මම නම් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ නැහැ කියලා. මම එහෙම හිතා ගත්තා.

අද මෙම විවාදය පැවැත්වෙන්නේ ගරු ජනාධිපතිතුමා වැඩබලන ජනාධිපතිතුමා ලෙස සිටියදී නිකුත් කළ 2022 ජූලි 17 වන දිනැති 2288/30 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව 2022 ජූලි මස 18 වැනි දින සිට රට පුරා ක්‍රියාත්මක කරන ලද හදිසි නීතිය අනුමත කර ගැනීම සඳහායි. පසුගිය දින කීපයේ බොහෝ දෙනෙක් කථා කළේ ජනාධිපති ලේකම් කාර්යාලය බලහත්කාරයෙන් අත්පත් කරගෙන සිටින උද්ඝෝෂකයින් ඉන් ඉවත් කිරීම සඳහා ආරක්ෂක අංශ අනුගමනය කළ ක්‍රියා පිළිවෙත පිළිබඳවයි. ජනාධිපති ලේකම් කාර්යාලය අත්පත් කරගෙන සිටි අරගළකරුවන් ඉන් ඉවත් කිරීම සඳහා පසුගිය 22වැනි දා අලුයම ආරක්ෂක අංශ පියවර ගැනීම ගැන පාර්ලිමේන්තු විවාදයක් ඉතා ඉක්මනින් ලබා දෙන්න කියලා විපක්ෂය ඉල්ලා තිබුණා. අද පැවැත්වෙන මේ විවාදයේදී ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන් නිසා, ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න මම බලාපොරොත්තු වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගෝල් ෆේස් අරගළකරුවන් විසින් එම අරගළය නම් කළේ, "Gota go home." ලෙසයි. එසේම ඔවුන් එම අරගළ භූමිය "ගෝඨා ගෝ ගම" ලෙස නම් කර තිබුණා. අරගළකරුවන්ගේ ඒකායන අරමුණ වුණේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයෙන් පහ කිරීමයි. ඔවුන් නිතරම කිව්වේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වන තුරු එම අරගළය නොනවත්වා පවත්වාගෙන යන බවයි. මේ වන විට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වෙලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නව ජනාධිපතිවරයෙක් තෝරා පත් කරගෙන ඉවරයි. හැබැයි ගෝල් ෆේස් අරගළය තවම තිබෙනවා. අරගළකරුවන්ගේ ඒකායන අරමුණ වූ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වීම ඉටු වී තිබියදීත් තවදුරටත් එම අරගළය පවත්වාගෙන යාමේ කිසිම පදනමක් නැති බවයි මගේ විශ්වාසය. හරිනම් ඔවුන් මේ වන විට අරගළය අවසන් කර එම භූමියෙන් ඉවත් විය යුතුව තිබෙනවා. එම අරගළ භූමිය හා අරගළය රට අස්ථාවර කර, රටේ පාලකයන් නෙරපා හැර, ආණ්ඩු පෙරළීමේ කුමන්ත්‍රණ දියත් කරන තිප්පළක් නොවිය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දවස්වල සාමකාමී අරගළකරුවන් කියන කණ්ඩායම ඉදිරියට දාගෙන මේ කුමන්ත්‍රණය සම්පූර්ණයෙන්ම මෙහෙයවූයේ පාතාලයේ කුඩුකාරයෝ, මංකොල්ලකාරයෝ බව අපි දන්නවා. සමහර දේශපාලන පක්ෂවල නායකයෝ පිටුපස ඉඳන් ඔවුන්ට නායකත්වය දෙමින්, උදවු කළා. ඔවුන් ඒ ඒ දේශපාලන කෝණයෙන් බලලා තමන්ගේ දේශපාලන වුවමනා එපාකම් ඉටු කර ගත්තා. ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහා තිබුණේ චීනච්චට්ටි වැටක්, ගරු අගමැතිතුමනි. එම අරගළකරුවන් ඒ චීනච්චට්ටි වැටම ගලවාගෙන ගිහිල්ලා. ඒකට වග කියන්නේ කවුද? එම අරගළකරුවන් වෙනුවෙන් පෙනී සිටින දේශපාලන පක්ෂ හා එම පක්ෂවල නායකයෝ එහි වගකීම භාර ගන්නවා ද?

ජනාධිපති මන්දිරයේ තිබුණු ඡායාරූපවල එක එක්කෙනා අත්සන් තබලා තිබෙනවා. රටේ වෙනසක් ඇති කරන්න කියලා අරගළ කරන අය කරපු දේවල් තමයි මේවා. මේ කට්ටිය එතැනට

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

ගිහිල්ලා සබන් ගාමින් swimming pool එකේ නානවා. එවැනි අයද, දැන් මේ රට වෙනස් කරන්න හදන්නේ? මේ සභාවේ සිටින දේශපාලන නායකයන්ට එවැනි අය වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන්ද? මේක කල්පනා කරන්න ඕනෑ කාරණයක්. හැබැයි, ඔවුන් දැන් කරන්නේ, "Gota go home" banners, cut-outs ඉවත් කරලා, වෙනත් නම් එයට ඇතුළත් කරලා තවත් අයකු ධුරයෙන් පහ කිරීම සඳහා කටයුතු කිරීමයි. එලෙස තවත් අයකු පහ කිරීම සඳහා මෙම අරගල භූමිය භාවිත කිරීමට මේ අයට කිසිදු සදාචාරාත්මක අයිතියක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝල් ෆේස් පිටිය පොදු දේපොළක්. 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ 3 (1) වගන්තිය ප්‍රකාරව මෙම අනවසර ඉදිකිරීම කර ඇති ස්ථානය අයත් කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය 1978.09.30 දිනැති අංක 4/1 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කර තිබෙනවා. එවැනි නාගරික සංවර්ධන ප්‍රදේශයක යම් සංවර්ධන කටයුත්තක්, තාවකාලික ඉදිකිරීමක් සිදු කරන්නේ නම්, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 8(ඒ)1 වගන්තිය ප්‍රකාරව ඒ සඳහා බලපත්‍රයක් ලබා ගත යුතුයි. ගෝල් ෆේස් පිටිය පිහිටා තිබෙන්නේ මෙරට ආර්ථික මර්මස්ථානයකයි. ඒ අවට ප්‍රධාන පෙළේ සංචාරක හෝටල් රැසක් පිහිටා තිබෙනවා. ඒ වාගේම Port City ජාත්‍යන්තර ආයෝජන මධ්‍යස්ථානය සහ කොළඹ වරාය පිහිටා තිබෙන්නේ මේ භූමියේයි. මෙම භූමිය තවදුරටත් ව්‍යාකූලව හා අනාරක්ෂිතව පැවතීම, විශේෂයෙන්ම Port City හරහා රටට ගෙන්වා ගැනීමට අපේක්ෂිත ජාත්‍යන්තර ආයෝජන සඳහාත්, සංචාරක කර්මාන්තය සඳහාත් දැඩි ලෙස අහිතකර බලපෑම් ඇති කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය සහ කොළඹ මහ නගර සභාව මඟින් මෙම ප්‍රදේශයේ සංවර්ධනය සඳහා විශාල මුදලක් වැය කර තිබෙනවා. මහ ජනතාවගේ එදිනෙදා කටයුතු සඳහා සහ පොදු කටයුතු සඳහා වෙන් කර ඇති මෙම භූමිය නඩත්තු කිරීමටත් විශාල මුදලක් වැය කිරීමට මෙම ආයතනවලට සිදුව තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 47/2004 දරන Environmental Foundation Limited එදිරිව, ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය සහ තවත් අය නඩුවේ තීන්දුව මඟින්ද මෙම ප්‍රදේශය පොදු මහ ජනතාවගේ සේවාවන් වෙනුවෙන් වෙන් කර තිබිය යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර තිබෙනවා. අරගලකරුවන් ලෙස හඳුන්වා ගන්නා මේ කණ්ඩායම එම ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී අයුතු ජන රාශියක් සිදු කර තිබෙනවා. පොදු දේපොළකට ඇතුළු වී ඒ තුළ නීති විරෝධී පදිංචියක් ස්ථාපනය කර, එම පදිංචිය තහවුරු කර ගැනීම සඳහා ලිපිනයන් පවා ලබා ගැනීමට කටයුතු කර තිබෙන බවට අපට තොරතුරු ලැබී තිබෙනවා. එම භූමිය තුළ අනවසර ඉදිකිරීම් රැසක් කර තිබීම හේතුවෙන් පොදු මහ ජනතාවට නිදහසේ එම ප්‍රදේශ භාවිත කිරීමට තිබූ අයිතියට බාධාවක් සිද්ධවෙලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුවත් එය බලපානවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙම සියලු ක්‍රියා නාගරික සංවර්ධන අධිකාරිය පනත උල්ලංඝනය කිරීමක්. ඒ අනුව 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත සමඟ කියවිය යුතු, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත සහ 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනතේ 28 (3) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට එම අධිකාරියට බලය පැවරී තිබෙනවා. මෙම ස්ථානයේ පැවැත්වෙන විරෝධය සාමකාමී අරගලයක් ලෙසත්, එම ස්ථානයේ රැඳී සිටින පිරිස සාමකාමී අරගලකරුවන් ලෙසත් හුවා දැක්වීමට උත්සාහ කළත්, විටින්-විට ඒ ආශ්‍රිතව සිදු වූ නීති විරෝධී ක්‍රියාකාරකම් සාමකාමී බව අභිභවා ගිය හිංසාකාරී, විනාශකාරී ක්‍රියාකාරකම් බව මෙම ගරු සභාවේ අවධානයට යොමු කරන්න මම කැමැතියි.

මේ අරගළය මුවාවෙන් ඉදිරියට ඇවිල්ලා "Go home Gota" කියලා පුවරු ගහගෙන, ඒ ඒ දිස්ත්‍රික්කවල, ආසනවල ඒ විනාශකාරී කටයුතු කිරීමට ඔවුන්ව හැසිරවූයේ කවුද කියන එක පසුගිය දවස්වල අපි දැක්කා. ගෙවල් ගිනි තබන්න කටයුතු කළේ කවුද කියන එක අපි දැක්කා. ඒවාට නායකත්වය දුන්නේ කවුද කියන එක අපි දැක්කා. අද ඒ අයගේ බලාපොරොත්තු ඉටු නොවනකොට සමහර දේශපාලන පක්ෂ නායකයන් ඇවිල්ලා නැවතත් තමන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් යම් යම් ප්‍රකාශ කරන ආකාරය අපි දකිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සාමකාමී අරගළකරුවන්ගෙන් කිසිදු අපේක්ෂාවක් කළ නොහැකි හිංසාකාරී, විනාශකාරී සිදුවීම් රැසක් මේ භූමිය ආශ්‍රිතව මේ වනකොටත් සිදු වෙමින් තිබෙනවා. මේ ස්ථානයේ රැඳී සිටින පිරිස් පමණක් නොව ඔවුන් විසින් විටින්-විට එම ස්ථානයට කැඳ වූ පිරිස් සහ අරගළකරුවන්ගේ සහායට එම ස්ථානයට පැමිණි බොහෝ පිරිස් සිදු කළ නීති විරෝධී ක්‍රියාකාරකම් පාලනය කිරීමට මේ ස්ථානයේ ස්ථානගතව සිටින අරගළකරුවන්ට නොහැකි වූ බව අපි තේරුම් ගත යුතුයි. මැයි 09 දා සහ ජූලි 09 දා සිදු වූ විනාශකාරී සිදු වීම් සිදු වුණේ මෙම ස්ථානය කේන්ද්‍ර කර ගනිමිනුයි.

මේ නිසා පොදු දේපළ මෙන්ම ඓතිහාසික දේපළ රැසක් විනාශ වුණා. මේ වනවිට එම අරගළ භූමිය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ පාරාදීසයක් බවට පත්වීම හේතුවෙන් සොරකම් රැසක් සිදු වී තිබෙනවා. මේ වනවිට ඒ අරගළකරුවන්ගේ ආරක්ෂක රැකවලුන් බවට පත් වී තිබෙන්නේ මත්කුඩුවලට ඇබ්බැහි වුණු පිරිස්. ඔවුන්ව තමයි විවිධ පෙළපාළි, උද්ඝෝෂණවල ඉදිරියෙන්ම තබාගෙන ආරක්ෂක වැටකඩුලු බිඳ දමන්න යොදා ගන්නේ. මේ තත්ත්වය අපි පසුගිය කාලයේ දැක්කා. ඒ නිසා මේවා නැහැයි කියන්න බැහැ. හැම තැනකම සිටින කුඩුකාරයන්, අද පොලීසිය ගියාම පොලිස් නිලධාරීන්ව පන්නනවා; "යනවා, යනවා, මෙතැනින් යනවා" කියනවා. අපි ඒවා මාධ්‍ය තුළ දකිනවා. මොකද, ඔවුන්ට කුඩු ජාවාරම කරන්න පුළුවන් හොඳම තිප්පොළ බවට එතැන පත්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලිනුත් කිව්වා වාගේ ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට ඉදිකර තිබුණු වීනච්චට්ටි වැටේ කොටස් අරගෙන යන්නේ, එක් අතකින් සිංහ කොඩියත් අරගෙනයි. ඒවා බරට ඇදගෙන යනවා. මේ වනවිට ජනාධිපති මන්දිරය පුරාවිද්‍යා සංරක්ෂිත ස්ථානයක් ලෙස නම් කර ගැසට් කර තිබෙනවා. ජනාධිපති ලේකම් කාර්යාලය සහ අරලියගහ මන්දිරය තුළ පුරාවිද්‍යා වටිනාකමින් යුත් පෞරාණික දේපළ තිබුණා. එම දේපළවලට තිබුණේ මූල්‍යමය වටිනාකම ඉක්මවා ගිය ඓතිහාසික වටිනාකමක්. ඒවා අපේ ඉතිහාසය සමඟ බැඳී තිබුණු ස්මරණීය සිහිවටන. ඒවායේ ගෞරවය හා වටිනාකම නොහඳුනන පිරිසක්ද අපේ රටේ අනාගතය භාර ගන්න මේ අරගළ කරන්නේ කියන එක අද ප්‍රශ්නාර්ථයක්. මේ දේපළ අත්පත් කර ගත්තාට පසු ඔවුන් හැසිරුණු ආකාරය දෙස මුළු ලෝකයම බලාගෙන සිටියා. ඔවුන්ගේ විකෘති ක්‍රියාකාරකම් හා හැසිරීම් දෙස බලාගෙන හිටපු ආයෝජකයෝ, සංචාරකයෝ මෙරටට පැමිණේවිද කියන කාරණයත් අපි සලකා බලන්න ඕනෑ.

සමහර දේශපාලන පක්ෂවලට ඕනෑ මේ රටේ ආර්ථිකය, අනාගතය විනාශ කරන්නයි. මේ රටට සංචාරකයෝ එනවාට ඔවුන් භයයි. සංචාරකයෝ ආවොත් මේ රටේ ආර්ථිකය හැදෙන බව ඔවුන් දන්නවා. සංචාරක ව්‍යාපාරයේ යෙදෙන මිලියන තුනක

පමණ ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයට අද රට පත්වෙලා තිබෙනවා. ආයෝජකයෝ ඇවිල්ලා මේ රට ගොඩ ගත්තොත් දේශපාලන න්‍යාය පත්‍රවලට වැඩ කරන අයගේ අරමුණු ඉටු වන්නේ නැහැ. ඡන්දයෙන් බලයට එන්න බැරි සමහර දේශපාලන පක්ෂ නායකයෝ දන්නවා ඔවුන්ට බලයට එන්න පුළුවන්කම තිබෙන්නේ අරගළයෙන් විතරයි කියලා. ඒ නිසා ඒ අය මේකට නායකත්වය දෙනවා. පවතින පාලන ක්‍රමය වෙනස් කර, රටේ පාලනය භාර ගන්න අරගළ කරන මේ පිරිසේ හැසිරීම දෙස බලාගෙන ඉන්න විදේශීය ආයෝජකයෝ නම් තමන්ගේ ආයෝජනවලට සුදුසු රටක් විධියට මේ රට තෝරා ගන්නේ නැහැ.

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, අරගළයට ගහපු නිසා විදේශිකයෝ එන්නේ නැහැ කියලා. මම එතුමන්ලාට එක කාරණයක් මතක් කරන්න ඕනෑ. එදා සිද්ධියේදී පාර්ලිමේන්තුව ආක්‍රමණය කරන්න එනකොට පක්ෂ නායකයන්ගේ රැස්වීම පහළ මාලයේ පැවැත්වෙමින් තිබුණා. අරගළකරුවන් ඇතුළට එනවාය කිව්වාම පක්ෂ නායකයෝ ඒ රැස්වීම නවත්වා එළියට ගියා. එහෙම භයක් තිබුණා. ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ජනාධිපති මන්දිරය, අරලියගහ මන්දිරය වටලා ඒවායේ බලය තහවුරු කරගෙන, ඒ අය මෙතැනටත් ආවා මෙහි බලය තහවුරු කර ගන්න. එහෙම වුණා නම්, අද මේ රටේ වෙන්නේ මොකක්ද කියලා කල්පනා කර බලන්න. පක්ෂ නායකයෝ දිව්වා. එහෙම නම්, ඔබතුමන්ලා සහ අපිව රැක්කේ ත්‍රිවිධ හමුදාව සහ පොලිසියයි කියන කාරණය අමතක කරන්න එපා. මේ සභාවේ සිටින අපි හැමෝටම ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ආරක්ෂාව දීලායි තිබෙන්නේ.

සමහර පක්ෂ නියෝජනය කරන හිටපු හමුදාපතිවරු ආරක්ෂක අංශවල හැසිරීම විවේචනය කරනවා. ඒ අයගේ වැරදි හැසිරීමක් සිදු වුණා නම් විවේචනය කළාට කමක් නැහැ. අපි දැක්කා, මේ සිදුවීම්වලින් පස්සේ හමුදා නිලධාරින්ගේ, පොලිසියේ නිලධාරින්ගේ දරුවෝ ටියුෂන් පන්තිවලට එනවා නම්, ඒක නවත්වනවාය කියලා සමහර අය කියා තිබුණා. කඩවලින් බඩු ගන්න දෙන්න එපාය කියා තිබුණා. ඒවාට හොඳ සහ නරක ප්‍රතිචාර ලැබී තිබුණා අපි දැක්කා. සමහර අය කියා තිබුණා, එහෙම කළොත් අපේ පන්තිවලට ඒ ළමයින්ව නොමිලයේ ගන්නවා කියලා. සමහර වෙළෙඳසැල්වලින් කියා තිබුණා, එහෙම දෙයක් කළොත් අපි ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට ප්‍රමුඛතාව දෙනවා කියලා. සමහර අරගළකරුවෝ ප්‍රකාශ කර තිබුණා ප්‍රභාකරන් හොඳයි කියලා. "තමුසෙලාට වැඩිය ප්‍රභාකරන් හොඳයි" කිව්වා. මේ ගරු සභාවේ ඉන්නවා යුද්ධය කරපු හිටපු හමුදාපතිතුමා. මා දන්නේ නැහැ, එතුමා කොයි විධියට මේක භාර ගනීවිද කියලා. ඒ ගැන එතුමා කථා කරන්න ඕනෑ.

මේ හදිසි නීතිය ගෙනෙන්නේ මේ රටේ ආරක්ෂාව වෙනුවෙන්. එහෙම නැතිව අපේ පෞද්ගලික ආරක්ෂාව වෙනුවෙන් නොවෙයි. මේ නීති රීති ගෙන එන්නේ තිබෙන තත්ත්වයේ භයානකකම තේරුම් අරගෙනයි. ඒ නිසා තමයි හදිසි නීතිය ගෙනැල්ලා මේ තත්ත්වය පාලනය කරන්න කටයුතු කරන්න ඕනෑ. රටේ පොදු මහජනතාව මේ අරගළය එක්ක හදවතින් බද්ධ වෙලා සිටියා. ඒක අපි පිළිගන්නවා. මිනිසුන්ට තිබුණු ආර්ථික අර්බුදය එක්ක, මිනිසුන්ට තිබුණු අපහසුතා නිසා, ආර්ථික වශයෙන් තිබුණු ගැටලු නිසා මිනිස්සු මේ අරගළය එක්ක බද්ධ වුණා. හැබැයි, මේ රටේ ජනතාව මේ වාගේ අශීලාචාර හැසිරීමක් මේ අරගළකරුවන්ගෙන් බලාපොරොත්තු වුණේ නැහැ. ජනතාවට මුහුණ දීමට සිදු වූ නොයෙක් දුෂ්කරතා හේතුවෙන් ඔවුන් අරගළය සමඟ එකතු වුණත්, ජනතාවගේ කඳුළු මතින් නොයෙක් දේශපාලන සහ වෙනත් න්‍යාය පත්‍ර ක්‍රියාත්මක වන බව මේ වනකොට පොදු ජනතාව වටහාගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ බොහෝ දෙනා දැන් අරගළයෙන් ඈත් වෙලා තිබෙනවා.

අද අරගළයට ගියොත් එතැන ඉන්න කුඩුකාරයෝ ටික බලාගන්න පුළුවන්. අද ගෝල් ෆේස් එකට ගියොත් බලාගන්න පුළුවන්, කුඩුකාරයෝ ටික තමයි එතැන ඉන්නේ. මේ රටේ සාමකාමී අරගළ කරපු පිරිස් මේ රජයේ නව ජනාධිපතිතුමාට, නව අගමැතිතුමාට කටයුතු කරගෙන යන්න අවස්ථාව දීලා අද අරගළයෙන් අයින් වෙලා තිබෙනවා. අද ජනාධිපති මාධ්‍ය අංශයට සම්බන්ධ වෙලා ඉන්න ප්‍රධාන පුද්ගලයන් දෙදෙනාම පසුගිය කාලයේ අරගළයත් එක්ක සම්බන්ධ වෙච්ච අය. ඒ අයගේ මුහුණු පොතේ දමා තිබුණා, ඒ අයගේ අරගළය අවසන් කළා, මේ රට ගොඩගන්න ඒ අය එකතු වෙනවා කියලා. ඒ වෙනුවෙන් අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. එම නිසා වගකීම් විරහිත පුද්ගලයන් ඒ ප්‍රදේශවලින් වහාම ඉවත් කර, තවදුරටත් ඇති විය හැකි වගකීම් විරහිත, නීතිවිරෝධී හා විනාශකාරී ක්‍රියාකාරකම් මුළුමනින්ම පාලනය කළ යුතුයි කියන කාරණය මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා.

කවුරුත් මේ අරගළකරුවන්ට අකැමැතියි, භයයි. කවුරුවත් කියන්නේ නැහැ, මේක කරන්න ඕනෑ කියලා. විපක්ෂය බලන්නේ දේශපාලන බලය ගන්නයි. සමහර අය ඒ අරගළකරුවන්ට බණින්න භයයි, ඇවිල්ලා ගෙවල්වලට ගිනි තියයි කියලා. මම එකහෙළාම කියනවා, මේ තත්ත්වය පාලනය කළේ නැත්නම් ඔබතුමන්ලාටත්, අපටත් මේ රටේ ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙයි කියලා. ඒ නිසා, කෙසේ හෝ මේ තත්ත්වය පාලනය කළ යුතුයි කියන ස්ථාවරයේ මා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වශයෙන් මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි, ජනාධිපති ලේකම් කාර්යාලයට යාබදව "උද්ඝෝෂණ පැවැත්වීමේ ස්ථානය" ලෙස නම් කර ඇති භූමිය ඒ සඳහා කිසිදු ආකාරයකින් සුදුසු ස්ථානයක් නොවන බව. පසුගිය කාලය තුළ වූ සිදුවීම් මඟින් යළිත් එය තහවුරු වී තිබෙනවා. විෂයභාර ඇමතිවරයා ලෙස මගේ අවධානය මේ සඳහා යොමු වී ඇති බව මම මේ ගරු සභාවට දන්වන්න කැමැතියි. එබැවින් වහාම ක්‍රියාත්මක වන පරිදි එය එතැනින් ඉවත් කර, ඒ සඳහා වෙනත් සුදුසු, විකල්ප ස්ථානයක් ලබා දිය යුතුයි කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විහාරමහා දේවි උද්‍යානය තිබෙන තැන ඒ සඳහා හොඳ ඉඩක් තිබෙනවා. එතැන විපක්ෂ නායකතුමාගේ කාර්යාලයටත් ළඟයි. එතුමාට නිතර සම්බන්ධකම් තබාගෙන කටයුතු කරගෙන යන්නත් පුළුවන්. ජනාධිපති ලේකම් කාර්යාලයට යාබදව තිබෙන, අරගළකරුවන් සිටින මෙම ස්ථානය ආර්ථික මර්මස්ථානයක්; මේ රටේ සංචාරක ක්ෂේත්‍රයට බලපාන තැනක්; පොදු ජනතාවට තිබෙන ස්ථානයක්. ඒ නිසා, එතැනින් එය ඉවත් කර මේ කියන ස්ථානයට අරගෙන එන්න ඕනෑය කියා මම මේ වෙලාවේ යෝජනා කරනවා.

අරගළකරුවන්ට තම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15වන ව්‍යවස්ථාවේ සීමාවන්ට යටත්ව, එනම් අනෙකුත් පොදු මහජනතාවට නිදහසේ ජීවත් වීමට ඇති අයිතියට බාධා නොවන පරිදි භුක්ති විඳිය හැකියි. අරගළකරුවන්ගේ සැබෑ අරමුණ රටට යහපත් අනාගතයක් උදා කරදීම නම්, රටේ සාමාන්‍ය ජන ජීවිතයට හා ආර්ථිකයට හානිදායක වන ක්‍රියාකාරකම්වලින් අත්මිදීම ඔවුන්ගේ වගකීමක් වන බව අවධාරණය කරනවා.

ඒ වාගේම මෙම ගරු සභාව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලින් මා ඉල්ලා සිටිනවා, තම තමන්ගේ පටු දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කර ගැනීම සඳහා අරගළය සහ අරගළකරුවන් බළල් අතක් ලෙස පාවිච්චි නොකරන ලෙස. අරගළය හිහන්නාගේ තුවාලය ලෙස භාවිත නොකොට එහි සැබෑ

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

යහපත් අරමුණු රටේ යහපත සඳහා යොදා ගැනීමට අප සමඟ අත්වැල් බැඳ ගන්නා ලෙස පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවලින් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කිරීමට පෙර ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට විශේෂ ස්තුති කිරීමක් කරන්න ඕනෑ. ඒ අය මාස හතරක් ඉවසාගෙන හිටියා. අරගළකරුවන් පොලීසිවලට ගිහිල්ලා ඒ අයට බැන්නේ ඉතාම නරක විධියටයි. ඒ අයව නිවටයෝ වාගේ සැලකුවා. හමුදා නිලධාරින්ට කථා කළ හැටි අපි දැක්කා නේ. ඔවුනුත් නිවටයෝ වාගේ හිටියා. හැබැයි, ඒක නිවටකමක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය ලෝකයේ තිබුණු ප්‍රධානම යුද්ධයකට මුහුණ දුන්නා. කොටි සමඟ සටන් කළා; කොටි පරාජයට පත් කළා. එහෙම අයට මේ අරගළය පරාජය කරන එකත් මහ දෙයක් නොවෙයි.  නමුත්, ඒ අය අරගළකරුවන්ට ඉඩ දුන්නා. හැබැයි, අවසානයේදී අරගළකරුවෝ හමුදා නිලධාරින්ට සක්කිලි විධියට බැන්නා.

මම මේ වෙලාවේ හමුදා නිලධාරින්ටත්, පොලිස් නිලධාරින්ටත් ඒ අය කළ සේවය වෙනුවෙන් අපේ ගෞරවය පුද කරනවා. ඒ අය වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව තුළින් ලබා දිය යුතු ඉහළම ගෞරවය අපි ලබා දෙන්න ඕනෑය කියන කාරණාවත් මතක් කරමින්,  හදිසි නීතිය සම්මත කිරීම සඳහා ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුදෙනාගේ සහයෝගය දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. එහෙම සහයෝගය නොදෙන කෙනෙකු ඉන්නවා නම්, ඒ සියලුදෙනාම ත්‍රස්තවාදීන්ට සහයෝගය දෙන අය හැටියට සලකන්න වෙනවාය කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා.  බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට,  ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 11.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
අද දවසේ මේ මොහොතේ අපි හදිසිය ගැන කථා කරනවා. හදිසිය ගැන කථා කරන කොට, හදිසිය දෙයාකාරයකින් අපට පෙනෙනවා. අද රටේ පොදු ජනතාවට තිබෙනවා, ලොකු හදිසියක්. රටේ ජනතාවට තිබෙනවා පෙට්‍රල් නැති නිසා හදිසියක්; ඩීසල් නැති නිසා හදිසියක්; භූමිතෙල් නැති නිසා හදිසියක්; ගෑස් නැති නිසා හදිසියක්. දූ දරුවන්ට කිරි පිටි නැති නිසා අම්මලාට තිබෙනවා හදිසියක්. රටේ ජනතාවට තිබෙනවා, සිමෙන්ති කොට්ටයක් ගන්න බැරි නිසා හදිසියක්. ජනතාවට තමන් පෝලිම්වල ක්ලාන්තය දමලා වැටෙනකොට රෝහලකට ගෙන යන්න බැරි නිසා හදිසියක් තිබෙනවා; පෝලිම්වල මිනිසුන් මැරී වැටෙන නිසා හදිසියක් තිබෙනවා; ඉඩමක් ගන්න බැරි නිසා හදිසියක් තිබෙනවා; කොටින්ම කිව්වොත්, නිවාස ණයක්වත් ලබා ගන්න බැරි නිසා ජනතාවට අද හදිසියක් තිබෙනවා. මේක බංකොලොත් රටක්, බංකොලොත් රාජ්‍යයක්. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා අද මේ ගරු සභාව ආමන්ත්‍රණය කරනවා අපි දැක්කා. එතුමන්ලා කොච්චර ආමන්ත්‍රණය කළත් අද දවසේ, මේ මොහොතේ දරුවන්ට පාසල්වලට යන්න බැහැ; ප්‍රවාහන පහසුකම් නැහැ. දරුවන්ට අධ්‍යාපනය ලැබීමට ලොකු හදිසියක් තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ලොකු හදිසියක් තිබෙනවා. ඖෂධ නැති නිසා හදිසියක් තිබෙනවා. ශල්‍යකර්ම කල් දැමීම නිසා හදිසියක් තිබෙනවා. ඒ වාගේම,  ගිලන් වෙච්ච ලෙඩුන්ට බෙහෙත් ලබා දීම ප්‍රමාද වීම නිසා හදිසියක් තිබෙනවා. ගොවියාට පොහොර නැති නිසා හදිසියක් තිබෙනවා. ගොවියාට වන්දි නොලැබීම නිසා හදිසියක් තිබෙනවා. ගෑස් සිලින්ඩර පුපුරපු නිවෙස්වල අයට වන්දි නොලැබීම නිසා හදිසියක් තිබෙනවා. ධීවර ජනතාවට තෙල් ටික නැතිව රස්සාව කර ගන්න බැරි නිසා හදිසියක් තිබෙනවා. දිනපතා පුංචි ආදායමක් ලබන මනුස්සයාට ආදායම් අහිමි වීම නිසා හදිස්සියක් තිබෙනවා. ස්වයං රැකියා කරන මේ රටේ අසරණ පරපුරට හදිසියක් තිබෙනවා. ඊළඟට, කාන්තා මූලික පවුල්වලට හදිසියක් තිබෙනවා. ආබාධිත ජන ප්‍රජාවට හදිසියක් තිබෙනවා. කුලියට වැඩ කරන මනුස්සයාට හදිසියක් තිබෙනවා. රාජ්‍ය සේවකයා ලබාගත් loan එකට මුළු වැටුපම කැපෙන කොට, එතැන හදිසියක් තිබෙනවා. අම්මලාගේ, දරුවන්ගේ මන්ද පෝෂණය ඇස් ඉදිරිපිට එන්න එන්නම වැඩි වනකොට, හදිසියක් තිබෙනවා. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කඩා වැටෙන කොට, බිඳ වැටෙන කොට, විනාශ වනකොට හතළිස් පන්ලක්ෂයකට ජීවනෝපාය අහිමි වනකොට, ලොකු හදිසියක් තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය එන්න එන්නම ක්ෂය වනකොට, එතැන හදිසියක් තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් විනාශ මුඛය කරා යන කොට, එතැන හදිසියක් තිබෙනවා. රැකියා අහිමි වනකොට, ලොකු හදිසියක් තිබෙනවා. මේ රටේ ශක්තිසම්පන්න බුද්ධිමතුන් රට අත් හැරලා පිට රටවලට යනකොට -බුද්ධි ගලනය සිදු වනකොට-, එතැන හදිසියක් තිබෙනවා. වේල් තුන පිරිමහ ගන්නට බැරිව ජනතාව හූල්ලමින් ඉන්න කොට, එතැන හදිසියක් තිබෙනවා. ගමේ අහිංසක පවුල්වල ඉන්න දූවා දූරුවන් ගමේ තිබෙන වැවට බැහැලා, වැවේ තිබෙන අල ටිකක් හාරාගෙන කන්න හදන කොට, එතැන ඒ පුංචි මනුස්සයාගේ අඳෝනාව, හදිසිය තිබෙනවා. හිඟමනේ ගිහිල්ලා මුදල් ටිකක් සොයාගන්න මනුස්සයාට හිඟමනවත් ලබා ගන්න බැරිව ඉන්නකොට, ලොකු හදිසියක් තිබෙනවා.

ත්‍රිරෝද රථ රියැදුරාට තමන්ගේ ජීවනෝපාය කරගෙන යන්න බැරි වන කොට, එතැන හදිසියක් තිබෙනවා. ලීසිං වාරිකය ගෙවාගන්න බැරි වන කොට ඒ මනුෂ්‍යයන්ට -ඒ පොදු ජනතාවට- ලොකු හදිසියක් තිබෙනවා. අලුතින් කොවිඩ් හිස ඔසවනවා කියලා ආරංචි වෙනවා. ඒ නිසාත් හදිසියක් තිබෙනවා. WHO එක අවදානමක් ලෙස ප්‍රකාශයට පත් කරපු monkeypox කියලා වයිරසයක් තිබෙනවා. ඒ නිසාත් හදිසියක් තිබෙනවා. මෙන්න මිත්‍රවරුනි, මිනිසුන් ජීවත් කරවන හදිසිය! මේක තමයි මහ පොළොවේ හදිසිය; මේක තමයි සත්‍යවාදී හදිසිය; මේක තමයි යථාර්ථවාදී හදිසිය. නමුත් අද මොකක්ද මේ විවාද කරන හදිසිය? මේ විවාද කරන හදිසිය තමයි තර්ජනය, ගර්ජනය, ම්ලේච්ඡත්වය, රාජ්‍ය ත්‍රස්තවාදය ව්‍යාප්ත කරන හදිසිය. ඒකයි මේ හදිසිය.

මේ සභාව ආමන්ත්‍රණය කරපු ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමාට සුබ පතන්න මට බැරි වුණා. මම ඔබතුමාට සුබ පතනවා. ඔබතුමාගේ දිවුරුම් දීමට පැමිණෙන්නට මම සැලසුම් කරලා සිටියේ. නමුත් ඔබතුමාගේම ආණ්ඩුවේ ම්ලේච්ඡ ක්‍රියාව තුළ මට එන්නට බැරි වුණා. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. මම ඔබතුමාට සුබ පතනවා. ඒ වාගේම ගරු සභානායකතුමාටත් අවංකවම සුබ පතනවා. මා හිතන්නේ, ජනාධිපතිතුමාගේත් සිහිනය සැබෑ වුණා කියලායි. ඒ වාගේම මා හිතනවා, පළපුරුදු නායකයන් හැටියට ඔබතුමන්ලා දෙපළගේත් සිහිනය සැබෑ වුණා කියලා. ඒක ගැන අපි සතුටු වෙනවා. නමුත් අමතක කරන්න එපා, ලක්ෂ 220කගේ සිහින කුඩුපට්ටම් වෙලා තිබෙන බව. ඔබතුමන්ලාගේ සිහින සැබෑ වුණා. නමුත්, තමුන්නාන්සේලා ඇතුළු අප සියලුදෙනා නියෝජනය කරන ලක්ෂ 220 අනාථ වෙලා තිබෙනවා. ඒක අමතක කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මහ පොළොවේ සත්‍යය? ගරු අගමැතිතුමනි, ගරු සභානායකතුමනි, මාස ගණනාවක් ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට සාමකාමීව උද්ඝෝෂණ සිදු වුණාද, නැද්ද? මොකක්ද ඇත්ත? මොකක්ද බොරුව? එතැන ත්‍රස්තවාදයක් සිදු වුණේ නැහැ. බොහොම සාමකාමීව තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ඒ ජනතාව ක්‍රියාත්මක කළා. මොනම අවස්ථාවකවත් ප්‍රචණ්ඩත්වයක් ක්‍රියාත්මක කළේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමනි, කොතැනද මේ ප්‍රචණ්ඩත්වයේ මුල? කවුද ප්‍රචණ්ඩත්වයේ පිතෘවරයා? හිටපු අගමැතිතුමා. මුල, අරලියගහ මන්දිරය -Temple Trees. කරුණාකර මේ සභාව නොමඟ යවන්න එපා, ත්‍රස්තවාදයක් ගැන කථා කරලා. ප්‍රචණ්ඩත්වයේ අලුගෝසු දේශපාලනයේ කණ්ඩායම් දැන් තමන්ට රිසි සේ සමාජයට ඇවිල්ලා අමුතුම කථා කියනවා. නමුත් ප්‍රචණ්ඩත්වය ආරම්භ වුණේ අරලියගහ මන්දිරයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමුගැනීමත් සමඟ බව කරුණාකර අමතක කරන්න එපා. කරුණාකර කවුරුවත් මේ සභාව නොමඟ යවන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප කිසිම දවසක නොසිතූ විරූ ආකාරයේ මහා දැවැන්ත ජන බලවේගයක් නිර්මාණය වුණා. මම සත්‍යය කියන්නට ඕනෑ. මමවත් හිතුවේ නැහැ, මේ වාගේ මහා ජන බලවේගයක් නිර්මාණය වෙයි කියලා. අගමැතිවරයාට ගෙදර යන්න සිද්ධ වුණා. ජනාධිපතිවරයාට ගෙදර යන්න සිද්ධ වුණා. හැබැයි, මම බොහොම පැහැදිලිව එක දෙයක් කියන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වසර ගණනක් විවිධ තල නියෝජනය කරපු පුද්ගලයෙකු හැටියට ඔබතුමා හොඳින් දන්නවා, අපි ප්‍රචණ්ඩත්වයට පක්ෂ ද, විපක්ෂ ද කියලා. මොනම හේතුවකටවත් කිසිම දවසක අපේ දේශපාලන ගමන් මගේදී අපි දේශපාලන ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කරලා නැහැ, එහෙම කරන්න යන්නෙත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා Temple Treesවලින් පටන් ගත්ත විවිධ තලවල ත්‍රස්තවාදය දවස පුරාම ක්‍රියාත්මක වුණා. මම ඒකට කියන්නේ ත්‍රස්තවාදය කියලා. මම එදාත් කිව්වා ත්‍රස්තවාදයේ ම්ලේච්ඡත්වය, කුරිරු ක්‍රියා ගැන. කිසිම කෙනෙකුට අයිතියක් නැහැ, තවත් කෙනෙකුගේ ව්‍යාපාරික ස්ථානයක් ගිනිබත් කරන්න, නිවසක් ගිනිබත් කරන්න, මන්ත්‍රීවරුන් හෝ සිවිල් පුරවැසියන් මරා දමන්න, ශාරීරික හානි කරන්න. ඒක මනුෂ්‍යත්වය නොවෙයි. මිනිස්සු එහෙම හැසිරෙන්නේ නැහැ. සිවිල් සමාජයක, මැදි ආදායම් ලබන රටක වඩා ප්‍රශස්තව, යුක්තිසහගතව, ගුණගරුකව මනුෂ්‍ය සංහතිය හැසිරෙන්නට ඕනෑ. ඒක තමයි අපි පිළිගන්නා ප්‍රතිපත්තිය.

අපි හොඳින් දන්නවා, එදා බුද්ධි අංශ ඇතුළු අනිකුත් සියලු අංශ විසින් ඇස්තමේන්තු කළේ 5,000ක්, 10,000ක පිරිසක් එයි කියලා. නමුත්, ඒ ආපු ගණන අපි හැමෝම දන්නවා. හැබැයි අපි කවදාවත් හිතුවේ නැහැ, හැටනව ලක්ෂයක් ඡන්ද ගත්ත ජනාධිපතිවරයාට රටින් පිට වෙන්න සිදු වෙයි කියලා. අපි හිතුවා, ජන බලවේගයට සවන් දීලා එතුමා ඉල්ලා අස්වෙයි කියලා. අපි හීනෙකින්වත් හිතුවේ නැහැ, මෙහෙම දෙයක් වෙයි කියලා. මෙන්න මේ කාරණාව මන්ත්‍රීවරු 225දෙනාම හිතේ තබා ගත්තොත් හොඳයි. තමන්ගේ satisfaction එකට, ස්වකීය පෝෂණයට, තමන්ගේ උද්දාමයට, තමන්ගේ ego එක satisfy කර ගන්න, දේශපාලන ගෙම්බෝ වාගේ එහාට මෙහාට පනින්න කවුරු හරි හිතනවා නම්, අවසානයේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ ජනතා අධිකරණයට මුහුණ දෙන්න ඒ අයට සිද්ධ වෙනවා. ඒ බව මේ 225දෙනාම දැනගත්තොත් හොඳයි කියලා මම නැවතත් කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අලුත් ජනාධිපතිවරයෙක් පත් වුණා. එතුමා පත් වුණු ක්‍රමවේදය ගැන, ආපු ආකාරය ගැන ප්‍රශ්න තිබෙනවා; ගැටලු තිබෙනවා. තමන්ට ලැබුණු මනාපවත් ගණන් නොකර පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඊට පස්සේ අගමැතිකමට පත්වෙලා, ජනාධිපතිකම දක්වා ගියා. ඒ ගැන තර්ක විතර්ක ගණනාවක් තිබෙනවා. මම මේ වෙලාවේ ඒවා විග්‍රහ කරන්න යන්නේ නැහැ. මොකද, ව්‍යවස්ථානුකූලව එතුමා ජනාධිපතිවරයා. ඒ ජනාධිපතිවරයාට ලබා දිය යුතු ගරුත්වය අපි ලබා දෙනවා. එතුමා ආපු ආකාරය ගැන විවේචන තිබෙනවා. ඇත්ත වශයෙන්ම මමත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, ජනාධිපතිවරයා ඉල්ලා අස්වීම තුළින් පුරප්පාඩු වුණු තනතුරට - ජනාධිපතිවරණය කියලා මම කියන්නේ නැහැ.- ඉදිරිපත් වූ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් එක්ක ජනාධිපතිවරයා දිවුරුම් දීමේ අවස්ථාවට සහභාගි වුණා. මේ වෙලාවේ ඔබතුමා වෙනුවට ගරු කථානායකතුමා මූලාසනයේ සිටියා නම් වටිනවා. වර්තමාන අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඒ වෙලාවේ හිටියා. අපි එදා පක්ෂ නායක සාකච්ඡාවක් කළා. ඒ සිදු වුණු කථාබහ ඔබතුමාට මතක ඇති, ගරු අගමැතිතුමනි. එක අතකින් කථානායකතුමා මූලාසනයේ නැති එකත් හොඳයි. මොකද, ඔබතුමා සත්‍යය තහවුරු කරයි කියලා මම හිතනවා. ගරු කථානායකතුමා, එක වාරයක් කළා කියපු දේ නැහැයි කියපු කෙනෙක්. ඒ නිසා මම කැමැතියි ඔබතුමාට එය තහවුරු කිරීමේ අවස්ථාව ලබා දෙන්න. දිවුරුම් දුන් ජනාධිපතිවරයාත් එක්ක අපි කථා කළා. එතුමාත් කථා කළා. එතුමා කියපු කාරණා මොනවාද? පාර්ලිමේන්තුවේ දී දිවුරුම් දීම ගැන එතුමා සතුටු වෙනවා කිව්වා. එහෙම නේද, ගරු අගමැතිතුමනි? ඒකෙන් එතුමා අදහස් කළේ, පාර්ලිමේන්තුවට බලය ලබා දීලා, පාර්ලිමේන්තු ක්‍රමවේදය තුළ අපි එකට එකතු වෙලා වැඩ කටයුතු කරමු කියන එක.

ඔබතුමාත් දැන් මාව ආමන්ත්‍රණය කළා. මම විශ්වාස කරනවා, ඔබතුමා එසේ ආමන්ත්‍රණය කළේ රට වැටී තිබෙන මේ ප්‍රපාතයෙන් ගොඩගැනීම සඳහා එකට එකතු වෙලා කටයුතු කරන්න එන්න කියලා අපට ආරාධනා කිරීම සඳහා කියලා.

ගරු අගමැතිතුමනි, ඔබතුමාටත් මතක ඇති, "හුස්ම" වැඩසටහන තුළින් තවදුරටත් උදව් කරන්න කියලා ජනාධිපතිතුමා අපට කිව්වා. මම මේ සභාවේදී කියනවා, ඔව්, තවදුරටත් අපි අපේ රටේ ජනතාවට, - අපේ රටේ සිටින ලක්ෂ 220ට- අපේ මාතෘ භූමියට ඒ ආධාර උපකාර ටික, ඒ ශක්තිය ලබා දෙන බව. එතුමා කිව්වා, අපි එකට එකතු වෙලා වැඩ කරමු කියලා. මම ඇත්තම කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපිට ලොකු හැඟීමක් ආවා; "වුණු දේවල් ඔක්කෝම සිද්ධ වුණා. ජනාධිපතිවරයෙකුත් පත් වුණා. අපි කොහොම හරි එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ" කියන ඒ අදහස අවංකවම අපිට ආවා. මම දැන් එන ගමන් අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් ඒ ගැන කිව්වා. ගරු අගමැතිතුමනි, නමුත් එදා රාත්‍රියේ සිද්ධ වුණේ මොකක්ද ? මම දන්නේ නැහැ, මොන ඔළ මොට්ටළයා ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායමට මේ උපදෙස දුන්නාද කියලා. ඒක මහ ගොන් තීන්දුවක්. වෙන වචන නැහැ, මට කියන්න. ඒක මහ ඔළ මොට්ටළ, තකතීරු තීන්දුවක්. වෙන වචන නැහැ, මට කියන්න. එදා රාත්‍රියේම හිංසනය, ම්ලේච්ඡත්වය, රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාත්මක කළා. එහෙව් දේවල් සිදු වුණාට පසුව අපි ආණ්ඩු කරන්න එයි කියලා ඔබතුමන්ලා හිතනවාද? මම පැහැදිලිව එක දෙයක් කියන්නම්. ඒ වාගේ, ජන මතයට විරුද්ධව පාවා දෙන තීන්දු ගන්න සමගි ජන බලවේගයේ, සමගි ජන සන්ධානයේ අපි සූදානම් නැහැ. මම පැහැදිලිව ඒක කියනවා. එහෙම යහපත් ක්‍රමවේදයකට අපට යන්න බැරි නම්, මට තිබෙන්නේ පෞද්ගලිකව දේශපාලනික වශයෙන් විශ්‍රාම යන්නයි. මම ඒක පැහැදිලිව කියනවා. අපි ප්‍රතිපත්තිගරුකව එක මතයක ඉන්නවා. අපි ඒ පැත්තට, මේ පැත්තට මුක්කු ගහන්න යන්නේ නැහැ. 24 පැයේම, 365 දවසේම තමන්ගේ මතිමතාන්තර වෙනස් කරගන්නා ක්‍රමවේදයකට අපි යන්නේ නැහැ. ඒවා කරනවා නම් කරන්නේ කවුරු උදෙසාද? රට වෙනුවෙන් නොවෙයි, තමන්ගේ පෞද්ගලික වරදාන, වරප්‍රසාද, ප්‍රතිලාභ උදෙසායි ඒවා කරන්නේ. ඒ මජර දේශපාලන සංස්කෘතියට අත් ඔසවන්න අපි සූදානම් නැහැ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා දිවුරුම් දෙන අවස්ථාවේ අපි දුටු රිදී රේඛාව අද අන්ධකාරය බවට පත් වෙලා තිබෙනවා. ඒ, "ගෝඨා ගෝ ගම" ස්ථානයේ හිටියේ කවුද? අම්මලා හිටියා; කුඩා දරුවෝ හිටියා; ආබාධිත රණ විරුවන් හිටියා; ආබාධිත ප්‍රජාව හිටියා; සිවිල් පුරවැසියන් හිටියා; මාධ්‍යවේදීන් හිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු දෙනාම ඊළඟ දවසේ සවස 2.00 වෙනකොට ඉවත් වෙන බව කියා තිබුණා. ඒක ආරක්ෂක අංශවලටත් දැනුම් දීලා තිබුණා. එසේ තිබියදී මේ ම්ලේච්ඡත්වය, මේ රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාත්මක කළේ ඇයි කියන එක මට නම් හිතා ගන්න බැහැ. ඒකයි මට හිතාගන්න බැරි, මේ මොන ඔළ මොට්ටළ උපදේශකවරුද කියලා. ඊළඟ දවසේ සවස 2.00ට යනවා කියා නිවේදනය කර තිබියදීත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා වාගේ අත්දැකීම් තිබෙන පුද්ගලයෙක් ඒ වාගේ උපදෙසක් තුළ එවැනි ඔළ මොට්ටළ, තකතීරු ක්‍රියාවක් කරයි කියලා මට නම් හිතන්න බැහැ.

එක දෙයක් මතක තබා ගන්න. ප්‍රචණ්ඩත්වය රජය කළත්, සිවිල් පුරවැසියන් කළත් ඒ ප්‍රචණ්ඩත්වයට අපි විරුද්ධයි. මේවා වැරදි විධියට අර්ථ කථනය කරන්න එන්න එපා. මම දන්නවා, මේවාට එක එක කථා ගොතන්න පුළුවන් බව. බොහොම පැහැදිලිව අපි ඒක ප්‍රකාශ කරනවා. නමුත් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, ඒ සිද්ධ වුණු ම්ලේච්ඡ ක්‍රියාව අප කිසිසේත්ම අනුමත කරන්නේ නැති බව.

එවැනි ම්ලේච්ඡ ක්‍රියාවක් ක්‍රියාත්මක කළ, රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාත්මක කළ එවන් රජයක් එක්ක එකට වාඩි වෙන එක තරම් රාජ්‍යද්‍රෝහී, දේශද්‍රෝහී ක්‍රියාවක් තවත් නැහැ කියා මම හිතනවා. ශිෂ්ට සම්පන්න සමාජයක, ශිෂ්ට සම්පන්න ආකාරයට අපි ප්‍රශස්තව හැසිරෙන්න ඕනෑ. හැබැයි, අපි අපේ යුතුකම් ඉෂ්ට කරනවා. රට වෙනුවෙන් යුතුකම ඉෂ්ට කරනවා. රට වෙනුවෙන් උදව් කරනවා. ජනාධිපතිවරයා අපෙන් ඉල්ලීම් කරලා තිබෙනවා, ඖෂධ සම්බන්ධයෙන්, ඒ උපකරණ සම්බන්ධයෙන් "හුස්ම" වැඩසටහනෙන් උදව් අවශ්‍යයි කියලා. සෞඛ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ඒ පැත්තෙන් අපි උපරිමයෙන් උදව් කරනවා; සීමා මායිම් රහිතව උදව් කරනවා. හැබැයි, එකට වාඩි වෙන්න කියලා නම් කියන්න එපා. අපි එකට වාඩි වෙන්නේ නැහැ. එකට වාඩි වෙලා අපි අපේ දේශපාලන චරිතය නිරුවත් කර ගන්න සූදානම් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ මර්දනකාරී කෲරත්වය, මේ මෘග ක්‍රියාදාමය දියත් කළ රජයත් එක්ක අපට ගනුදෙනු නැහැ කියලා. හැබැයි අපි විපක්ෂයේ ඉඳගෙන, ජනතාව ජීවත් කරවන ගනුදෙනු සම්බන්ධයෙන්, වර්තමාන ජනාධිපතිවරයා හැම දාම අගය කරලා කථා කරන පාර්ලිමේන්තු කමිටු ක්‍රමවේදය හරහා අපට දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබා දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව ටික වෙලාවක් ලබා දෙන්න, මෙතුමන්ලා ඉදිරිපත් කළ කාරණාවලට උත්තර ටිකක් දෙන්න.

අපේ සභානායකතුමා ඩේවිඩ් ග්ලැඩ්ස්ටන් ගැන කථා කළා. ගරු සභානායකතුමනි, ඩේවිඩ් ග්ලැඩ්ස්ටන් යැව්වේ, ඔහු අපේ polling booth එකක් අස්සට ගිය නිසායි. වර්තමාන තත්ත්වය තුළ අපේ තානාපතිවරු ගියාද, ඔය අරගළ භූමියට? තානාපතිවරු ගියේ නැහැ, අරගළ භූමියට. ඒ ගොල්ලන්ගේ අදහස් tweets හරහා ඉදිරිපත් කළා. හැබැයි, එක දෙයක් මතක තබා ගන්න. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් ඩේවිඩ් ග්ලැඩ්ස්ටන් ගෙදර යැව්වාය කියලා ලෝක බැංකුවෙන් ජනසවියට සල්ලි දෙන එක නතර වුණේ නැහැ. අද දවසේ මේ රජය ජාත්‍යන්තර ප්‍රජාව නියෝජනය කරන තානාපතිවරු කේන්ද්‍ර කරගෙන එක එක websites හරහා පහර පිට පහර දෙනකොට මොකක්ද වෙන්නේ? අද වාගේ දවසක අපේ රට ගොඩ ගන්න ජාත්‍යන්තරයේ තිබෙන වැදගත්කම කොපමණද කියලා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා දන්නවා. ඒක මම අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මම කියනවා, මේ අවස්ථාවේදී මෝඩ, තකතීරු ක්‍රියා කරන්න එපා කියලා. රාජ්‍ය තන්ත්‍රිකභාවය ගැන පාඩමක් ඕනෑ නම් අපි ටියුෂන් දෙන්නම්, ඉගෙන ගන්න. ඒ දේ කරන්න එපා. බොරුවට ඉල්ලාගෙන කන්න එපා. ඇත්තටම තමුන්නාන්සේලා ඉල්ලාගෙන කන්නේ නැහැ. එකසිය තිස්හතරදෙනාම හොඳට කාවි. මම කථා කරන්නේ අපේ රටේ සිටින ලක්ෂ දෙසියවිස්ස ගැන. කන්න වෙන්නේ, විඳින්න වෙන්නේ, පීඩනයට, අසහනයට ලක් වෙන්නේ ඒ ලක්ෂ දෙසියවිස්ස, එකසිය තිස්හතරදෙනා නොවෙයි.

මම තවත් කාරණයක් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙගෙන එන නිසා කථාව කෙටි කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මට තව වෙලාව තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, අද දින පළ වූ "ද අයිලන්ඩ්" පුවත් පතේ සඳහන් වී තිබෙනවා, "Group of senior docs calls for maximum restraint....." කියලා. එකසිය අටදෙනෙකුගෙන් යුතු අපේ ජ්‍යෙෂ්ඨ විශේෂඥ වෛද්‍යවරු කණ්ඩායමක් අර ම්ලේච්ඡ ප්‍රහාරය ගැන මොනවාද කියා තිබෙන්නේ? Their statement goes on to state, "Unexpected brutal attacks... " - බලාපොරොත්තු නොවුණු මහා ම්ලේච්ඡ ප්‍රහාර. "Perhaps for the first time...."

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல
(The Hon. Keheliya Rambukwella
How many doctors?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
There are 108.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
We have 35,000 doctors.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
That is right. So?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
But, these are specialists.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

I was not debating about the proportionality of the doctors who presented their view; මම තර්කයක් ඉදිරිපත් කළේ නැහැ, මෙච්චර ප්‍රතිශතයක් මෙහෙම කිව්වාය කියලා. මම කිව්වේ, එකසිය අටදෙනෙකු කිව්වාය කියලා. ප්‍රතිශතය ගැන ප්‍රශ්නයක් නැහැ. මෙන්න මේක හොඳට අහගන්න, සෞඛ්‍ය ඇමතිතුමනි. It further states, "Perhaps for the first time in the history, ambulances had been prevented from reaching the site,...."

මම හිතන්නේ ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි, ගිලන් රථවලට ප්‍රවේශ වන්නට ඉඩ ලබා නොදුන්නා කියන කාරණාව කියන්නේ. ඒක මම නොවෙයි, doctorsලා කියන්නේ. *[බාධා කිරීමක්]* No. let me finish, please. එහෙම කියන්නේ ප්‍රවීණ දොස්තරලා. ඒ අය භය නැහැ. ඔවුන්ගේ නම් ලැයිස්තුවත් ආලා තිබෙනවා. දැන් ඒ දොස්තරලා මාරු කරන්න යන්න එපා, ඔවුන්ගෙන් පළි ගන්න එපා. *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ, මෙතුමන්ලාට ඕනෑම දෙයක් කරන්න පුළුවන්නේ. මෙතුමන්ලා එක එක දේවල් හදලා ඒක කරයි. අනෙක් බරපතළ කාරණයත් හොඳින් අහගන්න. එහි තවදුරටත් සඳහන් වෙනවා, "The Red Cross too had surprisingly withdrawn by then." කියලා. බොහොම පුදුමයට කාරණාව තමයි, ඒ වෙනකොට රතු කුරුස සංවිධානයත් withdraw වෙලා, එහෙම නැත්නම් අයින් වෙලා තිබීම. ඒ වාගේම ඒ ගොල්ලෝ කියනවා, "The emergency laws in force at present leave a strong sense of insecurity and suspicion...." ඒ වෛද්‍යවරු කියනවා, වර්තමාන හදිසි තත්ත්වය - Emergency එක - අනාරක්ෂිතභාව ගැනත්, ඒ වාගේම සැකයට තුඩු දෙන කාරණා ගැනත් ලොකු හැඟීමක් - a sense of suspicion - ඇති කරනවා කියලා.

ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමනි, ඔබතුමා තවමත් අධ්‍යාපන ඇමතිතුමා නේද? ළමයින්ට අද ඉස්කෝලෙට යන්න ප්‍රවාහන පහසුකම් නැහැ. නමුත්, ඉස්කෝල ටික විවෘත කරලා තිබෙනවා. ගුරුවරුන්ටත් ප්‍රවාහන පහසුකම් නැහැ. ඉස්කෝල විවෘත කළා වාගේම කරුණාකර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයන්න. ඔබතුමන්ලාත් එක්ක එකතු වෙලා, "සක්වල" වැඩසටහන තුළින් පාසල්වල තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ප්‍රවර්ධනය කරන්න අපි අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. එම නිසා මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, අපි සියලුදෙනාටම අවශ්‍ය වන්නේ ජනතා ගෞරවය, ජනතා පිළිගැනීම, ජනතා විශ්වාසය බව. අපි මේවා පලුදු කර ගන්නට කිසිසේත්ම සූදානම් නැහැ.

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට මම මේ සමච්චල් කරනවා නොවෙයි. අද ඔබතුමාගේ කටින් කියැවුණා, "ඇතුලත්මුදලි" කියන නම. එහෙම කියලා ඔබතුමා කිව්වා, ඇතුලත්මුදලිව මැරුවේ ත්‍රස්තවාදීන් කියලා. *[බාධා කිරීමක්]* ඔව්, ඔව්, කිව්වා. හැබැයි, එදා මොකක්ද කිව්වේ? ඩෙන්සිල් කොබ්බෑකඩුව මැරුවේත් ප්‍රේමදාස, විජය විමලරත්න මැරුවේත් ප්‍රේමදාස, ලලිත් ඇතුලත්මුදලි මැරුවේත් ප්‍රේමදාස කියලා. *[බාධා කිරීමක්]* නැහැ, කිව්ව කට්ටිය ඔතැන ඉන්නවා නේ. ඔබතුමා දන්නේ නැත්නම් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් අහන්නකෝ. එම නිසා මම එකක් කියන්නම්. මිනිස්සු එක්ක සංවාදයේ නියැළෙනකොට ටොන් පව ගහන්න එපා. අසත්‍යය කවදා හරි එළි වෙනවා. දැන් මෙතැන ඒ අසත්‍යය ඔප්පු වුණේ, තමන්ගේම කටින්. ඇතුලත්මුදලි මැරුවේ, කොබ්බෑකඩුව මැරුවේ, විමලරත්න මැරුවේ ප්‍රේමදාස කියලා කලින් කියලා, දැන් කියනවා ඒ අයව මැරුවේ ත්‍රස්තවාදීන් කියලා. ඒක නේ කියන්නේ, කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ කියලා. එම නිසා කවදා හෝ සත්‍යය ජයග්‍රහණය කරනවා. ඒ වාගේම මේ කථාව වැරදියට අර්ථ කථනය කරන්න එපා කියන එකත් මම මතක් කරනවා. ඔය තනතුරු අරගෙන ම්ලේච්ඡ රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරපු ආණ්ඩු එක්ක එකට වාඩිවෙන්න අප කැමති නැහැ. තනතුරු නැතිවත්, පාර්ලිමේන්තු කමිටු ක්‍රමවේදය තුළ විපක්ෂයේ ඉඳගෙන ඕනෑම වගකීමක් අරගෙන රට ගොඩ ගන්නත්, ලක්ෂ දෙසියවිස්සක් වූ ජනතාව ගොඩ දමන්නත් අපි සූදානම් බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.15]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සිටින අපි දෙසියවිසිපස්දෙනාම දැනගත්තොත් හොඳයි කියලා ගරු විපක්ෂ නායකතුමා යම් කාරණයක් කිව්වා. ඇත්ත වශයෙන්ම එය අපි දැනගත්තොත් හොඳයි. මොකද, රටක නිරෝගී ප්‍රජාතන්ත්‍රවාදය සඳහාත්, යම් කිසි රටක යහ පැවැත්ම සඳහාත් බලපාන ප්‍රධාන ආයතන තුනක් තිබෙනවා. ඒවා තමයි, ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය. කුමන දේශපාලන මතිමතාන්තර දැරුවත්, අපි මේ රටේ ව්‍යවස්ථාදායකය -මේ උත්තරීතර සභාව- නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු.

අපි මහජනයාගේ ඡන්දයෙන් පත් වෙලා, මහජනයාගේ වග කීම් ඉෂ්ට කිරීම සඳහා දිවුරුම් දීලා මේ ගරු සභාවට පැමිණි මන්ත්‍රීවරු. ලෝකයේ කිසිම රටක නැති විධියට අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පසුගිය දා ම්ලේච්ඡ ලෙස මහපාරේ ඝාතනය කළා. එතුමා කුරිරු ලෙස මරා දැමුවා විතරක නොවෙයි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු 74 දෙනෙකුට පැය 12ක් ඇතුළත උන්හිටිතැන්, ඇඳුම් පැළඳුම් සියල්ල නැති කරලා අන්ත අසරණ තත්ත්වයට පත් කළා. එවැනි කෲර, ම්ලේච්ඡ ත්‍රස්තවාදයක් රටේ ක්‍රියාත්මක වෙච්ච අවස්ථාවේදීවත් මේ ගරු සභාවේ ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට වෙනම විවාදයක් විපක්ෂ නායකතුමා නොඉල්ලීම පිළිබඳ මම අවංකවම කනගාටු වෙනවා. කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා -හිටපු අමාත්‍යතුමා- අපේ පැත්තේ කෙනෙක් නොවෙයි. එතුමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත්වීමට විරුද්ධව මුල ඉඳන් ම සටන් කරපු මනුස්සයෙක්. ඒ වාගේම එතුමා ලාංකීය දේශපාලනය තුළ ප්‍රගතිශීලී පැත්තේ හිටගෙන දීර්ඝ කාලයක් පොදු ජනයාගේ හිතවතෙකු ලෙස ජනතාව වෙනුවෙන් පෙනී හිටපු මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක්. එතුමා වැදගත් මහත්වරුන්ගේ දේශපාලනයේ නිරත වෙච්ච කෙනෙක්. පසුගිය මැයි 9වෙනි දා සිද්ධියේ දී එතුමා රිය ඇතුළට ආලා, ඒකට පෙට්‍රල් වක් කරලා පුච්චලා මරන්න හැදුවා. මේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයකු වන එතුමා වෙනුවෙන් අපේ මේ ගරු සභාවේ කී දෙනෙක් ඉදිරිපත් වුණාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ගරු නියොජ්‍ය කථානායකතුමනි, මම ගරු අමරකීර්ති අතුකෝරළ මැතිතුමා වෙනුවෙන් ගුණ කථනය කළා. ඔබතුමාට ඒක මතකද කියලා මම දන්නේ නැහැ. මම එදා මේ ගැන කිව්වා. වෙන කවුරුවත් කිව්වේ නැහැ. ඔය පැත්තෙන් කිව්වේත් නැහැ, මේ පැත්තෙන් කිව්වේත් නැහැ. මම කිව්වා, "එතුමාගේ මරණය වෙනුවෙන් වන්දියක් දෙන්න ඕනෑ" කියලා. ඒක ඔබතුමාට මතකද කියන්න මා දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මතකයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ වාගේම දේපොළ හානි සම්බන්ධයෙන් මම කිව්වා. දේපළ නැති වෙච්ච සියලුදෙනාටම වන්දි දෙන්න ඕනෑ කියලා මම කිව්වා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට මම ප්‍රකාශයක් කළා. අපි ඒ සිද්ධිවලට විරුද්ධයි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
එහෙම, "විරුද්ධයි" කියලා හරි යන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කථා කළේ සියලුදෙනා වෙනුවෙන්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ පළමුවෙනි දේ මේකයි. අපි මේ රටේ ගරු පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු ලෙස කවර ජාතියකට අයිති වුණත්, කවර ආගමකට අයිති වුණත්, කවර දේශපාලන මතයක් දැරුවත්, ඒ දරන මතයට විරුද්ධව තමන්ගේ ගේ ඇතුළේ බයෙන් හා සැකයෙන් තොරව ජීවත් වෙන්න බැරි තත්ත්වයක් රටේ නිර්මාණය වෙලා තිබෙනවා නම්, ඒකයි රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. ද්‍රවිඩ ජන කොටසක් ජීවත් වෙන ප්‍රදේශයක යම් කිසි නිවසකට කණ්ඩායම් වශයෙන් ඇවිල්ලා ඒ ගේ ඉස්සරහා උද්ඝෝෂණය කරලා, "මෙතැනින් පිටත් වෙන්න" කියලා කිව්වොත්, එහෙමත් නැත්නම් ඒ අය ඒ ගේ ඇතුළට දාලා දරු මල්ලොත් එක්ක ගිනි තියනවා නම් ඒක හරිද? වෙනත් ආගමික කණ්ඩායමක් ඇවිල්ලා "ඔය ආගම අත් හරින්න ඕනෑ" කියලා යම් පිරිසකට කියන්න පටන් ගත්තොත්, අපි ඒකට විරුද්ධයි. අපි මේ පාර්ලිමේන්තුවේ පෙනී ඉන්නේ ඒ විරුද්ධ මතය වෙනුවෙන් පෙනී ඉන්න පිරිස් වෙනුවෙන්. මේ රටේ සියලු මිනිසුන්ට ජාති, ආගම්, වර්ණ, කුල භේදයෙන් තොරව තමන් කැමති ආගමක් අදහන්න, තමන් කැමති ජන වර්ගයක් වෙනුවෙන් පෙනී ඉන්න, තමන් කැමති දේශපාලනයක් වෙනුවෙන් පෙනී ඉන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ විධියට පෙනී ඉන්න අයගේ ගේ ඉස්සරහට ඇවිල්ලා උද්ඝෝෂණ කරනවා නම්, බැණ අඬගහනවා නම්, කොහොමද ඒ සමාජය සුවපත් සමාජයක් බවට පත් වෙන්නේ? මේ රටේ ප්‍රචණ්ඩ දේශපාලන අත්දැකීම් අපි ලබලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන හොඳටම දන්නවා. 1989දී අපි පාර්ලිමේන්තුවට තේරී පත් වෙන අවස්ථාවේදීත් මේ වාගේම කිව්වා. මේ පාර්ලිමේන්තුව වර්ජනය කළා. " පාර්ලිමේන්තුව හොර පාර්ලිමේන්තුවක්. පර්ලිමේන්තුව හොර ගුහාවක්. මේ මැතිවරණයට ඉදිරිපත් වෙන අයට දඬුවම මරණයයි" කියලා එදා කිව්වා. මරණයයි කිව්වා විතරක් නොවෙයි, ඡන්දය දාන්න යන පළමුවෙනි පස්දෙනා මරණවා කිව්වා; එහෙම මැරුවා. සජිත් ප්‍රේමදාස මැතිතුමා දන්නවා, මේවාත් ම්ලේච්ඡ ප්‍රහාර කිව්වාට, ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ යුගයේ මේ රටේ තරුණයෝ 60,000ක් ඝාතනය වුණා කියලා. රිචඩ් ද සොයිසා වාගේ මාධ්‍යවේදීන් ආණ්ඩුවේ හෙලිකොප්ටරයෙන් අරගෙන ගිහිල්ලා මරලා දැම්මේ මුහුදේ. එතකොට ගාමිණී ෆොන්සේකා මැතිතුමා තමයි නියෝජ්‍ය කථානායකතුමා ලෙස හිටියේ. අපි මේ ගරු සභාවේ දී කිව්වා, රිචඩ් ද සොයිසා මහත්මයා හෙලිකොප්ටරයෙන් අරගෙන ගියා කියලා. එහෙම අරගෙන ගියේ රජයේ හමුදාවලින්. එහෙම නැත්නම් ඒ අවස්ථාවේ හමුදා වෙනුවට හදලා තිබුණු වෙනත් කණ්ඩායම් විසින්. එහෙම මැර කණ්ඩායම් විසින් මෙහෙයවපු දේශපාලන ඉතිහාසයක් තියෙද්දී මේ මන්ත්‍රීවරු, ඇමතිවරු -ව්‍යවස්ථාදායකයේ ඉන්න මිනිස්සු- සම්පූර්ණයෙන් විනාශ කිරීම පිළිබඳ හදිසි තත්ත්වයක් රටේ නිර්මාණය වෙමින් පවතිනවා කියලා තේරුම් ගන්න බැරි විපක්ෂයක් ඉන්නවා නම්, ඒ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට හා මූලික මිනිස් අයිතිවාසිකම්වලට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා ආණ්ඩු පක්ෂයේ නොවෙයි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එතුමා පැහැදිලිව ජනාධිපතිතුමාට විරුද්ධව කටයුතු කළාය කියලා මුළු රටම දන්නවා. එතුමාගේ රථයෙන් එතුමාගේ නිවසට යන්න අයිතියක් නැත්නම් මොකක්ද ඇතිවන තත්ත්වය? එදා එතුමා ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ වුණාද?

එහෙම නැත්නම් අපේ රැස්වීමකට සම්බන්ධ වුණාද? නැහැ. එහෙම නම් කියන්න පුළුවන්, 83 ජුලි කලබලය ඇති වෙන්න මූලික හේතුවත් හමුදාවේ රණවිරුවෝ 13දෙනෙක් මරපු එක කියලා. ඒ රණවිරුවන්ගේ දේහ බොරැල්ල කනත්තට ගෙනාපු අවස්ථාවේ ඒ තුළින් කුපිත වෙච්ච ජනයා යම් යම් සිද්ධි ඇති කළා, එයින් පස්සේ ඒ ක්‍රියාවලිය මුල් කරගෙන මුළු රටම අවුරුදු ගාණක් යුද්ධයකට ගියා, එසේ යුද්ධයකට යන්න හේතුව ඒ රණවිරුවන් 13දෙනාගේ මරණය කියලා කියන්න පුළුවන්ද? එහෙම කියන්න පුළුවන් ද? එහෙම කියන්න බැහැ. කාලාන්තරයක් තිස්සේ සැලසුම් සහගතව පටන්ගෙන, මේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය වෙනස් කරලා, ත්‍රස්තවාදය පාවිච්චි කරලා බියවද්දලා, ඒ බිය තුළින් ආණ්ඩු වෙනස් කිරීම සඳහා අරගෙන ගිය දැවැන්ත කුමන්ත්‍රණයක සූක්ෂම වැඩ පිළිවෙළක් කලින් එළියට පැනීම තමයි මේ සිද්ධියෙන් වුණේ කියන එක තමයි මගේ පෞද්ගලික අදහස. සෑම ගෙදරකම විදුලිය විසන්ධි කරන්නේ කොහොමද, ජල සැපයුම විසන්ධි කරන්නේ කොහොමද, ගිනි තියන්නේ කොහොමද? මුළු රටක් පුරා පැය 12ක් ඇතුළත සංවිධානාත්මක කණ්ඩායම් විසින් ම්ලේච්ඡ ලෙස සැලසුම් සහගතව ඒ කටයුතු කළා. සමහර ප්‍රාදේශීය සභාවල හිටපු සභාපතිවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඒ අවස්ථාවේ ඒ අයගේ දරු පැටව් අරගෙන එළියට දුවපු දර්ශන තමුන්නාන්සේලා දකින්න ඇති. ලෝක ඉතිහාසයේ මෙවැනි සිදුවීමක් වෙලා නැහැ. ලෝකයේ ව්‍යවස්ථාදායකය තුළ එක මන්ත්‍රීවරයෙක් අනෙක් මන්ත්‍රීවරු සියලුදෙනාගේ හා ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන්ගේ ගෞරවය වෙනුවෙන් පෙනී ඉඳලා තිබෙනවා. අපේ රටේ පසුගිය මැයි මාසයේ වූ සිදුවීමෙන් එක මන්ත්‍රීවරයෙක් මියගියා පමණක් නොවෙයි, ව්‍යවස්ථාදායකය නියෝජනය කරන හැත්තෑ දෙදෙනෙකුට උන්හිටිතැන් නැතිවෙලා, ඇඳුම් පැළඳුම් පවා නැති වුණා. වර්තමාන ජනාධිපතිතුමා මේ රටේ අග්‍රාමාත්‍යවරයා ලෙස හය, හත් වතාවක් පත් වෙච්ච දේශපාලන පක්ෂයක නායකයෙක්. එතුමාගේ නිවස ගිනි තියලා, එතුමා පාරම්පරිකව රැස් කර ගත්ත විශාල ධනය වෙච්ච එතුමා කියවපු පොතපත නැති කරලා, සියල්ල විනාශයට පත් කළා. මේ තරම් ම්ලේච්ඡත්වයක් ඇති

කරන්න අපි කරපු දායකත්වය මොකක්ද? අපි කථානායකතුමාගෙන් ඉල්ලා සිටියා, මේ ගැන ලෝක පාර්ලිමේන්තු සංගමයට කියන්න, පොදු රාජ්‍ය මණ්ඩලයේ පාර්ලිමේන්තු සංගමයට කියන්න කියලා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ම්ලේච්ඡ ලෙස ඝාතනය කරලා, ඒ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැත්තෑ දෙදෙනෙකුට පැය 12ක් ඇතුළත උන්හිටිතැන් අහිමි කරලා, ම්ලේච්ඡ ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙච්ච ලෝකයේ එකම රට විධියට තමයි ලංකාවේ ඉතිහාසයට මේ කළු ලකුණ එකතු වෙන්නේ. ඒක ලඝු කොට තකන්න එපා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි දවසක මැරෙයි. අපි මැරුණාට පස්සේ මේ පාර්ලිමේන්තුවට එන අයත් ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරනවා කියලා දිවුරා පොරොන්දු වෙනවා. එසේ පොරොන්දු වෙච්ච අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව වෙන දේත් එලෙසින්ම අනුමත කරන්න තරම් පල්ලෙහා මට්ටමකට වැටෙනවා නම්, මේ පාර්ලිමේන්තුව ප්‍රබුද්ධ පාර්ලිමේන්තුවක් බවට පත් වෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! අද දින දිවා ආහාර විවේකයෙන් තොරව විවාදය පවත්වාගෙන යෑමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ලංකාව නිදහස ලබාගෙන මේ වෙනකොට අවුරුදු 74ක් වෙනවා. මේ කාලය තුළ අපි රටක් වශයෙන් මේ තරම් දරුණු ඛේදවාචකයකට මුහුණ දීලා නැහැ. මේ තිබෙන දැවැන්ත ආර්ථික අර්බුදයේ තිබෙන කොටස් ගැන පමණක් අපි හැමදාම කථා කර කර ඉන්නවා මිසක්, කිසි දවසක මේ පිළිබඳව ඇත්ත විවාදයකට එන්නේ නැහැ. අපේ රටේ දවසකට ආදායම තිබෙන්නේ කෝටි 400යි. අපි කැමැති වුණත්, අකමැති වුණත් අපට දවසකට වියදම තිබෙනවා කෝටි 1,000ක්. හැම දවසකටම කෝටි 600ක් අපි ණයට ගන්න ඕනෑ. හැම දවසකටම කෝටි 600ක් ණයට ගන්නේ නැතිව, ආණ්ඩුව වෙනස් වුණා කියලා රට පවත්වාගෙන යන්න පුළුවන් ද? කාගේ ආණ්ඩුවක් ආවත් මේ රට ඉදිරියට ගෙනියන්නේ කොහොමද? හැමදාම මේ රට ගෙනිහිල්ලා තිබෙන්නේ ණය අරගෙන. ගත්ත ණය ගෙවන්නේ නැති නිසා තවදුරටත් ණය දෙන්නේ නැත්නම්, මේ රට ඉදිරියට කොහොමද පවත්වාගෙන යන්නේ කියන එක පිළිබඳ වගකීම තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙනවා, රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතු බව. අපේ රටේ ගිය අවුරුද්දේ බදු ආදායම රුපියල් බිලියන 1,268ක් තිබෙනවා. ඒ රුපියල් බිලියන 1,268න්, බිලියන 1,115ක් වැටුප් හා විශ්‍රාම වැටුප් සඳහා වෙන් වෙනවා. එතකොට ඉතිරි රුපියල් බිලියන 153න් රටක් පවත්වාගෙන යන්න පුළුවන් ද?

ඒ සඳහා ණය ගත්තාම ඒ ණය නොගෙවීම නිසා මතුවෙලා තිබෙන ප්‍රශ්නයට පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනා වග කියන්නේ නැද්ද? ඒ වාගේම රට ඇතුළට එන්නේ -අපට ලැබෙන ආදායම- ඩොලර් බිලියන 10ක් 12ක් නම්, ඩොලර් බිලියන 20ක් 22ක් ආනයනය සඳහා වියදම් වෙනවා නම්, තෙල් ගෙනෙන්න යන වියදම අපි සොයා ගන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 දී -යහ පාලන රජය සමයේ- එක් අවුරුද්දකට බනිජ තෙල් බිල ඇමෙරිකානු ඩොලර් බිලියන 2.7යි. මේ අවුරුද්දේ බනිජ තෙල් බිල ඇමෙරිකානු ඩොලර් බිලියන 6.7යි. තෙල් ගෙනෙන්න විතරක් ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක් වැඩිපුර යනවා. ඩොලර් බිලියන 4ක් කියන්නේ කීයක්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
හොඳයි. මම තව විනාඩියකින් කථාව අවසන් කරන්නම්.

හම්බන්තොට වරාය විකිණීමෙන් ලැබුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි. Port City ව්‍යාපෘතියට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි. ඒ දෙකේම එකතුව ඇමෙරිකානු ඩොලර් බිලියන 2.8යි. මේ අවුරුද්දේ බනිජ තෙල් ගෙනෙන්න ඒ වාගේ දෙගුණයකටත් වැඩි මුදල් ප්‍රමාණයක් අවශ්‍යයි. අපට ඩොලර් මවන්න පුළුවන්ද? මොකක්ද විසඳුම? මොකක්ද විකල්පය? ඇයි, ඒක ජනතාවට කියන්නේ නැත්තේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ ආර්ථිකය ඍණ අගයක් ගත් අවස්ථා 3ක් තිබෙනවා. 2001 දී අපේ රටේ ආර්ථිකය ඍණ සියයට 1.4ක් වුණා. 2021 දී කොවිඩ් වසංගතය නිසා අපේ ආර්ථිකය ඍණ සියයට 3ක් වුණා. මේ අවුරුද්දේ සියයට හයක්, බින්දුවට වඩා පහළට ආර්ථිකය ඍණ වෙනවාය කියනවා. එතකොට මුළු රටේම නිෂ්පාදනය, නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජන කියන මේ සියල්ලම කඩා වැටෙනවා. එවැනි තත්ත්වයකදී මේ වාගේ ජාතික අර්බුදයකින් ගොඩ එන්නේ කොහොමද කියලා මේ ගරු සභාවේදී අපි සාකච්ඡා කළ යුතුයි. ඒ වාගේම දෙකේ පන්තියේ දේශපාලන සිතුවිලි ධාරාවෙන් බැහැරව රටක් වශයෙන් අපි එකට නැඟිටීම සඳහා සර්ව පාක්ෂික එකඟතාවක් ඇති කරගත යුතුයි. ඒ අනුව, මේ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා එකතු වී වැඩ කරන්න කියා සියලුදෙනාටම ආරාධනා කරමින්, රුදුරු ත්‍රස්තවාදී ව්‍යසනයෙන් රට බේරා ගෙන, නිරායුධ, අවිහිංසක මිනිසුන්ට බියෙන් හා සැකෙන් තොරව තමන්ගේ නිවස තුළ ජීවත් වෙන්නට හා කැමැති තැනක ජීවනෝපාය කර ගන්නට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා ආරක්ෂක අංශවලට අවශ්‍ය ශක්තිය දෙන්න මේ හදිසි නීතිය සම්මත කර දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.29]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இந்த அவசரகாலச் சட்டம் உருவாகியதும் இனப்படுகொலை ஆரம்பித்ததும் மறைந்த முன்னாள் சனாதிபதி ஜே. ஆர். ஜயவர்தன அவர்களுடைய காலத்தில்தான் என்பதை நான் இங்கு கூறிக்கொள்கின்றேன். அந்த இனப்படுகொலை ஆரம்பித்து இன்று 39 வருடங்கள் ஆகிவிட்டது. அதேபோல்,

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

இந்த அவசரகாலச் சட்டம் உருவாக்கப்பட்டு 39 வருடங்கள் ஆகிவிட்டது. அந்த அடிப்படையில் யூலைப் படுகொலை இடம்பெற்ற நாளை - வெலிக்கடைச் சிறைச்சாலையில் நடைபெற்ற இனப்படுகொலையின் 39ஆவது வருட நினைவு நாளை - இன்றைக்கு எங்களுடைய தமிழ்த் தேசம் கரிநாளாக நினைவுகூருகிறது. இதன்போது, தமிழீழ விடுதலை இயக்கத்தின் ஸ்தாபகர்களான தங்கத்துரை, குட்டிமணி ஆகியோர் உட்பட ஜெகன், நடேசதாசன், தேவன் என 53 பேர் படுகொலை செய்யப்பட்டார்கள். இன்றைய தினம் இந்த உயரிய சபையிலே யாரும் இது சம்பந்தமாகக் கருத்துரைக்க வில்லை என்ற கவலையோடு, அன்று கொல்லப்பட்டவர் களுடைய குடும்பத்தினருக்கு எங்களுடைய தமிழ் மக்கள் சார்பாக, தமிழீழ விடுதலை இயக்கத்தின் சார்பாக, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாக ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று அவசரகாலச் சட்டம் நீடிக்கப்படப்போகின்றது. சிங்கள மக்கள் தாக்கப்பட்டதைப் பெரியதொரு விஷயமாகக் கருதி, இன்று அதுதொடர்பில் இங்கு பலரும் பேசுவதை நான் காணக்கூடியதாக இருக்கிறது. ஜனநாயக ரீதியிலே போராடிய சிங்கள மக்கள் தாக்கப்பட்டதை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். உண்மையிலே அது கண்டிக்கத்தக்க ஒரு விடயமாகும். இந்த அரசாங்கம் செய்த அநியாயத்தைக் கண்டித்து வடக்கு, கிழக்கு மற்றும் மலையகத்திலுள்ள தமிழர்கள் இன்றைக்கும் போராட்டத்திலே ஈடுபடுகின்றார்கள். அவர்கள் ஜனநாயக ரீதியிலே போராடியவர்களைத் தாக்கியது தவறென்று சுட்டிக்காட்டுகின்ற அதேநேரம், அந்தப் போராட்டத்திலே பங்குகொண்ட சிங்களச் சகோதரர்களுக்கு ஆதரவும் தெரிவிக்கிறார்கள். ஆனால், அன்று எங்களுடைய தமிழ் மக்கள் தாக்கப்பட்டபோது, அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி எங்களுடைய இளைஞர்களைக் கைதுசெய்து சிறைகளை நிரப்பியபோது, யாருமே அதற்கு எதிராகக் குரல் கொடுக்கவில்லை. அது பயங்கரவாத நடவடிக்கையாகவே பார்க்கப்பட்டது என்பதை நான் இங்கு மிகக் கவலையோடு தெரிவித்துக்கொள்கின்றேன். எனவே, நாங்கள் அனைவரும் ஒன்றாக இணைந்து செயற்படக்கூடிய அளவுக்கு காலம் மாறியிருக்கிறது என்ற விடயத்தை நான் இந்த உயரிய சபையினூடாகத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஜனநாயக ரீதியான போராட்டத்தில் ஈடுபட்டிருக்கின்ற இளைஞர், யுவதிகள் எங்களுடைய தமிழ்த் தரப்பினரால் நடத்தப்பட்ட போராட்டம் நியாயமானது என்று ஏற்றுக் கொள்கின்ற அளவுக்கு வந்திருக்கிறார்கள். அந்த வகையிலே, இந்த ஜனநாயக ரீதியான போராட்டத்திலே ஈடுபடுகின்ற அத்தனை மக்களுக்கும் நாங்கள் எங்களுடைய ஆதரவைத் தெரிவிக்கத் தயாராக இருக்கிறோம். அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தி அவர்களை அடக்க நினைப்பது தவறாகும். நிச்சயமாக மறைந்த முன்னாள் சனாதிபதி ஜே. ஆர். ஜயவர்தன அவர்களால் அன்று நிகழ்த்தப்பட்ட அநியாயத்தின் பின்னர்தான், ஆயுதப் போராட்டம் முளைத்தது என்பதை இங்கு நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அந்த ஆயுதப் போராட்டத்தை முளைக்க வைத்தவர், மறைந்த முன்னாள் சனாதிபதி ஜே.ஆர். ஜயவர்தன அவர்கள்தான். ஆகையால், தயவுசெய்து இந்த ஜனநாயகப் போராட்டத்தை யாருமே ஒடுக்க நினைக்க வேண்டாம். தந்தை செல்வா அவர்களுடைய காலத்திலே இடம்பெற்ற ஜனநாயக ரீதியான போராட்டத்தை வன்முறைமூலம் மிக மோசமான முறையில் ஒடுக்கினார்கள். இப்பொழுதும் அவ்வாறான ஒரு சூழல் ஏற்படுவதற்கான வாய்ப்பு இருந்துகொண்டிருக்கிறது. ஆகையால், நாங்கள் எல்லோரும் ஒன்றிணைந்து செயற்பட்டு, எங்களுடைய இனப் பிரச்சினை உட்பட இந்த நாட்டிலே வாழ்கின்ற அனைத்து இனத்தவர்களுடைய பிரச்சினை களையும் தீர்த்து, ஐக்கிய இலங்கைக்குள்ளே ஒவ்வோர் இனத்தவரும் சுதந்திரமாக வாழக்கூடிய சூழலை ஏற்படுத்த வேண்டும். அதற்கான வாய்ப்பு இப்பொழுது உருவாகியிருக்கிறது. இந்த அவசரகாலச் சட்ட நீடிப்பைத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு எதிர்க்கும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

அதுமட்டுமல்ல, அன்று வெலிக்கடைச் சிறையிலே கொல்லப்பட்டவர்களுடைய உடல்கள் எங்கே புதைக்கப் பட்டிருக்கின்றன என்பதை இற்றைவரைக்கும் அறிந்து கொள்ள முடியாமல் இருக்கிறது. எனவே, அதனை இந்த அரசாங்கம் வெளிப்படையாக, உறுதிபடச் சொல்ல வேண்டுமென நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைக்குப் பல விடயங்கள் பற்றிப் பேசப்படுகின்றன. எங்களைப் பொறுத்த வரையில், இன்றைக்கு டீசல், பெற்றோல் என்பவற்றுக்குக் கொடுக்கப்படுகின்ற முக்கியத்துவம் மண்ணெண்ணெய்க்குக் கொடுக்கப்படுவதில்லை. மண்ணெண்ணெய் இன்மையால், எங்களுடைய மீனவச் சமூகம் 3-4 மாதங்களாகப் பட்டினியை எதிர்கொண்டிருக்கிறது. அப்படியானதொரு சூழலுக்குள் விவசாயிகளும் தள்ளப்பட்டிருக்கிறார்கள். ஆகவே, அரசாங்கம் பெற்றோல், டீசல் என்பவற்றுக்குக் கொடுக்கின்ற அதே முக்கியத்துவத்தை மண்ணெண்ணெய்க்கும் கொடுக்க வேண்டு மென்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, தமிழ்த் தேசியக் கூட்டமைப்புமீது சேறுபூசுவ தற்காகச் சில புல்லுருவிகள் எங்களைக் குறைசொல்கிறார்கள்; நாங்கள் சோரம் போய்விட்டதாகச் சொல்கிறார்கள். அதை நிரூபியுங்கள்! என்று நான் அந்தப் புல்லுருவிகளிடம் கேட்கின்றேன். அப்படி நிரூபித்தால் அவர்கள் சொல்வதை நாங்கள் கேட்போம். தமிழ்த் தேசியக் கூட்டமைப்பு என்றைக்கும் முதுகெலும்போடுதான் செயற்படும்; அது எடுத்த முடிவின் பிரகாரம்தான் செயற்படும்; அந்த முடிவை ஒருபோதும் மாற்றாது; அது ஒருபோதும் சோரம் போகாது என்று சொல்லி, விடைபெறுகிறேன். நன்றி. வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.36]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - சுகாதார அமைச்சரும் நீர் வழங்கல் அமைச்சரும்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health and Minister of Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදයට එක් වෙමින් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මම විශේෂයෙන්ම සතුටු වෙනවා. අද ගරු විපක්ෂ නායකතුමා, "හදිසිය", "හදිසිය", "හදිසිය" කියන වචනය පාවිච්චි කරමින් ආර්ථිකයේ ඇති වෙලා තිබෙන යම් යම් අවපාත

සහ ඒ ප්‍රශ්න ගැන විග්‍රහයක් කරමින් කථා කළා. එතුමාගේ හෘදය සාක්ෂියත්, මගේ හෘදය සාක්ෂියත් වාගේම මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225දෙනාත්, මේ රටේ යම් තීරණාත්මක අවස්ථාවකදී හොඳට හිතන්න පුළුවන් කණ්ඩායමක් ඉන්නවා නම් ඔවුනුත් බොහොම පැහැදිලිව දන්නවා මේක මේ පසුගිය මාස 18 තුළ වුණු සිදුවීම්වලින් ඉස්මතු වෙච්ච ප්‍රශ්නයක් නොවන බව. අවුරුදු ගණනක් තිස්සේ සිද්ධ වුණු යම් යම් අඩු පාඩුකම් නිසාත්, විවිධ රජයන් විසින් විටින් විට ගන්නා ලද යම් යම් තීරණ නිසාත් ඇති වෙච්ච ආර්ථික අර්බුදයක ප්‍රතිඵලවලටයි අපට අද මේ මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මේ අර්බුදකාරී වෙලාවේ අවස්ථාවාදී දේශපාලනය සම්බන්ධයෙන් අපට හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන් වුණා. මට මතකයි, මැයි 01 දා නුගේගොඩ තිබුණු රැස්වීමේදී සමහර අය බොහොම පැහැදිලිව කිව්වා, ව්‍යවස්ථාව කියන්නේ කොළ කැබැල්ලක්, රෙගුලාසි කියන්නේ රටේ පාලනයට අවශ්‍ය දෙයක් නොවෙයි කියලා. ඒවා ඔක්කෝම පැත්තකට විසි කරලා මහ පාරේදී මේ ගනුදෙනුව බේරා ගන්න ඕනෑය කියලා එදා අනාවැකියක් කියපු බවත් මම නැවත වරක් සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යවස්ථාවයි, ජන මතයයි පටලවා ගෙන කථා කරන්න බැහැ. මේ රටේ ජන මතය පැහැදිලිව පිළිබිඹු කර, ඒ ජන මතය එක්ක පාර්ලිමේන්තුව තුළ ඇති වෙන සංයුතිය ගැනත්, ඉන්පසුව සිද්ධ වන ක්‍රියාදාමය සහ පරිපාලනමය ක්‍රියාවලිය ගැනත්, අවශ්‍ය නීති රීති සම්බන්ධවත් ව්‍යවස්ථාවක බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි රටේ මූලික නීතිය. "මේ මූලික නීතිය කඩ කරලා කටයුතු කරමු" කියලා කාට හරි කියන්න පුළුවන්. එක වතාවයි ඒ දේ කරන්න ඕනෑ, එක වගන්තියයි කඩ කරන්න ඕනෑ. නමුත්, එහෙම කටයුතු කරපු රටවල් මොන ආකාරයෙන් විනාශ මුඛයට ගිහින් තිබෙනවාද කියලා මේ රටේ ප්‍රබුද්ධ ජනතාවට අවබෝධයක් ඇති කියන එකයි මගේ විශ්වාසය.

මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාම පැත්තකට දමන්න කියලායි සමහරු කියන්නේ. එහෙම නම්, ජන මතය කියන්නේ මොකක්ද? ජන මතය විමසන්න තමයි ව්‍යවස්ථාවට අනුව නියමිත කාලය තුළ මැතිවරණ පවත්වා තමන්ගේ නියෝජිතයන් පත් කරගන්න ජනතාවට අවස්ථාව ලබා දී තිබෙන්නේ. මේ රටේ සිටින මිලියන 22ටම පාර්ලිමේන්තුවට එන්න පුළුවන් නම්, තීන්දු තීරණ ගන්න පුළුවන් නම් හොඳයි. එහෙම බැරි නිසා තමයි මැතිවරණයක් හරහා මහජන නියෝජිතයන් පත් කර ගන්නේ. ව්‍යවස්ථානුකූලව ඔවුන් පාර්ලිමේන්තුවට සහභාගි වෙලා, පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන කණ්ඩායමක් හැටියට කැබිනට් මණ්ඩලයක් හරහා රටේ පරිපාලනය, ඉදිරි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමයි සිදු කරන්නේ. ව්‍යවස්ථාව තුළ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය විග්‍රහ කර තිබෙන්නේ ඒ ආකාරයටයි. හැබැයි, ඒකට වැරදි අර්ථකථන දෙමින් ජන මතය කියන එක වෙනම තැනකට ගෙනිහිල්ලා, "මේකයි ජන මතය, මේකයි විය යුත්තේ" කියන්න බැහැ.

මේ රටේ මිලියන 22ක ජනතාවගෙන් අරගළයේ ඉන්නවා කියන ප්‍රමාණය සියයට 10ක් නම්, එතැන මිලියන 2.2ක ප්‍රමාණයක් ඉන්න ඕනෑ. නමුත්, මේ "අරගළය" කියන වැඩ පිළිවෙළ තුළ එවැනි ප්‍රමාණයක් ඉන්නා බව පෙනෙන්න තිබෙනවාද? ඔබතුමන්ලා හෘදය සාක්ෂියත් එක්ක ඒ ගනුදෙනුව බේරා ගන්න. ප්‍රජාතන්ත්‍රවාදීව, ජන මතයට ගරු කරමින් මේ රටේ බලය ගන්න බැරි සංවිධානාත්මක කණ්ඩායමක් විසින් ඉතාම සැලසුම් සහගතව රටේ තිබෙන ආර්ථික අවපාතය ප්‍රයෝජනයට අරගෙන ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් හැටියටයි අපි මෙය දකින්නේ. පැහැදිලිව අපට පේන්න තිබෙන්නේ ඒකයි. ඊට අමතර දෙයක් නැහැ, එතැන. බොහොම පැහැදිලිව අපි මේක විග්‍රහ කර ගන්න ඕනෑ. එහෙම නම් ඇයි අපි ඡන්ද තියන්නේ? ඔය කියන අරගළයේ කණ්ඩායමට මේ රට, මේ පාර්ලිමේන්තුව භාර දීලා තව මාස හයකින් තව කණ්ඩායමක් අරගළ කළොත්, ඒ අරගළ කරන කණ්ඩායමට ඊළඟට රට භාර දෙනවාද? ඒ විධියට, "ඒකයි ජන මතය" කියලා, එහෙම එන එන කණ්ඩායම්වලට රට භාර දෙනවාද?

ඔය අරගළයේ කණ්ඩායම එක්ක විවෘත සංවාද තියනකොට ඒ අය කරුණු ඉදිරිපත් කළ ආකාරය මම දැක්කා. "හොඳයි, ගෝඨාභය යනවා. ඊළඟට, කවුද එන්නේ?" ඇහුවාම, "එතකොට අපි බලාගමු" කිව්වා. ඒ එන පුද්ගලයා ගියාම කවුද එන්නේ ඇහුවාම, "ඒකත් අපි බලාගමු" කිව්වා. මේ සියලුම කර්තව්‍යයන් අපට වැඩක් නැහැ, ගෝල් ෆේස් එක පැත්තේ මිනිසුන් පනස්දහසක්, ලක්ෂයක් එකතු වුණාම මේ සියලුම කර්තව්‍යයන් පැත්තකට දාලා, "ඒකයි ජන මතය" කියලා ඒ අයට රට භාර දෙන්න කියලායි විපක්ෂ නායකවරයා කියන්නේ. එතුමා කියනවා, ජන මතයට ගරු කරන්න කියලා. මොකක්ද ඒ අය කියන ජන මතය? ඒ ජන මතය මනින මිනුම් දණ්ඩ මොකක්ද? එය ක්‍රියාත්මක වෙන්නේ කොයි ආකාරයෙන්ද? ජන මතය මනින මිනුම් දණ්ඩ තමයි ඡන්ද ක්‍රමය; ජනතාවගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම. ඒ මිනුම් දණ්ඩ තමයි ක්‍රියාත්මක වුණේ. ඊට වැඩිය තිබෙන මිනුම් දණ්ඩ මොකක්ද? මම එය නොදන්නවා නම්, කවුරු හෝ දන්නවා නම් කරුණාකර එය පෙන්වා දෙන්න. ඒකට යම් කිසි විධියේ බලපෑමක්, පීඩනයක් එනවා නම් එය බේරා ගන්නත් ඕනෑ ව්‍යවස්ථා රාමුව තුළමයි. එතැනින් පිට පැනලා කටයුතු කරන්න බැහැ.

දැන් බොහෝ දෙනා ප්‍රචණ්ඩත්වය ගැන කථා කරනවා. ගෝල් ෆේස් ඒකේ ඉතාම සාමකාමීව, ආදරයේ අරගළයක් තිබුණා කියනවා. ආරම්භයේදී ඒ වාගේ යම් කිසි ගුණාංගයක්, ඒ වාගේ හොඳ වටපිටාවක් අපි එතැන දැක්කා. හැබැයි, මැයි 09වැනිදා ඇති වෙච්ච සිද්ධියත් එක්ක කියන්නේ මොකක්ද? ප්‍රහාරය අශිෂ්ට නම් ප්‍රතිප්‍රහාරයෙන් ශිෂ්ටත්වය බලාපොරොත්තු වෙන්න එපා කියලායි. මා මිත්‍ර රමේෂ් පතිරණ ඇමතිතුමා පැහැදිලිව මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "එදා සිදුවූ ඒ ප්‍රහාරය අපි හෙළා දකිනවා, ඒ ප්‍රහාරය සිදුවිය යුතු දෙයක් නොවෙයි" කියලා. හැබැයි, එහෙම කියද්දී, ඒ තිබුණු තත්ත්වය තුළ එල්ල වුණු ප්‍රහාරය කොහොමද? හිටපු මන්ත්‍රීවරයෙක් කියනවා, අපේ කණ්ඩායම් දැන් ලංකාව වටේම ක්‍රියාත්මක වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පැය 12 ඇතුළත නිවාස 77ක්, 78ක් ගිනි තියනකොට ඒක අහම්බෙන් වෙච්ච දෙයක් කියලා ඔබතුමන්ලාට, අපිට හිතන්න පුළුවන්ද, යම් බුද්ධියක් තිබෙනවා නම්? ඒ දේවල් අහම්බෙන් සිද්ධ වුණා කියා හෝ ප්‍රතිප්‍රහාර දැක්වීමක් ලෙස සිදු වුණාය කියා කවුරු හෝ හිතනවා නම්, කවුරු හෝ එහෙම කියන්න උත්සාහ කරනවා නම් ඒක පිළිගන්න පුළුවන් දෙයක්ද? මේ පාර්ලිමේන්තුවේ 225දෙනා ඒ විධියට හිතනවා නම් මේ 225දෙනාම යා යුතුයි කියලා මම හිතනවා. තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගැනීමේ අරමුණින් එතරම් පහත් මට්ටමකින් හිතලා කටයුතු කරනවා නම් මේ 225දෙනාම යා යුතුයි.

අපි මේ රටේ ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවට දිවුරුම් දීලා තිබෙනවා. ව්‍යවස්ථාව ආරක්ෂා කරනවා කියලා දිවුරුම් දී තිබෙන සමහර අය පාර්ලිමේන්තුව ළඟට ඇවිත් කියනවා, "මේ ගුබ්බෑයම අද දවස ඇතුළත යටත් කර ගන්න ඕනෑ. මේකට ගහලා අපේ ග්‍රහණයට ගන්න ඕනෑ" කියලා. එතකොට අපි 225දෙනාම බෙදිලා මේක ගැන කථා කරනවාද, නැත්නම් ඒකට ප්‍රතිචාර දක්වනවාද? මොකක්ද කළ යුත්තේ?

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

රටකට හදිසි නීතිය ගෙනෙන්න වෙන්නේ ඇයි? ඇයි, හදිසි නීතියට අදාළ වගන්තියක් තිබෙන්නේ? ඇයි, හදිසි නීතිය අවශ්‍ය වෙලා තිබෙන්නේ? අවුරුදු 18ක් මේ රට හදිසි නීතියත් එක්ක ගනුදෙනු කළා. මතක තියා ගන්න, එදා යාපනයට ගිහිල්ලා ආසියාවේ තිබුණු ලොකුම පුස්තකාලය ගිනි තියනකොට ඒකට අත්පුඩි ගහපු ගොඩක් අය අද කථා කරන අය අතර ඉන්නවා. ඒකෙදි හිනා වෙච්ච අය ඉන්නවා; සතුටු වෙච්ච අය ඉන්නවා. ඒ අයම අද අනික් පැත්තට කථා කරනවා. එදා ඒ සිදුවීම සාධාරණීකරණය කරනවා නම් මේ දේත් සාධාරණයි. ඒ දේ සාධාරණයි නම්, මේ දේත් සාධාරණයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඔබතුමාත් හිටියා නේ, ඒ කාලයේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මම හිටියේ නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, මම හිටියේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට වැරදිලා. ඒක ඔබතුමා නිවැරදි කර ගන්න. ඔබතුමා දන්නේ නැත්නම් ඉතිහාසය දැන ගන්න. කරුණාකර, වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* මම හිටියේ නැහැ. ඔබතුමා එහෙ මෙහේ ගිය හින්දා ඔබතුමාට ගණන් වැරදිලා. අර එහාට මෙහාට ගිය කාලය මතක නැතිව ඇති. ඒක වෙන කථාවක්. *[බාධා කිරීමක්]* ඒ නිසා කරුණාකර- *[බාධා කිරීමක්]* මම ඔබතුමාට උත්තර දෙන්නේ නැහැ. I am on my feet. - *[Interruption.]* I am on my feet. If you know what is in the Standing Orders, please sit down.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, බාධා කරන්න එපා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මම බාධා කළේ නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Please sit down!

ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළා, වෛද්‍යවරු 108 දෙනෙකු විසින් කර තිබෙන ප්‍රකාශයක් ගැන. මට කියන්න ලජ්ජයි, 09 වෙනිදා සිදුවීමේදී ගුටි කාපු, බේරේ වැවට දාලා ගහපු අය ඉස්පිරිතාලෙට ගේනකොට ඒ අයට ගැහුවා. එතකොට කවුරුත් කථා කළේ නැහැ. අපේ ප්‍රසන්න රණතුංග අමාත්‍යවරයා බෙහෙත් ගන්න ගියාම දොස්තර කෙනෙක් එතුමාට බෙහෙත් දෙන්න බැහැ කිව්වා, දේශපාලනය නිසා. මේවා හරි දේවල් ද? මේවා ගැන කවුරුත් කථා කරනවා ද? නැහැ. පාර්ලිමේන්තු පාරේ ඇම්බියුලන්ස් එකක් එනකොට ඒ ඇම්බියුලන්ස් එකට ගහනවා. මේවා ගැන කවුරුත් කථා කරනවා ද? ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. මම කනගාටු වෙනවා, විපක්ෂ නායකතුමා මේ දේවල් ඔක්කෝම අමතක කරලා කථා කිරීම ගැන. එදා වෙච්ච සිදුවීම අශිෂ්ට නම් මේ දේවලුත් අශිෂ්ටයි. ඔබතුමන්ලා කොන්ද කෙළින් තියාගෙන කථා කරන්න. මොකද, ඒක වැරදියි නම් මේකත් වැරදියි. ඒක සාධාරණීකරණය කරලා මේක අසාධාරණයි කියන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
හොඳයි.

එම නිසා මේවා අසාධාරණයි කියමින් ඔබතුමන්ලා අනික් දේවල් සාධාරණීකරණය කරන්න උත්සාහ කරන එකත් අසාධාරණයි කියන එකයි අපට කියන්න තිබෙන්නේ, විපක්ෂ නායකතුමනි. අසාධාරණය, සාධාරණය නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේ රටේ මූලික නීතියක් තිබෙනවා; ව්‍යවස්ථාවක් තිබෙනවා. ව්‍යවස්ථාවට අනුගත වෙනවා ද, එහෙම නැත්නම් ව්‍යවස්ථාවෙන් එළියට ගිහිල්ලා කටයුතු කරනවා ද, ඒ කටයුතු කරන එකට සහයෝගය ලබා දෙනවා ද, ඒකට අනුකම්පා කරනවා ද, ඒක අප පිළිවෙත හැටියට පාවිච්චි කරනවා ද කියන එක පිළිබඳ ගනුදෙනුව ඔබතුමන්ලා, අපි හෘදය සාක්ෂිය එක්ක බේරා ගන්න ඕනෑ. එහෙම නැතිව, කොහේ හරි උද්ඝෝෂණයක් කරලා මිනිස්සු 50,000ක් පාරට බැස්සා කිව්වාම ආණ්ඩු වෙනස් කරන්න ද කියන්නේ? පාර්ලිමේන්තුව වහලා දාන්න ද කියන්නේ? ඒකද කරන්න කියන්නේ? ඒකද වෙන්න ඕනෑ? නැහැ. අපි ක්‍රමවේදයක් හදා ගනිමු. ප්‍රජාතන්ත්‍රවාදයයි, ජන මතයයි පටලවා ගන්න එපා. ප්‍රජාතන්ත්‍රවාදයයි, ජන මතයයි පටලවා ගෙන තමයි හුඟ දෙනෙක් කථා කරන්නේ.

ගරු මන්ත්‍රීවරුනි, මේ අරගළය ආරම්භ කළේ කොහොමද? අපි 225 දෙනාම එපා කියලා නේ ඒක ආරම්භ කළේ. හැබැයි, ඊට පස්සේ මොකක්ද වෙන්නේ? 225 දෙනාගෙන් කිහිප දෙනෙක් ඒකෙන් එළියට එනවා. මේ 225දෙනාගෙන් කිහිප දෙනෙකු අයුතු ලෙස, ආසාධාරණ ලෙස, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව, ව්‍යවස්ථාවට විරුද්ධව රටේ බලය ලබා ගන්නේ කෙසේද කියන න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරනවා. වෙස් මුහුණු බැඳගෙන, ඒ න්‍යාය පත්‍රයට අනුව නටපු අය අද එළියට ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 09 වෙනිදා සිදුවීම දඩ මීමා කරගෙන මේ සියලුම කරුණු ඒකත් එක්ක පටලවා ගෙන, ඒ නිසා මේ දේ කරනවාය කියමින් සාධාරණීකරණය කරන්න යාම කොයි තරම් දුරට සාධාරණ ද කියා මා දන්නේ නැහැ. මෙතුමන්ලා තව වැරදි කථාවක් මේ පාර්ලිමේන්තුවේ කිව්වා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඒක නිවැරදි කරන්න ඕනෑ. එතුමන්ලා කිව්වා, අරගළ භූමියේ අය යන්නයි හිටියේ කියලා. 14 වෙනිදා තමයි පොලීසිය ඒ අයට ඉවත් වන ලෙසට පළමු දැනුම් දීම කළේ. 18 වෙනිදා දෙවැනි දැනුම් දීම කළා. එය ක්‍රියාත්මක නොකළ නිසා, ස්වේච්ඡාවෙන් ඉවත් නොවුණු නිසා තමයි තුන්වනුව ඒ අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න සිද්ධ වුණේ. මතක තියා ගන්න, ජනාධිපති ලේකම් කාර්යාලය කියන්නේ මේ රටේ ප්‍රධානම පරිපාලන ඒකකය බව. කවුරු හරි ගිහිල්ලා ඒ

පරිපාලන ඒකකය අල්ලා ගත්තාම මොකක්ද වෙන්නේ? එදා පාර්ලිමේන්තුව අල්ලා ගන්න එනකොට ඔබතුමන්ලා ඔක්කෝම කිව්වා, මේක බේරන්න කියලා. එදා පක්ෂ නායක රැස්වීම තිබුණු වෙලාවේ සියලු දෙනාම පිළිගත්තා, මෙය කළ යුතු නැහැ කියලා. ඒ වෙලාවේ සියලු දෙනාම බැහැලා එළියට ගියා. බලන්න, ජනාධිපති ලේකම් කාර්යාලයේ ඒ අය හැසිරුණු විධිය. පාර්ලිමේන්තුවට ආවත් ඒ අය හැසිරෙන්නේ ඒ වාගේ තමයි.

අද වන විට ජනාධිපති මන්දිරයේ කෝටි ගණනක දේවල් විනාශ කරලා තිබෙනවා. සමහර අය කියනවා, "ඕක මොකක්ද, මුළු රටම කාපු අය නේ" කියලා. මම මේ කියන්නේ, මේ සන්සන්දනය - මේ comparison එක - කරන ආකාරය ගැනයි. තව කොහේ හරි වෙච්ච සිදුවීමක් දාලා මේ කරන ප්‍රචණ්ඩත්වයට "හායි" කියනවා. වැරැදි නම් දෙකම වැරැදියි. එහෙම නම් ඒ වැරැදි දෙකටම දඬුවම් දෙන්නට ඕනෑ. දෙගොල්ලන්ම තම වැරැද්ද පිළිගන්නට ඕනෑ. අපි ඒ දෙගොල්ලන් ගැනම ඒ ආකාරයෙන් කථා කරන්නට ඕනෑ. "එක පැත්තක් හොඳයි. ඒ පැත්ත විතරයි හරි. අනෙක් පැත්ත වැරැදියි" කියන්න බැහැ.

ඔබතුමන්ලා මේ කාරණයත් මතක තියාගන්න. ඡන්ද පොළකට ගිහිල්ලා ජනතාවගේ මතය ඡන්ද පොළෙන් නිර්මාණය කර ගන්න බැරිව එය වෙනත් ආකාරයකින් නිර්මාණය කරනවා නම්, එසේ නිර්මාණය කරන එකට ඉඩ දෙනවා නම්, ඒකට ආශීර්වාද කරනවා නම් මුළු රටේම ඉන්න මිලියන 22 ම කවදා හරි ශාප කරයි. එදාට මේ රට ලිබියාව, සිරියාව වාගේ වනකොට, එසේ කිරීම ගැන ශාප කරයි. ඒ ශාප ලද්දන්ගේ ගොඩට මේ 225දෙනා එක්කාසු වෙන්න එපා කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා.

බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මැතිනිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[12.49 p.m.]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Hon. Deputy Speaker, our country, unfortunately for the last 40 odd years, has been governed under Emergency Regulations. I think my generation in particular has lived under Emergency Regulations for so long, that for many of us it had become normalized. Certainly for the people of the North and the East, the Emergency Regulations were very much a part of their existence.

But, the Emergency Regulations imposed on the 18th of July, 2022, which we are debating today, are unique for two specific reasons. One is that they include measures which are draconian and most repressive in ways they have never been before. For instance, the Regulations allow a person to be arrested even by the military and to be kept up to 72 hours. I do not think this has happened before. The Regulations have also vested in the President powers which are largely unchecked. For 72 hours, a person arrested need not be presented before court or to the police. The powers that have been delegated to the police and to the military have expanded exponentially. For example, simple offences are now described as high crimes and can be imposed with imprisonment up to 20 years or even life imprisonment. So, what is necessary is not to just look at the imposition of the Emergency Regulations, but at what has been gazetted under these particular Emergency Regulations since the measures that have been taken are unprecedented and they are unprecedented for a second reason: these measures were imposed at that time by an Acting President who has been unelected. President Ranil Wickremesinghe, as we know, is someone who lost his own constituency. It is he who came into power being elected to that position by this Parliament and is now imposing these draconian measures. So, when we are discussing these Emergency Regulations today, we have to take into account the specific nature of the Emergency measures, which are being considered and debated, and also the context within which these particular Regulations have been imposed.

In general, there is an understanding that for Emergency Regulations to be declared, there should be specific circumstances, that there should be some deep threat to national security or to public security. It is under those circumstances that Emergency Regulations are usually imposed. But, what are the conditions under which these Emergency Regulations have been imposed? We know that the protests that people have been engaging in for the past several months have arisen primarily due to the deep economic distress that people have been undergoing. Most of the protests started with the economic conditions that people have had to undergo and have been distressed by. How those kinds of protests can be described as a threat to national security and to public security is something that needs to be considered. People got on to the streets because of hunger, loss of livelihood, because their children have not been able to go to school, the shortage of medicines, fuel and the basic things that people need to get on with their lives. Those problems have still not been resolved; those problems are still there. Do you expect the people of this country to sit back and accept these conditions and to accept these as normal? It is not normal. They are not able to get on with their lives. Children have been deprived of school for over two and a half years. So, it is under those conditions that people got on to the streets, and the efforts to interpret and describe that as fascist and as actions of a terrorist group, to equate it in that way and to describe it in those terms show the lack of sensitivity to the concerns of the people and to what the people making such decisions are subject to.

Then, let us look at how these Emergency Regulations have been implemented. Was it necessary for the unarmed protestors to be evicted from their protest site at 1.00 a.m. on the 22nd of July, 2022 when they had already agreed to vacate that site on that day, within the next few hours. That was the agreement; they had announced they were leaving those sites. Yet, the Government saw it fit to attack those civilian protestors early in the morning of that day. They saw it fit to deny them access to legal support and medical support; ambulances were barred and lawyers were banned from entering those sites. Lawyers and media people who were there were also brutally attacked. How is this

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

proportionate to the seeming threat that the public or the nation was facing at that time? Since then, arrests of people who have been critical of the State and State institutions on social media have been made. How is that action proportionate to the threat to the nation? People have been pulled off planes. These sights are now being broadcast throughout the world in a way that is highly damaging to our international image and to the commitments this Government has made towards democracy and upholding the rights of the people. So, this is the reality where these Regulations are being experienced by the people. We know that Emergency Regulations come within the law of this country, that it is in our Constitution, but we also know that they have been used over and over again in this country to stifle dissent and criticism of the Government. It has always meant upholding the *status quo* and the establishment at the cost of civilian lives and their freedom.

Even in the Debate today, once again what we are seeing is that we are neglecting the causes of people's protests, the reasons that have driven people to the streets and again, we are talking about the concerns of the 225 MPs here. Yes, what happened to the MPs - one lost his life and many lost their homes - is not something that could be condoned or is acceptable. But, over 20 civilians had also died in queues. So many citizens of our country have lost their homes on so many different occasions. But, have we been as concerned or as sensitive to those situations as we have been when our own lives and our own homes have been under attack? Is it not understandable that people have such a rage against the 225 of us and against this Parliament? Unless we take those feelings and experiences into account, we will continue to be despised; this institution will continue to be despised and seen as irrelevant to the lives of the people and that is highly dangerous to democracy in this country. So, think about what it is that we are trying to combat, whether this is proportionate to the situation that is outside, whether what is being implemented under the Emergency Regulations is proportionate to the threat that is perceived. At whom is this threat really being directed? Who is under threat? And, if you listen to the Debate today, you would understand that the people who are feeling most under threat are the 225 of us. So, does that warrant this kind of draconian intervention in order to safeguard the lives and property of 225 versus the millions outside and the concerns and issues that the millions outside are facing?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
So, once again, let us not hide behind what is constitutional. We have to do what is right by the people. We also have to do what is seen to be right by the people. If, in any way, we are to reassert the legitimacy of this Parliament, we have to respond to what is happening outside, to the actual problems that people are facing outside rather than make this simply something about the 225 MPs inside here, once again. Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.59]

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு ஜோன் செனவிரத்ன)
(The Hon. John Seneviratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින පැවැත්වෙන හදිසි නීති විවාදයේදී වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අපි දන්නවා, පසුගිය අවුරුද්දක පමණ කාලයක සිට අපේ රටේ විශාල ආර්ථික අර්බුදයක් ඇතිවෙලා තිබෙන බව. මේ ආර්ථික අර්බුදය නිසා අපේ රටේ උද්ධමනය වැඩි වෙලා, විදේශ විනිමය හිඟයක් ඇති වෙලා, ජනතාවට අසීරු තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, ඩීසල්, පෙට්‍රල්, ගෑස් වැනි දේවල් හිඟ වීම නිසා කිසිම දවසක පෝලිම්වල නොහිටපු ජනතාවත් පෝලිම්වලට එන්න පටන් ගත්තා. ඒ අයගේ දුක් ගැනවිලිවලට පිළිතුරු නැති වුණා. අපි ආණ්ඩු පක්ෂයේ සිටින ගමන් මේවාට පිළිතුරු සපයන්න ගියත්, ඒවා ප්‍රායෝගික වුණේ නැහැ. කිසිම අවස්ථාවක ඒ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න බැරි වුණු නිසා අපි ඒ පිළිබඳව රජයේ අවධානය යොමු කළා. මමත්, අපේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුත් කිහිප වරක් ගිහිල්ලා හිටපු ජනාධිපතිතුමාට කිව්වා, රටේ මේ තත්ත්වය නිවාරණය කරන්න යම්කිසි පියවරක් වහාම ගත යුතුයි කියලා. නමුත් කනගාටුවෙන් වුණත් අපි කියන්නට ඕනෑ, ඒ සම්බන්ධව ප්‍රායෝගික ප්‍රතිඵල ගෙනදෙන කිසිම පියවරක් ගැනුණේ නැති බව.

මේ කාරණයත් මම විශේෂයෙන් කියන්නට ඕනෑ. ඊයේ පැවති ආණ්ඩු පක්ෂ රැස්වීමේදී එක මන්ත්‍රීවරයකුත් මේ කාරණය ගැන කථා කළා. එතුමා කිව්වා, "ස්වාධීන වෙන්න එපා" කියලා. ඇත්ත වශයෙන්ම අපි ස්වාධීන වුණේ කැමැත්තෙන් නොවෙයි. අපි බොහොම කැමැත්තෙන් ආණ්ඩුවේ හිටියේ. ආණ්ඩුවේ හිටියත්, ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න අපට බැරි නම් තවදුරටත් එම ආණ්ඩුවත් එක්ක සිටීම අපට අපහසු වුණා; ගැටලුසහගත වුණා. ඒ නිසා තමයි මමත්, අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමාත්, සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාත්, සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියත්, තවත් මන්ත්‍රීවරුන් අටදෙනෙකුත් වෙනම ස්වාධීන කණ්ඩායමක් හැටියට කටයුතු කරන්න තීරණය කළේ. තවත් මන්ත්‍රීවරුනුත් ඒ ආකාරයෙන්ම ස්වාධීන කණ්ඩායම් වුණා. අපි ආණ්ඩුවෙන් ඉවත් වුණේ නැහැ. තමුන්නාන්සේලාට මතක ඇති, අපි ආණ්ඩු පක්ෂයේ ඉඳලා විරුද්ධ පාර්ශ්වය පැත්තට එනකොට මේ සභාවේ මැද හරස් කරලා - cross කරලා - නොවෙයි අපි ආවේ. අපි පිටිපස්සෙන් ඇවිල්ලා දොරවල්වලින් මෙතැනට ඇතුළු වුණේ. අපිට වුවමනා වුණේ නැහැ, ආණ්ඩුවෙන් ඉවත් වෙන්න. අපට වුවමනා වුණේ, "අද මේ රටේ තිබෙන තත්ත්වය මෙන්න මේකයි. ඒ නිසා මේ සම්බන්ධව වහාම පියවර ගත යුතුයි" කියන කාරණය රජය කරන පාලකයන්ගේ අවධානයට යොමු කරන්නයි. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් අපට නිදහසේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතුවා. ඒ කාලයේ තමයි ඔය "අරගළය" කියන එක පටන් ගත්තේ. "අරගළය" කියලා සංවිධානයක් ගොඩනැඟිලා Galle Face එකේ ඒ අය ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා.

මා දන්නවා, මගේ හිතවත් සමහර අයත් ඒ අරගළයට ගිය බව. ඒ වාගේම සමහර නීතිඥයනුත් ගිහින් එයට සහයෝගය දුන්නා; ආහාර පාන දුන්නා. මේ අරගළය ආරම්භවෙලා ඔවුන් ක්‍රියාත්මක වනකොට කාටවත් බලාපොරොත්තු තබා ගැනීමට බැරි සංවිධානයක් බවට එය ක්‍රමානුකූලව පත් වුණාය කියලා මා හිතනවා. ඔවුන් කෑ ගහනවා මිසක්, මේ ප්‍රශ්නවලට විසඳුම් දෙන ක්‍රමයක් ඒ අරගළයේ තිබුණේ නැහැ. ගම්වල යම් යම් කටයුතුවලදී "හෝයියා" කියන්නා වාගේ නිකම්ම ශබ්ද නඟනවා මිසක් එයින් වැඩකට ඇති දෙයක් කෙරෙන්නේ නැති බව අපි මුලදීම දැන ගත්තා. විශේෂයෙන්ම අගමැති මන්දිරයේ තාප්පයෙන් පිට පැත්තේ මඩු ගහගෙන, අසභ්‍ය වචන කියමින්, කෑ ගහමින් ඔවුන් කටයුතු කළා. මම දවසක් එතැනින් ගියා. එදා මම ඉතාම කලකිරුණා. මේ රටට විශාල සේවයක් කරපු මනුෂ්‍යයාගේ අගමැති මන්දිරය ළඟ අසභ්‍ය වචන කියමින් රෑ දවල් කෑ ගහන එක කොච්චර වැරැද්ද කියලා මම හිතුවා. මම එතැනින් එනකොට ASP කෙනෙක් ඉන්නවා දැක්කා. මම එතැන වාහනය නවත්වා ඔහුට කිව්වා, මේ මඩු ටික ඉවත් කරන්න කියලා කරුණාකරලා ඒ ගොල්ලන්ට කියන්න කියලා. ඒ තාප්පය පෞද්ගලික තාප්පයක්. එය පෞද්ගලික තාප්පයක් වෙන්නේ, පුද්ගලයකු ජීවත්වන ගෙදරක ආරක්ෂාවට තිබෙන තාප්පයක් නිසායි. ඒ මඩු ගැලෙව්වාය කියලා ඒ මිනිස්සු ජාත්‍යන්තර ප්‍රජාවට මහා විශාල හඬක් නඟමින් කෑ ගහන්න පටන් ගත්තා. මම දන්නේ නැහැ, මේ විධියට කරන්න ගියොත් කොහොමද රටක් ගෙන යන්නේ කියලා.

ඒ සම්බන්ධයෙන් අපටත් මතයක් තිබුණා. භෞතික වශයෙන් කාටත් කරදරයක් නොවන විධියට ගෝල් ෆේස් එකේ ගෙන ගිය ඒ ව්‍යාපාරයට පහර දීම නිවැරැදියි කියලා මා කියනවා නොවෙයි. නමුත් කොල්ලුපිටියේ තිබුණු ඒ වැඩ පිළිවෙළ වැරැදියි. එය ඉවත් කළ යුතුව තිබුණා. මා හිතනවා, එදා පොලීසිය හරිහැටි කටයුතු කළා නම් එවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ කියලා. නමුත් පොලීසියටත් යම් යම් බාධක තිබුණා. අපි දන්නවා, එදා හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා එහි රෙගුලාසි ගැසට් කළේ නැති බව. ඒ නිසා හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න බැරි වුණා. නමුත් දැන් ඒ සියල්ලම ගැසට් කරලා තිබෙනවා.

ඊළඟට ගෙවල් ගිනි තැබීම් සිදු වුණා. ඒ සිද්ධි නිසා මිනිසුන් සම්පූර්ණයෙන් කලකිරුණා. ගෙවල් ගිනි තබන්න, මිනිසුන්ට පහර දෙන්න ඔවුන් කටයුතු කළා. ඒ වාගේම නීත්‍යානුකූලව තමන්ගේ වාහනයෙන් පාරේ ගිය මන්ත්‍රීවරයකු ඇදලා අරගෙන එතුමාටත්, එතුමාගේ ආරක්ෂක නිලධාරියාටත් පහර දීලා මරා දැම්මා. ඒ විතරක් නොවෙයි. අපේ කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාට පහර දුන්නා. එතුමාගේ වාහනය පුච්චා දැම්මා. එවැනි තත්ත්ව ඇති වනකොට මේ සංවිධාන ගැන, මේ තත්ත්වය ගැන ඇත්ත වශයෙන්ම අපට ලොකු කලකිරීමක් ඇති වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ සමහර අයට ලොකු කැක්කුමක් තිබෙනවා. ඒ මොකද? රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වීම ගැන.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு ஜோன் செனவிரத்ன)
(The Hon. John Seneviratne)
මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මා හිතනවා, හිටපු ජනාධිපතිතුමා ඉතාම බුද්ධිමත් තීන්දුවක් තමයි ගත්තේ කියලා. එතුමා අප සියලුදෙනාගෙන්ම ඇහුවා, ඊළඟට අගමැති ධුරයට පත් කරන්නේ කවුද කියලා. අප කාගේත් අනුමැතිය තිබුණා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරන්න. මොකද, ඒ වෙලාවේ හැටියට බොහෝදෙනෙක් ඒ ධුරය භාර ගන්න බැහැයි කිව්වා. පළමුවෙන්ම ඒ යෝජනාව ගැන විරුද්ධ පක්ෂයේ නායකතුමාට කිව්වා. එතුමා බැහැයි කිව්වා. ඒ වාගේම වෙනත් අයට විවෘතව offer එකක් දුන්නා. නමුත් බැහැයි කිව්වා. ඊට පස්සේ මොකද කළේ? රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කළා. ඊට පස්සේ රටේ නොයෙක් කලබල ඇති වුණා. එතුමාගේ ගෙයටත් ගිනි තැබුවා. තවත් ගෙවල් 70කට වැඩි ප්‍රමාණයකට ගිනි තැබුවා. මගේ දකුණු පස ආසනයේ සිටින විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ ගෙයටත් ගිනි තැබුවා. මේ කාරණයෙන් පෙනෙනවා, ඉවක් බවක් නැතුව ගෙවල්වලට ගිනි තැබුවාය කියලා. එහෙම ගෙවල් ගිනි තබමින් රටේ ලොකු විනාශයක් ඇති කළා. ඒ වෙලාවේ මිනිස්සු හිතුවා, අපේ රට පාලනය කරන්න කෙළින් මිනිහෙක් ඕනෑ කියලා. අපේ රට පාලනය කරන්න යමක් කරන්න පුළුවන් මනුෂ්‍යයෙක් ඕනෑ කියලා නව සංකල්පයක් බිහි වුණා.

එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරනකොට අපේ ප්‍රදේශවල යම් යම් විවේචන තිබුණා. ඒ අය ඇවිල්ලා අප හම්බවෙලා කිව්වා, "රනිල් නම් මේ ධුරයට පත් කරන එක එච්චර ගුණ නැහැ" කියලා. මා ජනාධිපතිතුමාට කිව්වා, මිනිසුන්ගේ මෙවැනි අදහසක් තිබෙනවා කියලා. ඇත්තම කියනවා නම් එතුමා වෙනත් දේශපාලනයක් කරයිද කියලා මිනිසුන් තුළ සැකයක් තිබුණා. නමුත් ජනාධිපතිතුමා කිව්වා, "රනිල් වික්‍රමසිංහ කියන්නේ මෝඩයෙක් නොවෙයි" කියලා. වෙනත් දේශපාලනයක්, පටු දේශපාලනයක් කරන්න ගියොත් එතුමාට අමාරුයි කියන එකයි ඒ කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ ජනතාව තුළ විශ්වාසයක් ඇති වෙලා තිබෙනවාය කියන එක මම කියන්නට ඕනෑ. ඒ ගොල්ලන්ගේ ආරක්ෂාව ගැන විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ගේ ආරක්ෂාව handle කරන්න පුළුවන් පුද්ගලයෙක් අද රටේ නායකයා බවට පත්වෙලා තිබෙනවා කියලා රටේ ජනතාව තුළ විශ්වාසයක් තිබෙනවා. අද රටේ සාමය ආරක්ෂා කරන්න, ජන ජීවිතය පවත්වාගෙන යන්න කටයුතු කිරීම සඳහා හදිසි නීතිය අවශ්‍යයි කියලා ප්‍රකාශ කරමින්, ඒ සඳහා සියලුදෙනාම ඡන්දය දීම අවශ්‍යයි කියන කාරණයත් මතක් කරමින්, මගේ වචන කීපය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.07]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක නීතිය ශක්තිමත් කළ යුත්තේ, රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂාකොට පවත්වාගෙන යෑමටයි. හදිසි නීතිය පැනවිය යුත්තේ එම අවශ්‍යතාවේ දිගුවක් ලෙසයි. අද හදිසි නීතිය පැනවීමේදී අරමුණු කරගෙන ඇත්තේ ඉහත අවශ්‍යතාවට එරෙහිව ක්‍රියා කිරීම බවයි මට නම් පෙනෙන්නේ. එනම්, ජනතාව ආරක්ෂා කිරීමට නොව, ජනතාව මර්දනයකොට පාලකයන් ආරක්ෂා කර ගැනීමට හදිසි නීතිය

[ගරු ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

පනවන බවයි අපට පෙනී යන්නේ. වර්තමාන ශීලාචාර ලෝකය මානුෂික අයිතිවාසිකම්වලට ගරු කිරීම, භාෂණය හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ගරු කිරීම ඉතා ඉහළින් අගය කරනු ලබනවා. ඒ බව අප සියලුදෙනාම දන්නා කරුණක්. 1971 හෝ 1989 යන කාල පරිච්ඡේදවලට වඩා දියුණු, ගෝලීය වශයෙන් මානුෂික අයිතිවාසිකම්වලට ගරු කරන ලෝකයක අද අපි ජීවත් වනවා. අපේ රටේ වර්තමාන දූෂිත පාලකයන් නව සිතුම් පැතුම් හා නව පරම්පරාවේ බලාපොරොත්තු පාගාගෙන රට පාලනය කිරීමට උත්සාහ දරන බව තමයි අපට මේ අවස්ථාවේ පෙනී යන්නේ. අපි ඒ ගැන ඉතා කනගාටු වනවා.

අද අපේ රට ජීවත් වීමට නුසුදුසු රටක් බවට පත්වෙලා තිබෙනවා. ජීවන බර ජනතාවට දරා ගන්න බැහැ. ජනතාව ඉන්ධන හා ගෑස් පෝලිම්වල දවස් ගණන් ගත කරනවා. පෝලිම්වල මිනිසුන් මිය යනවා. ජන ජීවිතය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. විදුලිය නැතිව ව්‍යාපාර බොහෝ ප්‍රමාණයක් වැසී ගිහින්. පාසල් පවත්වන්නේ සතියකට දින දෙකයි, තුනයි. රජයේ කාර්යාල විවෘත කරන්නේ සතියකට දින තුනයි. ප්‍රවාහනය කඩා වැටිලා. ඉතින්, කොහොමද රටක් ඉදිරියට ගෙන යන්නේ කියලායි අපට ප්‍රශ්න කරන්න වෙන්නේ. මේ තත්ත්වය යටතේ පාරට ආ මිනිසුන් අපි කැරලිකාරයෝ, ත්‍රස්තවාදියෝ කියලා හංවඩු ගහන එක, මේ සභාවේ කෑ ගහන එක ඉතා නොමනා කරුණක් හැටියටයි මා දකින්නේ.

අනෙක් පැත්තෙන්, රටේ විදේශ විනිමය නැති නිසා ලෝකයට තිබෙන ණය ගෙවා ගන්න බැහැ. ඒ මදිවට වර්තමාන නායකයා කරන්නේ, තවත් ණය ගන්න සොයන එක පමණයි කියලායි අපට පෙනෙන්නේ. හිඟා කන ඒ ණය ආපසු ගෙවන විධියක් ගැන මේ ආණ්ඩුවට කිසිම සැලැස්මක් නොමැති බව අපට පෙනී යනවා. ඉදිරි සුමාන දෙක, තුන අමාරුයි කියලා බලයට ආ අය මේ අවස්ථාවේ පවසනවා, ඉදිරි අවුරුද්ද අමාරුවෙන් ජීවත් වෙන්න වෙයි කියලා. ඒකෙනුත් නැවතත් ඔප්පු වෙනවා, මේ ගොල්ලන්ට සැලැස්මක් නැහැ කියලා.

තිබෙන පීඩනය දරා ගන්න බැරිව තමයි ජනතාව රජයට ගෙදර යන්න කියන්නේ. ජනතාව දන්නවා, වර්තමාන රජය හා එහි ප්‍රධානීන්ගේ දූෂිත ක්‍රියා මාර්ග නිසා රට බංකොලොත් වුණු බව. කරුණු එහෙම වුණත් වර්තමාන රජයේ හිටපු දූෂිත නායකයන් දැන් ඔවුන්ගේ ඉත්තෙක් දමාගෙන ඉදිරියටත් බලය පවත්වාගෙන යෑමට උත්සාහ දැරීම කනගාටුවට කරුණක්. මේ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ වන විට රටේ ජනතාව රට පුරා අරගළයක් දියත් කර තිබෙන්නේ. අරගළය 69 ලක්ෂයක් ඡන්ද ගත් ජනාධිපති ගෙදර යවා තිබියදීත්, පාලකයන්ට තවම යථාර්ථය තේරෙන්නේ නැහැ කියලායි මට පෙනී යන්නේ. වර්තමාන ජනාධිපති ජනතාව ප්‍රතික්ෂේප කරපු චරිතයක්. අපට පෙනෙනවා, ඒ ජනාධිපති විසින් මේ වන විට හමුදාව හා පොලීසිය යොදවා ජනතා මර්දනයට මාන බලන බව. එතුමාගේ චේතනාව මීසදිටුයි. මට පෙනෙන විධියට එතුමාට වැරදිලා. එතුමා හිතන්නේ මේ අරගළය, ගාලු මුවදොරට සීමා වුණු අරගළයක් කියලා. ජනාධිපතිතුමා තේරුම් ගත යුතුයි, මිලියන 22ක් වූ රටේ ජනතාව දැන් ඉන්නේ අරගළයේ බව. ඒ වාගේම හමුදාවල හා පොලීසියේත් සියයට 95ක් මේ වෙලාවේ ඉන්නේ අරගළයේ.

ඒ බවත් ඔබතුමා තේරුම් ගන්න. අරගළය මර්දනය කරන්න යොදන හමුදාවේ, පොලීසියේ අයගෙන් මම ඉල්ලා සිටිනවා, කිසිම විටෙක අරගළයේ යෙදී සිටින දරුවන්ට විරුද්ධව අවි භාවිතයෙන් හෝ පොලු-මුගුරුවලින් පහර දීම් කරන්න එපා කියලා. අරගළයේ ඉන්නේත් ඔයගොල්ලන්ගේ ඥාතියෝ, දූ දරුවෝ, අසල්වැසියෝ. දැන් මේ රටේ ත්‍රස්තවාදයක් නැහැ. ඒ නිසා ජනතාව ඉදිරියට යනකොට මුහුණු වසාගෙන යන්න හමුදාවේ සහ පොලීසියේ නිලධාරීන්ට අවශ්‍යතාවක් නැහැ. අපට ඇහෙනවා, මේ රටේ කැරැල්ලක් ගැන සමහරු කියනවා. මේ රටේ තිබුණු කැරලි, අවස්ථා තුනකදී අපි දැකලා තිබෙනවා. නමුත්, රටේ සිටින අහිංසක ජනතාව ජීවත් වෙන්න බැරි නිසා පාරට බැස්සාම, ඒ ගොල්ලන් කැරැල්ලක් කරනවා කියලා හංවඩු ගහලා මර්දනය කරන්න යන එක තිරිසන් වැඩක් හැටියටයි මා තේරුම් අරගෙන තිබෙන්නේ. මේ වෙනකොටත් හමුදාවල සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සෙසු නිලයන්ගෙන් සියයට 50ක් පමණ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් සටන් බිමේ ලේ, දහඩිය, කඳුළු හෙළපු අය. ඒ නිසා අපි අතීතයේදී හමුදාවලට ලබාගත් කීර්තිනාමය දැන් කිලුටු වෙන්න දෙන්න එපා කියලා මම හමුදාවල රණ විරුවන්ගෙනුත්, පොලිස් නිලධාරීන්ගෙනුත් ඉල්ලා සිටිනවා. දූෂිත දේශපාලුවන් ආරක්ෂා කරන්න ගිහිල්ලා ඔබ ලබාගත් ඒ කීර්තිනාමය නැති කර ගන්න එපා.

හමුදාව විසින් ජනතාවට පහර දුන්නොත් ජාත්‍යන්තරය නිකම් ඉන්නේ නැති බවත් මතක තබාගන්න. මැද පෙරදිගදී ජාත්‍යන්තරය ක්‍රියා කළ ආකාරය අමතක කරන්න එපා. ජනතාවට විරුද්ධව අවි පාවිච්චි කළ හමුදා අතුගා දමන්නට ජාත්‍යන්තරය මැද පෙරදිගදී ක්‍රියා කළ ආකාරය ඒ අවධියේ මාධ්‍ය හරහා අපි අපගේ දෑසින්ම දුටුවා. පරණ කෝන්තර අමතක කර, එකතු වෙලා සමගි වෙන්න කියලා මම මේ අරගළයේ සිටින දරුවන්ගෙන් ඉල්ලා සිටිනවා. වෙන වෙන අරමුණු නිසා ඔබ අතර තිබෙන සමගිය නැති කර ගන්න එපා. ලබන මාසයේ නවවැනි දා සමගි සම්පන්නව මුළු රටේම ජනතාව සමඟ නැවතත් කොළඹට ඇවිල්ලා, අරගළයේ අවසන් සටන ජයග්‍රහණයකොට දූෂිත දේශපාලනඥයන්ගෙන් සහ දේශපාලන සංස්කෘතියෙන් මේ රට බේරාගන්න කියලා අපි මේ අරගළයේ දරුවන්ගෙන් ඉල්ලා සිටිනවා.

වර්තමාන පාර්ලිමේන්තුවේ තිබෙන්නේ දූෂිත පාලනයක්; දූෂිත දේශපාලන සංස්කෘතියක්. ඒ නිසා පාලකයෝ එක් කෙනෙක්, දෙදෙනෙක් එළවා නැවත පාර්ලිමේන්තුවට රට භාර දුන්නාට ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ කියලා අරගළයේ සිටින දරුවන් දැන් තේරුම් ගනිමින් සිටිනවා. රට ගොඩනඟන්නට හැකි අලුත් බලවේගයක් හරහා ව්‍යවස්ථාව රැක ගැනීමට ක්‍රියා කළ යුතු බව මම තේරුම් අරගෙන ඉන්නවා. අරගළයේ සියලු දරුවන්ගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මෙය තේරුම් අරගෙන සියලුදෙනා එක අරමුණකට එන්න කියලා. අලුත් බලවේගයක් කියන එකෙන් අපේ පක්ෂය පමණක් මම අදහස් කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ දෙපැත්තේම ඉන්නවා, අලුත් බලවේගයක්, රටට ආදරේ බලවේගයක් ගොඩනඟන්නට පුළුවන් පිරිසක්. ඒ පිරිස කවුද කියලා අපි හඳුනාගන්න ඕනෑ. එවැනි බලවේගයක් බිහිවේවා කියා මම මේ අවස්ථාවේ ප්‍රාර්ථනා කරනවා. මේ රටේ සිටින ජනතාවගෙනුත්, විදෙස්ගතව සිටින සියලු ආදරණීය ශ්‍රී ලාංකීය ජනතාවගෙනුත් මම ඉල්ලා සිටිනවා, මේ රටේ සිදුවන දේවල් ගැන අවදියෙන් ඉන්න කියලා. දූෂිත පාලකයෝ ජනතාව මර්දනය කිරීමට පියවර ගත්තොත්, ඔවුන්ට විරුද්ධව ගත හැකි සියලු ක්‍රියා මාර්ග ගන්නා ලෙස මම ඔබෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. දූෂිත පාලනයක් ඉදිරියට ගෙනයන්න ඔබ මුදලින්වත් උදවු කරන්න එපා. ඇතිවන ආර්ථික පීඩනය දරාගෙන ඉන්න අපි ලෑස්තියි. දූෂිත පාලකයන් නඩත්තු කිරීමට අවශ්‍ය මුදල් ආධාර පවා ලබා දෙන්න එපාය කියා අපි ජාත්‍යන්තරයෙනුත්, ශ්‍රී ලාංකීය ජනතාවගෙනුත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. සියලු රටවැසියන්ගෙන් හා රජයේ සේවකයන්ගෙනුත් මම ඉල්ලා සිටිනවා, රජය විසින් කරන නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් ආදිය හෙළා දැක ඒවාට එරෙහිව නැඟී සිටින්න; ඒවාට එරෙහිව පෙළගැසෙන්න කියලා.

අරගළයේ දරුවන්ටත් මම ඉතා සතුටින් දන්වා සිටින්න ඕනෑ, මේ වෙනකොටත් මේ රටේ සිටින උගතුන් විශාල ප්‍රමාණයක් ඔබට ශක්තිය දෙන්න ඔබේ පසුපසින් සිටගෙන සිටින බව. මේ වනකොටත් අරගළය සමඟ නීතිඥයෝ, වෛද්‍යවරු සහ විශේෂඥ වෛද්‍යවරු වැනි අතිවිශාල පිරිසක් සංවිධානය වෙමින් සිටිනවා. ව්‍යාපාරිකයන්ගෙනුත් අපි ඉල්ලා සිටිනවා, අරගළය වෙනුවෙන් තමුන්නාන්සේලාත් කැප කිරීමක් කරන්න, මේ අරගළය රට ජයග්‍රහණය කරන තෙක් ඉදිරියට ගෙන යෑමට තමුන්නාන්සේලාත් ශක්තියක් වෙන්න කියලා. ඒ වාගේම අරගළය මර්දනය කරන්න එන අය ගැනත් දැනගෙන ඉන්න කියලා මම පවසනවා. ඉහත සංවිධානවලට ඔබ අත තැබුවොත් අනිවාර්යයෙන්ම ඔබට පසුතැවෙන්න සිද්ධ වන බව අනිවාර්යයි.

ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමනි, අත්අඩංගුවට ගැනීම්, warrants නිකුත් කිරීම් වැනි දේවල් හරහා ජනතාව මර්දනය කිරීමට ඔබතුමා දරන උත්සාහය වහාම නවත්වන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ ආණ්ඩුවක් ආපු දවසට ඒ ක්‍රම හරහා අගතියට පත් වන අයට අනිවාර්යයෙන්ම අපි සාධාරණය ඉෂ්ට කරනවා. ඒකට වැඩි කාලයක් යන්නේ නැහැ. සිර අඩස්සියට ගත්තත්, කොච්චර හදිසි නීතිය ගෙනාවත්, රිමාන්ඩ් කරලා තියන්න කොච්චර උත්සාහ කළත් ඒවායේ ආයුෂ කොටයි කියලා අපි මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

ගුවන් යානයේදී අර තරුණයා අත්අඩංගුවට ගත්ත ආකාරය ඉතාම පිළිකුල් සහගතයි. ඒ වාගේ පොලිස් නිලධාරින් අතීතයේත් අප දැක තිබෙනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
ඔබතුමන්ලා කරනකොට ඒක හොඳයි.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මම කථා කරලා ඉවර වුණාම ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

ගුවන් තොටුපළේදී ඒ පොලිස් නිලධාරින් හැසිරුණු ආකාරය, ක්‍රියා කළ ආකාරය අපි පිළිකුලෙන් හෙළා දකිනවා. ඒ වාගේ පොලිස් නිලධාරින් හැසිරුණු ආකාරය අතීතයේත් අපි දැකලා තිබෙනවා. අතීතයේත් මහජනයාට හිරිහැර කරන හැටි අපි දැකලා තිබෙනවා. එවැනි පොලිස් නිලධාරින් දේශපාලනඥයන්ට කඩේ යන හැටිත් අපි දැකලා තිබෙනවා. එම නිසා ඒ වාගේ හැසිරිලා තමන්ගේ අනාගතය අඳුරු කරගන්න එපා කියලා ඒ පොලිස් නිලධාරින්ට අපි මතක් කර දෙන්න කැමැතියි. පොලු හමුදාව දමාගෙන තරුණයන්ට පහර දෙන ඒවා නවත්වන්න කියලා ජනාධිපතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා. ළඟදී අනිවාර්යයෙන්ම ආපසු ඒවා තමුන්නාන්සේලාට කැරකිලා එන එක වළක්වන්න බැරි වෙනවා. ඒ නිසා නීතිය අතට ආවාම දැළි පිහිය අතට ගත්ත වඳුරෝ වාගේ හැසිරෙන්න එපා කියලා ඒ අදාළ අයට අපි මතක් කරන්න ඕනෑ.

පසුගිය දවස්වල T-56 ගිනි අවියක් හෝ දෙකක් නැති වුණා කියලා විශාල රංගනයක් තිබුණා. ඒක නැති වුණා කිව්වේ, අර නිල්පාට පාලම ළඟ. අපේ විමල් වීරවංශ මැතිතුමා හදපු අර bus stand එක ළඟ. ඒක කියනකොටම මගේ ඔළුවට ආවා, අනිවාර්යයෙන්ම ඒ T-56 ගිනි අවිය දියවන්නාවට විසි කරලා ඇති කියලා. පැතුම් කියන හිටපු හමුදා නිලධාරියා පසුපස පැන්නුවා, ඔහු ඒක අරගෙන තිබෙනවා කියලා. එයාට වෙඩි තියන්න යනවා කියලාත් අපට ආරංචි වුණා. අන්තිමේදී ඒ T-56 ගිනි අවිය හම්බ වුණා දියවන්නාවේ තිබිලා. එච්චරවත් බුද්ධියක් නැතිව රාජකාරි කළ නිලධාරින් ගැන අපට ලජ්ජාවක් සහ කනගාටුවක් ඇති වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට තව විනාඩියක් දෙන්න.

අරගළ කරනකොට, යුද්ධ කරනකොට collateral damage කියලා එකක් සිද්ධ වනවා. ඒක වළක්වන්න බැහැ. ඒක ලෝකයේ හැම තැනම වෙලා තිබෙනවා. මාළිගා වාගේ ප්‍රභූන් ජීවත් වෙච්ච තැන් අල්ලා ගන්නකොට ඒවාට හානි වූ ආකාරය අපි දැක්කා. ඒවායේ දේපළවලට හානි වුණා, antiquesවලට හානි වුණා, පින්තූරවලට හානි වුණා. නමුත්, ඒ හානිය සිද්ධ වුණේ ඒ තරුණයන් ඊට වඩා වටිනා දේවල් මේ රටට ලබා දෙන්න උත්සාහ කළ නිසායි. මේ රටේ ජනතාව හැටියට අපි ඒක බුද්ධිමත්ව තේරුම් ගන්න ඕනෑ. පින්තූර ආරක්ෂා කරනවාට වඩා, antiques ආරක්ෂා කරනවාට වඩා, ඒ තරුණයන් ආරක්ෂා කරගන්න සටන් කරන දේවල්වල වටිනාකම අපි තේරුම් ගන්න ඕනෑ.

ඊළඟට, "ඉන්ධන බෙදා හැරීමේ කටයුතු කඩිනම් සහ විධිමත් කරන්න" කියලා ජනාධිපතිතුමා උපදෙස් දුන් බවට ප්‍රවෘත්තියක් "ලංකාදීප" පුවත් පතේ තිබෙනවා. ඒ "ලංකාදීප" පුවත් පත මම මෙතැනට ගෙනැත් තිබෙනවා. අපට මතකයි, කලින් හිටපු ජනාධිපතිතුමාත් ඔය කඩිනම් කිරීම, විධිමත් කිරීම ගැන නිතර නිතර කථා කළා. නමුත් ඒවා සිද්ධ වෙන්නේ නැහැ. ඒවා හරියට අධ්‍යයනය කරලා විසඳුම් සොයනවා හැර, මයික් එකක් අරගෙන නිකම් කයිවාරු ගහලා, "කඩිනම් කරන්න, විසඳුම් සොයන්න" කියන්නේ මෙලෝ දෙයක් තේරුම් ගන්න බැරි නිකමුන් කියන එක අපි තේරුම් අරගෙනයි ඉන්නේ.

අද අපි ගරු අගමැතිතුමාට සුබ පැතුවා. ඊළඟට, එන අගමැතිතුමාත් ළඟ පුටුවේ වාඩි වෙලා ඉන්නවා. ගරු අගමැතිතුමන්ලා අරගළය තදින් විවේචනය කළාට, ඔය පුටු හම්බ වුණේ නම් අනිවාර්යයෙන්ම අරගළයට පින්සිද්ධ වෙන්නයි. මම දන්නවා, මේ අගමැතිතුමාටත් ඉදිරියේදී ජනාධිපති වෙන්නත් ඉඩ තිබෙන බව. ඒ නිසා ඒවා ගැන අවධානයෙන් ඉන්න ඕනෑ කියලා අපි දන්නවා. මේ පුටු මාරුව හරහා හොරු පාර්ලිමේන්තුවට එන බවත් මේ අවස්ථාවේ අපි දකිනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව නිවැරදි මාර්ගයට වැටෙනවා දකින්න අපි ඉතාම ආසාවෙන් බලාගෙන ඉන්නවා.

තමුන්නාන්සේලා අරගළය නිසා වෙච්ච හානි ගැන කථා කළා. ඒක අපි පිළිගන්නවා. එක මන්ත්‍රීවරයෙක් කෑ ගැහුවා මෙතැන ඉඳගෙන. කවුද එතුමා? එතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවාද දන්නේ නැහැ, මට පෙනෙන්නේ නැහැ. එතුමාටත් වේදනාවක් තිබෙනවා නම් ඒ ගැන අපි කනගාටු වෙනවා. මන්ත්‍රීවරයකුගේ ජීවිතය නැති වුණ එක ගැනත් අපි කනගාටු වෙනවා. අපි ඒවා අනුමත කරන්නේ නැහැ. ඒවායින් අපි මෝඩ සතුටක් ලබන්නේ නැහැ. නමුත්, තමුන්නාන්සේලා ඒ අතරේම තේරුම් ගන්න, පෝලිම්වලදීත් ජීවිත 25ක් නැති වුණාය කියන එක. ඒවා ගැනත් කනගාටු වෙන්න. ගෑස් ළිප් පුපුරලාත් ජීවිත නැති වුණා. ඒවා ගැනත් කනගාටු වෙන්න.

[ගරු ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

ගැස් ළිප් පුපුරලා ගෙවල් ගිනි ගත්තා; දේපළවලට හානි වුණා. ඒවා ගැනත් තමුන්නාන්සේලා කනගාටු වෙන්න. මේ සියලු දේ වෙනුවෙන් ජනතාවට සහනයක් ලැබෙන්න ඕනෑ. මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්න ඕනෑ. අනිවාර්යයෙන්ම මේ රට හරි තැනට ගෙන යන්න නම් මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්න කියලා තමයි අපිත් ප්‍රාර්ථනා කරන්නේ. හදිසි නීතිය ගෙනැල්ලා, මිනිස්සු අත්අඩංගුවට අරගෙන, හිරේ දාලා 1971, 1989දී මර්දනය කරපු විධියට මර්දනය කරන්න පුළුවන් කියලා වර්තමාන ජනාධිපතිතුමා හිතනවා නම් ජනාධිපතිතුමනි, ඔබතුමාට වැරැදිලා. ඔබතුමාට **වල්ගය** පැගිලා. ඔබතුමා තේරුම් ගන්න, වර්තමාන ලෝකය ඒ විධියට මෙල්ල කරන්න බැරි බව. දූෂිත පාලකයන්ට විරුද්ධව සටන් කරන මේ තරුණයන්ට -මේ ජනතාවට- ජයෙන් ජය ලැබේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.23]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට ඉතා තීරණාත්මක හා අඳුරු අවස්ථාවකට මුහුණ දීලා තිබෙන වෙලාවකයි අපි මේ හදිසි නීතිය පිළිබඳ විවාදය පාර්ලිමේන්තුව තුළ පවත්වන්නේ. මේ පාර්ලිමේන්තුව තුළ තිබුණු ජනාධිපති තේරීමේ ඡන්දයේදී අපි ප්‍රකාශිතවම ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළේ විපක්ෂයේ අනික් සියලු පාර්ශ්ව සමඟ එකට එකතු වෙලා. නමුත් ඒ ඡන්දයෙන් ජයග්‍රහණය කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඩලස් අලහප්පෙරුම මැතිතුමා දිනුවා නම් සර්ව පාක්ෂික පාලනයක් හරහා සුජාතභාවයක් සහිත පාලනයකින් මේ අන්තර් කාලය -මේ අර්බුදකාරී කාලය- පහු කිරීම තමයි අපේ බලාපොරොත්තුව වුණේ. අපි හිතුවා, ඒක තමයි මේකට සුදුසුම උත්තරය කියලා. ඒ උත්තරය අපි මුලින්ම හිටපු ජනාධිපතිතුමාට යෝජනා කළේ පසුගිය අප්‍රේල් මාසයේ 08වැනි දා, ලිඛිතව. නමුත් එතුමා ඒ යෝජනාව සුදුසු පරිදි පිළිගත්තේ නැහැ. මේ වාගේ අර්බුදකාරී තත්ත්වයක් කළමනාකරණය කරන්න පුළුවන් වන්නේ සුජාතභාවය තිබෙන පාලන තන්ත්‍රයකට. මා හිතන්නේ නැහැ, මේ ඇති කර ගෙන තිබෙන පාලන තන්ත්‍රයට ඒ සුජාතභාවය සමාජය තුළ නියමිත ප්‍රමාණයට තිබෙනවා කියලා. හැබැයි, නියමිත පරිදි සුජාතභාවය තිබුණත් නැතත්, මේ පාලනය නීත්‍යානුකූල පාලනයක්; ව්‍යවස්ථානුකූල පාලනයක්. අපි කැමති වුණත් නැතත් ඒ පාලන තන්ත්‍රය තමයි අද මේ රට පාලනය කරන්නේ.

මේ රටේ ජනතාවට ඇති වෙච්ච තත්ත්වය පිළිබඳව මේ ගරු සභාවේදී ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ බොහෝ මන්ත්‍රීතුමන්ලාගේ කථාවලදී කියැවුණා. ඒ නිසා මා නැවත නැවතත් ඒ පිළිබඳව කියන්න කාලය ගන්නේ නැහැ. ඇති වෙච්ච දරුණු ආර්ථික පීඩනය තුළින් හට ගත් අසරණභාවය මත, අපේ රටේ තිබෙන මේ ඛේදජනක තත්ත්වය මත ඇති වෙච්ච ආවේගය මත, මහා ජන සන්නිපාතයක් කොළඹට ඇවිල්ලා මහා සටනක් කළා. ඒ අනුව හිටපු ජනාධිපතිතුමා ධුරය අත්හැරලා සාමකාමීව ඉවත් වුණා. "GotaGoHome" කියලා තමයි මේ සටන පටන් ගත්තේ. "GotaGoHome" කියන සටනට සමාජයේ යම්කිසි අනුමැතියක් තිබුණා, මා ඒ කියපු පීඩාකාරී තත්ත්වය හේතු කොට ගෙන සහ ඒවාට කඩිනම් විසඳුම් ලැබෙන බවක් නොපෙනෙන කොට. ඒ හේතුව මත මහා ජන සන්නිපාතයක් විසින් ඒ අරගළය ගෙන ගියා. හැබැයි, අපි හිතුවේ "Gota, go home!" කිව්වාම ඒ ප්‍රශ්නය ඉවර වෙනවා කියලා. නමුත් දැන් බැලුවාම එහෙම නැහැ.

මට කලින් අපේ සරත් ෆොන්සේකා මැතිතුමා කථා කළා. ඊළඟ මාසයේ 09වැනි දා තව කෙනෙකු ගෙදර යවන්න එතුමන්ලා එනවා ලු. එයා ගෙදර යැව්වාම ඊට පස්සේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට සිද්ධ වෙයි ලු, ජනාධිපති වෙන්න. ඉතින් මේක මල කෝළමක් නේ. මේ විධියට වෙන වැඩක් කරන්න ලැබෙන්නේ නැහැ. "Gota, go home!", ඊට පසුව "Ranil, go home!", ඊට පසුව "Dinesh, go home!" ඊට වඩා ලේසියි නේ, කවුද ඕනෑ කියලා කියන එක. අපි එයා ජනාධිපති කරන්නම් කෝ මේ කරදරයෙන් බේරෙන්න. මේ රටේ ජනතාවට සාමයෙන් හුස්ම ගන්න ඕනෑ නැද්ද? "Go home!" කිව්වාම ගියා. දැන්වත් මේ රටේ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න සටන් කරන්න ඉඩ දෙන්නේ නැද්ද? මේ පාලන තන්ත්‍රය පිළිබඳව අපට විවේචන තිබෙනවා; අපට එකඟ වෙන්න බැරි තැන් තිබෙනවා. හරි, ඒවා අපි වෙනම බේරා ගන්නම්. හැම දාම මේ රටේ මිනිස්සු ජාත්‍යන්තර නාළිකාවලට ප්‍රවෘත්ති සපයමින්, මේ රට ලිබියාවක්, අප්‍රිකාවේ තිබෙන රටක සයිස් එකට මේ රටේ ප්‍රතිරූපය හදන එකද අරගළය කියන්නේ? ඒ අරගළයටද සුජාතභාවය දෙන්න යන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ සාධාරණ ආවේගයට මා කවදාවත් ගරහන්නේ නැහැ. එතැන හිටපු තරුණ දූ දරුවන්ගේ අව්‍යාජ අරගළයට මා කවදාවත් ගරහන්නේ නැහැ. තේරුම් ගන්න, මෙතැන තිබෙන්නේ රාජ්‍යය බිඳ වැට්ටවීම බව. මේ තිබෙන්නේ රාජ්‍යය බිඳ වැට්ටවීම. ඒකට ඉඩ දෙන්න බැහැ. මම විපක්ෂයේ හිටියත්, ආණ්ඩුවේ හිටියත්, කොහේ හිටියත් ඒකට ඉඩ දෙන්න කියන්නේ නැහැ.

එහෙම කරනවා නම් ඒක මහා පාපයක්. මට රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් ඇමතිකම් ඕනෑ නැහැ. මට මගේ රාජ්‍යය ඕනෑ. ආර්ථික අර්බුදයෙන් බැට කාලා අපි ගොඩ එන දවසට අපට රාජ්‍යය තිබෙන්නට ඕනෑ. මේ යන්නේ වෙන එකකට නොවෙයි. ජනාධිපති මන්දිරය ඇල්ලුවා. අරලියගහ මන්දිරය ඇල්ලුවා. ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළට ගිහිල්ලා ඒ ආයතනය ඇල්ලුවා. මේ විධියට රාජ්‍ය දේපළ අත්පත් කර ගන්න එක සාමකාමී ද? ඒවාට සාමකාමීයි කියලා කිව්වොත් හෙට දවසේත් ඇවිල්ලා තවත් රාජ්‍ය ආයතන අල්ලා ගනීවි. පාර්ලිමේන්තුවත් අල්ලන්න ආවා. එදා ආරක්ෂක අංශ සුදුසු පරිදි බලය පාවිච්චි නොකළා නම් මොකක්ද වෙන්නේ? හමුදා හටයකුගේ ඔළුවට යකඩ පොලුවලින් ගහද්දිත් වෙඩි තිබ්බේ නැහැ. ඒක තමයි, හමුදාවේ ඉවසිල්ල. අපේ රටේ ඉන්නේ ලෝකයේ ඉන්න හොඳම හමුදාවක්. එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ ලොක්කන්ගෙන් අහන්න, ලංකාවේ හමුදාව මොන තරම් දියුණු හමුදාවක් ද කියලා. හැබැයි, ඒ දියුණුකම කියන්නේ නිවටකම කියලා හිතන්න එපා. අද මොකක්ද මේ කරන්නේ?

මුලින්ම මේ සභාවේ මන්ත්‍රීවරුන් 73දෙනෙකුගේ ගෙවල්වලට ගිනි තියලා දේශපාලනඥයන්ට මානසික වශයෙන් බැරියර් දැම්මා; භය කළා. ඊළඟට, මහා සංඝරත්නයට එක එක තර්ජන කථා කියලා මානසික බාධා පැමිණෙව්වා. ඊට පස්සේ, කලාකරුවන්ට මානසික බාධා පැනෙව්වා. පොලීසියට මානසික බාධා පැනෙව්වා. කවුරු හරි අත් අඩංගුවට අරගෙන සාධාරණ, ඇත්ත චෝදනාවකට උසාවියකට ඉදිරිපත් කළාම නීතිඥයන්

200ක් විතර ඇවිල්ලා සද්දය දානවා. විනිශ්චයකාරවරයාට හිතෙනවා, "යකෝ, මේකට ඇප නොදුන්නොත් මූ මගේ ගෙදර ගිනි තියයි" කියලා. ඒ කියන්නේ, මානසික බාධා පමුණුවනවා. මානසික බාධා පමුණුවලා එදා ඊ පාර්ලිමේන්තුවත් අල්ලා ගත්තා නම් අද රාජ්‍යයක් පවතී ද? ඊට පස්සේ අල්ලා ගන්න තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිල්ලයි, ITN එකයි, රූපවාහිනී සංස්ථාවයි. "අපේ අතට රට ආවා. දැන් අපි කියන විධියට හිටපල්ලා" කියන්න පටන් ගන්නවා. මේක ද අපට ඕනෑ? ආර්ථික අර්බුදයේ පීඩනය අපට තිබෙනවා. ඒක ඇත්ත. ඒකෙන් අපි බැට කනවා. ඒකෙන් අපි ගොඩ එන්න ඕනෑ. හිටපු ජනාධිපතිතුමා ධුරය දරපු අවසන් කාලයේ මම ඒ වැඩ පිළිවෙළ ගෙනාවා. මම ඒ වැඩ පිළිවෙළ ගැන සඳහන් කරන්නම්. අපි විපක්ෂයේ හිටියත් මේ රට වෙනුවෙන් අපටත් වගකීමක් තිබෙනවා.

අපි රුසියාවේ රාජ්‍ය තෙල් සමාගමක සභාපති, CEO ලංකාවට ගෙන්වූවා. ඒ අය ගෙන්වලා කංචන විජේසේකර ඇමතිතුමා සහ මහ බැංකු අධිපතිතුමා එක්ක සාකච්ඡා කළා. ඒ අය 9වැනි දා තමයි රටින් පිටවුණේ. අර කට්ටිය swimming pool එකේ නාන දර්ශන දැකලා ඒ සභාපතිතුමා අපට කථා කරලා කියනවා, "උඹලාගේ රටේ මිනිසුන්ගේ attitude එක අපට ඒකෙන් තේරුණා" කියලා. මම මොකුත් උත්තරයක් දුන්නේ නැහැ. මොන උත්තරයක් දෙන්න ද? ඒක තමයි ජාත්‍යන්තරයට යන ප්‍රතිරූපය. කොහොම නමුත් ඒ සමාගම අවබෝධතා ගිවිසුමක් හදලා එවලා තිබෙනවා. ඒකට එකඟ ද, නැද්ද කියලා කියන්න. එකඟ නම්, ඊළඟට ඒ ගොල්ලන් එවනවා, operating agreement එකයි, guarantee එකයි. හැම මාසයකම ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක ණයක් ලැබෙනවා. මේ අවුරුද්දේ ජනවාරිවල ගන්න තෙල්වල මුදල ලබන අවුරුද්දේ ජනවාරිවල ගෙවන්න ඕනෑ. ඒක හම්බ වෙන්නේත් ලෝක වෙළෙඳ පොළේ තිබෙන මිලට වඩා සියයට 15ත්, සියයට 35ත් අතර අඩු මිලකට. හැබැයි, Ceylon Petroleum Corporation එකේ නීති අංශයේ නිලධාරිනියක් ලිඛිතව දෙනවා, "මේ සමාගමේ නීත්‍යනුකූලභාවය පිළිබඳව සොයා බැලීමෙන් තොරව මෙවැනි ගිවිසුමකට එකඟතාව දීම භයානකයි" කියලා. අපට ණයක් නේ මේ දෙන්නේ.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
ණයක් දෙන්නේ. ඒක ආණ්ඩුවේ ආයතනයක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මේ වෙලාවේ මෙහෙම උදව්වක් කරන මිනිසුන්ගේ පැටිකිරිය හොයන්න ඕනෑද?

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
ණය නේ දෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ණය දෙන්නේ. අපට මොකටද එහේ පැටිකිරිය? ඒ අවබෝධතා ගිවිසුමකට එකඟයි කියලා යැව්වොත්, ඊළඟට එනවා agreement එකයි, guarantee එකයි. Guarantee එක එන්නේ එහේ බැංකුවෙන්. ඒ දෙක ආපු ගමන් agreement එක අත්සන් කරන්න පුළුවන්. ඔවුන් අපට දෙන්නේ බොර තෙල්. එතකොට අපේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවේත් නැවත වැඩ පටන් ගන්න පුළුවන්. ඒ ගොල්ලන් අවුරුදු දෙකකට ගිවිසුම ගහන්නේ. ඒ අවුරුදු දෙකේදී මේ වැඩේ සාර්ථක නම් ඒක ඒ විධියටම අවුරුදු තුන, හතර, පහ දක්වා යනවා. ගරු ඇමතිතුමනි, මම පටු දේශපාලනයෙන් ඒක ගැන හිතනවා නම්, "මේක කෙරුණාට පස්සේ ආණ්ඩුව ස්ථාවර වෙයි. එතකොට අපට මොනවා හරි මැච් එකක් ගහ ගන්න බැරි වෙයි" කියලා හිතනවා නේ. එහෙම නේ වැඩි දෙනෙක් හිතන්නේ. අපි එහෙම හිතන්නේ නැහැ. එහෙම හිතන්නේ නැහැ කියන්නේ අපි මේ රාජ්‍යය බිඳ වට්ටන්න ඉඩ දෙන්නේ නැති නිසායි. ඔය වැඩේට අපි මහන්සි ගන්නේත් රාජ්‍යය බිඳ වට්ටන මෙහෙයුමට තෙල් පෝලිමේ ඉන්න මිනිහාගේ පීඩනය යොදා ගන්න නිසා, ඒ මිනිසුන් ඉක්මනට ගෙදරට යවන්න ඕනෑ නිසායි. තෙල් පෝලිම්වල ඉන්න මිනිස්සු ගෙදර යවන්න නම් මෙන්න මේ වැඩේ කරන්න කියන්න. වර්තමාන ජනාධිපතිතුමාත් හම්බ වෙලා අපි ඒ විස්තර ටික කිව්වා. කොහොමත් තෙල් මාෆියාවක් තිබෙනවා. හැබැයි, සමහර අය කොහෙන් කොහෙන් හරි, එක එක නිලධාරින් ලවා එක එක ලිපි දීලා මේ කටයුත්ත block කරන්නයි හදන්නේ. ඒක අතුරු කථාවක්.

දැන් මෙහෙම යන්න දුන්නොත් මොකද වෙන්නේ? ජනාධිපති මන්දිරයත් වැටලුවා. අපේ ආර්ථික අර්බුදය ඉතා දැනුවත්ව බාහිර පාර්ශ්ව විසින් යොදා ගනිමින් ඉන්නවා රාජ්‍යය බිඳ වට්ටන්න. මෙන්න මේක තේරුම් ගන්න. මහ ජනයාගේ තිබෙන සාධාරණ ආවේගය, සාධාරණ පීඩනය, දුක් ගැනවිල්ල රාජ්‍යය බිඳ වැට්ටවීම සඳහා අවභාවිතාවේ යොදවනවා.

ජාතික රාජ්‍යය කියන එක අපට හොඳට නරකට දෙකටම බලපාලා ඇති. නිදහස් සෞඛ්‍ය සේවය දුන්නා අපට ජාතික රාජ්‍යය හොඳට. නිදහස් අධ්‍යාපනය දුන්නා අපට ජාතික රාජ්‍යය හොඳට. තව තව අවස්ථාවල නරකටත් බලපාලා ඇති. කොහොම නමුත් හොඳට හෝ නරකට මේ ජාතික රාජ්‍යය පවතින්න ඕනෑ. ජාතික රාජ්‍යය බිඳ වට්ටවන්න දීම තරම් අපරාධයක්, පාපයක් තවත් නැහැ. සියෙරා ලියොන් අන්න ඒක කළා, හයිටි රාජ්‍යය අන්න ඒක කළා. මම දැක්කා මේ අරගළයේ ඉන්නවාය කියන කට්ටියක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යාලය ළඟට ගිහින් ජාත්‍යන්තර මැදිහත් වීමක් ඉල්ලනවා. ඒ වාගේම දෙමළ ජාතික සන්ධානයේ සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කොහේද පිට රටකට ගිහින් උතුරු - නැඟෙනහිරට විදේශීය හමුදාවක් ඉල්ලනවා. මෙහෙම වුණොත්, මේවාට ඉඩ දුන්නොත්, තව ටික දවසකින් මේක එනවා උතුරේ හමුදා කඳවුරු ගාවට. "ගලවාගෙන පලයව්" කියනවා; යන්න වෙනවා. ඊළඟට, එනවා ආගමික ස්ථාන ගාවට; කුරගලට. එතැනින් "යන්න" කියනවා; යන්න වෙනවා. මෙහෙම රටක් අපාලිත, අරාජික වෙන්න ඉඩ දීලා බලා සිටීම නොවෙයි කළ යුත්තේ. මම තව පැහැදිලි කරන්නම්. රටක් අරාජික කරන්න කිසිසේත්ම ඉඩ දෙන්න බැහැ. පොළොන්නරුවේ මන්ත්‍රීතුමා මරා දැම්මා. ඒ මනුස්සයා කරපු වරදක් නැහැ. ඒ වාගේම මේ සභාවේ ඉන්න ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාට පහර දුන්නා. ඒ මනුස්සයා කරපු වරදක් නැහැ. මිනිසුන්ගේ පීඩනය දන්න හින්දයි අපට ඒ හැම දෙයක්ම දරා ගන්න පුළුවන්. හැබැයි, රාජ්‍යය බිඳ වට්ටන්න දෙන්න බැහැ. අරගළයේ කාණ්ඩයක් වෙල්ලමුල්ලිවයික්කාල් ගිහින් යුද සැමරුම් ගලවන්න කියයි; කුරගලට ගිහින් පන්සල ඉවර කරන්න කියයි. එහෙම අරගළයකට තමයි සමහරු සුජාතභාවය දෙන්නේ.

ඔබතුමන්ලා හොයලා බලන්න, තායිලන්තයේ එක වෙලාවක තිබුණා කහ කමිසකාරයන්ගේ සටනක්. ඒකත් ගෙදර යන්නේ නැතිව තිබුණු සටනක්. ඒ ගැන සොයලා බලන්න. එහෙත් තිබුණා, නීතිඥ සංවිධානයක්. ඒකට තමයි ඇමෙරිකාව fund කළේ, ඒ සටනට වියදම් කරන්න. ඇමෙරිකාවේ CIA සංවිධානයට අනුබද්ධ NED කියලා සංවිධානයක් තිබෙනවා. 1983දී මේක පටන් ගත්තේ. National Endowment for Democracy තමයි ඒ සංවිධානයේ නම; ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජාතික උරුමය. මේ

[ගරු විමල් වීරවංශ මහතා]

සංවිධානය රටවල් 100ක විතර වැඩ කරනවා. මේ සංවිධානය නීතිය හා සාමාජීය පදනමට 2020 වර්ෂයේදී පමණක් ඇමෙරිකානු ඩොලර් 172,670ක් දීලා තිබෙනවා. මා ළඟ ඒ ලේඛනය තිබෙනවා. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

ඊළඟට, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට 2020 වසරේදී පමණක් ඇමෙරිකානු ඩොලර් 285,000ක් දීලා තිබෙනවා. මීට අමතරව USAID, CSI.ROL ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සිවිල් සමාජ මුලපිරීම සඳහා 2013 - 2017 කාලය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 3.9ක් වැය කර තිබෙනවා. මේ අරමුදල් වැය කරලා තිබෙන්නේ ශ්‍රී ලංකා රජයේ නීතිඥ සංගමය හරහා කියලා තමයි මේ වාර්තාවේ දැක්වෙන්නේ. බලන්නකෝ වැඩේ!

දැන් අපට මානසික බාධා පමුණුවනවා, "මේවා කිව්වොත් ගහයිද දන්නේ නැහැ, මේවා කිව්වොත් ගේ ගිනි තියයිද දන්නේ නැහැ" වාගේ. මේ තමයි මානසික බාධා. ඒවාට යටත් වෙන්න බැහැ. වීඩියෝ එකක තිබෙනවා කොලු ගැටයෙක් හමුදාව ළඟට ගිහිල්ලා හමුදාවට කියනවා, "තොපි යුද අපරාධ කළා. ප්‍රභාකරන් හොඳයි යකෝ උඹලාට වඩා" කියලා. මේ හමුදාවට එහෙම කියන්න පුළුවන් කාටද? මේ හමුදාව තමයි වී බිම්වලින් මිනිස්සු බේරාගෙන මිනිස්සු ළඟ ඉන්න හමුදාව. ඒ හමුදාවටත් දැන් barriers දාන්න යනවා. "කැවුතු ආච්චි" ද කවුද කියලා ගැනු කෙනෙක් ඉන්නවා. ඔය social mediaවල කට්ටිය එයාට කියන්නේ "කැවුතු ආච්චි" කියලා. ඒ අම්මා හමුදාවේ අය ළඟට වෙලා කියනවා, -ආච්චිද, අම්මාද මම දන්නේ නැහැ.- "මුන්ගේ ගෙවල් හොයාගෙන ගිහින් ගිනි තියන්න ඕනෑ, හමුදාවේ අයගේ ගෙවල් හොයාගෙන ගිනි තියන්න ඕනෑ" කියලා. දැන් මේ මොකක්ද කරන්න හදන්නේ? ගෙදර ඉන්න නෝනා හමුදාවේ ඉන්න මහත්තයාට කෝල් එකක් දාලා කියනවා, "අනේ ඔයා නම් ඕවාට පැටලෙන්න එපා" කියලා. අන්න, මානසික බාධා! මෙහෙම සැලසුම් සහගතවයි රාජ්‍යය බිඳ වට්ටන්න හදන්නේ. සරත් ෆොන්සේකා මහත්තයා එදා හමුදාවට නියෝග කළා, "ඔයගොල්ල වෙඩි තියන්න එපා, පහර දෙන්න එපා, මොකුත් කරන්න එපා" කියලා.

සාන්ත දාන්ත තීන්ත කුඩු වාගේ ඔහේ බලාගෙන ඉන්න ලු. ඒ කියන්නේ, පාර්ලිමේන්තුව ඇල්ලුවත් බලාගෙන හිටපන් කියන එකයි. මේක අරාජිකත්වය. මම කියන්නේ ඒ අය අරගලකරුවන් නොවෙයි, අරාජිකකරුවන්; මේ රට අරාජිකත්වයෙන් අරාජිකත්වයට ඇද වට්ටන්නන්. ඒකට ශක්තිමත්ව මුහුණ දීම අත්‍යවශ්‍යයි. හැබැයි, ඒ සඳහා යොදාගන්නා හදිසි නීතිය සාමාන්‍ය සිවිල් ජන සමාජයේ යුක්ති සහගත අයිතිවාසිකම් පොඩිපට්ටම් කරන්න පාවිච්චි කළොත්, ලබන මාසයේ විවාදයේදී අපි මේකට විරුද්ධ වෙනවා. අපේ ඡන්ද ටික තීරණාත්මක නැහැ, හදිසි නීතිය සම්මත කරගන්න. ඒක ඇත්ත. හැබැයි, අපට බැහැ එහෙම වුණොත් මේ හදිසි නීතියට පක්ෂ වෙන්න. අරාජිකවාදීන් රාජ්‍යය බිඳ වැට්ටවීමේ ඒ මහා අපරාධය සිදු කරන එක නතර කරන්න ඕනෑ. ඒකත් එක්ක හුරතල් වෙන සමහර දේශපාලනඥයෝ හිටියාට, අපි නම් ඒ අපරාධයට අකුරකින්වත් සම්මාදම් වෙන්නේ නැහැ, වචනයකින්වත් සම්මාදම් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, NED සංවිධානය විසින් ලංකාවේ විවිධ සංවිධානවලට දී තිබෙන මුදල් ගැන සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා.

මම මේ ටිකයි කිව්වේ. තව සංවිධාන ගණනාවකට ඩොලර් එවා තිබෙනවා. මේවා සමහර YouTubersලාට ගියා. එක එක විධියට මේ දේ වෙලා තිබෙනවා. අපි ගෝල් ෆේස් එක ළඟින් වාහනයක යන කොට, රුසියාවෙන් ආපු දෙදෙනා මට කිව්වා, යුක්රේනයේත් ඔහොමයි වුණේ කියලා. රුසියාවට හිතවත් ජනාධිපති එළවන්න මයිඩාන් පාර්ක් එකට සෙනඟ ආවා. ඒ කෙනා කිව්වා, එහේ American Embassy එකෙන්, ඒ ආපු එක පුද්ගලයෙකුට දවසකට ඩොලර් තුන ගණනේ වියදම් කළා කියලා. ඒ, රුසියානු ජාතිකයා එහෙම කිව්වේ. ගෝල් ෆේස් එකේ තිබුණු අරගළය දිහා බලලා ඔහු කියනවා, "උඹලාගේ රට පාලනය කරන්නේ උඹලාගේ ජනාධිපති නොවෙයි. උඹලාගේ ජනාධිපතිට උඩින් ඇමෙරිකානු තානාපති ඉන්නවා කියලා තමයි මට නම් තේරෙන්නේ" කියලා. කථාව ඇත්ත. ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මම හිතන විධියට සතියකට තුන්පාරක් විතර ජූලි චන්ග් නෝනා හමු වුණා. ඒ නෝනා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට හොඳට මානසික barriers හැදුවා. ගන්න ඕනෑ තීරණ ගැනුණේ නැහැ. එතකොට අර්බුදය උත්සන්න වෙනවා. නමුත්, එතුමා එහෙම කළාය කියා අවසානයේ එතුමාට කොහේවත් රටකින් පිහිටක් ලැබුණේ නැහැ. මම කියන්නේ මේක අපේ තීරණාත්මක මොහොත. අපි අතර මොන වාද භේද තිබුණත් රාජ්‍යය බිඳ වැට්ටවීමේ මේ මෙහෙයුමෙන් අපි මේ රාජ්‍යය බේරා ගන්න ඕනෑ. ඒක අපේ අවම යුතුකමක්. හැබැයි, ඒක කියලා තමුන්නාන්සේලා හදිසි නීතිය දමා ගත්තාට පසුව, "ආයෙත් එන්න. මේ කන්දත් අපේ තමයි, අර කන්දත් අපේ තමයි" කියලා මෝඩ වුන් නම් දමන්න එන්න එපා. එතකොට තමයි මේ රටේ මිනිසුන්ට යකා වැහෙන්නේ, "මුන් තවම පාඩමක් ඉගෙන ගෙන නැහැ" කියලා. හැබැයි, එන එන මිනිහාට “go, home!” කියන්න රටේ අතිමහත් බහුතරයට වුවමනාවක් නැහැ. අර සල්ලි ලැබෙන කට්ටිය විතරයි ඒක ෆෝම් කරන්නේ. ඒ නිසා අපි හිතන විධියට තමුන්නාන්සේලාගේ පාලනයට නොලැබී තිබෙන සුජාතභාවය ඉක්මනින් ඇති කරගත යුතුයි. ඒ වෙනුවෙන් සර්ව පාක්ෂික ජාතික එකඟතා පාලනයක් පිහිටුවීම සඳහා කටයුතු කළ යුතුයි. ඉදිරියේදී අපේ පක්ෂය හැටියට ඒකට අපේ යෝජනා මාලාව, අපේ වැඩ පිළිවෙළ විවෘතව ඉදිරිපත් කරනවා.

අපි කවුරුත් මේ වෙලාවේ වගකීමෙන් කටයුතු කළ යුතුයි. අපිට තිබෙන දේශපාලන කෝන්තර පිරිමහගන්න ගිහිල්ලා අවසානයේ මේ රට සියෙරාලියෝන් එකක්, එහෙම නැත්නම් අප්‍රිකාවේ හයිටියක්, එහෙම නැත්නම් ලිබියාවක් බවට පත් වෙන්න ඉඩ නොදිය යුතුයි. ඒක අපේ අවම වගකීම. මේ රාජ්‍යය තුළ ජීවත් වෙන්න ඕනෑ නම්, මේ රාජ්‍යය තුළ අපේ දරුවෝ හැදී වැඩෙන්න ඕනෑ නම් මේ අරාජිකවාදීන්ට ඉඩ නොතැබිය යුතුයි. ඒ සඳහා සාධාරණ ලෙස කටයුතු කළ යුතුයි.

දැන් කිව්වා, ජාතික රූපවාහිනියට පැනපු කෙනාව ප්ලේන් එකෙන් ගෙනාපු විධිය කැතයි කියලා. ඒ පුද්ගලයා ජාතික රූපවාහිනියට පැනපු විධිය හොඳයිද? මට ඒ වෙලාවේ ඒ ගැන අහන්න හිතුණා. ඒ වුණාට හොඳ නැහැ නේ, බාධා කරන්න. ඒ පුද්ගලයා ජාතික රූපවාහිනියට පැනලා "අපි තමයි අරගළය" කියලා පෝදා වැඩසටහන් නැවැත්තුවා. ඒක හොඳද? *[බාධා කිරීමක්]* දරුවෙක්ද, ඒ? ඒ දරුවෙක් නම්, උන්දැගේ අප්පච්චි කවුද කියලා හොයන්න ඕනෑ. *[බාධා කිරීමක්]* අප්පච්චිද ඒ කථා කළේ? ඒ දරුවන්ගේ අප්පච්චිද ඒ කථා කළේ? දරුවෝ වාගේ නොවෙයි, එදා මරුවෝ වාගේ හැසිරුණේ. මම මේ කියන්නේ තිබෙන පීඩනය නිසා හදවතින්ම ආපු අවංක තරුණ කෙල්ලෝ, කොල්ලෝ ගැන නොවෙයි. මම මේ කියන්නේ මේ සැලසුමේ පිටපත ලියා පිටපතට අනුව වැඩේ කරන කට්ටිය ගැනයි. ඒ නිසා ඒ ඇත්ත දරුවෝ ටික වරද්දා ගන්න එපා. මේ කියන්නේ මරුවෝ ගැන.

***** ***පුස්තකාලයේ තබා ඇත.***

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

එක පක්ෂයක නායකයෙක් කියා තිබෙනවා, ව්‍යවස්ථාවෙන් පිට බලය පිහිටුවන්න ඕනෑ කියලා. හොඳට තියේවි. මේක තමයි යට තිබෙන agenda එක: රාජ්‍යය බිඳ වට්ටනවා; අනීතික බලයක් පිහිටුවනවා. ඒ හරහා මේ රට සී සී කඩ වෙලා අරාජික වෙනවා. ඊට පසුව උතුර, නැඟෙනහිර වෙන් කරනවා. මේක තමයි සැලැස්ම - plan එක. මේ plan එකට නම් ඉඩ දෙන්න එපා. මේ plan එකට ඉඩ නොදිය යුතුයි. ඒ සඳහා එකමුතුව, කැපවීමෙන් කටයුතු කළ යුතුයි. ආරක්ෂක හමුදාවට, පොලීසියට අපි කියනවා, ඔබ රාජ්‍යය රැක ගන්න කියලා. ඔබ ඉන්නේ ඒකට. ඔබ අපිව රැකගන්න ඕනෑ නැහැ, රාජ්‍යය බිඳ වැට්ටවීමේ පාපතර මෙහෙයුම පරද්දන්න. ඒ වෙනුවෙන් අපි ඉන්නවා, ඔබත් සමඟ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කුමාර වෙල්ගම මැතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මට විනාඩි දහයක කාලයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඒ විනාඩි දහයක කාලය පාවිච්චි කරනවා, ආණ්ඩු පක්ෂයේ කාලයෙන් හරි, විපක්ෂයේ කාලයෙන් හරි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. අනිවාර්යයෙන්ම ඔබතුමාට ඒ අවස්ථාව ලැබෙනවා.

[අ.භා. 1.42]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
විනාඩි දහයට වැඩි වුණත් කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය මහත්මයා ජනාධිපතිවරණයට ගෙනෙන කොට එතුමා ගෙනෙන්න එපාය කියලා කෑ ගහලා කියපු මේ රටේ පළමුවැනි මිනිහා මමයි. පනස්අට ලක්ෂයක් එතුමාට විරුද්ධව ඡන්දය දීපු බව ඇත්ත. නමුත්, හැටනවලක්ෂයක් එතුමාට පක්ෂව ඡන්දය දුන්නේ, ගෝඨාභය මහත්මයා දමපු නිසා. නමුත්, මම දැක්කා, ගෝඨාභය මහත්මයාට මේ කටයුත්ත කරන්න බැහැ කියලා. මොකක්ද, ඒකට හේතුව? මගේ ජීවිතයේ පළමුවෙන්ම මම ගියේ, 1970දී රෝහණ විජේවීර මහත්මයාගේ පන්ති පහෙන් පන්ති තුනකට. ඒ, හොරවල ඩෙනිස්ටන් වත්තේ. විජේවීර මහත්මයා සහ DIG Dharmasekera අතර ඇති වූ සට්ටනය නිසා අපට ඊළඟ පන්ති දෙකට යන්න බැරි වුණා. නමුත්, විජේවීර මහත්මයා වරලත්පිටියේ, පොල්ගම්පල, ජේමවතී ජේමසිංහ මැතිනියගේ ගෙදරට ආවාම ඒ පන්ති දෙකටත් මම ගියා. ඒ, එක අත්දැකීමක්.

අනෙක් කාරණය මේකයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පත්වීමක් යටතේ, 1982 ඉඳලා මම කෙළින්ම අගලවත්ත ආසනයේ සංවිධායකවරයා හැටියට පත් වුණා. දැන් අවුරුදු හතළිහක් වෙනවා. මේ ගෙවුණු අවුරුදු හතළිහේදී මම දැක්කා, 1988-1989 භීෂණය. ඒ භීෂණය ඇති කළේ කවුද, කොහොමද කළේ කියලා දැක්කා. ඇයි, මැතිනිය පැරදුණේ? සිරිසේන කුරේ මහත්මයා එක්ක -අද එතුමා ජීවතුන් අතර නැහැ.- එදා සෝමවංශ අමරසිංහ මහත්මයාගේ නෑකමක් උඩ ගහපු ගිවිසුම නිසා මිනිසුන්ට ඡන්දය දමන්න දුන්නේ නැහැ. මගේ ඇස් දෙකට මම දැක්කා, අගලවත්ත, හල්ලොලුව කියන ගමේ එදා ඡන්දය දමන්න ගිය කෙනෙකු මැරුවා. වලල්ලාවිටදීත් ඡන්දය දමන්න ගිය අයට වෙඩි තිබ්බා. මම මැතිනියගේ ඡන්ද පෙත්සමේදී සාක්ෂි දීපු මිනිහෙක්. ඒ නිසා ඒ ත්‍රස්තවාදය ගැන මම ඉතා හොඳින් දන්නවා.

අද ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. අද තරුණයෝ ඉදිරියට දමලා කවුද පිටුපසින් ඉන්නේ? පිටුපසින් ඉන්නේ ත්‍රස්තවාදී නායකයෝ. ඒක තමයි ඇත්ත කතන්දරය. ත්‍රස්තවාදී නායකයෝ තමයි පිටුපසින් ඉන්නේ. එදා හිටපු නායකයන්ගේ අවතාර දැන් තිබෙනවා. ඔවුන් තමයි ඒ ඉන්නේ. ඔවුන් අර තරුණ ළමයින් ඉදිරියට දමනවා. මම මේ ගැන ඉතාම කනගාටු වෙනවා. මොකද, මේ රටේ ජනතාව හුඟක් දුක් විඳිනවා. ජනතාව අද තෙල් පෝලිම්වල ඉන්නවා; ගෑස් පෝලිම්වල ඉන්නවා. ජනතාවට කන්න විධියක් නැහැ. ජීවන බර ඉහළ ගිහිල්ලා තිබෙනවා. මිනිස්සු පෝලිම්වල මැරෙනවා. මේවා ගැන මම ඉතා කනගාටු වෙනවා. මම ඒක තමයි එදා කිව්වේ, ගෝඨාභයට මේ කටයුත්ත කරන්න බැහැ කියලා. මම ඒ බව දැක්ක නිසායි කිව්වේ.

අද තරුණ ළමයින් අරගළයේ ඉදිරියෙන් ඉන්නවා. මම එදා ගෙදරට යන්න යද්දී කොට්ටාවේ highway entrance එක ළඟදී මෝටර් සයිකල්වලින් කට්ටිය ඇවිල්ලා මාව නවත්වලා, තුන්හාරසියයක් වට වෙලා මට ගහන්න පටන් ගත්තා. මගේ රියැදුරාටත් ගැහුවා. මගේ PSO ඇවිල්ලා මාව බදා ගත්තා, "ගහන්න එපා" කියලා. ඔහුගේ පිටට ගහලා ඔහුව පැත්තකට ඇදලා දැම්මා. මට පොලුවලින් හොඳටම ගැහුවා. එතැන හිටියා, අවුරුදු 35ක විතර තරුණයෝ දෙතුන් දෙනෙක්. ඒ අය කිව්වා, "මෙයාට ගහන්න එපා. මොකද, මෙයා තමයි ගෝඨාභයට විරුද්ධව කථා කළ පළමුවැනි මිනිහා" කියලා. එතකොට අර ගහපු තරුණයෝ මොකද කිව්වේ? "නැහැ, නැහැ. මූත් දෙසිය විසිපහෙන් එකෙක්. මූව මරන්න ඕනෑ" කිව්වා. එහෙම කියලා, මාව අල්ලාගෙන හොඳටම ගැහුවා. මම ගියේ Double Cab එකේ. ඒ වාහනයට ගිනි තිබ්බා. අර අවුරුදු 35ක විතර තරුණයෝ කිහිපදෙනා කිව්වා, "ඔන්න වාහනයට ගිනි තියනවා, පැනගන්න" කියලා. මම කිව්වා, "මට පැනගන්න විධියක් නැහැ, වාහනයේ දොර lock වෙලා" කියලා. ඩ්‍රයිවර්ගේ පැත්තේ දොරෙන් තමයි මට ගැහුවේ. වීදුරු ඔක්කොම කඩලා තිබුණේ. මම කිව්වා, "අනේ, පුළුවන් නම් මාව ඇදලා ගන්න" කියලා. මාව ඇදලා ගන්නකොට කාර් එක ගිනි ගන්නවා. මාව ඇදලා ගන්නකොටත් අර අනෙක් තරුණයෝ මට ගැහුවා.

මාව අල්ලාගෙන ගහනකොට මගේ සරමත් ගැලවිලා වීසි වුණා, කමිසයත් ගැලවිලා වීසි වුණා. හොඳ වෙලාවට මම යටට ඇඳලා හිටියේ. යට ඇඳුම පිටින් මාව පාරට ඇදලා දැම්මා. එතකොටත් මට ගහනවා. මම බලන කොට වාහනය ගිනි ගන්නවා. තව විනාඩි දෙකක් හිටියා නම් වාහනය ඇතුළේදීම ගිනි අරගෙන මම මැරෙනවා. ඊට පස්සේ කවුද තරුණයෙකු මාව කකුලෙන් ඇදගෙන ගිහින් ජේමන්ට් එකේ කෙළවරේ තැබුවාට පසුව අපේ කළුතර ආසනයේ තරුණයෙක් ඇවිල්ලා "මේ අපේ වෙල්ගම මහත්තයා නේ!" කියලා මාව ත්‍රිරෝද රථයක දමාගෙන ඉස්පිරිතාලයට අරගෙන ගියා. මට විතරක් නොවෙයි, එදා 93දෙනෙකුට ගහලා. ඔවුන්ට ඉස්පිරිතාලයට යන්න වුණා. එදා කොහේදෝ ඉඳන් පොලීසියේ වාහනයකුත් ආවා. ඒ අය ඔවුන්ටත් අල්ලාගෙන හොඳටම ගැහුවා. ඔවුන් බෝට්ටුවක එන්ජින් එකක් අරගෙන ආවේ. ඊට පස්සේයි මම ඒ සිද්ධිය දැනගත්තේ. එදා ඒ වෙලාවේ මම ඒක දැනගෙන හිටියේ නැහැ. එදා මට ගහන්න හේතුව මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එදා

[ගරු කුමාර වෙල්ගම මහතා]

මැරුණා නම්, මෙතැන ශෝක ප්‍රකාශ සිදු කරයි. ශෝක ප්‍රකාශ සිදු කළාට පස්සේ ඒක ඉවරයි. අමරකීර්ති අතුකෝරළ මහත්මයා ගැන අද කථා කළා. නමුත් ආයෙත් කථා කරන්නේ නැහැ. මා තමුන්නාන්සේලාට කියන්නේ, ඒ වාගේ දේවලට ඉඩ දෙන්න අපට බැහැ කියලායි.

එදා මට ගහපු තරුණයන් ගැන මම අද දුක් වෙනවා. ඉදිරියට මගේ ආයුෂ අවුරුදු 20ක් තිබුණා නම්, ගුටි කෑවාට පස්සේ දැන් මගේ ආයුෂ අවුරුදු 10ට බැහැලා. එතකොට ඒ අවුරුදු 10 ඉඳලා මම මැරිලා යයි. නමුත් මම කියනවා, ඒ තරුණයන්ට හිරිහැර කරන්න එපා, ඔවුන්ට දඬුවම් දෙන්න එපා කියලා. ඒකට හේතුවක් තිබෙනවා. ඔවුන් පිටුපස ඉන්නේ ත්‍රස්තවාදී නායකයන්. ඒක නිසා ඔවුන්ට හිරිහැර කරන්න එපා. මොකද, මම තව අවුරුදු 10කින් මැරෙයි. නමුත්, ඒ තරුණයන්ට තව අවුරුදු 50ක් ජීවත් වෙන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නියෝජ්‍ය කථානායකතුමාටත් තව අවුරුදු 50ක් ජීවත් වෙන්න පුළුවන්. අපේ රටට තරුණයන් අවශ්‍යයි, රට ඉදිරියට ගෙන යන්න. වැරදි කළත්, වැරදි හරිගස්සාගෙන හෝ ඔවුන් ඉස්සරහට යයි. ඒ නිසා මා කියන්නේ, ඔවුන්ට මොකුත් කරන්න එපා කියලායි. හැබැයි, අපි ඒ ක්‍රියාවලට විරුද්ධ වෙන්න ඕනෑ. මොකද, ත්‍රස්තවාදී නායකයන්ට ඒවා උස්සන්න දෙන්න අපට බැහැ. මම ඒක විශේෂයෙන් කියන්න ඕනෑ.

අනෙක් කාරණය මේකයි. මේක කරන්න පුළුවන් මිනිහෙක් එපා යැ, ගේන්න. අපේ සුසිල් ප්‍රේමජයන්ත මහත්මයා කිව්වා වාගේ එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ ත්‍රස්තවාදය නැති කළා. ඒ අයව පුනරුත්ථාපනය කළා; ඒ අය යහ මඟට ගෙනාවා. ඒ වාගේ දේවල් ගොඩක් කළා. එහෙම කරලාත් ත්‍රස්තවාදී නායකයන් හැටියට ඔවුන් තවමත් එනවා නම්, ඒ දිහා බලාගෙන ඉන්න අපට බැහැ. මා හිතනවා, මේක අනාගත පරම්පරාවටත් ලොකු විනාශයක් කියලා. හොඳ මහත්තුරු තමයි අරගළයට ආවේ. හොඳට මතක තියාගන්න, අරගළයට ආවේ හොඳ මහත්තුරු. ලංකාව පුරා සිටින හොඳ මහත්තුරු අරගළයට ආවේ. නමුත්, ඒ අතරේ අර ත්‍රස්තවාදී නායකයන්ගේ මඟ පෙන්වීම යටතේ ඔවුන්ගේ ගෝලයෝ සිටියා, මේ රට විනාශ කරන්න.

මම කොරෝනා හැදිලා IDH එකේ සිටියා. ඒ ඉස්පිරිතාලයේ ආනන්ද විජේවික්‍රම දොස්තර මහත්මයාටයි, ඒ කාර්ය මණ්ඩලයටයි මම මේ වෙලාවේ විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මාව හෝමාගම ඉස්පිරිතාලයට අරගෙන ගියාම මට වෛද්‍ය ප්‍රතිකාර කරපු surgeon ධම්මික මහත්මයා ඇතුළු සියලුදෙනාට මම අද ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලා නිසා තමයි මගේ ජීවිතය බේරුණේ. ඒ වාගේම මගේ බිරිඳ සහ මගේ දරුවෝ එදා මගේ ළඟ ඉඳන් මට උදව් කළා. ඒ නිසා තමයි අද මට මෙතැන කථා කරන්න පුළුවන්කම ලැබුණේ.

මම තමුන්නාන්සේලාට කියනවා, අපි හොඳ නායකයෙකු තෝරාගෙන තිබෙන බව. තමුන්නාන්සේලා සියලුදෙනා ඒක දන්නවා. මේ තත්ත්වයට මුහුණ දෙන්න පුළුවන් නායකයෙකු තමයි තෝරාගන්න ඕනෑ. මගේ හොඳ මිත්‍රයෙක් තමයි ඩලස්. එතුමා මගේ හොඳ මිත්‍රයෙක්. අනුර බණ්ඩාරනායක මහත්මයාගේ කාලයේ ඉඳලා මම හඳුනන කෙනෙක්, එතුමා. නමුත්, ඒ අය ආවා නම්, ඒ අය නායකත්වයේ සිටියා නම් අර ත්‍රස්තවාදීන් කියන විධියට තමයි ඒ අය නටන්නේ. එහෙම නම් අද මේ තත්ත්වය නැහැ. එහෙම නම් ත්‍රස්තවාදී නායකයෝ කියාවි, "අපි කියන විධියට උඹලා කරන්න ඕනෑ" කියලා.

අනෙක් අතට, විපක්ෂ නායකතුමාටත් මම කියනවා, ඔබතුමා එක්ක සාකච්ඡාවට එන ඒ ත්‍රස්තවාදී නායකයන් ඔබතුමා එක්ක නැති බව. ඔවුන් බොරු කරන්නේ. ඔවුන්ට යහළුවන්, මිත්‍රයන් නැහැ. ඔවුන්ට හිතවත් අය නැහැ. අපි දන්නවා නේ ඒ කාලයේ මැතිනියත් එක්ක ඔවුන් කොච්චර නම් සාකච්ඡාවට ආවාද කියලා, ගරු සභානායකතුමනි. අන්තිමට ගන්නා තීන්දුව මොකක්ද? අන්තිමට ගන්නේ විරුද්ධ පැත්තේ තීන්දුවක්. නමුත්, මෙතුමන්ලා මේ බොරුවට රැවටෙනවා; සාකච්ඡා කර කර මේ බොරුවට රැවටෙනවා. මෙතුමන්ලාට කියනවා, "අපි උඹලාට බලය ලබා දෙනවා" කියලා. නමුත්, ඔවුන්ගේ හිතේ නැහැ, බලය ලබා දෙන අදහස. ඔවුන්ගේ හිතේ තිබෙන්නේ තමන් බලයට ඒමයි. ඔය වැඩේ රණසිංහ ප්‍රේමදාස මහත්මයාටත් කළා. ප්‍රේමදාස මහත්මයා බාබු ළඟ තබාගෙන හිටියා. අන්තිමට බාබු මොකද කළේ? බෝම්බය පත්තු කළා. ඉතින් මේක ඉතාම භයානක අවස්ථාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. අනුර දිසානායක මහත්මයා මේ පාර්ලිමේන්තුවේ ඉඳන් මගේ නම කියලා ප්‍රකාශයක් කළා. මම ඒක ඉස්පිරිතාලයේ ඉන්නකොට තමයි දැක්කේ. මා SLTB එකේ වාහන අමතර කොටස් - motor spare parts - ගෙනැල්ලා වංචාවක් සිදු කර තිබෙනවා කියලා කිව්වා. යහ පාලන ආණ්ඩුව කාලයේ මට නඩු දෙකක් දැම්මා. එකක් තමයි, එතුමා කියපු ඔය නඩුව. අනෙක් එක තමයි, මම නියෝජ්‍ය සභාපති කෙනෙකු පත් කළා කියන එකට අදාළ නඩුව. දැනට සති දෙකකට විතර ඉස්සෙල්ලා ඒ නියෝජ්‍ය සභාපතිගේ නඩුව Commission to Investigate Allegations of Bribery or Corruption මඟින් ඉල්ලා අස් කර ගත්තා. ඒ නඩුව ඉස්සරහට ගෙන යන්න බැහැ. ඒ වාගේම, මම මෙතැන දී නඩු අංකය කියනවා; Supreme Court එකේ FR - 14216. එම නඩුවේ විනිශ්චයකාරවරු තුන්දෙනෙක් ඉඳලා තිබෙනවා. ඒ අය තමයි සිසිර ජේ. ද ආබෲ, මුර්දු එන්.බී. ප්‍රනාන්දු, එස්. තුරෛරාජා යන විනිශ්චයකාරවරු. ඒ විනිශ්චයකාරවරුන් අන්තිමට කියනවා, "මේ නඩුව ඉස්සරහට ගෙන යන්න බැහැ" කියලා; “Learned Senior State Counsel appearing for the respondent submits that no evidence has been revealed against the petitioner in the course of the investigation conducted by the FCID”. ඒක dismiss කළා. ඉතින්, යහ පාලන ආණ්ඩුව කාලයේ මේ නඩු දමන කොට හිටපු කොටස්කාරයන් තමයි, මේ ගොල්ලන්. මේ ඉන්න බොහෝ දෙනෙකුට එදා නඩු දැම්මා. ජොන්ස්ටන්ට නඩු දැම්මා. රෝහිතට නඩු දැම්මා. මේ ඔක්කෝටම වාගේ නඩු දැම්මා. මම ඉහත කියපු කොටස්කාරයෝ තමයි අපේ නම් නරක් කරන්න හදන්නේ. එහෙම ලෙහෙසියෙන් අපේ නම් නරක් කරන්න බැහැ. "කුමාර වෙල්ගම" කිව්වාම, ලංකාවේ නොදන්නා කෙනෙක් නැහැ. අද ඕනෑ කෙනෙක් දන්නවා, 'මේ මිනිහා කෙළින් කථා කරන මිනිහෙක්' කියලා. ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමනි, මම විශේෂයෙන් ඔබතුමාට කියනවා, මම කියපු ඒ කාරණය හරි ද, වැරදි ද කියා ඔබතුමාට පුළුවන් නම් බලන්න කියලා. මම දැන් නඩු නොමිමරයත් දුන්නා.

මම මීට වඩා කථා කරන්නේ නැහැ. අපේ දිනේෂ් ගුණවර්ධන මහත්මයාටත් මම සුබ පතනවා. මොකද, අපේ මහින්ද රාජපක්ෂ මහත්මයා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාව ජනාධිපතිවරණයට දමන්න හදන කොට මම කිව්වා, "එතුමාව දමන්න එපා. දානවා නම්, දිනේෂ් ගුණවර්ධන මහත්මයාව දමන්න. මොකද, එතුමාට ජ්‍යෙෂ්ඨත්වය තිබෙනවා. ඒ ජ්‍යෙෂ්ඨත්වය මත එතුමාට අවස්ථාව දෙන්න" කියලා. මා එසේ කියූ බවට අර ඉන්න ජොන්ස්ටන් ප්‍රනන්දු හිටපු ඇමතිතුමා, රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමතිතුමා සාක්ෂි දෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථාව දැන් අවසන් කරන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම එදා මහින්ද මහත්මයාගෙන් ඇහුවා, "ඔබතුමාගේ තාත්තාත් එහා පැත්තට ගියේ ඇයි?" කියලා. එතුමා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයාත් එක්ක ගියේ ඩී.එස්. සේනානායක මහත්මයා මැරුණාම ජ්‍යෙෂ්ඨත්වය අනුව බණ්ඩාරනායක මහත්මයාට අගමැතිකම දුන්නේ නැති නිසා. ඒ නිසා දිනේෂ් ගුණවර්ධන මහත්මයාගේ නම ජනාධිපතිවරණයට දාන්න කියලා මම එදා කිව්වා. මම අද සන්තෝෂ වෙනවා. එතුමා හොඳ මහත්මයෙක්. ඒ වාගේ මහත්මයෙක් අද අගමැති පුටුවේ සිටින එක ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා.

අනෙක් කාරණය මේකයි. මම අසනීපවෙලා ඉන්න වෙලාවේ දී වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා මාව බලන්න ආවා. එතුමා මාව බලන්න ඇවිල්ලා මමත් එක්ක කථා කර කර හිටියා; මගේ දුක සැප බැලුවා. ඒ වාගේම එතුමා දොස්තර මහත්වරුන්ටත් කිව්වා, මම ගැන සොයා බලන්න කියලා. මම මේ වෙලාවේදී එතුමාටත් ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම, අපේ වත්මන් සභානායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමාත් අපේ පක්ෂය වෙනුවෙන් හුඟාක් දරදිය ඇදපු කෙනෙක්. එතුමාත් චන්ද්‍රිකා බණ්ඩාරනායක නෝනාගේ ළඟ ඉඳගෙන මැතිවරණ ව්‍යාපාරය ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියලා උදව් උපකාර කරපු කෙනෙක්. එම නිසා මම එතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

මම විපක්ෂයේ අයට කියනවා, පැත්තකට වෙලා ඉන්නේ නැතිව දැන් අපි සර්ව පාක්ෂික ආණ්ඩුවකට යමු කියලා. අපි සර්ව පාක්ෂික ආණ්ඩුවකට යන්න ඕනෑ. අපි මේ රට ගැන හිතන්න ඕනෑ. රටේ අනාගතය ගැන හිතන්න ඕනෑ. මේ රටේ දරුවන්ගේ අනාගතය ගැන හිතන්න ඕනෑ. අපි මේ රටේ දරුවෝ ගැන හිතලා සර්ව පාක්ෂික ආණ්ඩුවකට ගිහිල්ලා, අපේ සම්පූර්ණ සහයෝගය මේ රට වෙනුවෙන් දෙන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට මේ රට කරන්න බැරි වුණොත්, දැන් ගෙවල්වල ඉන්න මහත්වරු - මම කියපු වැදගත් මහත්වරු- ආපහු කෝච්චිවල නැඟලා ඒවි. ඒක නවත්වන්න බැහැ. කෝච්චිවල නැඟලා ඒ අය ඒවි. නමුත්, එතුමා හරියට මේ රට පාලනය කළොත් මේ රටේ මිනිස්සු එතුමාට ස්තුතිවන්ත වේවි. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ***ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (DR.) SUREN RAGHAVAN *took the Chair.*

[අ.භා. 1.58]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මගේ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ නායකයා වන ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවෙන් පිටතත්, අද දවසේ මේ පාර්ලිමේන්තුව ඇතුළේදීත් අපට අහන්න ලැබුණා, "මේක සාමකාමී අරගළයක්; බොහොම අහිංසක අරගළයක්" කියන වචන ටික. එසේ කියමින් ඒ අරගළයට උප්පැන්න සහතික දෙන ආකාරය අද දවසේත් අපේ පාර්ලිමේන්තුව තුළ අහන්න, දකින්න ලැබුණා. හැබැයි, ඒ අය අද කුමාර වෙල්ගම මැතිතුමා කරපු කථාව අහගෙන හිටියා ද කියලා මම අහන්න කැමැතියි. ගරු කුමාර වෙල්ගම මැතිතුමනි, ඔබතුමා කරපු කථාව මේ රටේ ජනතාව අද අහගෙන සිටියා. ඔබතුමාගේ කථාවේ තිබෙනවා, සාමකාමී අරගළයෙන් ලැබිච්ච තත්ත්වය මොකක්ද කියන එක. ඔබතුමා අද බොහොම සංවේදී කථාවක් කළේ. එදා තව විනාඩි දෙකක් ගතවුණා නම් මේ කෘතහස්ත දේශපාලන නායකයාගේ ජීවිතය නැති වෙනවා. එදා එවැනි දෙයක් සිදු වුණා නම්, අපි මෙතැනට ඇවිල්ලා කියාවි, "එතුමා වෙනුවෙන් අපේ ශෝකය ප්‍රකාශ කරනවා" කියලා. මේක තමයි මේ අරගළයෙන් අපට ලැබිච්ච දේ.

අරගළයට අද මොකක්ද සිද්ධවෙලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උත්සාහ කරන්නේ වෙන මොකකටවත් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට වෙනම කැලෑ නීතියක් එක්ක, කැලෑ රජයක් මේ රට තුළ ස්ථාපිත කරන්නේ කොහොමද කියලායි මේ බලන්නේ. කැලෑ නීතිය. 1988-89 කාලයේත් මේ රටේ කැලෑ නීතිය තිබුණු ආකාරය අපි දැක්කා. 1971දීත් මේ රටේ කැලෑ නීතිය තිබුණා. ඒ තිබුණු කැලෑ නීතිය නැවත ස්ථාපිත කිරීමට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ.

විමල් වීරවංශ හිටපු ඇමතිතුමා අද කථා කළා. එතුමා අද හොඳ කථාවක් කළා. එතුමා කිව්වා, "දැන්, ගෝඨා ගෝ හෝම්" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගෝඨා ගෝ හෝම්" කිව්වාට පස්සේ ගෝඨා ගියා. එතුමාට යන්න ගේකුත් නැහැ. දැන් එතුමා ඉන්නේ සිංගප්පූරුවේ. දැන් එතුමාට සිංගප්පූරුවෙනුත් යන්න කියනවා. තවමත්, "ගෝඨා ගෝ හෝම්" කියලා නළලේ පටි බැඳගෙන කට්ටිය ඉන්නවා. තවමත් එතුමාට යන්න ලූ. දැන් ඊළඟට කියනවා, "රනිල් ගෝ හෝම්" කියලා. මේ ආණ්ඩුව නියෝජනය කරමින් අපි කියනවා, මේ පාර්ලිමේන්තුවේ කවුරු හරි නැඟිටලා කියන්න, රනිලුත් "ගෝ හෝම්" නම් කාවද ගේන්න ඕනෑ කියලා? මේක වක්‍රාකාරව කියන්න ඕනෑ නැහැ, කෙළින්ම කියන්න. "අපට ඕනෑ කැලෑ නීතියක්. අපට ඕනෑ තුවක්කුවෙන් භය කරන්න. අපට ඕනෑ කථා කළොත් තුවක්කුව කටට දාලා වෙඩි තියන්න. තිබෙන මිනිහාගේ සල්ලි ටික අරගන්න ඕනෑ. වාහන දෙකක් ගෙදර තිබෙනවා නම් එයින් එකක් අරගෙන නැති

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

එක්කෙනාට දෙන්න ඕනෑ. මෙන්න මේ ක්‍රමය තමයි අපි ක්‍රියාත්මක කරන්නේ" කියලා කෙළින් කියන්න. ඒක කියන්නේ නැතිව, අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට මොකක්ද කරන්න පුළුවන් කියලා බලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනා ගැන එළියේ සිටින අය කථා කරනවා. හැබැයි, තව ටික දවසක් යනකොට මේ 225දෙනාගෙන් බහුතරයක් එක කඳවුරක ඉන්නවා. ප්‍රජාතන්ත්‍රවාදය රජ කරවන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ මේ රට ගෙන යන්න ඕනෑ කියන පණිවුඩය අද ලැබෙනවා. රටේ ජනතාවට ප්‍රශ්න තිබෙනවා. අද තෙල් පෝලිමක් ළඟට ගිහින් බලන්න. ඒ පෝලිම්වල දිග කිලෝමීටර එකයි, දෙකයි. හැබැයි, එතැන ඉන්න මිනිස්සු මේ රටේ කැලෑ නීතියට කැමැති අය නොවෙයි. පසුගිය ඉතිහාසයේ මේ රට ඒ තත්ත්වයට පත් කරපු අවතාර ඒ තෙල් පෝලිම් ළඟට යනවා. ඔවුන් තෙල් පෝලිම් ළඟට ගිහිල්ලා එතැන ඉන්න මිනිසුන්ව අවුස්සලා, "පාරට බහිමු" කියනවා. ඒ අය පාරට බහින එක සාධාරණයි. මොකද, දවස් දෙක තුනක් කන්න නැතිව, වැසිකිළියකට කැසිකිළියකට යන්න නැතිව ඉන්න මනුස්සයාට අඬගහලා "පාරට බහිමු, මෙහෙම රජයක් එක්ක කටයුතු කරන්න බැහැ" කිව්වාම ඒ මිනිහා එනවා. වරද ඒ අයගේ නොවෙයි. ලේ සුවඳ හඳුනන මිනිස්සු ටිකක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා; පසුගිය දා දැනුණු ලේ සුවඳ. ලේ සුවඳ එක්ක විතරයි ඔවුන් ජීවත් වෙන්නේ. ඒ ලේ සුවඳ හඳුනන මිනිස්සු තමයි අද ඒක කරන්න උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අරගළයේ තත්ත්වය මොකක්ද කියලා අපි දැක්කා. ජනාධිපති මන්දිරයට ගියාම අරගළයේ තත්ත්වය හොඳට පේනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජනාධිපති මන්දිරය ඇතුළට ගිය වෙලාවේ ඒක විනාශ කර තිබෙන ආකාරය දැක්කා. ජනාධිපති මන්දිරයේ නඩත්තු කටයුතු වෙනුවෙන් රුපියල් බිලියනයක් වියදම් කරන්න වෙනවා. ඒ කියන්නේ, රුපියල් මිලියන 1,000ක් වියදම් කරන්න වෙනවා. ජනාධිපති මන්දිරය හදන්න රුපියල් බිලියනයක් වියදම් කරන්න වෙනවා ලු. ඉතින්, මේක සාමකාමී අරගළයක්ද? ඒක කාගේ හෝ අම්මා තාත්තාගේ බුදලයක්ද? ඒක රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේවත්, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේවත්, එහෙම නැත්නම් විපක්ෂ නායකතුමාගේවත් දෙයක් නොවෙයි. ඒක මේ රටේ වත්කමක්. මේ රටේ තිබෙන වත්කම අද මේ තත්ත්වයට පත් කරලා තිබෙනවා. හැබැයි, මේකට සාමකාමී අරගළය කියලා තමයි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෘත්තීය සමිති නායකයෙක් හිටපු ජනාධිපතිතුමාගේ නිල කොඩිය අරගෙන ගිහිල්ලා, ඒ කොඩිය bedsheet එකක් විධියට පාවිච්චි කරලා, ඒ කොඩිය උඩ නිදාගෙන voice-cut එකක් දෙන ආකාරය මම අද වීඩියෝ පටයකින් දැක්කා. දැන් එයා ලු, ජනාධිපති. මේ රට මේ තත්ත්වයට පත් වෙන්නේ කොහොමද?

ආණ්ඩුවක් හැටියට අපි ජනතාවගේ ප්‍රශ්න විසඳන්න ඕනෑ; ජනතාවට ඇහුම්කන් දෙන්න ඕනෑ. ඒක වත්මන් ජනාධිපතිතුමා, වත්මන් අගමැතිතුමා ඇතුළු රජයේ වගකීමක්. අපි තෙල් ප්‍රශ්නයට අනිවාර්යයෙන් විසඳුමක් ලබා දිය යුතුයි. මොන දේ නැති වුණත්, තෙල් ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඕනෑ කියලා මේ ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන අපි අරගළ කරනවා. අපට ඕනෑ මේ තෙල් පෝලිම් නවත්වන්න. ඒ තෙල් පෝලිම් ඇතුළේ මම ඉහතින් කියපු ත්‍රස්තවාදී නායකයෝ ටික ඉන්නවා. ඒ පෝලිම් ළඟ ඉඳගෙන තමයි මේ ගොල්ලන් ඒ කටයුතු ලැහැස්ති කරන්නේ.

අපේ වත්මන් රාජ්‍ය නායකයා හැටියට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා, විදේශ තානාපතිවරුන්ට දෙන උත්තර පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. විදේශ තානාපතිවරුන් හිතා ගෙන ඇති මේ රට පාලනය කරන්නේ ඔවුන් කියලා. එහෙම එකක් නැහැ. මේ රට ස්වෛරී රාජ්‍යයක්. මේ රටේ ජනාධිපති, අගමැති ඇතුළු ආණ්ඩුව තමයි මේ රට පාලනය කරන්නේ. විදේශ තානාපතිවරුන්ගෙන් මම මේ කාරණය අහනවා. පසුගිය කාලයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැත්තෑහතකගේ ගෙවල් දොරවල් ගිනි තැබුවා. අමරකීර්ති අතුකෝරළ මන්ත්‍රීතුමාට මහ මඟදී ගහලා, මරා දැම්මා. කුමාර වෙල්ගම මැතිතුමාගේ ජීවිතය බේරුණේ අනූනවයෙන්. අපේ පක්ෂයේ -පොහොට්ටුවේ- ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ, නගරාධිපතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ ගෙවල් විශාල ප්‍රමාණයක් ගිනි තැබුවා. හැබැයි, මේ එක තානාපතිවරයෙක් හෝ තානාපතිවරියක් ඒ ගැන වචනයක් කථා කළාද? කනගාටුව ප්‍රකාශ කළාද? එක ට්විටර් පණිවුඩයක් නිකුත් කළාද? එකක්වත් දුන්නේ නැහැ. අපි මානවයෝ නොවෙයිද? ඒ විධියට කඩ වෙලා තිබෙන්නේ අපේ මානව හිමිකම් නොවෙයිද? අපි මානවයෝ නොවෙයි! මේක පුදුම වැඩක් නේ. හැබැයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කොන්ද කෙළින් තබා ගෙන ඇමෙරිකානු තානාපතිතුමාට උත්තරයක් දුන්නා.

ඔබේ රටේත් අහවල් කැපිටල් ගොඩනැඟිල්ල බේරා ගත්තේ මෙන්න මේ විධියට කියලා එතුමා කිව්වා. දැන් පුදුම වැඩක් වෙලා තිබෙන්නේ. මීට පස්සේ මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන බොරුවට දිවුරුම් දෙයි ව්‍යවස්ථාව රකිනවා කියලා. මෙතැන ඉඳගෙන බොරුවට කියනවා, "අපි ව්‍යවස්ථාවට අනුව ප්‍රජාතන්ත්‍රවාදය කරනවා" කියලා. නමුත් මේ පාර්ලිමේන්තුව ඇතුළේම ඉඳගෙන අඬගහනවා, පාර්ලිමේන්තුව වටකරලා කැලෑ නීතිය ගෙනෙමු කියලා. ඒ නිසා අපි එක දෙයක් කියන්න කැමැතියි. මේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය කියන්නේ අවුරුදු 30ක් තිස්සේ මේ රටේ තිබුණු යුද්ධය අවසන් කළ වීරෝදාර රණ විරුවෝ. දැන් පටන් ගන්න යන්නේ ඒ වීරෝදාර රණ විරුවන්ට එරෙහි ඉතිරි අරගළයයි. වීරෝදාර රණ විරුවන්ට එරෙහිව ඊළඟ අරගළය පටන් අරගෙන රණ විරුවන්ගේ චිත්ත ධෛර්යය වට්ටන්න පුළුවන්ද කියලා බලනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ රටේ ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හැම සාමාජිකයකු වෙනුවෙන්ම රජයක් හැටියට අපි පෙනී ඉන්නවා කියන එක බොහොම ගෞරවයෙන් මම මතක් කරනවා.

දැන් අපේ ගිනි තියන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආයෙත් ගිනි තියන්න තිබෙන්නේ පොළොව. ඒ ගිනි තියපු ඒවා හැදුවාද? නැහැ. දැන් ගිනි තියන්න තිබෙන්නේ පොළොව තමයි. එහෙම නැත්නම් අපේ ජීවිත ගන්න ඕනෑ. නිවටයෝ වාගේ ඉන්නවාට වඩා ජීවිතය දෙන එක හොඳයි.

මේ 225දෙනා අතරේ ගේම්කාරයෝ ඉන්නවා. මේ 225දෙනා අතරේ කැලෑ නීතියෙන් රජය ගන්න පුළුවන්ද කියලා බලන අය ඉන්නවා. ඒ වාගේම අවුරුදු 30ක් තිස්සේ වේළුපිල්ලේ ප්‍රභාකරන්ට කර ගන්න බැරි වුණු දේ දැන් කර ගන්න පුළුවන්ද කියලා බලන තව කොටසකුත් මේ අය අතරේ ඉන්නවා. එහෙම නම් දැන් මේක ඉර ගහලා බෙදා ගනිමු. අපේ රට ආරක්ෂා කර ගන්න ඕනෑ, මේ 225 ඇතුළේයි. අපි හරියට බෙදුණොත් අපට මේ සීමාව තුළ රටට පණිවිඩයක් දෙන්න පුළුවන්. ඒ නිසා අපි ඔක්කෝම ඒක රාශි වෙලා මේ පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය, ඒ වාගේම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට දිවි හිමියෙන් කැප වෙනවා කියා මතක් කරමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම කාලය පිළිබඳ සැලකිලිමත් වෙන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි නවයක් තිබෙනවා නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මට ලැබිලා තිබෙන කථික ලැයිස්තුව අනුව ඔබතුමාට විනාඩි අටයි තිබෙන්නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අද දවසේ විවාදයට පැයක කාලයකුත් වැඩි වුණා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම්, ඔබතුමාගේ පක්ෂයේ කාලයෙන් විනාඩියක් ගන්න වෙනවා. ඔබතුමා කථාව පටන් ගන්න.

[අ.භා. 2.08]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Okay, thank you.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම නව අගමැති ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට සහ නව සභානායක ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට සුබ පතනවා. එතුමන්ලාගේ වගකීම් සාර්ථකව කරගෙන යාමට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

Sir, my emergency is to save lives from hunger; my emergency is for food security; my emergency is for cooking gas and fuel; my emergency is to get our children back to school and my emergency is for medical security. So, my emergency is for survival. But, this Emergency brings fear into the lives of the people. I am in Parliament to fight for an emergency for survival, to make our people live, not to kill.

අද අපි මේ විවාදයේදී ගොඩක් කථා කළේ අරගළය ගැනයි. අරගළකරුවන් දසදෙනෙක් හිටියා නම්, නවදෙනෙක් අහිංසකව ඒ අයගේ කාර්ය භාරය කරගෙන ගියා. නමුත්, ඔය දසදෙනාගෙන් එක්කෙනෙක් නීති විරෝධීව ක්‍රියා කළා වෙන්න පුළුවන්. හුඟක් වෙලාවට අපි පහර එල්ල කළේ නීති විරෝධීව ක්‍රියා කළ අයටයි. ඒක හරි. කවුරු හෝ වේවා නීතිය කඩකළොත් ඒ කෙනාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්නම ඕනෑ. මම මේක කියන්න හේතුවක් තිබෙනවා. අහිංසක අයට නීති විරෝධී ක්‍රියා හේතුවෙන් බොහෝ ප්‍රශ්න ඇති වූ බව මම දන්නවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පෞද්ගලික නිවස ගිනිබත් කිරීම මා තරයේම හෙළා දකිනවා. අපි දේශපාලනයේ හිටියාට අපේ පවුල්වල අය -බිරිඳ, දරුවන්, අම්මලා, තාත්තලා, ආච්චිලා, සීයලා- මේවාට සම්බන්ධ නැහැ. පෞද්ගලික නිවසක් ළඟට ගිහින් විරෝධය පළ කරන එකටත් මම නම් විරුද්ධයි. අපි මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතුයි. මම දන්නවා, කුමාර වෙල්ගම මගේ මිත්‍රයාට සිදුවුණු දේ. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. මමත් මැයි නවවැනි දා නුලෙන් බේරුණා, පොලු පහරක් කන්න ගිහිල්ලා. *[බාධා කිරීම්]* දුවන්න පුළුවන් නිසා හොඳයි නේද? මම මේ සිද්ධීන් කිව්වාට අපි මේ එකක්වත් අනුමත කරන්නේ නැහැ. නමුත්, අපි මේවා අමතක නොකළ යුතුයි. මේ අරගළයට බලපෑ නොයෙක් හේතු තිබෙනවා. ඒකෙන් කිව්වේ system change එකක් ඕනෑ කියලායි. අරගළකරුවන් ඉල්ලන්නේ යම්කිසි වෙනසක්. ඒ වෙනස්කම්වලින් එකක් තමයි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුත් වෙනස් වෙන්න ඕනෑ කියන එක. ඒක, ඒ අයගේ ඉල්ලීමක්.

අද එක ඇමතිවරයෙක් කිව්වා, ජනාධිපති මන්දිරයට ගිය පිරිස සබන් ගාමින් ඒකේ swimming pool එකේ නෑවා කියලා. මේ රටේ තිබෙන බරපතළම අපරාධය ඒකද? කැලෑ එළි කිරීම, පස් කැපීම වැනි ක්‍රියා සිදු කරලා පරිසරය විනාශ කිරීම, ඒ වාගේම කප්පම් ගැනීම වැනි දේවල් සම්බන්ධයෙන් මේ සමහරුන්ට අත්හිට වූ නඩු තීන්දු පවා දීලා තිබෙනවා. එහෙම තියෙද්දි, අපි මේ පාර්ලිමේන්තුව තුළ අරගළකරුවන්ට විරුද්ධව කථා කරනකොට ඒ ජනතාව අපි දිහා බලලා,"මේ අයත් වෙනස් කරන්න ඕනෑ" කියන කථාව කියනවා.

අරගළකරුවන් අශීලාචාර ලෙස හැසිරුණා කියලා ප්‍රසන්න රණතුංග ඇමතිතුමා කිව්වා. රටේ ජනතාව අපේ හැසිරීම දිහා බලලා කියනවා, මේ අයගේ අශීලාචාර හැසිරීම නිසා තමයි අපිත් මේ system change එකක්, වෙනසක් ඉල්ලන්නේ කියලා. There is a difference between being legal and being legitimate. Gotabaya Rajapaksa was legal, but not legitimate. So, he had to go home. We see that the Hon. Ranil Wickremesinghe has now been made President. He is legal, but is he legitimate? People are questioning that. Members of Parliament like myselfe are legal, but are we legitimate? That is the question that people are asking. That question has to be answered.

අරගළයෙන් ඉල්ලන්නේ වෙනසක්. මොකක්ද, මේ වෙනස? ඒ අය කියනවා, ජන සභාවක් පිහිටුවන්න කියලා. මම අහගෙන හිටියා, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා නම් කථා කරනකොට කිව්වා, අපි එය කළ යුතුයි කියලා. ඒක හොඳයි, ඒක කළ යුතුයි. අපි තීරණවලට එනකොට ඒ තරුණ තරුණියන්ගේ, වෘත්තීයවේදීන්ගේ, විද්වතුන්ගේ ඒ වාගේම සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ අදහස්වලට අවධානය යොමු කරන්න ඕනෑ. මේ දේවල් කරන්න අපි හදිසි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ආහාර, ඉන්ධන, ගෑස්, අධ්‍යාපනය, සෞඛ්‍යය, පොදු ප්‍රවාහන සේවය, විදුලිය සම්බන්ධයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

අරගළයේ යෙදෙන පිරිස ගොවීන්ගේ ප්‍රශ්න ගැන කියනවා. විශේෂයෙන්ම ගොවි ණය ගැන කියනවා; microfinance ගැන කියනවා; ලීසිං ගැන කියනවා; කුඩා ව්‍යාපාරිකයන් ගැන කියනවා. ඒ වාගේම රඳවාගෙන සිටින සාමකාමී විරුද්ධවාදීන් නිදහස් කරන්න කියලාත් ඔවුන් කියනවා. ඒ අතරේ, සමහරු අත්අඩංගුවට ගන්න කියලා දැන් නියෝග නිකුත් කර තිබෙනවා. මම මේ කථා කරන වෙලාවේත් කොළඹ කොටුව පැත්තේ කාර්යාලවලට, තවත් නොයෙක් තැන්වලට CID එකේ අයත්, සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරිනුත් ගිහිල්ලා පින්තූර පෙන්වලා අසමින් ඉන්නවා, මේ අය ඉන්නවාද කියලා. ඒ වාගේම අහනවා ලු, මේ අයව හොයන්න එම ස්ථාන ඇතුළට යන්න පුළුවන්ද කියලාත්. දැන් මම මේ කථා කරන අතර මට ලැබුණු telephone calls ගැනයි මම මේ කියන්නේ. ඒ වාගේම සමාජ මාධ්‍යවල තිබුණා, ගුවන් යානයක් ඇතුළටත් ගිහිල්ලා කාවද පැහැර ගෙන ආවා කියලා. ඒක හරි ද, වැරදි ද කියලා කියන්න මම දන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් වගකියන ඇමතිවරයෙක් ඉන්නවා නම්, ඒක ගැන කිව්වොත් හොඳයි. ඒක පරණ තොරතුරක්ද, ඊයේ-පෙරේදා වෙච්ච එකක්ද කියලා කිව්වොත් හොඳයි. එහෙම අත්අඩංගුවට ගැනීමක් සිද්ධ වෙනවා නම්, ආගමන විගමන කටයුතුවලදී ඒක කරන්න ඕනෑ. එහෙම නැතිව, ගුවන් යානය ඇතුළේදී නොවෙයි ඒක කරන්න ඕනෑ. මොකද, ශ්‍රී ලංකා ගුවන් සේවාවේ නම්බුනාමයට, කීර්තියට ඒක පහරක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කට්ටිය කියනවා, දූෂණයට විරුද්ධව ක්‍රියා කරන්න කියලා. ඒ වාගේම අපට වත්කම් බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කරන්න කියනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කරන්න කියනවා. දැනටම ඒ නීතිය හදලා තිබෙනවා, Attorney-General's Department එක මඟින්. ඒක ගේන්න ඕනෑ. ඒක ගේන්න කියා මමත් ඉල්ලනවා. ඒ වාගේම සොරකම් කළ වත්කම් අය කර ගැනීම - stolen assets recovery - සඳහා දැනට නීතියක් නැහැ. ඒවාටත් නීති ගේන්න කියලා අපි කියනවා. ඒ වාගේම අපි දන්නවා, අවුරුදු 28ක් තිස්සේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවක් තිබුණාට එක ප්‍රසිද්ධ දේශපාලනඥයෙක්වත්, නිලධාරියෙක්වත් නඩු තීන්දුවකින් වරදකරුවෙකු බවට පත් කරලා නැති බව. ඉතින්, ඒවා නිසා අපි ගැන රටේ ඉබේටම මතයක් ඇති වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
තව මොහොතකින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා අප ගැන ඉබේම ඇති වී තිබෙන ඒ මතයට අපි උත්තර දෙන්න ඕනෑ. ඉතින් අපි රජයට කියනවා, මේ නීති-රීති ගේන්න කියලා. විධායක ජනාධිපති ක්‍රමය හරහා තමයි මේ ප්‍රශ්න ඇවිල්ලා තිබෙන්නේ. ඒ වාගේම අපි කෙටි කාලයකින් මැතිවරණයකට යන්න ඕනෑ. තවත් ඉල්ලීමක් තිබෙනවා, "අපි බහුපාර්ශ්වික ආණ්ඩුවක් හදමුද?" කියලා. මේ ජනාධිපතිතුමා ඉස්සෙල්ලා පෙන්වන්න ඕනෑ, මේ දේවල් කරන්න එතුමා ලැහැස්තියි, මේ දේවල් කරනවා කියලා. නැත්නම් මේක කරන්න බැහැ. මම කථා කරන්නේ නීතිය කඩ කරන අය ගැන නොවෙයි.

අරගළය පාගාගෙන ඉස්සරහට යන්න එපා. අපි ඒ මාර්ගයේ ගියොත් අපට වරදිනවා. මාස තුනක් තමයි හදිසි නීතිය පාවිච්චි කරලා පුද්ගලයකු අත්අඩංගුවේ තියා ගත්තේ. ඒක අවුරුද්දකට වැඩි කරන්න යනවා. අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. ඒක කරන්න එපා. මම කියන එක පොඩ්ඩක් අහන්න. උතුරේ මිනිසුන්ට කළ වැඩේ තමයි මේ කරන්න හදන්නේ. දකුණේත් ඒක කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේම පාර්ලිමේන්තුවේ රැඳී ඉඳලා අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කරපු කථාවලට සවන් දෙන්න මට අවස්ථාව ලැබුණා. ඒ කථාවලට සවන් දෙනකොට මට මතක් වුණා, මෙන්න මෙහෙම එකක්. ඇත්තටම මිනිසකු පරිණත වන්නේ ඔහු විශාල දේවල් ගැන කථා කිරීමට පටන් ගත් විට නොවෙයි, කුඩා දේවල් තේරුම් ගැනීමට පටන් ගත් විටයි. මේ පුංචි පුංචි දේවල්වත් තේරුම් නොගිය පිරිසක් තමයි මේ වෙනතුරු මේ සභාවේ කථා කළේ. ඒ නිසා තමයි කොල්ලන්ට ආපසු පාරට බහින්න කියලා අපේ විපක්ෂයේ සමහර ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරු අඬ ගහන්නේ. ඒ වාගේම, සමහර අය කොල්ලන්ට කියනවා, "වැඩේ අතට ගන්න. අතහරින්න එපා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විධියට 1980 අගත්, 1990 මුලත් අධ්‍යාපනය ලබන කාල සීමාවේ ලබපු අත්දැකීම් එකට එක්කහු කරලා බැලුවාම අපට පෙනෙනවා, මේ අරගළයේ ඉන්න පුංචි පුතාලට මේ ගැන තේරෙන්නේ නැහැ කියන එක. සමහර වෙලාවට ඒ පුතාලාගේ අම්මා අප්පච්චිලාටත් මේ කාරණය මතක නැතුව ඇති. අපේ කාලයේ වුණේත් මේකමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අපේ විශ්වවිද්‍යාල සමකාලීනයකු නිසා මේ කාරණය මතක ඇති. අරගළ මෙහෙයවන අය හැම දාම තිරෙන් පිටුපස්සේ හිටියේ. ඔවුන් එහෙම ඉඳගෙන කොල්ලෝ සටනට තල්ලු කළා. ඒකේ අවසාන ප්‍රතිඵලය වුණේ මේකයි. මේ රටේ 60,000ක් විතර කොල්ලෝ, කෙල්ලෝ තමන්ගේ ජීවිත පරිත්‍යාග කළා. මම දන්නේ නැහැ මේ ඇස්තමේන්තුව හරිද වැරදිද කියලා. ඒ කෙසේ වෙතත්, පරම්පරා පහකට ඒ සටනේ බලපෑම ඇති වෙලා තිබෙනවා.

අපේ ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා කියන දේ හරි. මේ ජන ඝාතක කණ්ඩායමට නෑදෑයෝ නැහැ, යාළුවෝ නැහැ. මේ අය මොළේ හෝදාගත්ත පිරිස්. ඒ නිසා මේ අය කරන කියන දේ පිළිබඳව මේ අරගළයට සම්බන්ධ පුංචි පුතාලා, ලොකු පුතාලා, මාමලා, බාප්පලා, සීයලා, ආච්චිලා හැමෝම තේරුම් ගන්න ඕනෑ. මම අවුරුදු 28ක් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු විධියට ඉගැන්වූවා. මට උපාධිය ඉවර කරන්න අවුරුදු 7ක් ගත වුණා. අපිත් එක්ක හිටපු ඉතා දක්ෂ බොහෝ අය තමන්ගේ ජීවිත පරිත්‍යාග කළා මේ සටන වෙනුවෙන්. මට මතකයි, වෛද්‍යවරු වෙන්න ඉගෙන ගත්ත මගේ කාමරයේ හිටපු මගේ සගයෝ දෙදෙනාම තමන්ගේ ජීවිත පරිත්‍යාග කළා. ඒ කවුරු වෙනුවෙන්ද කියලා අද වෙනතුරු මමත් දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම කැමැතියි මේ කාරණය පිළිබඳව ටිකක් ගැඹුරින් කාරණා ඉදිරිපත් කරන්න. අපේ රටට අපි හැමෝම ආදරෙයි. හැබැයි අපි රටට ආදරේ බව පෙන්වන විධියක් තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට පුළුවන්කමක් නැහැ, මෙතැන ඉඳලා හමුදාවට නියෝග දෙන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට පුළුවන්කමක් නැහැ, මේ අරගළයට තව පිරිසකට සම්බන්ධ වෙන්න කියලා කියන්න සහ අරගළ කරන පිරිස් අතරට ගිහිල්ලා අරගළයේ පාර්ශ්වකරුවන් වෙන්න. ඒකට හේතුව, ඒක රාජ්‍ය පෙරළීමට කරන කුමන්ත්‍රණයක් වීමයි. පාර්ලිමේන්තුවට තෝරා පත් කර එවන මන්ත්‍රීවරුන් මේ රටේ මහජනයා නියෝජනය කරන අය. අපි කල්පනා කරලා බැලුවොත්, රටට ආදරෙයි කියන ඒ පිරිස ඇත්තටම රටට ආදරේද? රටට ආදරේ නම් පසුගිය මාස හතරක කාල සීමාව තුළ මේ අය රටේ ආර්ථිකයට කොතරම් බලපෑමක් ඇති කළාද කියලා අපි දන්නවා.

මේ ළඟදී දවසක මහ බැංකුවේ හිටපු අධිපතිවරයෙක් එක්තරා රූපවාහිනී නාළිකාවක පැවැති සාකච්ඡාවකදී කියනවා, මූලික කාරණා තුනක් නිසා මේ රටේ ආර්ථිකයට බලපෑම් ඇති වුණා කියලා. නමුත්, මම කියන්න කැමැතියි ඒ කාරණා තුනට අතිරේකව අපේ රට මේ ආර්ථික අගාධයට ඇද දමන්න තිරයේ පිටුපස ඉන්න මේ පිරිස විටින් විට උත්සාහ කළ බව. ඒ අය දීර්ඝ කාලයක් තිස්සේ - පසුගිය අවුරුදු 50 තිස්සේම - රට අරාජික කිරීමට දරන ලද උත්සාහවල ප්‍රතිඵලයක් විධියට තමයි රට අද මේ ආර්ථික අගාධයට වැටිලා තිබෙන්නේ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.23]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුව අපගේ නව අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, සභානායක සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාටත් එතුමන්ලාගේ වැඩකටයුතු සාර්ථකව ඉටු කරන්න අවස්ථාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සාකච්ඡා කරමින් ඉන්නේ හදිසි නීතිය පැනවීම සඳහා වූ යෝජනාව ගැනයි. අද එක පැත්තකින් අපට ඇහෙනවා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට පිටතින් රාජ්‍ය බලය අල්ලා ගැනීමේ කුමන්ත්‍රණයක් -විදේශ කුමන්ත්‍රණයක්- වැඩ පිළිවෙළක් තිබෙනවා, එය මර්දනය කිරීමට ආරක්ෂක අංශවලට නව බලතල අවශ්‍යයි කියන අදහස. අනෙක් පැත්තෙන් අද මේ රටේ පනස්පන් ලක්ෂයක් පවුල් පාරට ඇද වැටී තිබෙනවා. ඒ පනස්පන් ලක්ෂය විඳින දුක් වේදනාව නිසා, ඒ පනස්පන් ලක්ෂයේ පවුල්වල මිනිසුන් හිතන ආකාරය නිසා ඒ අය අද අරගළ බිමට බැහැලා තිබෙනවා. අපට අද තෝරා ගැනීම තිබෙන්නේ මෙතැන. ඇයි මේ රටේ පනස්පන් ලක්ෂයක් පිරිස - විශේෂයෙන්ම අපේ තරුණ පරපුර- පාරට බැහැලා ජනාධිපති මන්දිරය, අග්‍රාමාත්‍ය නිල නිවස, ජනාධිපති කාර්යාලය අල්ලා ගන්න මේ ආකාරයට ක්‍රියාත්මක වුණේ? දරුවන්ට කිරි පිටි නැති, වැඩිහිටියන්ට බෙහෙත් නැති, අම්මාවරුන්ට පොළට ගිහිල්ලා බඩු ටික ගන්න විධියක් නැති, ඉන්ධන නැති, ගෑස් නැති, විදුලි බලය නැති රටක්, බංකොලොත් රටක් ඇති වෙච්ච නිසායි එහෙම වුණේ. මේ අවුරුද්දේ අප්‍රේල් 12වැනි දා මේ රට බංකොලොත් තත්ත්වයට පත් වුණා. කවුද ඊට වගකිව යුත්තෝ?

2020 මාර්තු මාසයේ 7වැනි දා මේ රටේ මහ බැංකුවට අන්තර්ජාතික මූල්‍ය අරමුදලින් පණිවුඩයක් ලැබුණා, "ඔබේ ණය ප්‍රතිව්‍යුහගත කර ගත්තේ නැත්නම් ඔබ ඉතා ඉක්මනින් අමාරුවේ වැටිලා බංකොලොත්භාවයට ලක් වෙන්න නියමිතයි" කියලා. ඒක නොතකා හැරියා, ඒ මූල්‍ය මණ්ඩලය. ඒක නොතකා හැරියා, ඒ හිටපු මහ බැංකුවේ අධිපති. අපේ රටේ 1950 ඉඳන් Monetary Law Act එක ක්‍රියාත්මක වනවා. නමුත්, මේ රට බංකොලොත්භාවයට පත් කිරීමට වග කිවයුතු ඒ මහ බැංකු අධිපතිවරයාට සහ ඒ මූල්‍ය මණ්ඩලයට නඩු දාන්න කවුරුවත් නැහැ. ඒ වාගේම 2002දී අපි සම්මත කර ගත්තා, Fiscal Management (Responsibility) Act එක. ඒ මඟින් මේ රටේ ණය පාලනය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ ලේකම්ට, මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට ලැබුණා. ඒ දීලා තිබුණ ඉලක්ක අනුව 2013දී අපේ රටේ ණය බර වෙන්න ඕනෑ, දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 60යි. අද කීයද? සියයට 120යි. එහෙම නම් ඒ වගකීම මුදල් ඇමතිලා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්ලා, භාණ්ඩාගාරයේ ලේකම්ලා ඉටු කරලා තිබෙනවා ද? නැහැ. මේ රටේ ජනතාව අද මෙලෙස දුක් විඳින්න එය එක හේතුවක් නේද? රාජපක්ෂ පවුලට අමතරව, ඒ මහා ජාතික බංකොල්ලයට අවශ්‍ය රැකවරණය ලබා දීපු අයට මුදල් නීති පනත යටතේ හෝ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ හෝ දඬුවම් දෙන්නේ නැතුව අරගළ බිමේ ඉන්න තරුණ තරුණියන් හිරගෙට යවන්න මොකක්ද ආණ්ඩුවකට තිබෙන සදාචාරාත්මක අයිතිය? ඒක නිසා මම බෙහොම පැහැදිලිව මෙය කියනවා. ඉදිරියේ ඉතාම බියකරු තත්ත්වයක් තිබෙන්නේ. අපි මේ බංකොලොත්භාවයේ පසුපසින් යැමයි තවමත් සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බැලුවා පසුගිය 25වැනි දා මොකක්ද ලංකා විදුලිබල මණ්ඩලයේ අපේ ඉල්ලුම කියලා. ඉල්ලුම, ගිගාවොට් පැය 38යි. ගිගාවොට් පැය 50ක ඉල්ලුමක් තිබුණු රටක්, ගිගාවොට් පැය 38ක ඉල්ලුමට වැටිලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ මේ තියෙන විදුලි කප්පාදුව නිසා නොවෙයි. සියයට 20කින් විදුලි බල ඉල්ලුම අඩුවෙලා තිබෙනවා කියන්නේ, ආර්ථිකයත් ඒ වාගේම ප්‍රමාණයකින් සංකෝචනය වෙලා තිබෙන බවයි. පළමු මාස තුන තුළ ආර්ථික සංකෝචනය සියයට 1.6ක තිබුණේ. දැන් ඒක සියයට 15, සියයට 20 සීමාවට ගමන් කරමින් තිබෙනවා. සැප්තැම්බර් මාසය වන කොට ඉන්දියානු ණය හෝ වෙනත් රටකින් ණය ලැබුණේ නැත්නම් මේ රට ඉතා භයානක අඳුරු අගාධයකට යනවා විතරක් නොවෙයි, අපි දැකපු අප්‍රේල් 9, මැයි 9, ජූනි 9 හා ජූලි 9 සිදුවීම් ඉදිරි කාලයේදී සතියෙන් සතිය එන්න පුළුවන්. අපි ඒක මතක තබා ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ කාරණයත් අවධාරණය කරන්න ඕනෑ. මේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවෙන් පිටත කවුරුන් හෝ බලය ස්ථාපිත කරන්න උත්සාහ කරනවා නම්, ඒක නතර කිරීමේ වගකීම ආරක්ෂක අංශවලට, රාජ්‍යයට තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නවලට නියම වගකිව යුත්තන් එළියේ සිටියදී, ඔවුන් ගැන හඬ නඟමින් දුක් විඳින ජනතාව මර්දනය කිරීම සඳහා හදිසි නීතිය යොදා ගැනීම සාහසික අපරාධයක් බවයි මගේ හැඟීම.

ඒ විතරක් නොවෙයි, මීට අවුරුදු 30කට කලින් තරුණයකු හැටියට මමත් විශ්වවිද්‍යාලයේ සිටියා. ඒ විශ්වවිද්‍යාලයේ සිටි කාලයේ අපි දැක්කා, මර්දනය කොහොමද එල්ල වුණේ කියලා. අපි පිටකොටුවට ගියාම පළමුවන දවසේ, දෙවන දවසේ, තුන්වන දවසේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් දර පොලුවලින් තමයි අපට ගැහුවේ. එදා අපට දීපු පණිවුඩය මොකක්ද? මට මතකයි, අද බොහෝදෙනකු කථා කරන රංජිතන් ගුණරත්නම් චරිතය. එදා අපට කොළඹ විශ්වවිද්‍යාලයේ

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

පිට්ටනියට එන්න කියලා අපි අත් දෙක වන-වනා, "නැවත උද්ඝෝෂණවලට එන්නේ නැහැ" කියලා කිව්වා. ශිෂ්‍යයෝ මහා ආවේගයෙන්, අත්පුඩි ගහලා එය පිළිගත්තා. මොකක්ද, අත් වුණු ඉරණම? ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා නම් සාමකාමීව මිය පරලොව ගියා. නමුත් 66,000ක පිරිසක් මහ පාරවල්වල ආදාහනය වුණා. රට තුළ මහා ඛේදවාචකයක් සිද්ධ වුණා. ඒ නිසා මා මතක් කරනවා, තුවක්කුවෙන් වෙඩි තබා, මර්දනයෙන් මේ ප්‍රශ්න යටපත් කරන්න හදනවා නම්, උතුරේ අත් දැකීමත් ඒකයි, දකුණේ අත් දැකීමත් ඒකයි, මේ රට නැවත ලේ විලක් කරා ගෙන යන්න ඉඩ තබන්න එපා; රංජිතන් ගුණරත්නම්ලා තව දහස් ගණනක් බිහි කරන්න ඉඩ දෙන්න එපාය කියලා. අපේ ජීවිතවලින් අපි ඒ අත් දැකීම ලබා ගත්තා. ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මහ පොළොවේ මරා දමා, දසලක්ෂ සංඛ්‍යාත පිරිසක් මේ රටින් පිටමං කරලා, එක තරුණ පරපුරක්ම විනාශ කරපු ඒ ක්‍රියාවලිය නැවත ඇති වෙන්න දෙන්න එපා. මොකද, මේ රට මේ බංකොලොත්භාවයට ගෙනෙන්න අපිත් වග කිව යුත්තෝ නිසා.

ජනාධිපතිතුමාට මා කියනවා, එතුමා එන්නේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් බිහි කරන්න නම්, එතුමාගේ විවෘතභාවය, එතුමාගේ එඩිතරභාවය, ඒ වාගේම එතුමාගේ අවංකභාවය පෙන්වන්න ඕනෑ බව. සර්ව පාක්ෂික ආණ්ඩුවක් කියන්නේ මොකක්ද කියන එක අපි පෙන්වා දුන්නා. ප්‍රතිපත්ති තීරණ පිළිබඳව, අනාගත ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳව පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් අවම එකඟතාවක් ඇති කර ගත යුතුයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 224දෙනාම අමාත්‍ය මණ්ඩලයට සම්බන්ධ වන විධායක කාරක සභා ක්‍රමයක් ඇති කර ගත යුතුයි. විශේෂයෙන්ම මේ රටේ දැවෙන ප්‍රධාන ආයතන, කඩා වැටෙන්න නියමිත බැංකු පද්ධතිය, කඩා වැටෙමින් තිබෙන බලශක්ති පද්ධතිය වැනි ඒවාට වෘත්තීය මට්ටමේ පිරිසක් පත් කරලා විශ්වාසය දිනා ගන්නා වැඩ පිළිවෙළකට ගමන් කළ යුතුයි. එහෙම නැතිව, සැලුන් දොර අරිනවා වාගේ, අතැනින්, මෙතැනින් පක්ෂවලින් මන්ත්‍රීවරුන් ගැනීමෙන්, එහෙම නැත්නම් ඒ අයගේ හිතවතුන් ගැනීමෙන්, නිලධාරීන් ගැනීමෙන් මේ ප්‍රශ්න විසඳන්න බැහැ. අපි බලාපොරොත්තු වෙනවා, එතුමාගේ රාජාසන කථාවේදී මේ වැඩ පිළිවෙළ, විවෘතභාවය, අවංකභාවය එතුමා ප්‍රකාශ කරයි කියලා. එහෙම නොවුණොත් මේ රටේ ජනතාව එතුමාවත් මේ ධුරයෙන් ඉවත් කිරීම සඳහා අරගළ කරනවාට සැකයක් නැහැ.

ඉතිහාසය බැලුවාම, අපි ඉන්නේ අතිශය තීරණාත්මක තැනකයි. ග්‍රීසිය බංකොලොත්වෙලා අවුරුදු 12ක්. ආර්ජන්ටිනාව බංකොලොත්වෙලා අවුරුදු 10ක්. විටින්-විට, නැවත-නැවතත් බංකොලොත් වෙමින්, අතිශය අන්තවාදී ආණ්ඩු පිහිටුවමින්, ප්‍රජාතන්ත්‍රවාදී සීමාවලින් ඔබ්බට ගමන් කරමින් මේ රාජ්‍යයන් බංකොලොත් වෙමින් තිබෙන බව මතක තබා ගත යුතුයි. ඒ නිසා අපි මේ මොහොතේ වග කීමෙන් කටයුතු නොකළොත්, අපි අවංක නොවුණොත්, එඩිතර නොවුණොත්, ඒ වාගේම අපි දූරදර්ශීයභාවයකින් තොරව, එකමුතුභාවයකින් තොරව කටයුතු කළොත් මේ රට නැවතත් ලේ ගංගාවකට ගමන් කරනවා. මේ හදිසි නීතියට මා නම් විරුද්ධයි. මා එයට එරෙහිව ඡන්දය පාවිච්චි කරනවා. මොකද, මේ රටේ මූල්‍ය වංචා කරමින්, මේ රට කොල්ල කාපු පරම්පරාවලට මගේ දරු පරපුර ලේ සාගරයක ගිල්වන්න කිසිම ආකාරයකින් ඉඩ දෙන්නට නොහැකියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මහින්ද අමරවීර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும்)

(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and Minister of Wildlife and Forest Resources Conservation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම, අලුතින් පත් වුණු අග්‍රාමාත්‍යතුමාටත්, ඒ වාගේම ගරු සභානායකතුමාටත් මම සුභ පතනවා. මේ පාර්ලිමේන්තුව නිසි ආකාරයෙන් පවත්වාගෙන යන්න එතුමන්ලාගේ දායකත්වය ලබා දෙයි කියලා මා විශ්වාස කරනවා. ජනාධිපතිතුමාටත්, සභානායකතුමා ඇතුළු ඒ සියලුදෙනාටත් පළමුවෙන්ම මට කියන්න තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කළොත් රටේ ජනතාව පාර්ලිමේන්තුවට ගරු කරනවාය කියන එකයි. අද සිද්ධවෙලා තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ ගෞරවය අපම කෙලෙසාගෙන තිබෙන එකයි. එක පැත්තකින්, සමහර අය කියනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මුදලට විකිණෙනවා කියලා. දැනුත් එවැනි කථා කිව්වා. මා හිතන හැටියට ඒ විධියට ගනුදෙනු කරපු අය තමයි එහෙම කියනවා ඇත්තේ. කවුරුන් හෝ එවැනි දෙයක් කියනවා නම් ඒ කරුණු ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ. එහෙම නොකර, නිකම් අපිම අපව හැල්ලු කර ගන්නවා. අපි එළියේ ඉන්න අයට ආයුධ දෙනවා; පාර්ලිමේන්තුවේ ඉන්නේ හොරු ටිකක්, පාර්ලිමේන්තුවේ ඉන්නේ සල්ලිවලට විකිණෙන පිරිසක් කියලා. එහෙම පොදුවේ කියන්න ගියාම පාර්ලිමේන්තුව කෙරෙහි විරෝධයක් ඇතිවන එක ගැන සැකයක් නැහැ. ඒ නිසා හැම කෙනකුම වග කීමෙන් කටයුතු කිරීම අවශ්‍යයි.

මේ අරගළය ඇති වෙන්න හේතු තිබුණා; ඒක ඇති වෙන්න පදනමක් හැදුණා. ඒ පදනම තමයි, ජනතාවට අත්‍යවශ්‍ය දේවල් ලබා දෙන්නට නොහැකි වීම. පොහොර නැති නිසා ගොවීන් පාරට බැහැලා ගොවීන්ගේ අරගළයක් විධියට තමයි ඒක පටන් ගත්තේ. ඊළඟට, පැය 12ක, 13ක විදුලි කප්පාදුවක් තිබුණා. ඒකටත් අරගළ කළා. ගෑස් නැති නිසා අරගළයක් ආවා. බෙහෙත් හිඟ වෙලා අරගළයක් ආවා. ඉන්ධන නැතිව අරගළයක් ආවා. මේ වාගේ අත්‍යවශ්‍ය දේවල් නැතිවීම නිසා තමයි අරගළ ඇති වුණේ. මේ අරගළ තත්ත්වය නිසා හිටපු ජනාධිපතිවරයා ඉවත්වෙලා තිබෙනවා. හිටපු අග්‍රාමාත්‍යවරයාට, හිටපු මුදල් අමාත්‍යවරයාට සහ තවත් අමාත්‍යවරු ගණනාවකට ඉවත් වෙන්න සිද්ධ වුණා. හැබැයි, මේ ප්‍රශ්නය හැම දාම ඉස්සරහට අරගෙන යන්න බැහැ. ඊට පසු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වුණා. දැන් එතුමා ජනාධිපති වෙලා තිබෙනවා. කෙටි කාලයක් ඇතුළත මේ ප්‍රශ්න විසඳන්නට දැන් මේ රජය මැදිහත් වෙලා තිබෙනවා. ඒකට යම් කාලයක් දෙන්න ඕනෑ. අවුරුද්දක, දෙකක කාලයක් නොවෙයි, අඩු තරමින් මාස හයක කාලයක්වත් දෙන්නේ නැතිව තමයි නැවත ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා මේ යොමු වෙලා තිබෙන්නේ. එදා තිබුණු ප්‍රශ්නවලින් එකක් තමයි විදුලි කප්පාදුව. එදා පැය 12ක, 13ක විදුලි කප්පාදුවක් සිදු වුණා. හැබැයි අද වෙනකොට ඒක පැය තුනකට පමණ සීමා කර ගෙන තිබෙනවා. ගෑස් මිලදී ගන්න විධියක් නැතිව දවස් ගණන් පෝලිම්වල සිටි අයට දැන් ගෑස් ටිකත් ලබා දෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම බෙහෙත් ගෙන්වීම සඳහාත් අවශ්‍ය මුදල් සොයාගෙන දැන් බෙහෙත් ටික ලබා දෙන්න පටන් අරගෙන තිබෙනවා.

ඊළඟට, ගොවියාගේ පොහොර ප්‍රශ්නය ගත්තාම, ගොවි ජනතාවට පොහොර ලබා දීමේ වග කීම මට තමයි පැවරුණේ. ඒ අය ඉල්ලා සිටියේ කෙසේ හෝ පොහොර ටික ලබා දෙන්න කියලායි. අපේ ගොවියෝ කිසි දෙයක් නිකම් ඉල්ලන කට්ටියක්

නොවෙයි. ඒ අය ඉතාම ගෞරවනීයව, අභිමානවත් විධියට ජීවත් වන කණ්ඩායමක්. ඒ අයගේ ඉල්ලීම වුණේ ඒ අයට අවශ්‍ය යෙදවුම් ටික ලබා දෙන්න කියන එකයි. පොහොර ඇතුළු ඒ අයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න, ඒ අයගේ නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබා දෙන්න කියලායි ඔවුන් ඉල්ලුවේ. අද වෙනකොට අපි ගොවීන්ට යූරියා ලබා දීමේ වැඩ පිළිවෙළ සියයට 90කින් පමණ අවසන් කර තිබෙනවා. ඉදිරි දින කීපය ඇතුළත - මේ සතිය අවසන් වන්නට පෙර- වී වගා කරන සෑම ගොවියෙකුටම පොහොර ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම මේ ලබා දෙන්නේ ඉතා ම හොඳ පොහොර බවත් මම කියන්න ඕනෑ. මම දැක්කා, දේශපාලන අධිකාරියේ අය, -මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු- ඒ අය වෙනුවෙන් පෙනී සිටින විවිධ සංවිධාන කිව්වා මේ ලබා දෙන්නේ බාල පොහොර කියලා. මම ඒ අයට ආරාධනා කළා, ඕනෑම ස්ථානයක මාත් එක්ක විවාදයකට එන්න කියලා; පට්ටපල් බොරු කියලා මිනිස්සු පාරට බස්සන්නේ නැතිව, විවාදයකට එන්න කියලා මම ඒ අයට කිව්වා. අද මොකද වෙලා තිබෙන්නේ? මේ රටේ ඉතිහාසයේ ගෙනාපු හොඳම පොහොර තමයි අපි මේ සැරේ ගොවීන්ට ලබා දීලා තිබෙන්නේ. ඒ පොහොර පිළිබඳව ජාත්‍යන්තර රසායනාගාර තුනකින් හොඳ වාර්තා ඇවිල්ලා තිබෙනවා. ඉතාම හොඳ පොහොර ටිකක් ගොවියාට ලබා දීලා, අද ඒ ගොවියා ඉතා සතුටින් තමන්ගේ ගොවි බිමේ වගා කටයුතු කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම අපි ගෙනාපු ඒ පොහොරවලින් මෙට්‍රික් ටොන් 15,000ක් තේ වගා කරන ගොවීන්ට ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවා. ඉදිරි දවස්වලදී ඒ පොහොර ටික තේ වගා කරන අයට ලබා දෙනවා. ඒ වාගේම බඩ ඉරිඟු වගා කරන ගොවීන්ට සහනාධාර ක්‍රමය යටතේ පොහොර ලබා දීමේ කටයුත්තත් සිද්ධ වෙනවා.

ඊළඟට තිබෙන ප්‍රශ්නය තමයි, ගොවියා මහ කන්නයට මුහුණ දෙන්නේ කොහොමද කියන කියන එක. මහ කන්නය සඳහාත් පොහොර ගෙන්වීමට අවශ්‍ය මුදල් සොයාගෙන අපි මේ වනවිට ඒ කටයුතු කරමින් සිටිනවා. මා දන්නා පරිදි, මේ දවස්වල ඒ යූරියා ලබා ගැනීමේ ටෙන්ඩර් කාර්ය පටිපාටියේ අවසාන කටයුතු සිද්ධ වෙමින් පවතිනවා. ඒ අනුව ලබන මහ කන්නයටත් පොහොර ටික ලැබෙනවා. ඊට අතිරේකව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මඟින් පොහොර හොන්ඩර 365,000ක් නොමිලයේ ලබා දෙනවා. මුං ඇට වගා කරන ගොවි පවුලකට රුපියල් 17,500ක වාගේ ආධාරයක් -ඩොලර් 50ක මුදලක්- ලබා දෙන්නත් කටයුතු කරනවා. මේ වාගේ කටයුතු කරමින් අපි අද ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳලා තිබෙනවා. මම හිතන්නේ නැහැ දැන් නම් වෙනදා වාගේ ගොවීන් පාරට ගෙනෙන්න දේශපාලන අධිකාරියට පුළුවන් වෙයි කියලා. එක් එක් දේශපාලන සංවිධාන එක්ක යම් ගොවීන් පිරිසක් ඉන්නවා. ඒ අයට නම් මෙහෙම නොවෙයි, රත්‍රන්වලින් මේවා දුන්නත් සෑහීමකට පත්වෙන්නේ නැතිව ඇවිල්ලා මොකක් හෝ කියාවි. හැබැයි, සාමාන්‍ය ගොවි ජනතාව මීට පසු පාරට බහින්නේ නැති වෙන්න ඒ කටයුතු කිරීමේ වග කීම අපි භාරගෙන තිබෙනවා.

පසුගිය කාලයේ ගොවීන් විශාල පිරිසකට වගා ණය ගෙවා ගන්න බැරි වුණා. අවුරුදු ගණනාවක් තිස්සේ හිඟ වෙලා තිබුණු ඒ ගොවි ණය සියල්ල දැන් අපි කපා හැර තිබෙනවා. ඒ අයගෙන් ඒ ණය අය කරන්නේ නැහැ. රාජ්‍ය බැංකු හතරෙන් ලබාගත් ගොවි ණය කපා හැර තිබෙනවා. ඒ නිසා අපේ ගොවි ජනතාවට අවශ්‍ය කටයුතු සියල්ල දැන් සිද්ධ වෙමින් පවතිනවා.

දැන් මම කියපු ඒ කණ්ඩායමත් අරගළයේ හිටපු එක කොටසක්. මම හිතන විධියට ඒ අය දැන් අරගළයෙන් යම් මට්ටමකට ඉවත් වෙලා තිබෙනවා. ඒ, ප්‍රචණ්ඩකාරී අය නොවෙයි. ඇත්තටම වේදනාවක් තිබෙන අය. පෝලිමේ ඉඳලාත් ඉන්ධන ටිකක් ගන්න නැති වුණාම, apartment එකක ඉන්න කෙනෙකුට ගෑස් එකක් ගන්න නැති වුණාම වේදනාවක් ඇති වනවා; වෛරයක් එනවා. අපි ඒක පිළිගන්න ඕනෑ. දවසේ වැඩි කාලයක් - පැය 12ක්, 13ක්- ගෙදරට විදුලි බලය නැති වුණාම කේන්තියක් එනවා. ඒ අය අරගළයට ආවා. නමුත්, දැන් ඒ අය අරගළ බිමෙන් අයින් වෙලා ඉන්නේ. දැන් එතැන ඉන්නේ වෙන කණ්ඩායමක්. ඒ අයට මේවා දීලා සතුටු කරන්න බැහැ. ඒ අය පොහොර, තෙල්, ගෑස්, බෙහෙත් දීලා සනසන්න පුළුවන් කණ්ඩායමක් නොවෙයි. ඒ ඉන්නේ දේශපාලන කණ්ඩායම්. සමහර කට්ටිය ඊළඟ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ගණන වැඩි කරගන්න බලාගෙන ඉන්නවා. ඒ අතර තවත් කට්ටියක් ඉන්නවා, ඒ අයට ඡන්දය ඉල්ලා ප්‍රජාතන්ත්‍රවාදී විධියට පාර්ලිමේන්තුවට එන්න බැරි නිසා බලහත්කාරයෙන් බලය ලබා ගන්න පුළුවන්ද බලන. ආයුධ බලයෙන් හෝ වෙනත් ආකාරයකින් බලය ලබා ගන්න පුළුවන්ද බලන කණ්ඩායමක් ඉන්නවා. ඒ අය තමයි කියන්නේ, අරගළයේ නීතිය රටේ නීතියයි කියලා. අරගළයේ නීතිය, රටේ නීතියයි කියන කණ්ඩායමක් එතැන ඉන්නවා. ඒ කියන්නේ, මේ රටේ ව්‍යවස්ථාව, නීති පද්ධතිය වෙනස් කරලා නඩු තීන්දු දෙන්න බලාගෙන ඉන්න කට්ටියක් ඉන්නවා. ඉස්සර එහෙම කාලයක් තිබුණා. අපේ තරුණ කාලයේ අපට මතකයි, ගස් යට වෙනම නඩු ඇහුවා. එහෙම නඩු අහලා වරෙන්තු කළා; ගස්වල බැඳ තැබුවා; වධ දුන්නා; මරණීය දණ්ඩනය දුන්නා. ඒ වාගේ දේවල් කරන්න බලාගෙන සිටින කණ්ඩායමක් දැනුත් ඉන්න බව පෙනෙන්න තිබෙනවා. ඒ අයට අර මා කලින් සඳහන් කළ දේවල් සපයා හෝ දේශපාලනික වශයෙන් පිළිතුරු දෙන්න පුළුවන්කමක් නැහැ. ඊළඟට, ඒ කාලයේත් එක එක බලකායන් තිබුණා. විජයබාහු බලකාය වැනි එක එක බලකායවල් තිබුණා. දේශප්‍රේමී සංවිධාන යැයි කියමින් ඒවායින් නියෝග දීලා නඩු අහපු, මරණ වරෙන්තු නිකුත් කළ තත්ත්වයක් තිබුණා. ඒ වාගේ කැලෑ නීතියක් මේ රටේ නැවත ඇති වෙන්න දෙන්න බැහැ. ඒ නිසා මේ රටේ නීති පද්ධතිය ශක්තිමත් වෙන්න ඕනෑ.

බලන්න, එදා අරගළයට වෙච්ච දේ ගැන බලන්න ගියාම විපක්ෂ නායකතුමාට අල්ලාගෙන තඩි බෑවා. ඒක හොඳටම පෙනුණා නේ. එදා ඉරාන් මන්ත්‍රීතුමාටත් තඩි බෑවා. ඊළඟට, කුමාර වෙල්ගම මැතිතුමා තමයි මුල ඉඳලාම "Gota, go home!" කිව්වේ. එතුමාටත් අල්ලාගෙන ගැහුවා. එතුමා යාන්තමින් මරණින් බේරුණේ. රාජිත සේනාරත්න මැතිතුමාත් අරගළයේ කට්ටියත් එක්ක බොහොම සමීපව හිටියා. ඒත් එතැනට ගියාම එතුමාටත් අල්ලාගෙන ගැහුවා. මේක තමයි ඇති වුණු තත්ත්වය. ගොඩක් කට්ටියට ගැහුවා. ඊළඟට, ගෙවල් ගිනි තියපු සිද්ධි ගැන බලන්න. මේවාට කිසිම සම්බන්ධයක් නැති අයගේ ගෙවල්වලටත් ගිනි තිබ්බා. ස්වාධීන වෙලා හිටපු දුමින්ද දිසානායක මැතිතුමාගේ නිවසටත් ගිනි තිබ්බා. මොනවාද මේ කරලා තිබෙන්නේ? මේ වාගේ දේවල්වලට ඉඩ දෙන්න පුළුවන්කමක් තිබෙනවා ද?

අනෙක, කොච්චර වටිනා දේවල් ද මේ නැති කර ගත්තේ? ජනාධිපති මන්දිරයේ, අගමැති කාර්යාලයේ, අරලියගහ මන්දිරයේ, ජනාධිපති ලේකම් කාර්යාලයේ නැති වෙච්ච දේවල්වල වටිනාකම ගණනය කරන්න බැහැ. ඒ, බිලියන ගණනක් වටිනා දේවල්. ඒ අපේ රටේ සංස්කෘතිය. ඒවා විනාශ කළා. මේවාට එරෙහිව කටයුතු කරන්නේ නැතිව රජයකට ඉන්න පුළුවන්ද? ඒ නිසා අපි මේ පිළිබඳ අවධානය යොමු කරන්න ඕනෑ.

තවත් කට්ටියක් කියනවා, මේ මන්ත්‍රීවරු 225 දෙනාම ඕනෑ නැහැ, 225 දෙනාම යන්න ඕනෑ කියලා. අපේ සමහර අයත් ඒ වෙනුවෙන් කථා කරනවා. එහෙම නම් කවුරු වෙනුවෙන්ද ඒ අය කථා කරන්නේ? මේ 225 දෙනාම ඕනෑ නැහැ කිව්වාට වෙනත් අය ගෙනෙන්නේ කොහොමද? සෑම කෙනකුටම ඡන්දය ප්‍රකාශ කරන්න අවස්ථාවක් එනවා. මේ 225දෙනාම හොඳ නැත්නම්, ඒ

[ගරු මහින්ද අමරවීර මහතා]

ඡන්ද විමසීම පැවැත්වෙන වෙලාවට මේ 225දෙනාම අයින් කරලා, වෙනත් 225දෙනකු පත් කර ගන්න පුළුවන්. හැබැයි, ඒක මහජන කැමැත්තෙන් මිස වෙනත් විධියකට කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි හදිසි නීතිය පනවන්නේ. එම නිසා හදිසි නීතිය සම්මත කර ගැනීමේ වගකීම අපි හැමෝටම තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ எம்.ஏ. சுமந்திரன் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு; you have seven minutes.

[2.41 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Presiding Member, we are debating the imposition of the state of Emergency today. This is the third attempt in three months to promulgate a state of Emergency. In early May, President Gotabaya Rajapaksa purportedly promulgated a state of Emergency. It lasted only for a few days. It was challenged in the Supreme Court, I myself appeared as counsel and the Court granted leave to proceed against that imposition of Emergency; the case is still pending in court. It was immediately revoked. Thereafter, he promulgated a state of Emergency again and allowed it to lapse before it could be debated in this House. This is the third time when on the 18th of July, Acting President Ranil Wickremesinghe promulgated a state of Emergency, which is now placed before the House.

Sir, the Leader of the House, when he presented the Resolution under the Public Security Ordinance, recounted a story of his experience in appearing for some suspects who were charged with the bomb attack in Parliament. In that narration itself, he said that his clients were found to have given a confession and that was not given voluntarily; it was found that they had not given it voluntarily and therefore, they were acquitted. I should rest my case just with that. If it was not given voluntarily, how was it given then? The abuse of Emergency powers is what he was referring to. This, we have lived through experience. This is the contradiction and I call this “a Government of contradictions”. The very Minister who introduces the Resolution says that in his experience, confessions were obtained by force and yet, he presents one of the most draconian, not just a proclamation, Resolutions that have been made under it. We have not seen anything like this in the past.

What is the cause for this? Why is a state of Emergency necessary today? We have gone through a stormy period from April till July. There were attempts to promulgate Emergency, which failed. Now, after the new President has taken over, a state of Emergency is being declared. What for? He became President on account of this protest! If not for this protest, he would not be the President today. That is quite simple. Everyone who keeps saying, “You know, we have to abide by the Constitution" is now seated there having formed a new Government on the back of the protest! If not, you would not be there; if not, the President would not be there. You have benefitted from the protest and once you have sat there, you are saying that all what happened in the protest is illegal. Then, all that happened after it is also illegal; your occupying that post is also illegal.

Since time is short, I just want to refer to one fact. Impunity in this country has a long history and that, I can refer to from July, 1983. This is the month of July and we remember what happened in July, 1983. One of the greatest blots in the history of this country is the massacre of the prisoners in the Welikada Prison, who were under the protection of the State. They ought to have been protected by the State; they were in the custody of the State. Has anybody been prosecuted for that? No. Then, the massacre of the inmates in Bindunuwewa under State custody. Has anyone been prosecuted for that? No. Also, the massacre of the "Trinco 5", the 17 ACF aid workers in Mutur, the list goes on. There was another incident in Trinco: the eleven youth abducted from Colombo and detained there. It was more recent. Has anyone been prosecuted for that? No.

Sir, since time is short, I want to **table*** the most recent publication of the UTHR(J) titled “Impunity in times of uncertainty, Can Currency be Protected where Life and Freedom are Savaged?, Addressing Lanka’s Trust Deficit must go deeper than Economics”.

This is a UTHR (J) Report dated 09th July, 2022. I urge Members of Parliament to read it - it is on the web as well, but I am tabling it here - to see, to identify the root causes. What it says is, the rupee is devaluing, but life and liberty have been devalued in this country much earlier. Therefore, we must get our perspective right. If not, there is no future for this country. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Minister of Labour and Minister of Foreign Employment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා මේ අරගළය සම්බන්ධයෙන් සහ මේ ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් දරන මතය පිළිබඳව නම් මා තුළ විමතියක් දනවන්නේ නැහැ. හැබැයි, ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කථා කරද්දී සඳහන් කළා, ගෙවල්වලට ගිනි තැබීම ආදි කඩාකප්පල්කාරී ක්‍රියා පමණක් නොවෙයි, ගෙවල් ඉස්සරහට ගිහිල්ලා විරෝධතා දැක්වීම පවා තමා අනුමත කරන්නේ නැහැ කියලා. නමුත්, එතුමාගේ පක්ෂයේ නායකතුමාගේ -මා නියෝජනය කරන පක්ෂයේ නායකතුමාගේ- සහෝදරිය තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ගෙදර ඉස්සරහට ගිහිල්ලා, කෑ ගහලා, සෙනඟට එන්න කිව්වේ. එතුමාගේ පක්ෂයේ වත්තල ආසන සංවිධායකතුමාගේ පුතා තමයි එතැනට ගිහිල්ලා කෑ ගහන්නේ "මෙහේට එන්න" කියලා. ඔහු අද රට පැනලා ඉන්නේ. එහෙම තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ගෙදර ළඟට සෙනඟ ගෙනැල්ලා, එතුමාගේ ගේ ගිනි තියන්න ඕනෑ කරන මූලික වැඩ කටයුතු ටික කළේ.

මේ වෙලාවේ Emergency දාන්න ඕනෑ මොකටද කියන කාරණය ගැන කියමින් විපක්ෂ නායකතුමා අද කිව්වා, මේ වෙලාවේ emergency තිබෙන්නේ fuelවලටයි, කෑම පිළිබඳවයි, ගෑස් පිළිබඳවයි කියලා. ඇත්ත! මේ අරගළය පටන් ගත්තේ ගෑස් නැති නිසා, තෙල් නැති නිසා, ඖෂධ හිඟ වන නිසා, ආර්ථික අර්බුදය නිසා. මේ සියල්ල එක්ක තමයි මේ අරගළය නිර්මාණය වුණේ. මේ අරගළය නිර්මාණය වුණේ එහෙමයි. හොඳට ඇඳගත්තු කොළඹ හතේ නෝනලා, මහත්වරු ගෙදර ගෑස් ටික නැති වනකොට, තෙල් ටික ගහගන්න පෝලිමට යන්න සිදු වන කොට තමයි පාරට බැස්සේ. තමන්ගේ අනාගතය ගැන ප්‍රශ්න මතු වන කොට, තමන්ගේ අනාගතය පිළිබඳව අර්බුදකාරී හැඟීමක්, රටේ අනාගතය පිළිබඳ ප්‍රශ්නයක් මතු වන කොට තමයි තරුණයෝ පාරට බැස්සේ. හැබැයි, ඒ තරුණයන් පාරට බැහැලා, අවිහිංසාවාදී අරගළයක් තමයි පටන් ගත්තේ. ඒ අය අරගළය පටන් ගත්තේ ඉටිපන්දම් අරගෙන; පන්දම් අරගෙන. කොළඹ කාන්තාවන් එළියට බැහැලා, අරගළය පටන් ගත්තේ බෙලෙක්කවලට ගහලා සද්ද කරමින්. ගම්වල ගොවියෝ හුළු අතු අරගෙන පාරට බැස්සේ පොහොර නැති නිසා. හැබැයි, මෙතැන වෙච්ච ප්‍රශ්නය තමයි, මේ සාමකාමී අරගළයට දේශපාලන මුහුණුවර දෙන්න කණ්ඩායමක් ඉදිරිපත් වීම. තරුණයන් ගෝල්ෆේස් එකට යනකොට ඒ අයගේ පිටුපසින් ගියා, ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය තිබෙන, ලංකාවේ ඉඳන් දේශපාලන කටයුතු මෙහෙයවන, ලංකාවේ ආයුධ සන්නද්ධ අරගළවලට නායකත්වය දීපු අය; 1988, 1989 අත් පත් කර නොගත් ආයුධ අදටත් තමන්ගේ අතේ තියාගෙන ඉන්න කණ්ඩායම්. ඔවුන් මේ තරුණයන්ගේ අරගළය බලහත්කාරයෙන් අතට ගත්තා.

එදා රාජිත සේනාරත්න මහත්මයලා සමගි ජන බලවේගය නියෝජනය කරමින් කිව්වා, පිට රට ඉඳලා මේ අරගළය සංවිධානය කරන තරුණයන් පිළිබඳව. එතුමා ඒ අය පිළිබඳව බොහොම දැනුවත්ව කථා කළා. හැබැයි, අවසානයේදී -අන්තිමට- එතුමාට පාරේදී ටොකු ඇන්නේ ඒ කවුරුවත් නොවෙයි. ඒ එළියට බැස්සේ, මෙන්න මේ ත්‍රස්තවාදී කණ්ඩායම්වලට උල්පන්දම් දෙන, මේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුව ක්‍රියා කරන කණ්ඩායම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා රූප රාමු කීපයක්. බලන්න, මේ තිබෙන්නේ, ගරු අමරකීර්ති අතුකෝරළ මන්ත්‍රීතුමා මරා දමපු ආකාරය දැක්වෙන රූප රාමු. මේ තිබෙන්නේ, සාමකාමී අරගළය මුවාවෙන් ගිහින් වාහන ගිනි බත් කරපු ආකාරය. මේවා මේ සාමකාමී අරගළයට සම්බන්ධ තරුණයන්ගේ වැඩ නොවෙයි. බලන්න, මේ රූප රාමුවලින් පෙනෙන්නේ, වාහන ගිනි තියපු ආකාරය; වාහන පෙරළා දැමූ ආකාරය. ඊළඟට, මගේ අතේ තිබෙන මෙන්න මේ රූප රාමුවලින් පෙනෙන්නේ, අරලියගහ මන්දිරය, ජනාධිපති මන්දිරය අත් පත් කරගෙන, ඒවා තුළ විනාශයන් සිදු කළේ කොයි ආකාරයෙන්ද කියන එක. ඒවාට රුපියල් කෝටි ගණනක අලාභයක් කරපු හැටි තමයි මේ රූප රාමුවලින් පෙන්නුම් කරන්නේ. මේ විනාශ සිදු කළේ සාමකාමී අරගළකරුවන් නොවෙයි; සාමකාමී තරුණයන් නොවෙයි. සාමාන්‍ය තරුණයන්ගේ අසහනය, සාමාන්‍ය තරුණයන්ගේ අදහස් පාවිච්චි කරමින්, ඔවුන්ගේ සිත්වලට විෂබීජ දාපු, උල්පන්දම් දීපු ත්‍රස්තවාදී කණ්ඩායම් තමයි මේ සියල්ල කළේ. ඒ අය කරපු ඒ විනාශය දැක්වෙන මේ සියලු රූප රාමු මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ සියලු විනාශ සිදු කළ අරගළයේ නායකයන් යැයි කියාගන්නා ත්‍රස්තවාදී කණ්ඩායමක්. ඔවුන් සැබෑ අරගළයේ නායකයන් නොවෙයි. සැබෑ අරගළයට නායකත්වය දුන්නේ, බොහොම සද්භාවයෙන් යුත් කණ්ඩායමක්. නමුත්, ඒ අය පිටුපසින් ආ මේ ත්‍රස්තවාදී කණ්ඩායමට, මේ කැරලිකාරී කණ්ඩායමට ඕනෑ වුණා, පාර්ලිමේන්තුවෙන් පිටත බලය පිහිටුවා ගන්න. ඒකේ නායකයා පසුගිය දවසක press conference එකක් පවත්වා කියනවා, "කවුරු ආණ්ඩු ගත්තත් අපට ඕනෑ විධියට කටයුතු කරන්න ඕනෑ" කියලා. ඒ අය විපක්ෂ නායකවරයා හම්බ වෙනවා.

සුමන්තිරන් මහත්මයා හම්බ වෙනවා; හම්බ වෙලා සාකච්ඡා කරනවා; "හැබැයි, අපි කියන විධියට තමයි වැඩ කරන්න ඕනෑ" කියලා කියනවා. කණ්ඩායමක් ඇවිල්ලා විපක්ෂ නායක කාර්යාලයේදී සාකච්ඡා කරලා එළියට බැහැලා කියනවා, "මේ අයත් එක්ක අපි කථා කළා. හැබැයි, කවුරු ජනාධිපති වුණත්, කවුරු අගමැති වුණත් අපට ඕනෑ විධියට තමයි ආණ්ඩු කරන්න ඕනෑ" කියලා.

පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීම පැවැත්වුණු වෙලාවක කණ්ඩායමක් ඇවිල්ලා පාර්ලිමේන්තුව වට කරනවා. පාර්ලිමේන්තුවේ දැනට ඉන්න මන්ත්‍රීවරයෙකුයි, හිටපු මන්ත්‍රීවරු දෙන්නෙකුයි ඒ වෙලාවේ එතැනට ගිහිල්ලා කියනවා, "පාර්ලිමේන්තුව වට කරන්න ඕනෑ. එන්න මෙතැනට එකතු වෙන්න" කියලා. පක්ෂ නායක රැස්වීමේ හිටපු කවුරුවත් ප්‍රකාශ කළේ නැහැ, "අපි පාර්ලිමේන්තුව රැක ගන්න ඕනෑ. ඒ නිසා මෙතැනට කාටවත් එන්න දෙන්න එපා" කියලා. එහෙම ප්‍රකාශ කරන්නේ නැතිව, ඒ අය හිමින් සීරුවේ පාර්ලිමේන්තුවෙන් මාරු වෙලා ගියා.

ඒ පැමිණි අය ඩෝසර් අරගෙන ආවා, පාර්ලිමේන්තුව ඩෝසර් කරන්න කියලා. හමුදා නිලධාරින්ට ගැහුවා. ඒ වෙලාවේ හමුදාව නීතිය ක්‍රියාත්මක නොකළා නම් අද මේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ල නැහැ. එදා හමුදාවට ඒ අණ නොදුන්නා නම්, හමුදාවට එසේ නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය බලය ලබා නොදුන්නා නම් අද මේ පාර්ලිමේන්තුව නැහැ. පාර්ලිමේන්තුව කියන්නේ නිකම්ම ගොඩනැඟිල්ලක් නොවෙයි. මේ තුළින් තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබිඹු කරන්නේ. එහෙම නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ගහන්න තමයි ඒ අයට වුවමනා වුණේ. ඒක තේරුම් නොගත්තු විපක්ෂ නායකතුමා ඒ කණ්ඩායමත් එක්ක එකතු වෙලා ඒ කණ්ඩායමට ඕනෑ විධියට වැඩ කිරීම සඳහා ආණ්ඩු හදන්න කල්පනා කළා.

බලන්න, මේ රටේ හමුදාව වැඩ කටයුතු කරන්නේ කොහොමද කියලා. ආයුධයක් අතේ තිබුණු, හමුදාවේ තරුණ සොල්දාදුවෙකුගේ බෙල්ලෙන් අල්ලාගෙන කුණුහරුප කියද්දීත්

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු මනුෂ නානායක්කාර මහතා]

ඒ හමුදා සෙබළු තමා තුළ තිබෙන දැවැන්ත ශික්ෂණය එදා පෙන්වූවා. කුණුහරුප කියද්දී තම ආයුධ අතේ තියෙද්දි ඔවුන් ඒ වචනයක්වත් ඇහුණේ නැහැ වාගේ හිටියා. ඒ අය පරීක්ෂා කළා, 'අපේ හමුදාවේ ඉවසීම කොච්චරක්ද කියලා; 'අපේ පොලීසියේ ඉවසීම කොච්චරක්ද' කියලා. බණ්ඩාරනායක පිළිරුව ළඟ සිටි කණ්ඩායම ඉවත් කරන්න උසාවි නියෝගයක් නිකුත් කර තිබියදී, ඒ උසාවි නියෝගය එතැනට අරගෙන ගිය විටත්, "පලයන්, පලයන්! මෙතැනින් පලයන්!! අපේ ගමට එන්න එපා!" කියලා පොලිස් නිලධාරින්ව එළවා දැම්මේ මේ අය අධිකරණයටවත් සලකන්නේ නැහැ කියන එක පෙන්වමින්.

කැරලිකරුවන් එදා පාර්ලිමේන්තුවට ගිහි තැබුවා නම්, පාර්ලිමේන්තුව තමන්ගේ අතට ගත්තා නම් එතැනින් පස්සේ අධිකරණයටත් අත තියලා අධිකරණයත් ගිනි තැබීමේ සැලැස්ම තමයි, පාර්ලිමේන්තුවට එහා ගිහින් ඒ අරගළයේ කැරැලිකරුවන් අතට බලය ගැනීමේ සැලැස්ම තමයි ක්‍රියාත්මක වුණේ. අපි ස්තුතිවන්ත වෙනවා, එදා ජනාධිපතිවරයා තෝරා පත් කරගන්න ඡන්දය පවත්වපු වෙලාවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඡන්දය දීලා අද මේ තත්ත්වය ඇති කරන්න සහයෝගය දීපු සියලුදෙනාට.

මා ළඟ දැන් තිබෙනවා, එදා සමගි ජන බලවේගය, නම් ලකුණු කරන්න පාවිච්චි කරපු ලේඛනය. මේක රහස් ලියවිල්ලක් තමයි. නමුත් මම මේ අවස්ථාවේදී මේ ලේඛනය **සභාගත*** කරනවා.

මේකේ ලකුණු දාගෙන තිබෙනවා, "RW"ට කීයද, "DA"ට - ඩලස් අලහප්පෙරුමට - කීය ද කියලා. මේ කොළය දැක්කාම දන්නා අයට කාරණය වැටහෙනවා. මේ කොළයේ තිබෙනවා ඡන්දය දීපු හැටි. මේකේ හැටියට ගණන් හදලා අන්තිමට කියනවා, ඩලස් අලහප්පෙරුම මැතිතුමාට ඡන්ද 118ක් හම්බ වෙනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හම්බ වෙන්නේ ඊට අඩු ඡන්ද ගණනක් කියලා. ඒ මුලික ලියවිල්ල ඔවුන් ළඟ තිබුණා. ඒ ගණන් එකතු කරපු කොළය නම් නැහැ. හැබැයි, අපේ මන්ත්‍රීවරුන් ඒ ආකාරයට ඡන්දය දුන්නාද, නැද්ද කියන ප්‍රශ්නය අපි අහනවා. මෙවැනි ඡන්දයක්වත් කරගන්න බැරි විපක්ෂය අද මොන කථාවක්ද මේ කියන්නේ කියලා අපි අහනවා. මේ අයට පාර්ලිමේන්තුවේ ඡන්දයක්වත් හරියට handle කරන්න බැහැ. අන්තිමට තමන් දන්නේත් නැහැ, තමන් ළඟ හිටපු කී දෙනෙක් රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඡන්දය දුන්නාද කියලා.

හමුදාවේ නිලධාරින්ට අපි මේ වෙලාවේ ශක්තිය දෙන්න ඕනෑ. අපි මේ වෙලාවේ හදිසි නීතිය සම්මත කරන්න කියා ඉල්ලන්නේ මේ රටේ සාමාන්‍ය මිනිසුන් තළන්න පෙළන්න නොවෙයි; මේ රටේ ඉන්න මිනිසුන් වාර්ගිව බෙදලා ගැටුම් හදන්න නොවෙයි. මේ වෙලාවේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්න ඕනෑ. සුමන්තිරන් මන්ත්‍රීතුමා ඇහුවා, "දැන් අර්බුදය ඉවරයි. ජනාධිපතිවරයා එළවලා ඉවරයි. අගමැති ගිහිල්ලා ඉවරයි. මේ වෙන කොට ඒ අර්බුදකාරී තත්ත්වය ඉවරයි. ඉතින් දැන් මොකටද හදිසි නීතිය දමන්නේ?" කියලා. හදිසි නීතිය නොදැම්මා නම්, මේ විධියට හමුදාව ක්‍රියාත්මක නොවුණා නම්, මේ විධියට හමුදාවට අණ නොදුන්නා නම් අද පාර්ලිමේන්තුව ඉතුරු වෙන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරලා දෙන්න, මේ රටේ මිනිසුන්ට නිදහසේ ජීවත් වෙන්න ඉඩ හදන්න, සංචාරකයන්ට මේ රටට එන්න ඉඩ හදන්න, ආයෝජකයන්ට මේ රටට එන්න ඉඩ අවස්ථාව හදන්න තමයි, මේ රටේ නීතිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් නැවතත් එවන් නැඟී සිටීමක් ඇති නොවන්න තමයි, කැරලිකාරයන්ට නැඟිටින්න බැරි වෙන්න තමයි, ඒවාට අවශ්‍ය නීති ප්‍රතිපාදන සැලැස්වීම සඳහා තමයි මේ කටයුතු කරන්නේ. රටේ සාමය බලාපොරොත්තු වන කෙනෙක් ඉන්නවා නම්, රටේ සාමකාමී වාතාවරණයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදය බලාපොරොත්තු වන කෙනෙක් ඉන්නවා නම් මේ වෙලාවේ මේ හදිසි නීතිය සම්මත කරන්න ගෙන ආ යෝජනාවට සහයෝගය දීලා එයට පක්ෂව ඡන්දය දිය යුතුයි කියලායි මා කියන්නේ.

මේ වෙලාවේ අරගළයේ නියුතු තරුණයන්ගේ මතය සැලකිල්ලට ගන්න කියලා අපට යෝජනා කරනවා. ඔව්, ඒ සඳහා අපි සූදානම්. අරගළයේ තරුණයන් බලාපොරොත්තු වන වෙනස, මේ රටේ සිදු කළ යුතු වෙනස සිදු කරන්න අපි ඉතාම ඕනෑකමින් බලාපොරොත්තු වෙනවා. ඒ අය පාර්ලිමේන්තුවේ කටයුතුවලට සම්බන්ධ කර ගන්න, කමිටුවලට සම්බන්ධ කර ගන්න වාගේම මහජන සභා හදලා ඒ අයගේ අදහස් උදහස්, යෝජනා ගන්නත් අපි සූදානමින් ඉන්නවා කියන එකත් මම මේ වෙලාවේ මතක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා. 2.58]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ කථා කරන්න නැඟිට්ටේ හරිම කනගාටුවෙන්. මගේ මිත්‍රයා මීට මාස තුනකට ඉස්සෙල්ලා අපේ පැත්තේ ඉඳගෙන අපිත් එක්ක කථා කළ විධියයි, දැන් පාර්ලිමේන්තුවේදී මේ රටේ ජනතාව වෙනුවෙන් කථා කරන විධියයි දැක්කාම මට මේ වෙලාවේ කථා නොකර ඉන්න තරම් හිතුණා. මොකද, මනුස්සයෙක් ඒ තරම් ඉක්මනින් වෙනස් වෙන්නේ කොහොමද කියලා මට හිතාගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය කියලා තිබෙනවා අපේ රටේ ජනතාවගෙන් සියයට 50ක්, ඒ කියන්නේ අපේ රටේ පවුල් ලක්ෂ 60න් ලක්ෂ 30ක්, ලක්ෂ 220ක් වූ රටේ ජනතාවගෙන් ලක්ෂ 110ක් වේල් තුනෙන් එක වේලක් කන්නේ නැහැ කියලා. වේල් තුනෙන් එක වේලක් කන්නේ නැති ජනතාව තමන්ගේ අයිතිවාසිකම් දිනා ගන්න යම් අරගළයක් කරද්දී, හදිසි නීතිය මුවාවෙන් මේ රජය ගෙන යන රාජ්‍ය ත්‍රස්තවාදයට සමස්ත ජනතාවම විරුද්ධ වෙන්න ඕනෑ කියලා මම හිතනවා. ඇයි, මේ රටේ හදිසි නීතිය පනවන්න අවශ්‍ය වුණේ? වර්තමාන රජය සහ ඊට ඉස්සෙල්ලා හිටපු ජනාධිපතිවරයා ඇතුළු රජය මේ රටට කළ ඉතාම අනවශ්‍ය පීඩනය නිසා තමයි මේ රටේ ජනතාවට පාරට බහින්න සිද්ධ වුණේ. 2019 ජනාධිපතිවරණයෙන් පස්සේ මේ රටේ රාජ්‍ය ආදායම ශීඝ්‍ර ලෙස අඩු වෙන්න පටන් ගත්තා. ජනාධිපතිවරයා ගත්ත තීන්දු තමයි ඒකට බලපෑවේ. ඒ වාගේම රසායනික පොහොර තහනම නිසා රටේ ආහාර හිඟයක් ඇති වුණා. මේ තත්ත්වය නිසා රටේ ජනතාවට පාරට බහින්න සිද්ධ වුණා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ වන විට රටේ ජනතාවට තමන්ගේ නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය නැති වෙලා තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවට විරෝධය පළ කිරීමේ හැකියාවත් නැති වෙලා තිබෙනවා. අද හදිසි නීතිය ගෙනැල්ලා තිබෙනවා. එසේ හදිසි නීතිය ගෙනෙන්න ප්‍රධාන හේතුවක් තමයි, හදිසි නීතිය නැතිව රට පාලනය කරන්න බැරි තත්ත්වයකට අද රට පත් වෙලා තිබීම. හදිසි නීති රෙගුලාසිවල තිබෙනවා, "යම් පොලිස් නිලධාරියෙකු හෝ යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින්, ... වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම කළ හැකි වන අතර,..." කියලා. හදිසි නීතිය පැනෙව්වේ නැත්නම් පොලිස් නිලධාරියෙකුට මේ බලය නැහැ. අපි දැක්කා, හදිසි නීතිය පනවන්නත් ඉස්සෙල්ලා ඊයේ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ගුවන් යානයක් තුළදී යම් කිසි පුද්ගලයකු අත්අඩංගුවට ගන්න හදනකොට, "වරෙන්තුව කෝ?" කියලා අහද්දීත් කිසිම වරෙන්තුවක් නැතිව ඔහුව අත්අඩංගුවට ගනිපු හැටි. හදිසි නීතිය සම්මත කර ගන්නත් ඉස්සෙල්ලා ඉඳන්ම ඒක ක්‍රියාත්මක වෙනවා.

ඊළඟට, මේ රෙගුලාසිවල එක වගන්තියක තිබෙනවා, "... පොලිස් නිලධාරියාට අත්තනෝමතික බලතල ලබා දී ඇත" කියලා. මේ ආණ්ඩුව බලයට පත් වෙලා හදිසි නීතියත් එක්ක ඉතා භයානක විධියට තමයි මේ රට පාලනය කරන්න හදන්නේ. ඇයි මේ ආණ්ඩුවට මේ විධියට රට පාලනය කරන්න සිද්ධ වුණේ? රුපියල් 50ට තිබුණු පාන් රාත්තල අද වෙද්දී රුපියල් 200ට ගන්න සිදු වුණාම, රුපියල් 117ට තිබුණු පෙට්‍රල් ලීටරය රුපියල් 450ට ගන්න සිද්ධ වුණාම මේ රටේ ජනතාවට අරගළ කරන්න අයිතියක් නැද්ද? ඒකයි මේ අරගළය ඇති වෙලා තිබෙන්නේ. මැයි 09වැනි දා සාමකාමී අරගළයට ගහපු අයව අත්අඩංගුවට ගත්තාද? ඒ ගොල්ලන් අද යහතින් ඉන්නවා. ඊයේ ඒ එක මන්ත්‍රීවරයෙක් රූපවාහිනියට ඇවිල්ලා ප්‍රකාශයක් කරනවා අපි දැක්කා, ඒ අය ආරක්ෂා කරගන්න. 09වෙනි දා අරගළයට ගහපු අය අත්අඩංගුවට ගත්තාද? ඒක නොකර, මේ අහිංසක අරගළකරුවන් අත්අඩංගුවට ගන්න හදිසි නීතිය ගෙනෙන්නේ මොකටද? මැයි 09වෙනි දා සිදු වූ අරගළය නිසා මහින්ද රාජපක්ෂ මැතිතුමාට තනතුර දාලා යන්න වුණා. ජුනි 09වෙනි දා බැසිල් රාජපක්ෂ මැතිතුමාට ගෙදර යන්න වුණා. ජූලි 09වෙනි දා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ගෙදර යන්න වුණා. අරගළකරුවන් මේ සියල්ල කළේ තමන්ගේ බඩගින්න වෙනුවෙන්. ඒ ආණ්ඩුව කළ ඉතාම අදූරදර්ශී ක්‍රියාමාර්ග නිසා තමයි මෙහෙම වුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට නියමිත වේලාව අවසන්.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් අරගළයට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ නිසා හදිසි නීතිය ගෙනැල්ලා තිබෙනවා. වර්තමාන ජනාධිපතිතුමා අගමැති වෙච්ච වෙලාවේ මොකක්ද කිව්වේ? මොකක්ද එතුමා කිව්වේ? "ගෝඨාගෝගම" ආරක්ෂා කරනවා කිව්වා. ගෝඨාගෝගමට කමිටුවක් පත් කරලා, හිටපු ඇමතිවරයෙක් පත් කරලා ආරක්ෂාව දෙනවා, සම්පත් සපයනවා කිව්වා. අන්තිමට මොකක්ද කළේ? එතුමා ජනාධිපති වෙලා පැය 24ක් ගියේ නැහැ, සන්නද්ධ පොලිස් නිලධාරින් දාලා බැටන් ප්‍රහාර එල්ල කරලා ඔවුන්ව එතැනින් එළවලා දැම්මා. මේක ඉතාම කෲරතර පහරදීමක්. එහෙම තිබියදී අද හදිසි නීතිය ගෙන ඒමට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. සමගි ජන බලවේගයේ අපි මේ හදිසි නීතියට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එල්ටීටීඊ එක පරාජය කරලා වසර ගණනාවකට පසුව, එහෙම නැත්නම් දශකයකට විතර පසුව නැවත වතාවක් හදිසි නීති විවාදය මේ පාර්ලිමේන්තුවේ පවත්වයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ. කෙසේ වෙතත්, අද හදිසි නීතිය ගැන අපි සාකච්ඡා කරනවා. මේ මූළු කාරණය දිහා බැලුවාම, 09 වැනි දා ඇති වුණු සියලු අරගළ පිටුපස තිබෙන්නේ ඇත්තටම විප්ලවීය කථාවක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒ පිටුපස තිබෙන්නේ මේ රටේ ආර්ථික අර්බුදයේ ස්වරූපය. මේක තමයි ඇත්ත. හැබැයි, ඒ ආර්ථික අර්බුදය තේරුම් ගන්නේ නැතිව මැයි 09 වැනි දා අරගළය ආරම්භ කළේ ඔය පැත්තෙන්. වෙන කවුරුවත් නොවෙයි ඒක කළේ. ඒක අමතක කරලා ආපහු සැරයක් මෙහා පැත්තට හැරෙන්න අයිතියක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. නැත්නම් මේ තත්ත්වය මේ මට්ටමට තල්ලු වෙන්නේ නැහැ. එතැනදී යම් කොටසක් හැසිරුණු ආකාරය මම පිළිගන්නේ නැහැ. කාගේ හෝ චේවා නිවාස ගිනි තැබීම් පිළිගන්නේත් නැහැ. අනාගතයේ ඒවා කරනවාට මම කැමතිත් නැහැ. හැබැයි, අද වෙනකම් මේ රජයට පුළුවන් වෙලා නැහැ, මේ මහා ආර්ථික වියවුලට උත්තර දෙන්න. අඩු ගණනේ, "කරන්නේ මේකයි" කියලාවත් කියන්න පුළුවන්කමක් නැහැ. ඒ වෙනුවට, කඳකට අලුත් ඔළුවක් සවි කළා කියලා කිසිම දවසක ඒක සාර්ථක වෙන්නේ නැහැ. එහෙම නම්, ආපහු සැරයක් ආවර්ජනය කරන්න ඕනෑ, මේක කරන්නේ කොහොමද කියලා. වරද්දා ගන්න එපා, පැහැදිලිව මේක ලංකාවේ තිබෙන දැවැන්ත ආර්ථික අර්බුදයක්. මේ අර්බුදය, ළඟා කර ගත් ආර්ථික අර්බුදයක්. කිසිම කෙනෙකුට තේරුණේ නැහැ, මේ විධියට ණය ගත්තාම ගෙවන්න බැරි වෙනවා, ගෙවන්න බැරි වුණාම මේ වාගේ කලබලයක් එනවා කියලා. එසේ කලබලයක් එන්නට කලින් කරන්න ඕනෑ මොකක්ද කියලා තර්ක කරන්න පුළුවන් කිසි මිනිහෙක් හිටියේ නැහැ.

ඔබතුමන්ලාට මතක ඇති, ඒ කාලයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හිටියේ අපි ඔක්කෝටම ඉහළින් බව. ඒ නිසා ඒ ගොල්ලන් කථා කරන දේ දේව වාක්‍ය වුණා. අපි කථා කරන දේ සාමාන්‍ය මිනිසුන්ගේ වාක්‍ය වුණා. ඒ නිසා අපට වැරදුණා. ඉතින්, හදිසි නීතිය දමලා මේ තත්ත්වය වෙනස් කරන්න පුළුවන් වෙයි කියා මම හිතන්නේ නැහැ. ඒකයි, මම මේ කියන්න උත්සාහ කරන්නේ. ලංකාවේ සාමාන්‍ය නීතිය ගත්තාම, ඕනෑම විධියකට ක්‍රියා කරන්න මේ රටේ නීති පද්ධතිය ශක්තිමත්. මම මේකේ නීති උපාධිය ගන්න යන්නේ නැහැ. නමුත් මමත් දන්නවා, අධිකරණ ඇමතිතුමාත් දන්නවා, දණ්ඩ නීති සංග්‍රහය සහ අධිකරණයට අදාළ අනෙක් නීති අණපනත් අපට සම්පූර්ණයෙන්ම ප්‍රමාණවත් බව. හදිසි නීතිය දැම්මෙන් කරන්නේ තමන්ට කරන්න බැරි දෙයක් ඒ හරහා කරන එකයි. මට නම් මේකට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ලංකාවේ සාමාන්‍ය නීතිය ශක්තිමත්ව තිබෙනවා. සාමාන්‍ය නීතිය යටතේ ක්‍රියා කරන්න. මම කියන්නේ ඒකයි. මොකද, මේ ආර්ථික අර්බුදය වෙනස් කරන්න පුළුවන් වෙන්නේ තමුන්නාන්සේලා ඒකට උත්තරයක් හෙව්වොත් විතරයි. එතෙක් මොනවත් නවතින්නේ නැහැ. ඒ නිසා මේක හුදු කණ්ඩායමකට ලඝු කරන්න එපා. යම්කිසි ක්‍රියාමාර්ගවලට ලඝු කරන්නත් එපා. ඒ වෙනුවට, නිවැරදිව මූලයන් සොයා ඒ මූලයන්ට උත්තර දෙන්න

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

තමුන්නාන්සේලා කල්පනා කරන්න ඕනෑ. එහෙම නැතිව, අපි එදා කරපු දේ අද සාර්ථක වෙන්නේ නැහැ. මොකද, එදා තිබුණු තත්ත්වය නොවෙයි අද සමාජය තුළ තිබෙන්නේ. තෙල් ටිකක් බෙදා ගන්න බැරි නම්, කෑම ටිකක් සාධාරණ මිලකට දෙන්න බැරි නම්, ඉස්පිරිතාලයකට ගියාම පිටින් ඖෂධ ගන්න කියනවා නම්, එතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද කියා බලන්න ඕනෑ. ආණ්ඩුව ඉස්සෙල්ලාම මේක තේරුම් ගන්න. තේරුම් අරගෙන ඒකට උත්තර හොයන්න. ඒ සඳහා මහජනයා එක්ක සාකච්ඡා කරන්න. මහජන සභා එකතු කරන්න. වෘත්තිය සමිති සම්බන්ධ කරගන්න. එහෙම නැතිව කවදාවත් මේක විසඳන්න බැහැ.

මම කියන්නේ මේකයි. තමුන්නාන්සේලාට ලොකු වගකීමක් තිබෙනවා, මේ රටේ තිබෙන සියලු දේශපාලන පක්ෂ එක්ක කථා කරලා පොදු එකඟතාවලට එන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ඔබතුමාට.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම ඉක්මණින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමුනාන්නාසේලා ආණ්ඩු කරන්න. නමුත් පොදු එකඟතා ඇති කරගෙන අපි හැමෝම සම්බන්ධ කරගෙන ජනතාව ඉස්සරහට යන්න. අන්න එතකොට මේ අරගළය අවසන් වෙනවා. ජනතාවගේ ප්‍රශ්නයට විසඳුම් හොයන්නේ නැතිව, එකපාරට හදිසි නීතිය ගෙනාවාට වැඩක් වෙන්නේ නැහැ. ඒක හරියට, පය බරවායට පිටකර බෙහෙත් බඳිනවා වාගේ වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ අපි කථා කරන්නේ, හදිසි නීතිය ගැන. නොයෙක් කාල සීමාවලදී මේ රටේ හදිසි නීතිය පනවා තිබුණා. නමුත්, මේ වෙලාව ඊට වඩා බොහෝ වෙනස්. දැන් මේ හදිසි නීතිය පනවන්න යන වෙලාව මේ රටේ සමස්ත ජනතාව ප්‍රශ්න රාශියකින් ඔළුව පුරවාගෙන ඉන්න වෙලාවක්. මේ වෙලාවේ රටේ ජනතාවට කන්න නැහැ. අම්මලා තාත්තලාගේ අත් දෙක අල්ලාගෙන දරුවෝ අඬනවා, "අපට බඩගිනියි, අම්මේ, තාත්තේ, අපට කන්න දෙන්න" කියලා. හැබැයි, අම්මාට, තාත්තාට දරුවන්ට කන්න දෙන්න ක්‍රමයක් නැහැ. මොකද, ජීවත් වෙන්න ඔවුන්ට ආදායමක් නැහැ. ඊළඟට, තෙල් පෝලිමට ගියාට තෙල් ටික නැහැ. මොකද, ෂෙඩ් එකට එදාට තෙල් ටික ඇවිල්ලා නැහැ. ඊළඟ දවසේ තමයි තෙල් ටික එන්නේ. ඒ වාගේ ප්‍රශ්න රාශියක් තිබෙනවා. එක පැත්තකින් තෙල් ප්‍රශ්නය, තවත් පැත්තකින් ගෑස් ප්‍රශ්නය. අනෙක් පැත්තෙන් තමන්ගේ ව්‍යාපාරය කර ගන්න බැහැ, රැකියාව කර ගන්න බැහැ. සතියකට දවස් හතරක් තෙල් පෝලිමේ හිටියාම වැඩ කර ගන්න පුළුවන් වෙන්නේ දවස් තුනයි. එවැනි කාල සීමාවක හදිසි නීතිය පනවලා මේ කරන කාර්යය සම්බන්ධව තමයි අපට ප්‍රශ්නය තිබෙන්නේ.

මේ අරගළය ගැන අර කථා මේ කථා ගොතලා කියලා, අරගළය නිසාම දැන් සුර සැප විඳින, එහෙම නැත්නම් වරප්‍රසාද බුක්ති විඳින කණ්ඩායම තමයි දැන් අරගළයට ඇඟිල්ල දිගු කර කර බණින්නේ. හැබැයි, 'අරගළය' කියන්නේ මොකක්ද කියලා අපි හඳුනා ගන්න ඕනෑ. ගෝල් ෆේස් එකේ තිබෙන අරගළය ගැන නොවෙයි අපි කථා කරන්නේ. ගෝල් ෆේස් එකේ තිබෙන අරගළය එකක්. හැබැයි, හැම ගෙදරකම අරගළයක් තිබෙනවා, ජීවත් වීම සඳහා. අන්න ඒක ගැන අපි පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ. නමුත්, ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ගෝල් ෆේස් එකේ පොඩි කණ්ඩායමක් කරන අරගළය ගැන තමයි හැමෝම කථා කරන්නේ.

මේ හදිසි නීතිය යටතේ තිබෙන කාරණා මොනවාද බලන්න. පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක, මුහුදු වෙරළක හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැඟිල්ලක කවුරු හරි එකතු වෙලා ඉන්නවා නම්, පොලීසියට, ගුවන් හමුදාවට, නේවි එකට, ආමි එකට ඒ සියලුදෙනාම එතැනින් පලවා හරින්න පුළුවන්. පලවා හරින්න පුළුවන් විතරක් නොවෙයි, සමහර වෙලාවට ඒ අය වැරදිකරුවන් හැටියට ගෙනිහිල්ලා දවස් හතක් prison එකේ තියාගන්නත් පුළුවන්. එහෙම නැත්නම්, දවස් හතක් තමන්ගේ භාරයේ -පොලීසියේ- තියාගෙන ප්‍රශ්න කරන්න පුළුවන්. මේ කාරණාව ගැන හිතලා බලන්න. මෙතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, මිනිසුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වීම. මිනිසුන්ට කන්න නැති නිසා, අඳින්න නැති නිසා මිනිස්සු කෑ ගහලා පාරට එනකොට, මේ හදිසි නීතිය යටතේ කියනවා, "උඹ අපි කියපු විධියට හිටපන්, කන්න බැරි නම් ගෙදර නිකම් හිටපන්" කියලා. මේ රටේ නීතිය, පාරට එන මිනිහාගේ බෙල්ල මිරිකලා ගේ අස්සට දමන එක නම්, තවදුරටත් මිනිස්සු මේ රටේ ජීවත් වෙන්න ඕනෑද? අන්න ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

ධීවරයාට වෙච්ච දේ බලන්න. අද ධීවරයාට භූමිතෙල් ටික නැහැ. සුළුපන්න ධීවරයාට සති ගණනක් තිස්සේ භූමිතෙල් ටික ලැබිලා නැහැ. විෂය භාර ඇමතිවරයා හමු වුණත්, ඒ ප්‍රශ්නයට හරියට උත්තරයක් ලැබෙන්නේ නැහැ. ධීවරයාට භූමිතෙල් ටික ලැබෙන්න තවත් කොච්චර කාලයක් යාවිද දන්නේ නැහැ. ඒ පවුල් සියල්ලම ඉවරයි. ඒ පවුල්වලට යන්න තැනක් නැහැ. ඒ වාගේම අපට අවශ්‍ය හොඳම පෝෂ්‍යදායී ආහාරයක් වන මත්ස්‍ය සම්පත ගොඩට එන්නේ නැහැ. එතකොට ජනතාවට කන්න තිබෙන පෝෂ්‍යදායී කෑමක් අඩු වෙනවා. අද අත්‍යවශ්‍ය භාණ්ඩ ටික මිලදී ගන්න බැරි තත්ත්වයක ඉන්න ජනතාවට මාළු ටිකත් නැතිව යනවා, ධීවර පවුල් ටිකත් සම්පූර්ණයෙන් විනාශ වෙනවා. හැබැයි, ධීවරයා පැහැදිලි කථාවක් කියනවා. මොන හදිසි නීතිය දැම්මත්, ලබන සතියේ ධීවරයාට භූමිතෙල් ටික දුන්නේ නැත්නම්, ධීවරයා එළියට ඇවිල්ලා ආණ්ඩුවත් එක්ක ඒක බලා ගනීවි. මතක තියාගන්න, තමුන්නාන්සේලා ජනතාව එක්ක සෙල්ලම් කරන්න සූදානම් වෙන්න එපා. හදිසි නීතිය පනවලා තමුන්නාන්සේලා මේ කරන්නේ, ජනතාවගේ ජීවන තත්ත්වය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කිරීම, එහෙම නැත්නම් විනාශ කිරීම. අන්න ඒකට තමයි අපි විරුද්ධ. එහෙම නැතිව වෙනත් කාරණාවක් නිසා නොවෙයි. බොහොම ස්තුතියි.

[අ.භා. 3.12]

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම අපේ නව අග්‍රාමාත්‍යතුමාටත්, සභානායකතුමාටත් මම සුබ පතනවා. අද අපට හදිසි නීතිය අවශ්‍ය ඇයි කියන කාරණය පිළිබඳව පක්ෂ, විපක්ෂව කරුණු ගණනාවක් ඉදිරිපත් වුණා. සැබෑ වේදනාවක් තිබෙන, කම්පනයට පත් වුණු මිනිස්සු මහ පාරට ඇවිල්ලා රජයට විරුද්ධව කැරලි ගසා කරන සැබෑ අරගළයක් අපට සාධාරණීකරණය කරන්න පුළුවන්. ඒකේ ප්‍රතිඵලයක් විධියට හිටපු අගමැතිතුමා ගියා, හිටපු මුදල් ඇමතිතුමා ගියා, හිටපු ජනාධිපතිතුමා ගියා. ඒ අරගළකරුවන්ගේ විරෝධයට භාජන වූ සියලුදෙනාම දැන් එළියට ගිහිල්ලා ඉන්නේ. දැන් තිබෙන්නේ අලුත් ආණ්ඩුවක්. මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ අලුත් ආණ්ඩුවත් එක්ක අප ඉදිරිපිට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

මීට මොහොතකට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, හදිසි නීතිය පැනවීමේ තිබෙන අසාධාරණය ගැන. හැබැයි, මම මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. අද මහ බැංකුවේ අධිපතිතුමා කියනවා, අපි මේ තත්ත්වයෙන් ගොඩ එන්න නම්, මේ ආර්ථික අර්බුදයෙන් මිදෙන්න නම්, IMF එකත් එක්ක සාකච්ඡා කරලා ඒ ආධාර මුදල් ටික ගන්න ඕනෑ කියලා. මේ තිබෙන කැරලි කෝලාහල සහ ප්‍රචණ්ඩත්වයත් එක්ක IMF එක මේ කාරණයට අපිත් එක්ක එකඟ වෙයිද කියන ප්‍රශ්නය තිබෙනවා කියලා ඊයේ-පෙරේදා මහ බැංකු අධිපතිතුමා මාධ්‍ය තුළින් කියනවා මම දැක්කා. ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටින ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියක් කියනවා, මේ ප්‍රචණ්ඩත්වය සහ අරගළය නුඹලාගේ රටින් තුරන් කළේ නැත්නම් නුඹලාට සත 25ක මුදලක්වත් මූල්‍ය ආයතනවලින් ගන්න පුළුවන් වෙන්නේ නැහැ කියලා. ඔවුන් ඒක දැඩි සේ, පුන පුනා කියනවා. එහෙම නම්, අපි මේ තත්ත්වය බුද්ධිමත් විධියට කළමනාකරණය කරන්නේ කොහොමද? මේ රටේ මූල්‍ය පාලනයේ වැදගත්ම හා සුවිශේෂීම ස්ථානය තමයි, පාර්ලිමේන්තුව. අපි මේ රටේ මිනිසුන්ට කන්න බොන්න දෙන්න ඕනෑ, මේ රටේ මිනිසුන්ට ගෑස් ටික, ඉන්ධන ටික, බෙහෙත්-හේත් ටික දෙන්න ඕනෑ. අපි හැමදාම විලාප දෙමින්, පත්වන ආණ්ඩුවලට, රාජ්‍ය නායකයන්ට, මහජන නියෝජිතයන්ට තනතුරු අතහැරලා එළියට පලයල්ලා කියලා චෝදනා කළාට මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ නැහැ. ඒ හින්දා අපි කැමැති වුණත්, අකැමැති වුණත් අද මේ රටේ තිබෙන ප්‍රචණ්ඩත්වය, කැරලි කෝලාහල ටික අවම කරලා රට සන්සුන් කළේ නැත්නම් මූල්‍ය ආයතන අපේ රට දිහා පස්ස හැරිලාවත් බලන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒ කාරණය පදනම් කරගෙන තමයි අද මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යම් යම් විධිවිධාන ගැසට් කරලා සන්නද්ධ හමුදාව කැඳවා හදිසි නීතිය පනවන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ වෙලාවේ මේ පාර්ලිමේන්තුව බුද්ධිමත් විධියට මේ ප්‍රශ්නය තේරුම් බේරුම් කර ගන්න අවශ්‍යයි.

අපි මේ ගැන නැවත නැවත සාකච්ඡා කරමින්, අපේ දේශපාලන න්‍යාය පත්‍රවල එල්බගෙන දිගින් දිගටම ඒ තත්ත්වයන් පැහැදිලි කරන්න ගියොත්, මේ රටේ මිනිස්සු මහ පාරේ මැරිලා වැටෙනවා. මම හිතන විධියට මේ වෙනකොටත් තෙල් පෝලිම්වලදී 25දෙනෙකුට වඩා මියැදිලා තිබෙනවා. මේ කාලකණ්ණි තත්ත්වය නැවත බැලීමේ ආශාවෙන් අපි ප්‍රචණ්ඩත්වයට උඩ ගෙඩි දීලා, ප්‍රචණ්ඩත්වය වපුරන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කර දීලා මේ රට ලේ විලක් කරනවාද, එහෙම නැත්නම් මේ රටේ ජනතාව තෝරා පත්කර ගත් ගරු මන්ත්‍රීතුමන්ලා 225දෙනා තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර ටික පැත්තකට දාලා මේ අර්බුදකාරී අවස්ථාවේදී මේ රට නැවත නඟාසිටුවන්න, මේ රටේ මිනිසුන්ගේ කුසගින්න නිවන්න, මේ රටේ මිනිසුන්ට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ටික, ඉන්ධන ටික, බෙහෙත් ටික, පොහොර ටික දීලා මේ රට සුඛිත මුදිත කරන්න තීන්දු ගන්නවාද කියලා අපට හිතා බලන්න වෙනවා. ඒ හින්දා මේ වෙලාවේ බුද්ධිමත් මහජන නියෝජිතයන්ගේ ඒකායන තීන්දුව විය යුත්තේ, මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට මේ රටේ දැන් තිබෙන තත්ත්වය සාමකාමී කරලා, මූල්‍ය ආයතනවලට ලංකාවට එන්න ඉඩ ප්‍රස්ථාව සලසා දීලා, මහජන ආරක්ෂක ආඥාපනතේ යම් යම් විධිවිධාන ක්‍රියාත්මක කරලා රට සන්සුන් කිරීමයි. ඒකෙන් අදහස් කරන්නේ, මේ රටේ සිටින නිරායුධ මිනිසුන්ට හිරිහැර කිරීම, ඔවුන්ව තළා පෙළීම, ඔවුන් සිර අඩස්සියට ගැනීම නොවෙයි. නමුත්, අපි මේ තත්ත්වය, මේ නීතිය ආරෝපණය නොකළොත්, මේ රටේ සන්නද්ධ හමුදාවට, පොලීසියට ක්‍රියාත්මක වෙන්න පුළුවන්කමක් නැහැ. පසුගිය කාලයේ මේ නිදහස් අරගළය නිසා මේ රටේ සන්නද්ධ හමුදාව සහ පොලීසිය අන්තිම පහත් තත්ත්වයට වැටිලා, ඒ මිනිසුන්ට ආත්ම ගරුත්වයක් ඇතිව රැකියාව කර ගන්න බැරිව බරපතළ විධියේ හිංසනයකට ලක් වුණාය කියන එකත් අමතක කරන්න එපා. එම නිසා මම මේ වෙලාවේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් බොහොම බැඟපත්ව සහ බොහොම ඕනෑකමින් ඉල්ලීමක් කරනවා. මා කරන මේ කථාව දේශපාලන කථාවක් නොවෙයි. රාජපක්ෂ ආණ්ඩුව පිළිබඳව, රාජපක්ෂ ආණ්ඩුව ගත් තීන්දු තීරණ පිළිබඳව එදා අපටත් ප්‍රශ්නයක් තිබුණා. ඒක නිසා තමයි අපි එදා ස්වාධීන මන්ත්‍රීවරු විධියට කටයුතු කරන්න තීරණය කළේ. හැබැයි, අපි එහෙම සිටියා කියලා මේ රටේ මිනිසුන්ගේ දැවෙන ප්‍රශ්න පිළිබඳව තීන්දු තීරණ ගන්නකොට රාජපක්ෂ ආණ්ඩුව, එහෙම නැත්නම් රාජපක්ෂවරු පිළිබඳ කරුණු ඉස්සරහට දමා මහජනතාවගේ අවශ්‍යතා පැත්තකට හෙළනවා නම්, අපි මන්දබුද්ධික මිනිස්සු කියලා තමයි කියන්න වෙන්නේ. එම නිසා අපි මේ වෙලාවේ හදිසි නීතිය පිළිබඳව වූ යෝජනාව සම්මත කර දීලා මේ රට සාමකාමී කරන්න කටයුතු කරමු කියා යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හදිසි නීතිය පසුගිය මාස දෙක තුළ දෙතුන් වතාවක්ම පැනවූවා. නමුත්, ජනතා විරෝධයත් එක්ක, නීතිඥ සභායත් එක්ක අපට ඊට විරුද්ධව නැඟී සිටින්න පුළුවන් වුණා.

දැන් අද මේ හදිසි නීතිය පනවන්නේ මොකටද? ප්‍රථමයෙන්ම, මේ රටේ විශාල අරගළයක් තිබෙන බව අපි දන්නවා. ගෝල්ෆේස් අරගළය පමණක් නොවෙයි, සමස්තයක් හැටියට මේ රටේ ජනතාවට ජීවත්වීමේ අරගළයකටත් මුහුණ දෙනවා. එතකොට ආණ්ඩුවට විරුද්ධව ජනතාව නැඟී සිටිනවා. ආණ්ඩුවට විරුද්ධව නැඟී සිටින ජනතාවට විරුද්ධව තමයි මේ හදිසි නීතිය පනවන්නේ. වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි. මේ රටේ

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

ජනතාව වෙනුවෙන්, ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් හදිසි නීතිය පනවන්නේ නැහැ. අද ඇත්තටම හදිසි නීතිය පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ මේ රටේ ජනාධිපතිවරයා ඇතුළු මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් ආරක්ෂා කරන්නයි. එහෙම නැත්නම්, "මේ රටේ ජනතාවට ත්‍රස්තවාදීන්ගෙන් ලොකු ගැටලුවක් තිබෙනවා. මේ රටේ ජනතාවට ඉතා දරුණු ප්‍රහාරයක් එල්ල වෙනවා. ඊට විරුද්ධව අපි සූදානම් වෙන්න ඕනෑ" කියලා හදිසි නීතිය ගෙන ඒමක් නොවෙයි අද සිද්ධ වෙන්නේ. මේක අපට ඉතා පැහැදිලියි.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත්වෙලා උදේ 10.00ට දිවුරුම් දුන්නා; දවල් 12.00ට හදිසි නීතිය දැම්මා; රෑ 12.00ට ගෝල්ෆේස් එකේ ඉන්න අයට ගහන්න පටන් ගත්තා. ඒකයි වුණේ. ජනතාව නැඟී සිටින එකට විරුද්ධව හදිසි නීතිය දැමීමට හේතුව තමයි, මේ තිබෙන ප්‍රශ්නවලට ජනතාව පිළිගන්නා විසඳුමක් මේ පාර්ලිමේන්තුව ලබා දීලා නැති එක. තිබෙන ප්‍රශ්නවලට මේ සමාජය පිළිගන්නා විසඳුමක් මේ පාර්ලිමේන්තුවෙන් ලබා දුන්නා නම් හදිසි නීතියක් අවශ්‍ය වෙන්නේ නැහැ. ප්‍රශ්නවලට විසඳුමක් ලබා දුන්නා නම් ජනතාව මේ ආණ්ඩුවට, මේ මැති ඇමතිවරුන්ට විරුද්ධව නැඟී සිටින්නේත් නැහැ. ඉතින් අපි මේ කාරණය තේරුම් ගන්න අවශ්‍යයි. අපි සියලුදෙනා එකතු වෙලා මේ පාර්ලිමේන්තුවෙන් මේ සමාජය පිළිගන්නා විසඳුමක් ලබා දිය යුතුයි. දැන් සිද්ධ වුණේ මොකක්ද? ජනාධිපතිවරයා පත් වෙලා පැය 24ක් යන්න කලින් මේ ප්‍රහාරය එල්ල කිරීම තුළින් අද ජාත්‍යන්තර වශයෙන් අපට ලොකු හානියක් වෙලා තිබෙනවා; රටට කළු පැල්ලමක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා IMF එක Staff-level Agreement එක ලබා දීමත් කල් දාලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. European Union එක පැහැදිලිවම අහනවා, ප්‍රශ්න කරනවා, GSP Plus සහනය මේ රටට අවශ්‍යද, නැද්ද කියලා. මේ අනවශ්‍ය ක්‍රියා නිසා ජාත්‍යන්තර වශයෙන් අපි මේ විධියට කොන් වෙනකොට ඒක මේ රටේ අපි හැමෝටම බලපානවා. ඒ නිසා අපට ලොකු වග කීමක් තිබෙනවා. විරෝධතාවක යෙදී සිටි තරුණයෙක් අදත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා වෙන වෙන හේතු නිසා. අපි දැක්කා, ඊයේ plane එක ඇතුළේ ඉන්නකොට පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්න කටයුතු කළ ආකාරය. අත්අඩංගුවට ගැනීම් කරන්න පුළුවන්. නමුත්, අද ඉතා පැහැදිලිව පෙනෙන දෙයක් තමයි මර්දනය කරන්නයි මේ විධියට අත්අඩංගුවට ගන්නේ කියන එක. වෙන කිසි දෙයක් නිසා නොවෙයි. මේ රටේ ජනතාව මර්දනය කරලා, භය කරලා, පාගාගෙන ඉන්න උත්සාහ කරන රජයක් තමයි මේ තිබෙන්නේ. මේ හදිසි නීතිය පැනවීම ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුත්තක් නිසා ඒ ගැන දෙවතාවක් හිතන්න කියලා මේ වෙලාවේ මම මතක් කරනවා. *[බාධා කිරීමක්]* හොඳයි, මම කථාව අවසන් කරන්නම්.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත වෙලාව අඩු කළාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමාට කලින් විනාඩි 4යි තිබුණේ. විනාඩි 5ක් තිබුණේ නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට විනාඩි 5ක කාලයක් තිබුණා නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 5ක කාලයක් ලබා දීලා තිබුණේ නැහැ. කලින් විනාඩි 5ක් දෙන්න ඇති. නමුත්, කාලය කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය නිසා ඒක විනාඩි 4ක් බවට පත් වුණා.

[අ.භා. 3.22]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම කියනවා, මාසයක් ගතවෙනකොට මේ රටේ ආණ්ඩු 4ක් පත්වුණ බව. මේ රටේ පවතින්නේ කොයි තරම් අස්ථාවරභාවයක් ද කියන එක අපට එයින්ම තේරුම් යනවා.

දැන් මේ අරගළයේ යෙදී ඉන්නා වූ අය මර්දනය කිරීමට යනවා නම්, සිවිල් යුද්ධයක් ඇතිවෙයි කියලා අරගළයේ ඉන්න අයගේ නියෝජිතයෝ කියනවා. එතකොට මේ මර්දනයට යන අයත්, මේ මර්දනයට මුහුණදෙන අයත් එකට හමුවෙන point එකක් තිබෙනවා. ඒ තමයි සිවිල් යුද්ධය. සිවිල් යුද්ධයක් ඇති වුණාම මේ රටේ ඇතිවෙන බරපතළ තත්ත්වය ගැන මම කියන්න ඕනෑ නැහැ. අපට මීට පෙර ඒ පිළිබඳ අත්දැකීම් තිබෙනවා. ඊට වඩා හුහක් බිහිසුණු ආකාරයට මේ සිවිල් යුද්ධය ඇති වෙන්න පුළුවන් කියන එක මගේ සැකයයි. සිවිල් යුද්ධයක් ඇති වුණාම තමයි මේ රටට විදේශ හමුදාවලට කඩා වදින්න පුළුවන් වෙන්නේ. ඒ නිසා අපි ඒ පිළිබඳවත් දැනගත යුතුයි. අපේ රටේ මේ අරගළයේ ඉන්නා අය ඒ ගොල්ලන්ගේ යෝජනා ඉදිරිපත් කරනවා. අපි ඒ අයටත් මේ පාර්ලිමේන්තුවට එන්න ඉඩක් හදමින්, අද තිබෙන ඡන්ද ක්‍රමයට වඩා සාධාරණ ඡන්ද ක්‍රමයක් ඇති කරලා ඡන්දයකට යැමයි අපට තිබෙන්නේ.

මේ හදිසි නීතිය සම්මත කරන්න කියලා අපට කියන්න ඉස්සෙල්ලා ජනාධිපතිතුමා අපට මාර්ග සිතියම පෙන්වන්න ඕනෑ, ප්‍රජාතන්ත්‍රවාදය කරා මේ රට ආපසු ගෙන යන. ප්‍රජාතන්ත්‍රවාදය යට කිරීමක් තමයි මේ හදිසි නීතියෙන් වෙන්නේ. එවැනි නීතියක් ඉදිරිපත් කරනකොට නැවත අපි ප්‍රජාතන්ත්‍රවාදයට යන්නේ කොහොමද කියලා එතුමා අපට මාර්ග සිතියමකින් පෙන්වන්න ඕනෑ. ඒ සඳහා අපට ඡන්දයකට දින ලැබෙනවාද? ලබන අවුරුද්දේ මාර්තු වෙනකොට පළාත් පාලන මැතිවරණයේ ඡන්දය තියලා ඉවර වෙන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණය ලබන වසරේ පෙබරවාරි විතර තියන්න ඕනෑ. කෝ, ඒකට සූදානමක් තිබෙනවා ද? නැත්නම් නැවතත් මේ පළාත් පාලන ආයතන කොමසාරිස්වරුන්ට බාරදීලා ඒ ඡන්දය කල් දාන්න යනවා ද? එහෙම නම් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කොහේටද යන්නේ?

අපි මතක තියා ගන්න ඕනෑ, මේ අරගළකරුවන් ඒ ඒ සිදුවීම්වලට පොළඹවන අය ඉන්න බව. ඔවුන් කියනවා, "ඔව්,

උඹලාට බලය ගන්න පුළුවන්. ඉස්සරහට පලයන්. මර්දනයට මුහුණ දෙන්න උඹලාට පුළුවන්. උඹලාට මේ රටේ ජනාධිපති එළවන්න පුළුවන් වුණා. මේ රටේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු අගමැතිවරු වෙලා, තවත් මන්ත්‍රීවරු සභානායකවරු වෙලා තිබෙනවා." කියලා. -අගමැතිවරු, සභානායකවරු වූ අයට අපි සුබ පතනවා.- "එවැනි පාලන පෙරළියක් ඇති කළේ උඹලායි. එහෙම පාලන පෙරළියක් ඇති කරපු ජනතා බලය උඹලාට තිබෙනවා නම්, උඹලාට පුළුවනි මේ රටේ බලය ගන්නත්" කියලා අරගළකරුවන් පොළඹවන අය කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරන්නම්.

මට අවසාන වශයෙන් එක දෙයයි කියන්න තිබෙන්නේ. මේ අරගළකරුවන්ගේ බලය නැඟී එනවා නම් අපට හමුදාව, පොලිසිය දාලා ඒක බේරා ගන්න පුළුවන්. නමුත්, ජනාධිපතිතුමාගේ බලය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කරන්න යනවා නම්, අපි මොකක් දාලා ද ඒක නවත්වන්නේ? එසේ කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) SUREN RAGHAVAN *left the Chair, and* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

[අ.භා. 3.28]

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට රට ඉතාම භයානක තැනකට ඇවිල්ලා තිබෙන්නේ. මොකද, අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා කරපු ප්‍රකාශවලින් අපි දැක්කා, මේ වන විට අපේ රටේ තිබෙන තත්ත්වය මොකක්ද කියලා. අද අපේ රටේ නීතියේ ආධිපත්‍යය සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා ඉවරයි. ඒ වාගේම රටේ නීතිය පිළිගන්නවා කියලා පාර්ලිමේන්තුවට ආපු සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියනවා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වැඩක් නැහැ, නීතිවලින් වැඩක් නැහැ, අපි ළඟ තිබෙනවා අලුත් සම්මුති, ඒ කැලෑ නීතිය අනුව තමයි මේ රට පාලනය කරන්නේ" කියලා. එවැනි දේවල් පසුගිය දවස්වල ප්‍රකාශ කරපු ආකාරය අපි දැක්කා. ඒ වාගේම රටේ නීතිය රකිනවා කියලා දිවුරුම් දීලා ආපු සමහර නීතිඥවරු, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වැඩක් නැහැ. අලුත් සම්මුතිවලට තමයි වැඩ කරන්නේ. කැලෑ නීතිය අනුව තමයි වැඩ කරන්නේ" කියලා පොලිස් මූලස්ථානය ඉදිරිපිටදී කියපු ආකාරය අපි දැක්කා. ඒ විතරක් නොවෙයි, පොලිස්පතිතුමාගේ ගෙයත් ගිනි තබන්න ඕනෑය කියලා කථා කළා. අද සමහර ආගමික පූජකවරුන් රටේ නීතියට අභියෝග කරන්නත් පටන් අරගෙන තිබෙනවා. නීතිඥ කණ්ඩායම් ගිහිල්ලා, රටේ දේපළවලට ගිනි තබපු, රාජ්‍ය දේපළ මංකොල්ල කාපු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඝාතනය කරපු ඒ ඝාතකයන්ට ඇප දෙන්න කථා කරනවා. ඒ නීතිඥ කණ්ඩායම් විසින් ඒ අයට ඇප අරගෙන, ඒ අය සිප වැළඳගෙන, මල් මාලා දාලා පිළිගෙන නීතියේ ආධිපත්‍යයට අභියෝග කරන ආකාරයත් අපි දැක්කා. නීතිපතිතුමනි, අගවිනිසුරුතුමනි, මේ කථා ඔබතුමන්ලා අහගෙන ඉන්නවා නම් මේ පිළිබඳව අවධානය යොමු කරන්න. නීතියේ ආධිපත්‍යය, නීතියේ කඩා වැටීම ගැන අපි පසුගිය වසර පුරාම කථා කළා. නමුත්, කිසි කෙනෙකු ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. ඒ වාගේම රාජ්‍ය බුද්ධි අංශත් නිදාගෙනයි ඉන්නේ. මම ඒක වගකීමෙන් කියන්නේ. දැන් ඇවිල්ලා එක එක දේවල් කිව්වාට වැඩක් නැහැ; අශ්වයා පැනලා ගියාට පසුව ඉස්තාලය වහලා වැඩක් නැහැ. මේ රටට වෙන්න තිබෙන හානිය දැන් විශාල වශයෙන් වෙලා ඉවරයි.

දැන් හදිසි නීතිය ගැන ලොකු බිල්ලෙක් මවා ගෙන යනවා. හදිසි නීතිය පනවන්නේ මේ රටේ මහජනතාව වෙනුවෙන්; රාජ්‍ය ආරක්ෂාව වෙනුවෙන්. ඒ වාගේම රාජ්‍ය පරිපාලනය ආරක්ෂා කර ගන්න, පොදු මහජනතාව ආරක්ෂා කර ගන්න, ජාතික ආර්ථිකය ආරක්ෂා කර ගන්නයි හදිසි නීතිය පනවන්නේ. විශේෂයෙන්ම රටේ සංස්කෘතිය ආරක්ෂා කර ගන්න අපේ නීති රීති අලුතෙන් හදන්න සිද්ධ වෙලා තිබෙනවා. ගෝල් ෆේස් අරගළය දිහා බැලුවාම පේනවා මේ රටේ සංස්කෘතිය මොන තරම් පිරිහිලාද කියලා. ඒ වාගේම රටේ දරුවන්, තරුණ තරුණියන් සංස්කෘතිය පැත්තෙන් මොන තරම් පිරිහිලා තිබෙනවාද කියලා අපි දැක්කා. එතැන මොන තරම් අවාසනාවන්ත දේවල් සිදු වන තැනක්ද කියලා ඊයේත් අපි දැක්කා. ඒ නිසා හදිසි නීතිය පනවා හෝ අපේ රටේ අවුරුදු 2500ක ඉතිහාසය, සංස්කෘතිය ආරක්ෂා කර ගන්න අපට දැන් සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආරක්ෂිත ස්ථානය වන ජනාධිපතිතුමාගේ මන්දිරය NDTV නාළිකාව විසින් ලෝකයටම පෙන්වූ හැටි අපි දැක්කා. ඒක ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ පෞද්ගලික බංගලාව නොවෙයි. NDTV නාළිකාව විසින් ඒක මුළු ලෝකයටම පෙන්වූවා. NDTV නාළිකාවට පුළුවන්ද, ඉන්දියාවේ ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ මාළිගා, නිවාස පෙන්වන්න? ඒ වාගේ මහා භයානක තත්ත්වයකට,

[ගරු මධුර විතානගේ මහතා]

අවිචාරවත් තත්ත්වයකට තමයි මේ රට අද පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා හදිසි නීතිය පනවා හෝ මේ රටට වෙන්න තිබෙන විපත් ටික අපි වළක්වා ගන්න ඕනෑ. මේ සියවසේ වෙච්ච දැවැන්ත ප්‍රශ්න රාශියකට අපේ රටත් ගොදුරු වුණා. විශේෂයෙන්ම ගෝලීය වසංගතයට අපි බලවත් ලෙස ගොදුරු වුණා. ලෝකයේ ආර්ථික කඩා වැටීමට අපි ගොදුරු වුණා; බලශක්ති අර්බුදයට අපි ගොදුරු වුණා; ඉන්දු පැසිෆික් සාගර අර්බුදයට ගොදුරු වුණා. බටහිර රටවලින් ඉන්දු පැසිෆික් ව්‍යාපෘතියත්, ඒ වාගේම චීනයේ Belt and Road Initiative, එහෙම නැත්නම් Silk Road ව්‍යාපෘතියත් එක්ක විශාල බල අරගළයක් ක්‍රියාත්මක කරන්න මේ රටේ දේශපාලන කණ්ඩායම්, කල්ලි පසුගිය කාලයේ ඉතාම අවිචාරවත් ලෙස කටයුතු කළ හැටි අපි දැක්කා. තානාපතිවරු ඒ සඳහා සැදී පැහැදී වැඩ කරන ආකාරයත් අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දශක තුනක් තිස්සේ මේ රට පාලනය කරපු සියලුදෙනා අඩු වැඩි වශයෙන් මේ අර්බුදයට වගකියන්න ඕනෑ. අද නිකම් බොරුවට කථා කර, කිඹුල් කඳුළු හලලා වැඩක් නැහැ. දැන් හෝ කමක් නැහැ, සත්‍යය තේරුම් අරගෙන අවංකව අපි වැඩ කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ලොකු සමාගම් දෙකක් තිබෙනවා. ඒ සමාගම් දෙකට project එකක් භාර දී තිබෙනවා. "ජාතික ආරක්ෂාව බිඳ වට්ටපල්ලා, ජාතික ආර්ථිකය කඩපල්ලා, රටේ පරිපාලනය අවුල් කරපල්ලා, ජන ජීවිතය අවුල් කරපල්ලා, රට තුළ සිවිල් යුද්ධයක් ඇති කර එක්සත් ජාතීන්ගේ සංවිධානයට මේක ගැට ගහලා මේ රට තවත් සුඩානයක්, තවත් හයිටියක් කරපල්ලා" කියලා මේ රටට කෙළ හළන මිනිස්සු ඒ කොම්පැනි දෙකට මේ project එක භාර දීලා තිබෙනවා. ඒ කොම්පැනි දෙක තමයි සීමාසහිත ජනතා විමුක්ති පෙරමුණ සමාගම සහ සීමාසහිත පෙරටුගාමී සමාගම. රුපියල් බිලියන ගණනක project එකක් තමයි මේ භාර දී තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
පසු ගිය මාර්තු 23 වැනිදා අනුර දිසානායක මැතිතුමා ප්‍රකාශයක් කළා. "අපට ව්‍යවස්ථාව වැඩක් නැහැ, රටේ නීති වැඩක් නැහැ, අපි මහ පාරේ මේ ගනුදෙනුව විසඳා ගන්නම්" කියලා ඒ අය චණ්ඩි පාට් දැමූ හැටි අපි දැක්කා. ඩයස්පෝරාව කොහොමද මේකට සම්බන්ධ වුණේ, පූජකයෝ කොහොමද සම්බන්ධ වුණේ, තානාපතිවරුන් මොන විදියේ ව්‍යසනයක් කළාද කියලා මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. නමුත් කාලය නැති නිසා මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 3.33]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

මේ ආණ්ඩුවට හදිසියේම හදිසි නීතිය අවශ්‍ය වෙලා තිබෙන්නේ ඇයි? මහ පාරේ සිටින මිනිසුන්ගේ දුක මේ ආණ්ඩුවට පේන්නේ නැද්ද?

අද අලුත් අගමැතිවරයෙක්, ජනාධිපතිවරයෙක් පත් වෙලා සිටියත් පෝලිම් අඩු වෙලා නැහැ. මීට දවස් 4කට, 5කට උඩදී නැවත වතාවක් වටිනා මිනිස් ජීවිත දෙකක් පෝලිම්වලදී නැති වුණා. මේ විධියට මිනිස්සු දුක් විඳිනකොට, මිනිස්සු බඩගින්නේ ඉන්නකොට මේ ආණ්ඩුවට හදිසිය තිබෙන්නේ හදිසි නීතිය ගේන්නද? ඇයි, හදිසි නීතිය ගේන්නේ? හදිසි නීතිය ගේන්නේ මර්දනය කරන්න. මේ රටේ මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය මර්දනය කරන්න. ගිනි තැබීම්වලට, අලාභ හානි කිරීම්වලට අපි විරුද්ධයි. හැබැයි, ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ඉඳගෙන තමන්ගේ විරෝධය පළ කිරීමටත්, උද්ඝෝෂණය කිරීමේ අයිතියත් මේ රටේ ජනතාවට තිබෙනවා. ඒ අය මර්දනය කරන්න, ඒ අය භය කරන්න මේ අය අද කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට අමතක වෙලා තිබෙනවා මේ රටට දුන්නු පොරොන්දු. ඒ වාගේම එදා පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වුණු ඒ වින්දිතයන්, ඒ අහිංසක මිනිසුන් සාධාරණත්වයක් බලාපොරොත්තු වෙනවා. හැබැයි, ඒ අයට සාධාරණයක් ඉෂ්ට කරන්නේ නැහැ. හදිසියේ හදිසි නීතිය නම් ගේනවා. පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව කථා කරනකොට වවුනතිව් සිද්ධිය අපට අමතක කරන්න බැහැ. එදා අපේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ බෙල්ල කපලා මැරුවා. මේ ගැන පරීක්ෂණ කරනකොට මොකක්ද කිව්වේ? "මේ එල්ටීටීඊ නැඟිටීමක්, එල්ටීටීඊ එකෙන් තමයි මේක කළේ" කියලා පුනරුත්ථාපනය වුණු එල්ටීටීඊ සාමාජිකයන් දෙදෙනෙකුව අත් අඩංගුවට ගත්තා. ඒ වාගේම අපට කාත්තන්කුඩි බෝම්බ සිද්ධියත් අමතක කරන්න බැහැ. මේ බෝම්බ සිද්ධියේ පරීක්ෂණ කොහොමද සිදු වුණේ කියන එක පිළිබඳ අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු වෙලා තිබෙනවාද කියලා අපට සැකයක් තිබෙනවා. ඒ වාගේම තමයි මාවනැල්ලේ සිද්ධිය. අපට පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයේ මුලට යනකොට මේ සිද්ධි ගණනාවම මතක් වෙනවා. එහිදී බුද්ධි අංශවල හිටපු නිලධාරීන් නිසි තොරතුරු ලබා ගත්තාද, ඒ නිසි තොරතුරු අරගෙන හරියට ක්‍රියාත්මක වුණාද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා; සැකයක් තිබෙනවා; ගැටලුවක් තිබෙනවා. මේ සිදුවීම් සියල්ලම වෙලා තමයි එදා පාස්කු ඉරු දින ප්‍රහාරය සිදු වුණේ. ඒ පරීක්ෂණ කරපු ලුතිනන් කර්නල් කැලුම් මහත්මයාත්, ලුතිනන් කර්නල් අන්සාර් මහත්මයාත්, මේජර් ඉක්‍රම් මහත්මයාත් හරියට ඒ පරීක්ෂණ කළාද කියන එක පිළිබඳ සැකයක් තිබෙනවා. හැබැයි, මේ අයගේ හිතවතා, එහෙම නැත්නම් මේ අයත් එක්ක ගනුදෙනු කරන සලේ කියන බුද්ධි ප්‍රධානිතුමා කියන තොරතුරු විතරයි අපට අනාවරණය වෙලා තිබෙන්නේ.

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයේ මහ මොළකරු, එහෙම නැත්නම් මේ සිදුවීම පිටුපස හිටියේ කවුද කියන එකට එදා කිව්වේ සලේගේ නම. දැන් ආණ්ඩුව පැත්තට ගිහින් ඉන්න හරින්ලා තමයි ඒ කථාව කිව්වේ. එතුමන්ලා දැන් ආණ්ඩුවේ ඉන්නවා. හැබැයි, අදටත් -මේ තත්පරයේත්- සලේ තමයි SIS එකේ ප්‍රධානියා. ඊළඟට, "සොනික්" ගැනත් කිව්වේ හරින්ලා තමයි. දැන් සලේව

SIS ප්‍රධානියා හැටියට තියාගෙන වර්තමාන ජනාධිපතිතුමා Scotland Yard එකට මේ පරීක්ෂණ සියල්ලම භාර දෙන්න හදනවා. එතකොට නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ! නැවත වතාවක් මේ රටේ මිනිසුන් ගොනාට අන්දවන්නයි මේ හදන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හරින්ලා අද කැබිනට් මණ්ඩලයේ, පාර්ලිමේන්තු කණ්ඩායමේ ඉන්නවා. ඊයේ පෙරේදා තිබුණු පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමට මේ බුද්ධි අංශ ප්‍රධානියා ගෙන්වලා ලොකු සාකච්ඡාවක් කළා. ඔහු මොනවාද කිව්වේ? මේ අරගළයේ පිරිස් අතර ත්‍රස්ත ක්‍රියා කරන කණ්ඩායමක් ඉන්නවා කියලා ඔහු ලොකු විග්‍රහයක් කළා. එතකොට හරින්ලා කියපු විධියට පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සලේ නම්, - අපි කිව්වේ නැහැ, කිව්වේ හරින්ලා.- ඔහුව SIS එකේ ප්‍රධානියා හැටියට තියාගෙන, මම නම් කියපු, ඒ පරීක්ෂණ කළ හමුදාවේ ප්‍රධානින්ව ඒ තනතුරුවල තියාගෙන, එතුමන්ලා ඔය ඇමතිකම් දරමින් කැබිනට් මණ්ඩලයේ ඉන්නේ කොහොමද කියලා අපි අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හරි පැහැදිලියි, මේ රටේ මිනිසුන්ව නැවත වතාවක් මෝඩයාට අන්දවලා, මේ විධියට හදිසි නීතිය ගෙනැල්ලා මේ රටේ ජනතාව මර්දනය කරන්නයි මේ හදන්නේ කියලා. ඒ බව අපට හොඳටම පෙනෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Suren Raghavan. You have five minutes.

[අ.භා. 3.37]

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ විවාදයට සහභාගි වන්නේ ඉතාම වේදනාවෙන් හා කණස්සල්ලෙන්. මන්ද යත්, මීට අවුරුදු 39කට කලින් හරියටම අද වාගේ දිනයක ජාතිය දෙමළ වූ හේතුව නිසාම මා ජීවත් වුණු මගේ ගෙදර, මාගේ පවුලේ අය ජීවත් වුණු ගෙදර විනාශ කළා. මම මගේ පුංචි මල්ලී සමඟ දවස් දෙකහමාරක් පමණ කැලයක හැංගිලා හිටියා. අපේ ප්‍රජාතන්ත්‍රවාදයේ කඩා වැටීම කොයිතරම් වේදනාකාරී ද? අවුරුදු 39ක් ගිහිල්ලාත් අපි ආයෙත් කථා කරනවා හදිසි නීතිය යටතේ මේ රටේ පාලනය, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවන්න. අපේ ජීවිත කාලයම වාගේ ඒ වෙනුවෙන් ගත කර තිබෙනවා. මේ රටට අවුරුදු 2,500ක ඉතිහාසයක් තිබෙනවා. මිහිඳු හාමුදුරුවන් ගෙන ආ බෞද්ධ ධර්මයෙන් පෝෂණය වුණු රට යැයි කියන මේ රටේ අපි අද කටයුතු කරන්නේ හදිසි නීතියේ හස්තය නැතිව පාලනය කරගන්න, අපි අපිටම පාලනය කරගන්න බැරි සමාජයක් තුළ ඉඳගෙනයි.

අද හදිසි නීතිය පවත්වා ගෙන යන්න හේතුව මොකක්ද? මේ හදිසි නීතිය පවත්වා ගෙන යන්නේ සැබෑ අරගළයට විරුද්ධව කටයුතු කිරීමට නම් නොවෙයි. "ආදරයේ අරගළය" "අයිතියේ අරගළය" තිබුණේ අප්‍රේල් මාසයේ 09 වැනිදා ඉඳලා මැයි මාසයේ 09 වැනිදා වනතුරු පමණයි. එදායින් පසුව පටන් ගත්තේ මොකක්ද? එදායින් පසුව පටන් ගත්තේ ප්‍රචණ්ඩත්වයේ හා වෛරයේ අරගළයයි. එය මැයි 09වැනිදා ඉඳලා ජූලි 09වැනිදා වනතුරු කරගෙන ගියා. ඊට පස්සේ පටන් ගත්තා, රාජ්‍ය විරෝධී ප්‍රතිගාමී අරගළය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අරගළය කරන්න ජනතාවට අයිතිය තිබෙනවා. අපි අදත් ඒක කියනවා. ඔය අරගළකරුවන් අතරේ මම උගන්වපු මගේ ශිෂ්‍යයෝ ඉන්නවා; මගේ මිතුරන් ඉන්නවා. අරගළය කිරීම, විසම්මුති වීම ප්‍රජාතන්ත්‍රවාදී රටක අවම අයිතියයි. අරගළ කරන්න මේ රටේ තරුණයන්ට අයිතිය තිබෙන්නේ ඇයි? කලාපයේ තරුණයන් හා සසඳනකොට මේ රටේ තරුණයන්හට එලෙස ජීවත්වීමේ අයිතිය, ආර්ථික වශයෙන් ලැබිය යුතු අයිතිය ලැබී තිබෙනවා ද? ඒ ආර්ථික අයිතිය ලබා ගන්න, තමන්ට අවශ්‍ය පරිදි රැකියාවක් සොයා ගන්න අයිතියක් ඔවුන්ට තිබෙනවා ද? නැහැ. ඒ රැකියාව සොයා ගන්න සුදුසු අධ්‍යාපනයක් තමන්ට අවශ්‍ය පරිදි ලබන්න අයිතිය ලැබී තිබෙනවා ද? නැහැ. ඒවා බැරි වුණොත් තමන්ට කැමැති ව්‍යාපාරයක් කරන්න අයිතිය තිබෙනවා ද? නැහැ. අපි අවුරුදු 74ක් තිස්සේ කටයුතු කරලා අද තරුණ පරපුරට භාර දීලා තිබෙන්නේ හිස් වුණු සමාජයක්; හිස් වුණු අවකාශයක්. ඔවුන්ගේ අභිප්‍රායන්, ආශාවන් ඉටු කරන්න බැරි සමාජයක් වැඩිහිටියන් හැටියට අපි බිහි කර තිබෙනවා. ඒ නිසා අරගළ කිරීමේ අයිතිය තරුණ පරපුරට තිබෙනවා. නමුත්, ඒ හා සමානවම, සමගාමීව, සමාන්තරව කිව යුතු දෙයක් තිබෙනවා. එනම්, මේ රාජ්‍යයට විරුද්ධව බෙදුම්වාදී හෝ විදේශ ප්‍රතිපත්තීන් හරහා ගේන්න යන ප්‍රතිගාමී අරගළයට අපි විරුද්ධයි කියන එකයි. ඒ අරගළයට අපි විරුද්ධ වන්නේ මේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය රැක ගන්න පමණක්ම නොවෙයි.

අද අගමැතිවරයා තම මංගල කථාව අවසන් කළේ, මිහිඳු හාමුදුරුවන් එදා රජතුමාට දුන්නු පණිවිඩය මතක් කරමිනුයි. ඒ පණිවිඩයට අනුව, අපි මේ රජයේ අයිතිකරුවන් නොවෙයි, අපි මේ රජයේ භාරකරුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ දේශයේ භාරකරුවන්. අපට අවශ්‍ය කර තිබෙනවා, ඔබේත්, මගේත් ආදරණීය මේ දේශය හෙට මීට වඩා හොඳ දේශයක් හැටියට මතු පරපුරට භාර දෙන්න. අන්න ඒ බලාපොරොත්තුව විනාශ කරන්න හදනවා නම්, එය ප්‍රතිගාමී කටයුත්තක්. මොන වචන දැම්මත් එය ප්‍රතිගාමී කටයුත්තක්; රාජ්‍ය විරෝධී කටයුත්තක්. අන්න ඒ දෙයින් රාජ්‍යය රැක ගැනීමේ ව්‍යාපෘතියට අපි දායක විය යුතුයි.

හදිසි නීතිය යටතේ අපේ තරුණයෝ ඇතුළු රටේ පුරවැසියන් තළා පෙළා දැමීමේ අරමුණක් තිබෙනවා නම්, අපි ඒකට විරුද්ධයි. මම හැමදාමත් ගරු කරන අපේ ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා -ඒ රණ විරුවා- මේ අවස්ථාවේ මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. එතුමා අද කරපු කථාවේ තිබුණා, එක්තරා ව්‍යුහාත්මක ප්‍රතිවිරෝධයක්. එතුමා මෙතැන සිට නිලධාරින්ට, හමුදාවට කියනවා, මේ හදිසි නීතිය නිසා රජය දෙන අණ පිළිපදින්න එපා කියලා. මා කනගාටු වෙනවා, එතුමා මේ රටේ උසස්ම හමුදා නිලධාරියා වෙලා ඉඳලාත් එවැනි වූ තීරණයකට හමුදාව තල්ලු කිරීමට උත්සාහ කිරීම ගැන. මන්ද යත්, එතුමා තමයි හමුදාවේ හරි නිලය අරගෙන මේ රටේ තිබුණු මහා භයංකර වැඩ පිළිවෙළක් වූ බෙදුම්වාදය පරාජය කළේ.

මේ හදිසි නීතිය ගෙනෙන්නේ ගෝල් ෆේස් එකෙහි ආදරණීය අරගළය කරපු, අයිතියේ අරගළය කරපු තරුණ ළමයින් ඇතුළු පුරවැසියන්ට විරුද්ධව නොවෙයි. නමුත්, මොන නමින් ආවත් ශ්‍රී ලංකාවේ, මගේ මාතෘ භූමියේ රාජ්‍යය කඩා වට්ටන්න උත්සාහ ගන්නා වූ ප්‍රතිගාමී සන්නද්ධ අරගළයට අප විරුද්ධ නිසායි මේ විවාදය අද ගෙනැවිත් තිබෙන්නේ. ඒ නිසා තමයි අපි හදිසි නීතිය සම්බන්ධයෙන් වන රෙගුලාසිවලට පක්ෂව ඡන්දය දෙන්න යන්නේ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Selvarajah Kajendren. You have four minutes.

[பி.ப. 3.43]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற அவசரகாலச் சட்ட நீடிப்பு தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு, நான் ஒரு விடயத்தை ஞாபகப்படுத்த விரும்புகின்றேன். 39 ஆண்டுகளுக்கு முன்னர், தற்போது இந்த நாட்டினுடைய சனாதிபதியாக இருக்கின்ற ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் கல்வி அமைச்சராக இருந்தபொழுது, அவருடைய மாமனாரான ஜே.ஆர். ஜயவர்தன அவர்கள் சனாதிபதியாக இருந்தபொழுது, சகல அதிகாரங்களையும் கையிலே வைத்துக்கொண்டு இலங்கை தீவு முழுவதும் வாழ்ந்த தமிழ் மக்களுக்கு எதிராக வன்முறை கட்டவிழ்த்து விடப்பட்டது. குறிப்பாக, கொழும்பு மாவட் டத்திலே வாக்காளர் பட்டியலை அடிப்படையாக வைத்து தமிழர்களுடைய வீடுகள் இனங்காணப்பட்டு, அவை கொள்ளையடிக்கப்பட்டன; எஞ்சிய உடைமைகள் அனைத்தும் எரித்து அழிக்கப்பட்டன. பெண்கள் பாலியல் வல்லுறவுக்கு உள்ளாக்கப்பட்டார்கள்; பலர் மிகக் கொடூரமான முறையிலே சித்திரவதை செய்யப்பட்டு, படுகொலை செய்யப்பட்டார்கள். இவ்வாறான மிகக் கொடூரமான சம்பவம் நடைபெற்று இன்று 39 ஆண்டுகளாகிவிட்டது. இன்று இந்த நாடு இந்த நிலைமைக்கு வருவதற்குக் கொள்ளிக்கட்டை செருகப்பட்ட இச்சம்பவம் 39 ஆண்டுகளுக்கு முன்னர் இதேபோன்றதொரு ஜுலை மாதத்தில்தான் இடம்பெற்றது. எங்களுடைய சகோதரிகளை உங்களுடைய காடையர்கள் பாலியல் வல்லுறவுக்கு உட்படுத்தியதால் ஆத்திரமடைந்த எங்களுடைய தமிழ் இளைஞர்கள் அதற்கு எதிர்வினையாற்ற முற்பட்ட பொழுது, உங்களால் சூட்டப்பட்ட பெயர்தான் பயங்கரவாதம்! இந்தச் சபையில் இருந்து கிடைக்கக்கூடிய சகல விதமான சுகங்களையும் அனுபவிப்பதற்காக, உங்களுக்கு எதிராக வரக்கூடிய நியாயமான எதிர்ப்புப் போராட்டங்களை ஒடுக்குவதற்காக, 'பயங்கரவாதிகள்' என்ற முத்திரை குத்தி, சட்டங்களை இயற்றி தமிழர்களுக்கு எதிரான ஒடுக்குமுறையை 40 ஆண்டுகளுக்கும் மேலாக நீங்கள் மேற்கொண்டு வந்தீர்கள். அதன் விளைவாகத்தான் இன்று இந்த நாடு இந்த நிலைமைக்கு வந்திருக்கிறது. ஒன்றரை வருடங்களுக்கு முன்னர் எங்களுடைய கட்சியின் தலைவர் இங்கே ஒரு விடயத்தைத் தெளிவாகச் சொல்லியிருந்தார். அதாவது, "எங்களுக்கு எதிராக நீட்டிய துப்பாக்கிகளும் உங்களுடைய கொடூர சட்டங்களும் உங்களுடைய மக்களுக்கு எதிராகத் திரும்பும்" என்று. இன்று அந்தச் செயற்பாடு தீவிரமடையத் தொடங்கியிருக்கிறது. உங்களுடைய கைகளாலே உங்களுடைய மக்களின் கண்களைக் குத்துகின்ற நிலைமை உருவாகியிருக்கிறது.

என்னைப் பொறுத்தவரையில், நீங்கள் இந்த அவசரகாலச் சட்டத்தை நீடிப்பதைக் கைவிட வேண்டும். ஏன், இந்த அவசரகாலச் சட்டம் நீடிக்கப்படுகிறது? ஏற்கெனவே மக்களால் முற்றாக நிராகரிக்கப்பட்ட ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி, பின் கதவால் ஆட்சி அதிகாரத்தைக் கைப்பற்றிக்கொண்ட பிற்பாடு, போராட்டக் காரர்கள் தன்னுடைய நியமனத்தை ஏற்றுக்கொள்ளாத நிலையில், அவர்கள் தன்னை விரட்டியடிப்பார்கள் என்ற அச்சம் காரணமாக, ஏதோ ஒரு வகையில் ஆர்ப்பாட்டங்களை ஒடுக்கவேண்டும் என்பதற்காகவே அவர் இப்பொழுது அவசர காலச் சட்டத்தைக் கையில் எடுத்திருக்கிறார். எதிர்காலத்தில் உங்களுடைய தேசத்தில் உங்களுடைய மக்களுக்கு எதிராக மோசமானதொரு நிலைமையை உருவாக்குவதற்கு - ஓர் இரத்த ஆறு ஓடுவதற்கு - இது கால்கோள் இடும் என்பதை நான் இந்த இடத்திலே பொறுப்புணர்வோடு கூறிவைக்க விரும்பு கின்றேன். இந்த நிலைமை தவிர்க்கப்பட வேண்டுமாக இருந்தால், தமிழ்த் தேசத்துக்கும் சிங்களத் தேசத்துக்கும் இடையிலான பிரச்சினை தீர்க்கப்பட வேண்டுமாக இருந்தால், இலங்கையிலுள்ள ஒற்றையாட்சி முறைமையை ஒழித்து, தமிழ்த் தேசத்தை அங்கீகரிக்கக்கூடிய வகையில் சமஷ்டி அடிப்படையிலான ஓர் அரசியலமைப்பை நீங்கள் கொண்டுவர வேண்டும்.

உங்களுடைய தேசத்திற்குள் இருக்கின்ற இந்தப் பிரச்சினையைச் சரியான முறையில் அணுகவேண்டுமாக இருந்தால், நீங்கள் உடனடியாக இந்தப் பாராளுமன்றத்தைக் கலைத்து, பொதுத் தேர்தலுக்குச் செல்ல வேண்டும். ஏனென்றால், இந்தப் பாராளுமன்றத்தின்மீது மக்களுக்கு நம்பிக்கை இல்லை. பொதுத் தேர்தலுக்குச் செல்வதனூடாக மட்டும்தான் உங்களுடைய மக்களின் நம்பிக்கையைப் பெற்ற ஒரு பாராளுமன்றத்தை உங்களால் உருவாக்கக்கூடியதாக இருக்கும். ஆளும் கட்சியின் பிரதம கொறடா அவர்கள் இன்று காலை உரையாற்றும்போது, "Gota, go home!" என்று சொன்னார்கள்; 'கோட்டா' போய்விட்டார்; இப்பொழுது, எல்லாப் பிரச்சினையும் முடிந்துவிட்டது" என்று சொன்னார். இதைக்கூட, விளங்கிக்கொள்ள முடியாதவர்களாக நீங்கள் இருக்கின்றீர்கள். 'கோட்டா' என்பது ஒரு குறியீடு மட்டுமே! கடந்த சனாதிபதித் தேர்தலில் அவருக்குத்தான் அங்கீகாரம் வழங்கப்பட்டது; அவருக்காகத்தான் பாராளுமன்றத் தேர்தலினூடாக மூன்றில் இரண்டு பெரும்பான்மை பலமும் வழங்கப்பட்டது. அவரைப் பதவி விலகுமாறு மக்கள் சொல்கிறார்கள் என்றால், அவருக்கும் உங்களுடைய அரசாங்கத்திற்கும் வழங்கப்பட்ட ஆணையை அந்த மக்கள் மீளப் பெற்றுவிட்டார்கள் என்றுதான் அர்த்தம்! அதற்குப் பிற்பாடு, இந்த அரசாங்கம் ஆட்களை மாற்றி மாற்றி ஆட்சி செய்வதை மக்கள் ஏற்றுக்கொள்வதற்குத் தயாராக இல்லை. இப்படிப்பட்ட ஒரு சூழலில் நீங்கள் தொடர்ந்தும் அதிகாரத்தைக் கையில் வைத்துக்கொண்டு ஆட்சியை நடத்துகின்றீர்கள் என்றால், நீங்கள் ஒரு பாசிச ஆட்சியை நடத்துகிறீர்கள்; ஜனநாயகத்திற்கு விரோதமாகச் செயற்படு கின்றீர்கள் என்றுதான் அர்த்தம்! உண்மையிலேயே நீங்கள் ஒவ்வொருவரும் ஜனநாயகத்தைக் காப்பதற்காக, உங்களுடைய நாட்டைக் காப்பதற்காகத்தான் பேசுகின்றீர்கள் என்று சொன்னால், உடனடியாகப் பாராளுமன்றத்தைக் கலைத்து, பொதுத் தேர்தலுக்குச் செல்லுங்கள்! அதன் மூலமாகத்தான் உங்களுடைய தேசத்தில் ஏற்பட்டிருக்கின்ற நெருக்கடி நிலைமையைக் களையக்கூடியதாக இருக்கும் என நான் பொறுப்புணர்வுடன் சொல்லிக்கொள்ள விரும்புகிறேன். இல்லையென்றால், இந்தப் போராட்டக்காரர்கள் ஒவ்வொரு வராக இனங்காணப்பட்டு, வேட்டையாடப்படுகின்ற நிலைமைதான் நிச்சயமாக உருவாகும்.

நேற்றைய தினம் விமானத்துக்குள் வைத்து ஒருவர் கைதுசெய்யப்பட்டிருக்கிறார். அவர் விமானத்தில் ஏறி, கதிரையில் அமரும்வரை உங்களுடைய உளவுத்துறை அதிகாரிகளும் விசாரணை அதிகாரிகளும் என்ன செய்து கொண்டிருந்தார்கள்? "நாங்கள் இப்படித்தான் மிருகத்தனமாக, கொடூரமான முறையில் நடந்துகொள்ளுவோம்" என்று முழு உலகத்திற்கும் அச்சுறுத்தல் விடுக்கும் வகையில் ஒரு செய்தியைச் சொல்வதற்காகவா நீங்கள் அவரை இறுதிவரை விட்டுவிட்டு விமானத்திற்குள் இருந்து நாயை இழுத்து வருவதுபோன்று இழுத்து வந்தீர்கள்? என்ற கேள்வியை நான் உங்களிடம் கேட்க விரும்புகிறேன். நாங்கள் இவ்வாறான கொடுமைகளைப் போதியளவுக்கு அனுபவித்திருக்கிறோம். உங்களுடைய படையினர் எங்களுடைய பெண்களைக் கொடூரமான முறையில் பாலியல் வல்லுறவுக்கு உட்படுத்தி

யிருக்கிறார்கள். அதேபோல், பல்லாயிரக்கணக்கான இளைஞர்கள் மிகக் கொடூரமான முறையில் சித்திரவதை செய்யப்பட்டிருக்கிறார்கள். என்னுடைய சொந்தத் தம்பி பல்கலைக்கழக விரிவுரையாளராக இருந்தபொழுது கைது செய்யப்பட்டு, தலைகீழாகக் கட்டித் தொங்கவிடப்பட்டு, மிக மோசமாகத் துன்புறுத்தப்பட்டார். இவ்வாறான கொடுமை களை நாங்கள் நன்கு அனுபவித்திருக்கிறோம்.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

என்னுடைய தம்பி கைதுசெய்யப்பட்டதற்கும் சம்பந்தம் இருக்கிறது. இப்படிப்பட்ட கொடூரங்களை அனுபவித்தவர்கள் நாங்கள். அதற்காக, நாங்கள் அனுபவித்த கொடூரங்களைச் சிங்கள மக்களும் அனுபவிக்க வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கவில்லை. இந்த நாடு பொருளாதார நெருக்கடி யிலிருந்து மீளவேண்டுமாக இருந்தால், நீங்கள் ஆக்கபூர்வ மாகச் சிந்திக்க வேண்டும். முதலில் நீங்கள் செய்யவேண்டியது இந்தப் பாராளுமன்றத்தைக் கலைத்து, பொதுத் தேர்தலை நடத்துவதுதான். அதன்மூலம் நீங்கள் புதியதோர் அரசாங்கத்தை உருவாக்குங்கள்! அந்தப் புதிய அரசாங்கம் முகவர்களோடு அல்லாது தமிழ் மக்களுடைய அபிலாஷை களைப் பிரதிபலிக்கின்ற தமிழ்த் தேசத்துத் தலைவர்களோடு பேச வேண்டும். உங்களுக்கு வாக்களித்த 69 இலட்சம் மக்களும் தற்போது உங்களை நிராகரிக்கின்றபோது, "நாங்கள் தேர்தலினூடாக மக்களால் தெரிவுசெய்யப்பட்டவர்கள்" என்று நீங்கள் சொல்லிகொண்டு இருக்கக்கூடாது.

உண்மையிலேயே பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டுமாக இருந்தால், நீங்கள் தேர்தல் காலங்களில் கொடுத்த வாக்குறுதிகளின் அடிப்படையிலே அந்த மக்கள் உங்களுடன் வந்து பேசுகின்றார்களா? அல்லது பின் கதவால் வந்து 'டீல்' பேசுகின்றார்களா? என்பதை கவனத்திற்கொள்ள வேண்டும். உண்மையிலே அந்த மக்களுடைய அரசியல் அபிலாஷைகளை நிறைவேற்றிக்கொடுக்க வேண்டும் என்ற நோக்கத்துடன் செயற்படக்கூடிய தலைவர்களோடு நீங்கள் பேச வேண்டும். தமிழ்த் தேசத்தினுடைய இறைமையையும் சுயநிர்ணய உரிமையையும் அங்கீகரிக்கின்ற அடிப்படையில் அமைந்த ஓர் அரசியலமைப்பைக் கொண்டுவருவதற்கு இங்கிருக்கின்ற மூத்த தலைவர்கள் முன்வர வேண்டும். இங்கே கௌரவ சுசில் பிரேமஜயந்த, நீதி அமைச்சர் கௌரவ விஜயதாஸ ராஜபக்ஷ போன்ற மூத்த தலைவர்கள் பலர் இங்கிருக்கிறார்கள். இந்தப் பிரச்சினையை இனிமேலும் நீடிக்கவிட வேண்டாம் என நாங்கள் உங்களிடம் பொறுப்புணர்வுடன் கேட்டுக் கொள்கின்றோம்.

பூகோள ஆதிக்கப் போட்டி காரணமாக சர்வதேச சக்திகள் உங்களுடைய பலவீனங்களை வாய்ப்பாகப் பயன்படுத்தி யதனால்தான் இன்று இந்த நாடு பாதாளத்திற்குள் சென்றிருக்கிறது. சர்வதேச சக்திகளின் இந்தப் பூகோள ஆதிக்கப் போட்டியால் இந்த நாடு மேலும் சீரழியக்கூடாது என்றால், நீங்கள் எங்களுடைய தேசத்தை அங்கீகரித்து, சமஷ்டி முறையிலான ஓர் அரசியலமைப்பைக் கொண்டு வாருங்கள்! அதன்மூலம் நீங்களும் நாங்களும் சேர்ந்து இந்த நாட்டைக் கட்டியெழுப்பக்கூடியதாக இருக்கும். புலம்பெயர் வாழ் எங்களுடைய மக்கள் பல பில்லியன் டொலர்களைக் கொண்டுவந்து, இந்த நாட்டிலே முதலீடுசெய்து, இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கும் அபிவிருத்தியடையச் செய்வதற்கும் பங்களிப்புச் செய்வதற்குத் தயாராக இருக் கிறார்கள். நாங்கள் ஒருபொழுதும் அவசரகாலச் சட்டத்தை ஏற்றுக்கொள்ளமாட்டோம். நீங்கள் அதனை இரத்துச் செய்து, ஆகவேண்டிய காரியத்தைப் பாருங்கள்! உடனடியாகப் பாராளுமன்றத்தைக் கலைத்து, பொதுத் தேர்தலை நடாத்தி, அடுத்த கட்டத்திற்குச் செல்வது பற்றிச் சிந்திக்க வேண்டும் என்று கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එක්තරා ආකාරයකට අපේ රටේ දේශපාලනයේ අලුත් සම්මුතියක් සනිටුහන් කෙරෙන මොහොතක්, එවැනි සම්මුතිවාදී දේශපාලනයක් රට විසින් ඉල්ලා සිටින මොහොතක්, හැටනව ලක්ෂයක ජනතා වරමකින් අප පත් කරගත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ ජන වරම අර්ථවත් කිරීමට අපොහොසත් වීම නිසා මේ සභාව විසින් අලුත් ජනාධිපතිවරයෙකු පත් කරගෙන ඇති මොහොතක්. අපි ප්‍රාර්ථනා කරනවා, තමාගේ පක්ෂයේ ප්‍රතිපත්ති අබිබවා මේ පාර්ලිමේන්තුවෙන් තේරී පත් වූ ජනාධිපතිතුමා ලෙස සියලු පක්ෂවල සාධනීය මතවාදවලට සවන් දෙමින් සැබෑ සම්මුතිවාදී රජයකට නායකත්වය දීමට ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට හැකි වේවා කියලා.

ඒ සමඟම අපි කැමැතියි, නව අගමැති, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත් අපගේ "යුතුකම" ජාතික සංවිධානයේ හෘදයංගම සුබ පැතුම් එක් කරන්නට. එතුමා හසළ අත් දැකීම් තිබෙන, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයන් සුරැකීමට කැප වූ නායකයෙක්, මව් බිමට ආදරය කරන දේශප්‍රේමියෙක්, මව් බිමේ නිදහසම අභියෝගයට ලක්ව ඇති මොහොතක, දේශපාලන භේද ඉක්මවා සම්මුතීන් ගොඩනඟා ගැනීම සඳහා සුදුසුම නායකයෙක්.

මේ අපේ මව් බිමේ අඳුරුතම මොහොතක්. එම සනඳුර දුරැර, සාකච්ඡාවෙන්, සංවාදයෙන්, සම්මුතියෙන් මේ අපගේ මාතෘ භූමියට අරුණාලෝකයක් වීමට මෙම ගරු සභාවට හැකිවේවා යන්න අපගේ පැතුමයි.

හදිසි නීතිය පැනවීම සම්බන්ධයෙන් "යුතුකම" ජාතික සංවිධානයේ මතය දැන් කෙටියෙන් හෝ ඔබ හමුවේ තැබීම අපගේ යුතුකමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති, මේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලේදීම ගරු කථානායකතුමා කැඳවා තිබූ පක්ෂ නායක රැස්වීමක් පැවැත්වෙන මොහොතක මේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ල වට කරනු ලැබූ බව, එහෙම නැත්නම් එවැනි ප්‍රයත්නයක් දරනු ලැබූ බව. ඒ ප්‍රයත්නයට ජනතාව කැඳවූ ඇතැමුන්ගේ නායකයන් අප සමඟ පක්ෂ නායක රැස්වීමේ සිටියදීමයි ඒ ක්‍රියාවලිය සිදු වූයේ. මෙය, "ඊ දනියෙල් දවල් මිගෙල්" රඟපා හැකි මොහොතක්ද? එදා මේ රටේ ත්‍රිවිධ හමුදාව මේ පාර්ලිමේන්තුවෙන් මඟ පෙන්වීමක් පැතූ බවයි අපගේ අවබෝධය. ඒ මඟ පෙන්වීම මේ ගරු සභාව ලබා දිය යුතුයි. රුදුරු ත්‍රස්තවාදයකින් මව් බිම රැකගත්, ඒ වාගේම පාලනයක් නැති, නීතියක් නැති හෝරාවක අපගේ දේශය අනාථ භූමියක් වීම, ගොදුරු බිමක් වීම අපේක්ෂාවෙන් සිටි ඒ විජාතික බලවේගයන්ගේ අපේක්ෂා ඉටු වීමට ඉඩ නොතැබූ අපගේ

[ගරු ගෙවිඳු කුමාරතුංග මහතා]

ආරක්ෂක හමුදාවන්ට අපගේ ප්‍රණාමය, මේ ගරු සභාවේ ප්‍රණාමය පුද කළ යුතු බවයි අපගේ අදහස. ඔවුන් පෙන්වූ ඒ ඉවසීම, ඒ විනය, මව් බිම වෙනුවෙන් තම යුතුකම හා වගකීම් ඉටු කිරීමේදී පෙන් වූ ධෛර්යසම්පන්නභාවය අප පැසසිය යුතුයි. අප එයට ගරු කළ යුතුයි. මේ අවස්ථාවේදී හදිසි නීතිය පැනවීම නීතියේ ආධිපත්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදී අවශ්‍යතාව සුරැකීම සඳහා අවශ්‍ය වන්නේ නම්, අපි ඒ සඳහා අනුමැතිය දිය යුතුයි. ගරු අගමැතිතුමනි, මේ අනුමැතිය විජාතික කුමන්ත්‍රණකාරී බලවේග පැරදවීම සඳහායි; මේ අනුමැතිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීම සඳහායි. ඒ සඳහාම පමණයි!

අපි දැන් අරගළ භූමිය ගැන ද මඳක් විමසමු. ඒ අරගළ භූමිය නිදහසේ, ප්‍රජාතන්ත්‍රවාදයේ, අන්‍යෝන්‍ය ගරුත්වයේ ක්ෂේම භූමියක් වී යැයි අවංකව කිව හැකිද? ඒ අරගළය පිළිගත්, ඒ අරගළයට ආශීර්වාද කළ විවිධ දේශපාලන ධාරවන්ටවත් එය ක්ෂේම භූමියක් වීද? විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට, ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමාට, ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති නායකයන්ට ඒ අරගළ භූමියේදී අරගළයට පක්ෂ වෙමින් හෝ තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමට අවස්ථාව තිබිණි ද? ජනාධිපති ලේකම් කාර්යාලය මුදා ගැනීමත් සමඟම, ප්‍රජාතන්ත්‍රවාදයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස වෙනුවෙන් එක් වන ලෙස දැන් අරගළ භූමිය ප්‍රධාන දේශපාලන පක්ෂවලින්, බලවේගවලින් ඉල්ලා සිටිනු අපි දුටුවෙමු. අපි ගරු ජනාධිපතිතුමාගෙන් සහ ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, අන් පුරවැසියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අවහිර නොකරන ලෙසයි; නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, විරෝධය පළ කිරීමේ අයිතිය සීමා කිරීමට මේ හදිසි නීති විධිවිධාන යොදා නොගන්නා ලෙසයි. ඒ වාගේම, අරගළ භූමියේ අයගෙනුත් අපට ඉල්ලීමක් කිරීමට ඇත. ඔබ විවිධ අදහස්වලට ගරු කිරීම පිළිබඳව ආදර්ශයක් දෙන්න, විවිධත්වය තුළ සම්මුතීන් ගොඩනැඟීම පිළිබඳ ආදර්ශයක් දෙන්න, ප්‍රචණ්ඩත්වය පිටු දැකීම පිළිබඳ ආදර්ශයක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමනි, මෙය මව් බිම වෙනුවෙන් සම්මුතියක් ඉල්ලා සිටින මොහොතක්. මේ සඳහා සර්ව පාක්ෂික සාකච්ඡාව නොපමාව කැඳවන ලෙස, සර්ව පාක්ෂික සම්මුතීන් නොපමාව ගොඩනඟා ගන්නා ලෙස අපි ගරු ජනාධිපතිතුමාගෙන් සහ අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බෙදීම් ඉක්මවා, සතුරුභාවය ඉක්මවා, මව්බිම වෙනුවෙන් සම්මුතීන් ගොඩනඟා ගැනීමට නව දේශපාලන ආදර්ශයක් දීමට මෙම ගරු සභාවට හැකි වේවායි අප ප්‍රාර්ථනා කරනවා. මේ අන්ධකාර මොහොතේ මව්බිමට මඟ කියන, ආලෝකයක් වීමට මේ ගරු සභාවට හැකිවේවා! ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරණ ආණ්ඩුවේ නායකයා හැටියට අද අලුත් ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවෙන් තෝරාගෙන තිබෙනවා. එතුමාගේ ප්‍රධාන කාර්යය හැටියට, පළමු කාර්ය හැටියට හදිසි නීතිය ක්‍රියාත්මක කිරීමේ යෝජනාව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2022 මැයි 06 වැනි දා පාර්ලිමේන්තුවේ කරපු කථාවෙන් කොටසක් මම එම හැන්සාඩ් වාර්තාවෙන් උපුටාගෙන කියවන්න කැමැතියි. එදින හැන්සාඩ් වාර්තාවේ 838 වන තීරුවේ දෙවන ඡේදයේ මෙසේ සඳහන් වනවා:

> "මම තවත් කාරණයක් කියන්න ඕනෑ, ඊයේ දවල් ඇති වුණු සිද්ධිය ගැන. මට ඕනෑ වුණේ, මම ගැන කිව්වේ මොකක්ද කියලා බලන්න. එහෙත් ඇත්ත වශයෙන්ම ඒක දිහා බැලුවාම පේනවා මිනිස්සු කියා තිබෙන දේ. මේ මුළු පාර්ලිමේන්තුවටම ශාප කරනවා, අපි මේ දවසත් නාස්ති කළා කියලා. අපි නිකම් ගහ ගන්නවා. ආණ්ඩුවයි, විපක්ෂයයි ගහ ගන්නවා. විපක්ෂයයි, විපක්ෂයයි ගහ ගන්නවා. පාර්ලිමේන්තුවේ කාර්යය ඒකද කියලා අහන්නේ. මේ පාර්ලිමේන්තුව කරමින් ඉන්නේ ඒකයි."

ඊළඟට, 838 වන තීරුවේම හතර වන ඡේදයේ මෙසේ සඳහන් වනවා:

> "... ඒකයි අපි ආණ්ඩුවට කිව්වේ, කරුණාකර මේ ප්‍රශ්න විසඳන්න කියලා. රටේ ජනතාව කියන්නේ, රාජපක්ෂවරු යන්න, කෙසේ හෝ කථා කරලා ඒ කාරණය කරන්න කියලා."

ඊළඟට, එහි පස්වන ඡේදයේ මෙසේත් සඳහන් වනවා:

> "ඒ විතරක් නොවෙයි, මම අද සභානායකතුමා එක්ක කථා කළා, කොහොමද community එකක් ඇති කරන්නේ කියලා. මොකක් හෝ අපි පෙන්වන්න ඕනෑ. මම කියන්නේ ඒක මදියි කියලා. නමුත් අපි කොහොම හරි ඒකවත් පෙන්වමු. අපි මේ සභාවට ඇවිල්ලා නිකම් කෑ ගහලා, කථා කරලා යනකොට මිනිස්සු අපිව පන්නන එක, මේ පාර්ලිමේන්තුව වට කරන එක සාධාරණයි."

මැයි 09 වැනිදා ගෝඨාගෝගමට ප්‍රහාරය එල්ල කළාම ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා කළ ප්‍රකාශයක් 2022.05.10 වැනි දා "ලංකාදීප" පුවත් පතේ සඳහන් වී තිබෙනවා. "ප්‍රහාරයට විරෝධය. ආණ්ඩුව සමඟ රනිල් කිසිම සාකච්ඡාවකට නැහැ. හදිසි නීතිය යොදා ගනිමින් ගෝඨාගෝගමට එල්ල කරපු ප්‍රහාරය හේතුවෙන් රනිල් සාකච්ඡාවලින් ඉවත් වන බව හිටපු අගමැති, එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය" කියලා.

ඊළඟට, 2022 මැයි 13 වැනි දා පළ වූ පුවත් පතක තිබෙනවා, "ගෝඨාගෝගමට අත නොතබමි. ආර්ථිකය හදලා පෙන්වනවා. නව අගමැති රනිල්ගේ පොරොන්දුවක්" යනුවෙන්. එතුමා එදා කියනවා, ගෝඨාගෝගමට ගහන්නේ නැහැ කියලා. ඊළඟට මැයි මාසයේ 16 වැනි දා එතුමා කියා තිබෙනවා, "ගෝඨාගෝගම ආරක්ෂා කිරීමට එජාප නියෝජ්‍ය නායක රුවන්ව පත් කරනවා. අනුකමිටුවකුත් දානවා" කියලා. ඒ ආකාරයෙන් තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා පාර්ලිමේන්තුවේදිත්, එළියේදිත් කියා තිබෙන්නේ. නමුත්, එතුමා ජනාධිපති වෙලා පැය 24ක් යන්න කලින් එතුමා පාර්ලිමේන්තුවේ කරපු කථාවලට, මාධ්‍යයට කරපු ප්‍රකාශවලට හාත්පසින්ම වෙනස් ක්‍රියා මාර්ගයකට ගිහින්, රාත්‍රී 12.00ත් පාන්දර 1.00ත් අතර වෙලාවේදී ගෝඨාගෝගමට ආරක්ෂක අංශ යවලා ඒ තරුණ ප්‍රජාවට පහර දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය මාස හය හත තුළ මේ රටේ ආර්ථිකයේ විශාල දරිද්‍රතාවක් ඇති වුණු බව අපි සියලුදෙනාම දන්නවා. මේ රටේ පෙට්‍රල් පෝලිම්, ඩීසල් පෝලිම්, ගෑස් පෝලිම් හා කිරි පිටි පෝලිම් ඇති වුණා. පැය ගණන් ඒ පෝලිම්වල ඉන්න සිදුවෙලා මිනිසුන් අන්ත අසරණභාවයට පත් වුණා. ඒ තත්ත්වය නිසා තමයි මේ ආණ්ඩුවට විරුද්ධව විශාල ජනතා විරෝධයක් නැඟී ආවේ. ඒ විරෝධය වෙන වෙන අය තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රවලට පාවිච්චි කරන්න පුළුවන්.

නමුත් ඒ විරෝධය මේ මහ පොළොවෙන් ආපු ජනතා විරෝධයක්. අන්න ඒ ජනතා විරෝධය දිහා අපි සංවේදීව බලලා, එයට ඇහුම් කන් දෙන්නේ නැතිව දේශපාලන වශයෙන් බලලා, ජනතාව තළා පෙළා මර්දනය කරන්න හදනවා නම් මීට වඩා භයානක දේවල් අනාගතයේ ඇති වෙන්න පුළුවන් කියලා මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අත්අඩංගුවට ගැනීම් සිදු වනවා. අපි ඊයේ දැක්කා SriLankan Airlines එකට අයත් ගුවන් යානයකදී තරුණයෙක් අත්අඩංගුවට ගත්ත ආකාරය. අද තවත් තරුණයෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අත්අඩංගුවට ගත් තරුණයන්ට එක එක චෝදනා ඉදිරිපත් කර තිබෙනවා. රාජ්‍ය දේපළවලට හානි කළා කියලා චෝදනා තිබෙනවා; ජනාධිපති මන්දිරයට හානි කළා කියලා චෝදනා තිබෙනවා; අරලියගහ මන්දිරයට හානි කළා කියලා චෝදනා තිබෙනවා; ජනාධිපති ලේකම් කාර්යාලයට හානි කළා කියලා චෝදනා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 දී දින 52 ආණ්ඩුව කාලයේ මන්ත්‍රීවරුන් කී දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ දේපළවලට හානි කළා ද කියලා මම අහන්න කැමැතියි.

එදා කථානායක පුටුව කැලිවලට කඩලා දැම්මා. ඒ මේසය මත තිබුණු mike එක කඩලා දැම්මා. එතැන තිබුණු පොත්වලට හානි කළා, මේස පුටුවලට හානි කළා. මේවාත් ජනතා දේපොළ තමයි. නමුත් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒකට නීතිය ක්‍රියාත්මක වුණේ නැත්තේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් එළියේ ඉන්න මිනිස්සු නීතිය ගැන විශ්වාස කරන්නේ නැතිව, මේ රටේ නීතියේ ආධිපත්‍යය නැහැයි කියමින්, එයට විරුද්ධව සටන් කරන එක සාධාරණ නැද්ද කියලා මට කියන්න. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනා තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහලා මට ඒක කියන්න. අපේ මේ මන්ත්‍රීවරු 225දෙනාගෙන් බහුතරයක් 2018 වර්ෂයේ පැවති දින 52 ආණ්ඩුව කාලයේත් මේ පාර්ලිමේන්තුවේ සිටියා. තමුන්නාන්සේලා දැක්කා, එදා මන්ත්‍රීවරුන් හැසිරුණු ආකාරය. ඉතින්, එතුමන්ලාට විරුද්ධව නඩු පැවරුවේ නැත්තේ ඇයි කියලා කියන්න. එදා ඔය මේසය මත තිබුණු mike එක කැඩුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කථානායකතුමාගේ ආසනය කැලිවලට කැඩුවා. රාජ්‍ය ලාංඡනයට හානි කළා. ඒ ඇයි? ඩීල් දේශපාලනය නිසායි. එතකොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වශයෙන් සිටියා, මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වශයෙන් සිටියා. ඒ ඩීල් දේශපාලනය නිසා මේ පාර්ලිමේන්තුවේ ජනතා දේපොළවලට හානි කරපු අයට විරුද්ධව අද වන කල් එක නඩුවක්වත් පැවරුවේ නැහැ. ඉතින්, අපි තවත් කථා කරන්නේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එළියේ ඉන්න මිනිසුන්ට අපි දෙන ආදර්ශය මොකක්ද? අරලියගහ මන්දිරය, ජනාධිපති මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළේ තිබුණු භාණ්ඩවලට අලාභ හානි කරපු තරුණයන්ට විතරක් නඩු පවරන එක අපට පිළිගන්න පුළුවන් කියලා අපට කියන්න පුළුවන්ද? *[බාධා කිරීමක්]* ඒක තමයි මම කියන්නේ. පාර්ලිමේන්තුවේ තිබෙන මේ සංස්කෘතිය ගැන, නීතියේ ආධිපත්‍යය ගැන, මේ රටේ නීතිය ක්‍රියාත්මක වන ආකාරය ගැන මේ රටේ ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය නිසා තමයි අද වනකොට මේ රටේ තරුණ පරම්පරාවේ, මේ රටේ ප්‍රජාවේ, ඒ සියලු ජනතාවගේ නැඟිටීම සිද්ධවෙලා තිබෙන්නේ.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වෙන්න කලින් මේ පාර්ලිමේන්තුවේදීම එතුමා කිව්වා, පාර්ලිමේන්තුව වට කරන එක සාධාරණයි කියලා. අද එතුමා විධායක ජනාධිපති ධුරයට පත්වෙලා ඉන්නවා. ඒ නිසා අද එතුමා කියන්නේ වෙන දෙයක්. ඒ නිසා අපි කියනවා, මේ තිබෙන ගැටලුව තේරුම් ගන්න කියලා. අද මේ ජනතාවගේ නැඟිටීම, තරුණයන්ගේ පැත්තෙන් තිබෙන විශාල කලකිරීම ගැන තේරුම් ගන්න. ඒවාට නිකම් වල්මත්වෙලා යන්න ඉඩ දෙන්න එපා. ඒ තරුණයන් එක්ක කථා කරන්න. යම් ගිවිසුමක් තුළින්, එහෙම නැත්නම් යම් අවබෝධයක් තුළින් ඒ තරුණයන්ගේ ප්‍රශ්න ටික තේරුම් ගෙන, ප්‍රජාතන්ත්‍රවාදීව නව ප්‍රවේශයකට ගිහින් මේ ප්‍රශ්න ටික විසඳා ගන්න ඕනෑ. එහෙම නොකර, හදිසි නීතිය පනවලා, හමුදාව යොදවලා, පොලීසිය යොදවලා මේ අරගළය මර්දනය කරලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතන්න එපා. ඉතිහාසයේ එහෙම හිතපු නායකයෝ බොහෝදෙනෙක් වළ පල්ලට ගිහිල්ලා තමයි නැවතුණේ කියන කාරණයත් මතක තබා ගන්න.

අද ප්‍රශ්නයක් තිබෙනවා. අද වෙනත් ජනාධිපතිවරයෙක් පත්වෙලා ඉන්නවා. තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ආණ්ඩුවට අලුත් ජනාධිපතිවරයෙක් පත් වුණා. නමුත් පරණ කැබිනට් මණ්ඩලයමයි ඉන්නේ; පරණ ඇමතිවරුමයි ඉන්නේ. ඉතින්, අද ජනතාවගේ පිබිදීමක් තිබෙනවාද? ජනතාවගේ පිබිදීමක් නැහැ. ගරු ඇමතිවරුනි, තමුන්නාන්සේලා දිවුරුම් දෙනකොට වතුර ගහන බවුසර් තබාගෙන, කඳුළු ගෑස් තබාගෙන, හමුදාවේ 500ක්, 1,000ක් අගමැති කාර්යාලය වටේ ආරක්ෂාවට දමලා තමයි තමුන්නාන්සේලා දිවුරුම් දුන්නේ. ජනතාවගේ ප්‍රසාදයක්, ජනතාවගේ විශ්වාසයක්, ජනතාවගේ පිබිදීමක් තමුන්නාන්සේලාට ලබා ගන්න බැරි වුණු නිසායි එහෙම කරන්න සිද්ධ වුණේ. ඒ කාරණය තේරුම් ගෙන අලුත් ආණ්ඩුවේ නොවෙයි, පරණ ආණ්ඩුවේ අලුත් ජනාධිපතිවරයා වැඩ කරයි කියලා විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාජ්‍යය යනු මම යයි සිතන පාලකයා මෙන්ම ජනතාව යනු අපි යයි සිතන කණ්ඩායම්ද ප්‍රජාතන්ත්‍රවාදයට අතිශයින් හානිදායකයි. අද අපි ජීවත් වන්නේ එවැනි වටපිටාවකයි. අද සමහර කණ්ඩායම් විශ්වාස කරනවා ඒ ගොල්ලෝ තමයි ජනතාව කියලා. එතකොට ඒ අය හිතනවා, ඒ ගොල්ලෝ තමයි ජන මතය නියෝජනය කරන්නේ කියලා. ඒක මනින්න ක්‍රමවේදයක් නැහැ. ජනතාවට මුහුණ දෙන්න සිදු වුණු කරදර, කම්කටොලු දඩම්මා කරගෙන තමන්ගේ බලකාමය සාක්ෂාත් කර ගන්න මුල් වුණු ත්‍රස්තවාදී කණ්ඩායම් එක්ක තමයි අද අපට ප්‍රජාතන්ත්‍රවාදීව අරගළ කරන්න සිද්ධවෙලා තිබෙන්නේ. එක පැත්තකින්, ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් අරගළය තිබෙනවා. හැබැයි, අරගළයෙන් එහාට ගිහින් ඉතාම අශික්ෂිත ලෙස, ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස බලය ඩැහැගන්න කුමන්ත්‍රණය කරන ස්වරූපයක් තමයි අද අපට පෙනෙන්න තිබෙන්නේ.

ඒ නිසා තමයි අද ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට ගිහිල්ලා, මේ කියන විධියේ හදිසි නීතියක අවශ්‍යතාව සමාජය තුළ පැන නැඟී තිබෙන්නේ. අද රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. රාජ්‍ය ආයතනයකට කඩා වැදිලා, ඒ රාජ්‍ය ආයතනයේ කටයුතු සිදු කර ගන්න බැරි තත්ත්වයට ඒ ආයතන පත් කරන ත්‍රස්තවාදීන් අද බිහිවෙලා තිබෙනවා. එහෙම ත්‍රස්තවාදියෙක් ගුවන් යානයකට

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

නැහලා මෙරටින් පැනලා යන්න හඳනකොට අධිකරණ නියෝගයකට අනුව වරෙන්තුවකින් අල්ලනකොට අද අපේ රටේ තිබෙන ඊනියා විපක්ෂය ඒ මානසික බාධකයට යටවෙලා, ඔය කියන අරගළ ත්‍රස්තවාදයට යටවෙලා ඒක සාධාරණීකරණය කරන එක ගැන, ඒ ගැන විවේචනය කරන එක ගැන මම බොහෝ සේ ලජ්ජාවට පත් වෙනවා. තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකවරයා අරගළ භූමියට ගියාම එතුමාට පොල්ලකින් පහර දෙන්න උත්සාහ කිරීම ප්‍රජාතන්ත්‍රවාදයද? තමුන්නාන්සේලාගේ පක්ෂය නියෝජනය කරන රාජිත සේනාරත්න මන්ත්‍රීතුමාට අඩි පහක් උඩ පැනලා ටොක්කක් ඇන්නා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයද? ඒ වාගේම තමුන්නාන්සේලාගේ පක්ෂය නියෝජනය කරන රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාට තර්ජනය කළා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයද? අපි කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ඔය කියන ඊනියා සදාචාරය හා ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වය අතර වෙනස වෙන් කර ගන්න කියලායි. ඒක වෙන් කර ගත්තේ නැත්නම් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට පැවැත්මක් නැති වෙනවා. ඒ නිසා තමයි අපි මේ ඉල්ලීම කරන්නේ.

පසුගිය කාලය පුරාවටම අපි මේ ආණ්ඩුව තුළ සිටිමින්, ජනතා උද්ඝෝෂණ, ජනතා අරගළ, ජනතා වැඩවර්ජන ආදී සියලු දේවල්වලදී හදිසි නීතිය පනවනවාට විරුද්ධව කථා කළා. ඒ අයට යම් ප්‍රහාරයක් එල්ල වෙනකොට ඒවාට විරුද්ධව අපි කථා කළා. හැබැයි, මේ මොහොතේ ඊට වඩා එහාට ගිය බරපතළ අර්බුදයක් තිබෙනවා. මොකද, ඉතාම හානිදායක තත්ත්වයක් මේ වෙනකොට රටේ උද්ගත වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සිටි -ව්‍යවස්ථාදායකයේ සිටි- මන්ත්‍රීවරයෙක් මහ මඟදී ගහලා මරා දැමුවා. ජනතා ඡන්දයෙන් පත් වී පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරු හැත්තෑ ගණනකගේ ගෙවල් විනාශ කර තිබෙනවා. අද ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාව ඉරා පැත්තකට විසි කර දමා වෙනම පාලනයක් අත්‍යවශ්‍යයි කියන දේශපාලන කණ්ඩායම් බිහිවෙලා තිබෙනවා. මිනිසුන්ගේ අවශ්‍යතාව මත; මිනිසුන්ගේ කරදර මත; මිනිසුන්ගේ ආර්ථික අහේනිය මත ත්‍රස්තවාදී කණ්ඩායමක් අත්තනෝමතිකව, ත්‍රස්තවාදී ආකාරයට රාජ්‍ය බලය උකහාගන්න උත්සාහ කරන ආකාරයක් තමයි අද අපට පේන්න තිබෙන්නේ. ඒ නිසා මේ සඳහා නීතිමය ප්‍රතිපාදන මත තිබෙන හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න අපට සිද්ධ වෙනවා. මොකද, අද ඒ සඳහා අවශ්‍යතාවක් මතු වී තිබෙනවා. සෑම ක්ෂේත්‍රයකින්ම ඒ සම්බන්ධව ඉල්ලීම් කර තිබෙනවා. එදා -ජූලි නවවැනි දා- මේ අරගළය වෙනුවෙන් පෙනී සිටි, කොළඹට පැමිණි නොපැමිණි සියලුදෙනා අද ආයාචනා කර සිටිනවා, කරුණාකර නීතියේ ආධිපත්‍යය සාක්ෂාත් කරන්න කියලා. නීතියේ ආධිපත්‍යයෙන් තොරව මේ රටට ආයෝජකයෝ එන්නේ නැහැ, ඒ අයගේ ව්‍යාපාර කරන්න බැහැ. අද මේ රටේ සිටින වැදගත්, බුද්ධිමත් සාමාන්‍ය ජනතාව කියනවා, රටේ නීතියේ ආධිපත්‍යය නැවත ශක්තිමත් කරන්න කියලා. මේ විධියට තව ටික දවසක් ගියොත්, විනිශ්චයකාරවරයෙක් දෙන තීන්දුවට විරුද්ධව ඒ විනිශ්චයකාරවරයාගේ නිවස පවා වටලයි, ඒ විනිශ්චයකාරවරයාට පහර දෙයි.

පසුගිය දවසක මේ ව්‍යවස්ථාදායකය ආක්‍රමණය කරන්න යම් පිරිසක් පැමිණි වෙලාවේ ඒක ව්‍යර්ථ කරන්න බැරි වුණා නම්, ඊළඟට අත තබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු මේ රටේ අධිකරණ පද්ධතියටයි. මේ අවස්ථාවේදී මම නීතිඥ සංගමයට පැහැදිලිව කියන්න ඕනෑ, ත්‍රස්තවාදී සංගම්වල ලේබලයක් වෙන්න එපා කියලා. අපිත් නීතිඥයෝ. අපි අවුරුදු ගණනාවක් මේ රටේ අධිකරණවල වැඩ කළා. ඒ වාගේම මහෙස්ත්‍රාත්වරුන්ට කියනවා, අධිකරණ ක්‍රියාවලියේදී තමන් හමුවට එන නඩුව සම්බන්ධයෙන් විෂය මූලිකව බලන්න කියලා. අපි දන්නවා, සියයට 90ක් විනිශ්චයකාරවරු නිවැරදි ආකාරයෙන් තමන්ගේ කටයුතු කරන බව. හැබැයි සමහර අවස්ථාවල අපට පේන්න තිබෙනවා, විනිශ්චයකාරවරුනුත් භය වුණු ස්වරූපයක්. අපි පසුගිය කාලයේ ඒ තත්ත්වය දැක්කා.

රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක අපටත් අර්බුද තිබුණා. එතුමාගේ කාලයේදී ඉඩම් සංශෝධන පනත් කෙටුම්පත ගෙනාවා. ඒ වෙලාවේ ඒකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරලා ඒක අවලංගු කරපු කෙනෙක්, මම. හැබැයි, ඉතිහාසය විසින් වර්තමානය තුළ අද අපට යම් කිසි අවස්ථාවක් දීලා තිබෙනවා. මේ රට දැන් තිබෙන තැනින් ගොඩගන්න පාට, පක්ෂ භේද බලන්නේ නැතිව මේ රට නිවැරදි ආර්ථික ගමනක ගෙනයන්න අවශ්‍ය දායකත්වය දෙන්න කියලා එතුමා අපෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් මේ රටේ නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරන්න, මේ රටේ සාමාන්‍ය මිනිසුන්ට බියක්, සැකක් නැතිව ජීවත් වෙන්න පුළුවන් අවස්ථාව ඇති කරන්න, මේ වෙලාවේ හදිසි නීතිය සම්මත කිරීමේ අවශ්‍යතාව අපි පැහැදිලිව සාක්ෂාත් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නව අගමැතිතුමාටත්, සභානායකතුමාටත් මේ අවස්ථාවේදී මගේ සුබපැතුම් පිරිනමන්න කැමැතියි. ඔබතුමන්ලා දෙපළම කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු වීම නිසාත් මට විශේෂ සතුටක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ කථාවලට මම අද උදෑසන ඉඳන්ම සවන් දුන්නා. දැන් මේ ගරු සභාවට ඇවිල්ලා වාඩිවුණු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2009 වර්ෂයේ අවසන් කරපු එල්ටීටීඊ ත්‍රස්තවාදය නැවත කොහේ සිට මේ රටට ආවාද කියා මම දන්නේ නැහැ.

මොකද, හැත්තෑව, අසූව දශකවල මේ රටේ සිටි දමිළ තරුණයෝ ඇතුළු දමිළ ජනතාව තමන්ගේ සාධාරණ බලාපොරොත්තු ඉෂ්ට කර ගන්න අරගළය පටන් ගත්තා. මුලින් පටන් ගත්තේ සාමකාමී අරගළය නේ. ඊට පසුවයි ඒක අවි ආයුධවලට ගියේ. එතකොට මේ ශ්‍රී ලංකා ආණ්ඩුව අවි භාවිත කරමින් මිලිටරි බලය පාවිච්චි කරපු අවස්ථාවේදී ඒකට විරුද්ධව කථා කළ දමිළ මන්ත්‍රීවරුන්ගේ කථාව තමයි අද මෙතැන පවතින්නේ. ඒ ගැන මට පුදුමයි. කෙසේ වුණත් මම කියන්න කැමැතියි, අද මේ රටේ පවතින ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට ඉතිහාසයෙන් අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ බව. මොකද, නැවත මේකට military solution එකක් දෙන්න හදන්න එපා. Let us go for a political solution. මම මෙතැන ඉඳලා අපේ විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගෙන් - එතුමා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිවරයා.- අර ගේනවා කියපු සංශෝධන සම්බන්ධයෙන් ප්‍රශ්න කළා. ඒ සංශෝධන ඉදිරිපත් කරන්න. ඒවා තමයි දේශපාලන විසඳුම්. We

need a political solution, not a military solution. We have failed by bringing in military solutions. මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කළ බව අපි දන්නවා. එතකොටත් මම මේ පාර්ලිමේන්තුවේ හිටියා. මම ඒක දන්නවා. නමුත්, ප්‍රශ්න ටික අවසන් වුණේ නැහැ නේ. තවත් ප්‍රශ්න තිබෙනවා නේ. අදටත් ඒ ගින්දර නිවා ගන්න බැරි වෙලා තිබෙනවා නේ. ඒ නිසා කවදාවත් මේ විසඳුම් හරියන්නේ නැහැ. දෙමළ වේවා, සිංහල වේවා, උතුර වේවා, දකුණ වේවා, military solutionsවලට යන්න එපා. දේශපාලන විසඳුමකට යන්න. ඒ නිසා හදිසි නීතිය ගෙනැල්ලා මේ තත්ත්වය විසඳා ගන්න බැහැ කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

මේ අරගළ නිසා අපේ ජනාධිපතිතුමාගේ පෞද්ගලික නිවසත් ගිනිබත් වුණා. ඒ නිවසට කිහිප වතාවක් මම ගිහිල්ලා තිබෙනවා. එතුමා අපේ පැත්තේ සිටිනකොටත්, විපක්ෂයේ සිටිනකොටත් මම ගිහිල්ලා එතුමා සමඟ නොයෙක් දේවල් සාකච්ඡා කර තිබෙනවා. ඒ නිවසේ හැම තැනක්ම මම හොඳට දන්නවා. ඒ නිවස ගිනිබත් වූ එක ගැන මම කනගාටු වෙනවා. අපි ඒවා අනුමත කරන්නේ නැහැ. ඒ වාගේම මේ සිද්ධි නිසා මෙහි සිටින මැති-ඇමතිවරු බොහෝදෙනෙකුගේ නිවාස ගිනිබත් වුණා. අපි ඒවා අනුමත කරන්නේ නැහැ; අපි ඒවාට එකඟ වෙන්නේ නැහැ. ඒවා ගැන අපි කනගාටු වෙනවා. ඒක අරගළය නොවෙයි, භීෂණය.

ජනාධිපති ලේකම් කාර්යාලයට, අග්‍රාමාත්‍ය කාර්යාලයට පසුගිය දිනවල යම් පිරිසක් ඇතුළු වුණා. ඒක වැරදියි. ඒක නීති විරෝධී ක්‍රියාවක්. අපි ඒකට එකඟ වෙන්නේ නැහැ. නමුත්, මැයි මස 9වන දා වනකල් ගාලු මුවදොර පිට්ටනියේ අරගළකරුවන් සාමකාමීව අරගළය කරගෙන ගියා කියන එක අමතක කරන්න එපා. මම දැක්කා, අපේ ඇමෙරිකානු තානාපතිතුමිය වන ජූලි චන්ග් මහත්මිය ජනාධිපතිතුමා හමු වෙලා තිබෙන බව. එතුමිය අපේ ජනාධිපතිතුමා එක්ක සුහද සාකච්ඡාවක් කර තිබෙනවා ලු. එතුමිය ඇතුළු රටේ සිටින අනෙකුත් තානාපතිවරු අපි හමු වුණා. ඒ වෙලාවේ ඔවුන් මොකක්ද කිව්වේ? ඔබේ රටේ මේ අවස්ථාවේදී සිදුවන මේ අරගළය තමයි, 'මොඩල් අරගළය' කියලා ඔවුන් කිව්වා. දකුණු අප්‍රිකාවේ, දකුණු ඇමෙරිකාවේ, ආසියානු රටවල, යුරෝපා රටවල පවා අරගළ සිදුවන බවත්, ඒ හැම රටකම ප්‍රචණ්ඩත්වය ඇති වූ බවත්, ලංකාවේ එවැනි තත්ත්වයක් ඇති වුණේ නැහැ කියාත් එතුමිය සතුට ප්‍රකාශ කළා. ඒ අරගළයට ඉස්සෙල්ලාම ගිහිල්ලා පහර දුන්නේ කවුද? අරගළකරුවන් උසිගැන්වූයේ කවුද? ඒක පිළිගන්න ඕනෑ. ඒක නේ ඇත්ත. එහෙම නැහැ කියලා කාටවත් කියන්න පුළුවන්ද? ඒක පිළිගන්න පුළුවන් නේ. එතැනින් තමයි මේ තත්ත්වය පටන් ගත්තේ. ඒ නිසා අරගළය වෙනයි, භීෂණය වෙනයි. අරගළයට අපි එකඟයි. අරගළය පැත්තේ තමයි කවදත් අපි හිටියේ. දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව අරගළ කළ සෑම තැනකම අපි ඉඳලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩ්ඩක් වෙලාව දෙන්න.

නමුත්, භීෂණය වෙනයි. විමල් වීරවංශ මැතිතුමා කථා කරනකොට මම අහගෙන හිටියා. එතුමාගේ කථාවට මම එකඟ වෙන්නේ නැහැ. නමුත්, එතුමා කියපු එක දෙයකට මම එකඟ වෙනවා. ඒ තමයි, අපි රාජ්‍යය ආරක්ෂා කරන්න ඕනෑය කියන එක. ඒ තැන මාත් ඉන්නවා. ශ්‍රී ලංකා රාජ්‍යය ආරක්ෂා වෙන්නම ඕනෑ. රාජ්‍යය කඩා වැටෙන්න ඉඩ දෙන්න බැහැ. මම හිතන විධියට කවුරුත් ඒ ස්ථාවරයේ ඉන්නවා. සමහර අය ව්‍යවස්ථාවෙන් පිට, පාර්ලිමේන්තුවෙන් පිට මහජන සභාවක් ඕනෑ කියලා කියනවා මට ඇහුණා. ඒ මහජන සභාව තමයි, මේ පාර්ලිමේන්තුව. මේක තමයි, මහජන සභාව. මේකේ අඩු පාඩු තිබෙනවා නම් අපි හදා ගනිමු, නීති වෙනස් කර ගනිමු, සංශෝධන කරමු. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා ඉන්නවා, සංශෝධන කරන්න. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසිවතාවක් අපි සංශෝධනය කරලා තිබෙනවා නේ. තවත් ඕනෑ තරම් සංශෝධන ඉදිරිපත් කරමු. ඒකේ ප්‍රශ්නයක් නැහැ. අපි නීති හදමු. පාර්ලිමේන්තුවට වෙනත් විකල්පයක් නැහැ. පාර්ලිමේන්තුවට දේශපාලන විකල්පයක් නැහැ. එක්කෝ එහෙම කියන අය පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. හැබැයි, පාර දැනගෙන එන්න ඕනෑ. නමුත් ඒ අයට මෙතැනට එන්න නම්, ඊට අවශ්‍ය දේශපාලන විසඳුම තමුන්නාන්සේලා ලබා දෙන්න ඕනෑ. මිලිටරි බලය යොදන්න එපා, පොලීසි දමන්න එපා, ගහන්න එපා, වෙඩි තියන්න එපා, මරන්න එපා. ඒවා හරියන්නේ නැහැ. එහෙම ඒවා මේ රටේ අපි දැක තිබෙනවා නේ. දෙමළ ජනයා නියෝජනය කරන අපි මේ ඔක්කෝටම මුහුණ දීලා තිබෙනවා. 1958දී, 1977දී, 1983දී ගෙවල්, වාහන ඇතුළු අපේ දේපළ ගිනි තැබුවා. මිනිසුන්ටත් වෙඩි තැබුවා, දරුවෝ උස්සලා ගින්දරට විසි කළා. අපි ඒ ඔක්කෝටම මුහුණ දුන් මිනිස්සු. ඒ නිසා මේ දේවල් ගැන අපට අලුතෙන් කියා දෙන්න හදන්න එපා. ඒවා ගැන අපි කනගාටු වෙනවා. මේ ඔක්කෝම අපි දැක තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපි මේවා ගැන දන්නවා. එම නිසා නැවත එහෙම තැනකට යන්න එපා. හදිසි නීතිය - Emergency - දමාගෙන මේක ඉවර කරන්න යන්න එපා. The Tamil Progressive Alliance, as a party, will oppose and vote against the Emergency. හදිසි නීතියට විරුද්ධව අපි ඡන්දය දෙනවා කියලා මේ අවස්ථාවේදී මම කියනවා. *[බාධා කිරීමක්]* ඇයි, ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය මොකක්ද? *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථික ලැයිස්තුවේ නම් සඳහන් දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථා අවසන් වනතුරු සභාවේ කටයුතු පවත්වාගෙන යා යුතු යැයි මා යෝජනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Naseer Ahamed. You have five minutes.

[பி.ப. 4.17]

**ගරු නසීර් අහමඩ් මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு நஸீர் அஹமட் - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Naseer Ahamed - Minister of Environment)

Hon. Presiding Member, the Emergency is not something new for Sri Lankans. After Independence, the country had been under a state of Emergency for more than 37 years and more than 34 times, Emergency Regulations had been approved here. So, why was the Emergency imposed? There were reasons for that. People think that the Emergency had been imposed only during the war time, but it had not been so.

இந்த நாட்டிலே அவசரகாலச் சட்டமானது வெவ்வேறு காரணங்களுக்காக மிக நீண்ட காலமாக அமுல்படுத்தப்பட்டு வந்தது. குறிப்பாக, 'சுனாமி' அனர்த்தம் ஏற்பட்டதன் பின்னர், அதனால் ஏற்பட்ட தாக்கத்தை நிவர்த்தி செய்வதற்காக இந்த நாட்டிலே the Emergency அமுல்படுத்தப்பட்டது என்பது உங்கள் அனைவருக்கும் தெரியும்! இந்த நாட்டில் பல விடயங்களுக்கு Emergency இருப்பதாக SJBஇன் தலைவரும் எதிர்க்கட்சித் தலைவருமான கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் பேசும்போது சொன்னார். Health உட்பட பல விடயங்கள் அடங்கிய list ஒன்று அவரால் வாசிக்கப்பட்டது; நான் அதைக் கேட்டுக்கொண்டிருந்தேன். இந்த விடயங்கள் அனைத்தும் தீர்க்கப்பட வேண்டுமாகவிருந்தால், இந்த நாட்டிலே அவசரகாலச் சட்டம் அமுலில் இருக்கவேண்டும் என்பதை நான் இவ்விடத்திலே தெரிவித்துக்கொள்கின்றேன். அவசரகாலச் சட்டமானது மிகவும் அவசியமான ஒரு விடயமாகப் பார்க்கப்படவேண்டிய ஒரு காலகட்டத்தில் நாங்கள் வாழ்ந்து கொண்டிருக்கிறோம்.

We all know what happened on the 09th of May, 2022 and all the Hon. Members, even those in the Opposition, would agree with me that there was no law and order on that day. கடந்த மே மாதம் 9ஆம் திகதி என்னுடைய வீடும் officeஉம் எரிக்கப்பட்டது. பிர்தௌஸ் என்ற காடையன் என்னுடைய அலுவலகத்துக்கு மாத்திரமல்ல, நிறைய இடங்களுக்குத் தீ வைத்தான். மேலும், ஊரிலுள்ள அனைத்து விளம்பரப் பலகைகளையும் அடித்து நொறுக்கினான். இவை அனைத்தையும் பொலிஸார் பார்த்துக்கொண்டிருந்தார்கள். அதே காடையன் கொழும்பிலே நடைபெற்ற අරගළය - போராட்டத்தை lead பண்ணுகின்ற காட்சி அடங்கிய video என்னிடம் இருக்கிறது. அதில் அவன் "'Deal Ranil', go home!" என்று ஒரு groupஐயும் "Nandasena Gotabaya, go home!" என்று இன்னுமொரு groupஐயும் lead பண்ணுகிறான். இவ்வாறு அன்று அந்தக் காடையன் பயங்கரவாதச் செயலைச் செய்யும்போது இந்த நாட்டிலே சட்டம் தூங்கிக் கொண்டிருந்தது. போராட்டம் என்ற போர்வையிலே பயங்கரவாதச் செயற்பாடுகளைச் செய்துகொண்டிருப்பதைப் பொலிஸார் பார்த்துக்கொண்டிருக்கிறார்களே தவிர, அவர்களால் அந்த பிர்தௌஸை arrest பண்ண முடியவில்லை. அந்த அளவுக்குத் துர்ப்பாக்கியமான நிலையில்தான் இந்த நாட்டிலே சட்டமும் ஒழுங்கும் இருக்கிறது. எனவே, சட்டங்களில் மாற்றங்களை ஏற்படுத்தவேண்டிய தேவை இருக்கிறது. இவ்வாறான காடையர்கள் இந்த நாட்டிலே சட்டத்தைக் கையிலெடுப்பதற்கு நாங்கள் - எதிர்க்கட்சியைச் சேர்ந்த Membersஆக இருந்தாலும் சரி, ஆளும் கட்சியைச் சேர்ந்த Membersஆக இருந்தாலும் சரி - இடமளிப்போமாக இருந்தால், இந்த நாட்டிலே சட்டம், ஒழுங்கை நிலைநாட்ட முடியாமற்போகும்; அமைதியை ஏற்படுத்த முடியாமல் போகும்; அபிவிருத்தியை மேற்கொள்ள முடியாமல் போகும் என்ற யதார்த்தத்தை நாங்கள் புரிந்துகொண்டு செயற்பட வேண்டிய தேவை இருக்கிறது. ஆகையால், எதிர்க் கட்சியினராக இருந்தாலும் சரி, ஆளும் கட்சியினராக இருந்தாலும் சரி, தற்போது இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற நிலைமையைச் சீர்செய்வதற்கு நாங்கள் எல்லோரும் அவசரகாலச் சட்டம் தொடர்பான இந்தத் தீர்மானத்தை ஆதரிக்கவேண்டிய தேவை இருக்கிறது என்ற யதார்த்தத்தை இங்கு கூறிவைக்க விரும்புகின்றேன்.

கௌரவ ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் பின் கதவால்தான் பிரதமராக வந்தாரென இன்று பலரும் சொல்கிறார்கள். நான் அவர்களிடம் ஒரு விடயத்தைக் கேட்க விரும்புகிறேன். THERE ARE 225 Parliamentarians here in this House and among them, 196 are elected Parliamentarians. இந்த நாட்டுக்கான அடுத்த சனாதிபதியை இச்சபையானது வாக்கெடுப்பினூடாகத் தெரிவுசெய்தது. Opposition Members அதற்கு விருப்பமில்லையென்றால், ஏன் அது தொடர்பான வாக்கெடுப்பில் கலந்துகொண்டீர்கள்? Why did you come and vote? Because you wanted to elect a President by the vote of the Members of Parliament. When someone you do not like got elected, you say he had got in through the back door. How is it possible? இங்குள்ள 225 Parliamentariansஇல் 196 Parliamentarians தேர்தல்மூலம் மக்களால் தெரிவுசெய்யப் படுபவர்கள். நாங்கள் வெறுமனே இங்கு வந்து represent பண்ணவில்லை. மாறாக, எங்களை மக்களே தெரிவுசெய்து அனுப்பி இருக்கிறார்கள். நாங்கள் மக்களுடைய அபிலாஷைகளை நிவர்த்தி செய்வதற்காகவே இங்கு வந்திருக்கிறோம். அவ்வாறான மக்கள் பிரதிநிதிகளால்தான் இன்று கௌரவ ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இந்த நாட்டினுடைய சனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டிருக் கிறார். The Hon. Ranil Wickremesinghe has been elected as President under the Constitution and therefore, it is valid. A lot of people say that it is against the Constitution. அது Constitutionஇற்கு எதிரானது என்றமாதிரி அதிகமானவர்கள் பேசிக்கொண்டிருக்கிறார்கள். Our country is in a critical situation. We all must understand that. There is an economic crisis, not a political crisis. The Opposition has hijacked that economic crisis and turned it into a political crisis. Therefore, it is vital that we all get together and resolve the economic issue in order to take this country forward.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Charles Nirmalanathan. You have five minutes.

[பி.ப. 4.23]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று இந்தப் பாராளுமன்றம் அவசரகாலச் சட்ட நீடிப்புக்காகக் காலையில் கூட்டப்பட்டு, தற்பொழுது அது தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கிறது. எனக்கு முன்பு கருத்துக் கூறிய பலர், அவசரகாலச் சட்டம்

இலங்கைக்குப் புதிய விடயமல்ல என்பதை வலியுறுத்திக் கூறினார்கள். இலங்கையில் அவசரகாலச் சட்டமும் பயங்கரவாதத் தடைச் சட்டமும் இருந்து வருகின்ற காரணத்தினால்தான் இன்று இந்த நாடு மிக மோசமானதொரு பொருளாதார நெருக்கடியைச் சந்தித்திருக்கிறது. இன்று இந்த நாடு சர்வதேச நாடுகளிடமிருந்து கடனை எதிர்பார்த்து நிற்கின்ற ஒரு நாடாக மாறியிருப்பதற்கு மிகப் பிரதான காரணம், இந்த அவசரகாலச் சட்டமும் பயங்கரவாதத் தடைச் சட்டமுமாகும் என்பதை நான் கௌரவ உறுப்பினர்களுக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

2009ஆம் ஆண்டு யுத்தம் முடிவுற்ற பின்னர், அதிகமான போராளிகளுக்கு முன்னாள் சனாதிபதி கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்கள் புனர்வாழ்வளித்து, அவர்களை விடுதலை செய்தார். முன்னாள் சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் ஒரேயொரு அரசியல் கைதியை மாத்திரம் விடுதலை செய்தார். அந்த அரசியல் கைதிக்கெதிராக நீதிமன்றத்தில் வழக்கு தாக்கல் செய்யப்பட்டிருந்த நிலையில்தான் அவர் விடுதலை செய்யப்பட்டார். முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்கள் நீதிமன்றத்தால் தீர்ப்பளிக்கப்பட்டு, குறுகிய காலத்துக்குள் விடுதலையாகிச் செல்ல இருந்தவர்களை விடுதலை செய்தார். பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு, நீண்ட நாட்களாகச் சிறையிலிருக்கின்ற கிட்டத்தட்ட 23 பேருக்கு தற்பொழுது நீதிமன்றத்தால் தீர்ப்பளிக்கப்பட்டிருக்கிறது. ஆகையால், அவர்களை உடனடியாக விடுதலை செய்யவேண்டும் என்று நான் இந்த நாட்டினுடைய சனாதிபதி அவர்களையும் இங்கிருக்கின்ற நீதி அமைச்சர் அவர்களையும் மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், நீதிமன்றத்தில் விசாரணை நடந்துகொண்டிருப்பவர்களையும் குறுகிய காலப் புனர்வாழ்வுக்கு உட்படுத்தி, விடுதலை செய்யவேண்டும் என்ற கோரிக்கையை நான் இன்று நடைபெறுகின்ற அவசரகாலச் சட்டம் தொடர்பான விவாதத்தினூடாக தமிழ் மக்கள் சார்பாக புதிதாகத் தெரிவுசெய்யப்பட்ட சனாதிபதியிடமும் உங்களிடமும் முன்வைக்கின்றேன். அவர்களுடைய பெயர் விபரங்களை நான் எழுத்துமூலம் உங்களிடம் மிக விரைவில் கையளிப்பதற்கு எண்ணியிருக்கிறேன். கௌரவ அமைச்சர் அவர்களே, புனர்வாழ்வளித்து அவர்களை விடுதலை செய்யவேண்டும் என்ற நோக்கில் 2015-2019 காலப்பகுதியில் நீங்கள் பல முயற்சிகளை எடுத்திருந்தீர்கள். எனினும், துரதிருஷ்டவசமாக அது நடைபெறவில்லை. தற்பொழுது நாட்டில் ஏற்பட்டிருக்கின்ற நெருக்கடியான சூழ்நிலையில், அவர்களுடைய குடும்பங்கள் எந்தளவுக்குக் கஷ்டப்படும்? அவர்களுடைய பிள்ளைகளின் கல்வி மற்றும் எதிர்காலம் எந்தளவுக்குப் பாதிக்கப்படும் என்பது பற்றி நீங்கள் சிந்திக்க வேண்டும். குடும்பத் தலைவன் இருக்கின்ற குடும்பங்கள்கூட, இயல்பு வாழ்க்கையை வாழ முடியாத ஒரு சூழ்நிலையே தற்பொழுது இருக்கிறது. அப்படியென்றால், குடும்பத் தலைவன் இல்லாத ஒரு குடும்பம் எந்தளவுக்குச் சிரமப்படும் என்பது உங்களுக்குத் தெரிந்திருக்கும். அவர்களுடைய விடுதலை என்பது மிக முக்கியமானது. ஆகையால், அவர்களை விடுதலை செய்ய வேண்டுமென்ற கோரிக்கையை நான் உங்களிடம் மிக விநயமாக முன்வைக்க விரும்புகின்றேன்.

அவசரகாலச் சட்டத்தை நீடிப்பதை விடுத்து, ஏன் அதைக் கொண்டுவருகிறோம்? அதற்கு மாற்று வழி என்ன? என்பது தொடர்பில் ஆராய்ந்த பின்னரே அது தொடர்பில் ஒரு முடிவுக்கு வரவேண்டும். "இலங்கைக்கு அவசரகாலச் சட்டம் ஒன்றும் புதிதல்ல" என நீங்கள் தொடர்ச்சியாகச் சொல்லிக் கொண்டு, மீண்டும் மீண்டும் அதை அமுல்படுத்துவது என்பது இந்த நாட்டைப் பாதாளத்துக்குள் தள்ளுகின்ற ஒரு செயற்பாடாகவே அமையும். நான் இங்கு குறிப்பாக ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். அவசரகாலச் சட்டமும் பயங்கரவாதத் தடைச் சட்டமும் இந்த நாட்டில் அமுலில் இருந்தால், எவ்வாறு சுற்றுலாப் பயணிகள் இங்கு வருவார்கள்? அவர்கள் இங்கே வந்து எவ்வாறு சுயமாகச் செயற்பட முடியும்? இந்தப் பாராளுமன்றத்திலே அவசரகாலச் சட்ட நீடிப்பு தொடர்பான தீர்மானம் நிறைவேற்றப்படுகின்ற பொழுது, அதை உலக நாடுகளும் பார்த்துக்கொண்டிருக்கும். இலங்கையில் அவசரகாலச் சட்டம் அமுலில் இருக்கிறது; அங்கு பாரிய போராட்டங்கள் நடைபெறுகின்றன. ஆகையால், இலங்கைக்குச் செல்லக்கூடிய சூழ்நிலை தற்பொழுது இல்லை என்பதை அவர்கள் உணர்ந்து கொள்வார்கள். இலங்கையைப் பொருளாதார நெருக்கடியிலிருந்து மீட்பதாக இருந்தால், நாங்கள் எவ்வாறு பயணிக்க வேண்டும் என்பது தொடர்பில் நீண்ட கால அடிப்படையிலான திட்டத்தையும் சிறந்தொரு பொருளாதாரக் கொள்கையையும் வகுத்து, சரியான நிதி முகாமைத்துவத்தோடு பயணிக்க வேண்டும். அவ்வாறு பயணித்தால் மாத்திரமே இலங்கையைப் பொருளாதார நெருக்கடியிலிருந்து மீட்க முடிவதோடு, நாட்டு மக்கள் வரிசையில் நிற்கின்ற நிலையையும் இல்லாதொழிக்க முடியும். ஆகவே, புதிதாகத் தெரிவுசெய்யப்பட்டிருக்கின்ற சனாதிபதியும் அவர் சார்ந்த அரசாங்கமும் இது தொடர்பில் மிக விரைவாகச் சிறந்ததொரு முடிவை எடுக்கவேண்டும் எனக் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Major) Sudarshana Denipitiya. You have five minutes.

[අ.භා. 4.29]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද විශේෂ දවසක්. අපේ මාතෘ භූමිය පත්වෙලා තිබෙන තත්ත්වය ගැන අද වනකොට අපි දුකෙන් කථා කරනවා. ඒ ගැන අද අපට විශාල දුකක් දැනෙනවා. අපේ වීරෝදාර රණවිරුවන් 2009 මැයි මස 18වැනි දා ත්‍රස්තවාදීන්ගෙන් මේ රට බේරා දුන්නේ මේ වාගේ තත්ත්වයකට අපේ රට නැවතත් පත් කරන්න නොවෙයි. කොරෝනා වසංගතයෙන් ජනතාව දුක් විඳින වෙලාවේ වීරෝදාර රණවිරුවන් ඔබ සියලුදෙනාම ඒකෙන් බේරා ගත්තා. අපේ වීරෝදාර රණවිරුවන් ඔබ සියලු දෙනාටම නිදහසේ හුස්ම ගන්න අවස්ථාව සලසා දුන්නා. ඉන් අනතුරුව සියලුදෙනාටම නිදහසේ,නීරෝගීව ඉන්නත් වීරෝදාර රණවිරුවන් අවස්ථාව හදා දුන්නා. හැබැයි, අද ඒ තත්ත්වය වෙනස් වෙලා. අද වන කොට සමහර අයට අපේ වීරෝදාර රණවිරුවන් "අට පාස් ආමිකාරයන්" බවට පත් වෙලා. "අට පාස් ආමිකාරයා" ළඟට ඇවිල්ලා කියනවා, "කුලී හමුදාවක්" කියලා. මේ ආකාරයට, අපේ වීරෝදාර රණවිරුවන්ට නොයෙකුත් දේවල් කියන තත්ත්වයට මේ වනකොට සමහරු පත් වෙලා තිබෙනවා. මමත් හමුදා නිලධාරියෙක් හැටියට කටයුතු කළ නිසා මේ අවස්ථාවේදී ඉතාම දුකෙන් තමයි ඒ ගැන කථා කරන්නේ.

අපි උසස් පෙළ විභාගයට ඉදිරිපත් වුණු 1988-1989 කාලයේ මේ වාගේම භීෂණයක් අපේ රටේ තිබුණු බව මට මතකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදාත් මේ වාගේම භීෂණයක් අපේ රටේ තිබුණා. ඒ කාලයේ මගේ අයියාත් හමුදාවේ හිටියා. ඒ

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

කාලයේ ගෙදරට ඇවිල්ලා ලියුම් දෙනවා, "අයියා හමුදාවෙන් අයින් කර ගන්න. නැත්නම් පවුලම මරා දමනවා" කියලා. තාත්තාගේ ඔළුවට ගල් කටස් තියලා කියනවා, "පුතා හමුදාවෙන් අයින් කර ගන්න" කියලා. එහෙම කාලයක් තිබුණා. නමුත්, අපේ රටේ ජනතාවට මේ සියල්ලම අමතක වීම ගැන මා කනගාටු වනවා. එදා අපි ගොඩක් දුක් වින්දා. ඒ කාලයේ සියලුදෙනාගේම හැඳුනුම්පත් අරගෙන ගියා. අපට විදුලිබලය ලැබී තිබුණත් බල්බ් එකක්වත් දල්වන්න දුන්නේ නැහැ. අපේ රටේ එවැනි යුගයක් තිබුණා. අද වනකොට ඒ වාගේ වාතාවරණයක් නැවත අපේ රටේ ඇති කරන්න නොයෙකුත් කණ්ඩායම් උත්සාහ කරනවා. අහිංසක දරුවන් ඉදිරියේ තියා ගෙන තමයි ඔවුන් මේ කටයුතු කරන්නේ. වෙනත් මුහුණුවරකින් තමයි ආපසු මේ තත්ත්වය එන්න හදන්නේ. දරුවන් ඉස්සරහට අරගෙන තමයි මේ දේවල් කරන්නේ. ඒ අය විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නා අහිංසක ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, තරුණ-තරුණියන් සියලුදෙනාම එකතු කරගෙන වෙනත් පැත්තකින් මේ කටයුත්ත ඉස්සරහට ගෙන එන්න උත්සාහ කරනවා. ඒකට එල්ටීටීඊ ඩයස්පෝරාවත් එකතු වෙලා තිබෙනවා. ඒ ගොල්ලන් මේකට ආධාර - funds - දෙනවා; නොයෙකුත් විධියට උදවු කරනවා. මේ විධියේ නොයෙක් කණ්ඩායම් ඉන්නවා. මේ කණ්ඩායම් සියල්ල එකතු වෙලා ඉස්සරහට ඇවිල්ලා, අපේ විරෝදාර රණවිරුවා "අට පාස් ආමිකාරයා" කියලා පහළට දමලා මේ රට විනාශ කරන්න උත්සාහ කරනවා.

මේ වෙලාව, අරගළ කරන්න සුදුසු වෙලාවක් නොවෙයි. සියලුදෙනා එකතු වෙලා නැවත වතාවක් මේ රට බේරා ගන්න ඕනෑ වෙලාවක්, මේක. රටේ ආර්ථිකය ගොඩ ගන්න ඕනෑ වෙලාවක්, මේක. ඒ වෙනුවෙන් උත්සාහ කරන වෙලාවේ අරගළ කරලා, මේ රට විනාශ කරන්න මේ අය උත්සාහ කරනවා. අපට හිතා ගන්න පුළුවන්ද, මේ වෙන දේවල් පිළිබඳව? ජනාධිපති මන්දිරය, අගමැති මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය, රූපවාහිනී සංස්ථාව මේ අරගළකරුවන් අල්ලා ගෙන හිටියා. මේවා ත්‍රස්තවාදී ක්‍රියා. මේවා අහිංසක මිනිස්සු කරන දේවල් නොවෙයි. මේවා ත්‍රස්තවාදී ක්‍රියා. ඒ නිසා තමයි හදිසි නීතිය පැනවීම අවශ්‍ය වෙන්නේ. අහිංසක මහ ජනතාව බේරා ගන්න වාගේම ඒ අරගළයට සම්බන්ධ වෙලා ඉන්න අහිංසක දරුවන් බේරා ගන්න තමයි මේ හදිසි නීතිය පනවන්නේ. මේ වාගේ තත්ත්වයක් ඇති වනවා නම් ඒ තත්ත්වය සමනය කරන්න තමයි හදිසි නීතිය පනවන්නේ. එහෙම නැතිව අනවශ්‍ය දෙයක් සිදු වුණාට පස්සේ හදිසි නීතිය පනවා වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා තමයි හදිසි නීතිය පනවලා, මේ රට ආරක්ෂා කර ගන්න හදන්නේ. නමුත්, විකෘති සමාජයක් නිර්මාණය කරන්න තමයි ටිකෙන් ටික ඒ අය ලෑස්ති වෙන්නේ. ඔවුන් විරෝදාර රණවිරුවන්ට ගරහනවා, "අට පාස් ආමිකාරයා" කියලා. ඒ අයට නොයෙකුත් දේවල් කියනවා. අපේ විරෝදාර රණවිරුවන්ට මෙහෙම කියන්නේ ඇයි? ඔවුන්ට එහෙම කියන්න හේතුව මොකක්ද? රණ විරුවෙක් වශයෙන් යුද හමුදාවට බැඳිලා, ඒ පාඨමාලාව හදාරන්න බැරි කොන්ද පණ නැති මිනිස්සු තමයි එහෙම කියන්නේ. එදා අපි හමුදාවට බැඳිලා, ඒ පාඨමාලාව හදාරලා, ත්‍රස්තවාදීන් විනාශ කරන වෙලාවේ අපට තිබුණේ මරණ සහතිකයට මැරෙන වෙලාව දමා ගැනීම පමණයි. මැරෙන වෙලාව විතරයි අපට මරණ සහතිකයට දමා ගන්න තිබුණේ. අපි ඒකත් ලියා ගන්න සූදානම්නුයි හිටියේ. එහෙම තමයි අපි හමුදාවට බැඳිලා සේවය කළේ. එදා අපේ විරෝදාර රණවිරුවන්ට කවුරුවත් කිව්වේ නැහැ, "අට පාස් ආමිකාරයා" කියලා. එදා විරෝදාර රණවිරුවන් ගමට යනකොට ගමේ මිනිස්සු ඔවුන් පිළිගත්තා. අද විරෝදාර රණවිරුවන්ගේ ෂර්ට් එකෙන් අල්ලලා කියනවා, "උඹ කුලී හමුදාකාරයෙක්. උඹ එළියට පලයන්" කියලා. අද වන විට අපේ විරෝදාර රණවිරුවන් එවැනි තත්ත්වයකට පත් කර තිබෙනවා. සමාජය මේ තරම් පිරිහෙන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

මම 1990දී තමයි යුද හමුදාවට බැඳුණේ. දෙවතාවක් මා තුවාල වුණා. මා මේ වනකොට ආබාධිත නිලධාරියෙක්. අපේ විරෝදාර රණවිරුවන්ට මෙහෙම අපහාස කරන එක ගැන මා දුක් වනවා. එහෙම විය යුතු නැහැ. අපේ විරෝදාර රණවිරුවන්ට එහෙම දේවල් කිරීම සුදුසු නැහැ.

ඔබ සියලුදෙනාම ඒක පිළිගන්නවා ඇති. මේ අරගළය පිටුපස සිටින කණ්ඩායම්වලට මම කියනවා, තමන්ගේ ඕනෑ-එපාකම් ඉෂ්ට කරගන්න අහිංසක තරුණ-තරුණියන් බිලිදෙන්න එපා කියලා. ඉදිරියේදී ඔවුන්ට පොලිස් වාර්තාවක් ගන්න හම්බ වෙන්නේත් නැහැ. ඇහිලි සලකුණු ටික ගත්තාට පස්සේ ඉදිරි කාලයේදී ඔවුන්ට ලොකු ප්‍රශ්න ඇති වෙයි. එහෙම නැත්නම් පොලිස් වාර්තාව ගන්න කොට ලොකු ප්‍රශ්නයක් වෙයි. අරගළකරුවෙක් නම් ඔහුට රැකියාවකට යන්න හම්බ වෙන්නේ නැහැ; විදේශ රටකට යන්න හම්බ වෙන්නේ නැහැ, වීසා එකක් ගන්න හම්බ වෙන්නේත් නැහැ. ඒ අහිංසක දරුවන්ව පත් කරන තත්ත්වය ඒකයි. හැබැයි, මේ අරගළයේ පිටුපස සිටින මිනිසුන්ගේ ළමයින් සියලුදෙනාම ඉන්නේ පිට රටවල. ඒ ළමයි පිට රටවල ඉගෙන ගන්නේ. හැබැයි, මේ රටේ අහිංසක ළමයින් ඉස්සරහට දාලා ඒ අය මේ අරගළය ඉස්සරහට ගෙන යනවා. අන්තිමට ඒ දරුවන්ට කිසිම දෙයක් කරගන්න බැරි වෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු වුණත් අරගළකරුවෙකු කියලා කිව්වාට පස්සේ පෞද්ගලික අංශයේ රැකියාවකටවත් යන්න හම්බ වෙන්නේ නැහැ. Police report එක නැතුව රැකියාවකට යන්නත් බැහැ. ඔක්කෝම අමාරුවේ දාලා පසුගිය දිනක එක් කෙනෙක් පැනලා යන්න හැදුවා. ඔහු රූපවාහිනී සංස්ථාව අල්ලාගෙන චණ්ඩියා වාගේ කථා කළා. රැවුල, කොණ්ඩය කපලා ඔහු ඊයේ රටින් පිටව යන්න හැදුවා. ඒවා තමයි ඒ අය කරන දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශ්වවිද්‍යාලවල අහිංසක දරුවන් පාරේ. පෞද්ගලික විශ්වවිද්‍යාලවල නම් අවුරුදු 20ක් යන කොට degree එකත් කරලා ඉවරයි. අවුරුදු 22 වෙන කොට master’s degree එකත් කරලා ඉවර වෙන්න පුළුවන්. හැබැයි, මේ ළමයින්ට අවුරුදු 32 වෙන කොටත් උපාධිය ලබා ගෙන විශ්වවිද්‍යාලවලින් එළියට එන්න ලැබෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අරගළ කරන දරුවන්ගෙන් මම එක දෙයක් ඉල්ලා සිටිනවා. කරුණාකර ඔය දරුවන් මේ තත්ත්වය වටහා ගන්න. එක එක්කෙනා කියන විධියට, එක එක නායකයෝ කියන කියන විධියට වැඩ කරලා මේ රට විනාශ කරන්න එපා. ඔබේ අනාගතය විනාශ කර ගන්න එපා. ආදරණීය අම්මලා, තාත්තලාගෙනුත් මම ඉල්ලා සිටිනවා, ඔබේ දරුවා රැක ගන්න කියලා. තමන්ගේ දරුවන්ට මේ වාගේ සමාජ විරෝධී ක්‍රියාවලට සම්බන්ධ වෙන්න ඉඩ දෙන්න එපා. එහෙම වුණොත් ඔවුන්ගේ අනාගතය ඉවරයි. ඔබගේ දරුවා තමයි ඔබේ බලාපොරොත්තුව. ඒ ආදරණීය අම්මලා, තාත්තලා දුක්විඳලා මේ දරුවන් විශ්වවිද්‍යාලවලට එවලා ඔවුන් බලාපොරොත්තු වන දේ කරගන්න හම්බ වෙන්නේ නැහැ, මෙහෙම වුණොත්. ආදරණීය අම්මලා, තාත්තලාගෙන් වාගේම ඒ දරුවන්ගෙන් මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, "මේ දේවල්වලට සම්බන්ධ වෙන්න එපා. අපි ඔක්කෝම එකතු වෙලා මේ රට ගොඩගනිමු" කියලා. මේ රට ගොඩ ගන්න තමයි මේ හදිසි නීතිය ක්‍රියාත්මක කරන්නේ. එහෙම නැතුව මර්දනය කිරීම සඳහා නොවෙයි. ජනතාවගේ සුබසිද්ධිය සඳහා සහ ඒ අහිංසක දරුවන්ගේ සුබසිද්ධිය සඳහා තමයි මේ දේ කරන්නේ. එම නිසා ප්‍රචණ්ඩ

තත්ත්වයට පත් වෙන්න එපා. මේ රට ගොඩනැඟීමේ කටයුතුවලට සාමකාමීව දායක වෙන්න කියලා මම ඔබ සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.36]

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முதலில் இந்த நாட்டினுடைய சனாதிபதியாகத் தெரிவுசெய்யப் பட்டிருக்கின்ற அதிமேதகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுக்கும் புதிய பிரதமர் கௌரவ தினேஷ் குணவர்தன அவர்களுக்கும் சபை முதல்வர் சுசில் பிரேமஜயந்த அவர்களுக்கும் என்னுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இரண்டு தினங்களுக்கு முன்னர், இந்தியாவின் குடியரசுத் தலைவர் பதவிக்கு திரௌபதி முர்மு அவர்கள் தெரிவு செய்யப்பட்டிருக்கிறார். இந்தியாவைப் பொறுத்தளவிலே, சிறுபான்மைச் சமூகமான பழங்குடி இனத்தைச் சேர்ந்த ஒருவர் சனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டிருக்கிறார். எமது நாட்டில் இருக்கின்ற பொருளாதார நெருக்கடிக்கு மத்தியில், நாட்டில் ஸ்திரமான ஓர் அரசாங்கம் அமையப்பெற வேண்டும் என்ற நோக்கிலேயே இப்பொழுது புதிய சனாதிபதித் தெரிவு இடம்பெற்றிருப்பதோடு, புதிய பிரதமர் தலைமையிலான அரசாங்கமும் அமைக்கப்பட்டிருக்கிறது. இந்த அரசாங்கம் பொருளாதார நெருக்கடிக்குத் தீர்வு காணவேண்டும் என்று நான் உளமாரப் பிரார்த்திக்கின்ற அதேவேளை, இந்திய குடியரசுத் தலைவர் பதவிக்கு திரௌபதி முர்முவின் தெரிவானது, புதியதோர் அரசியல் கலாசாரத்தை அல்லது உண்மையான system changeஇனை எமது நாட்டுக்குக் கற்றுத்தர வேண்டும் எனவும் பிரார்த்திக்கின்றேன்.

உண்மையிலேயே எமது நாட்டில் ஏற்பட்டிருக்கின்ற பொருளாதார நெருக்கடியும் அதன்மூலம் உருவான அரசியல் ஸ்திரத்தன்மையின்மை மற்றும் மக்கள் போராட்டம் என்பன குறைத்து மதிப்பிடக்கூடிய விடயங்கள் அல்ல. எங்களுடைய மக்களுக்குச் சரியான முறையிலே அத்தியாவசியப் பொருட் களை வழங்கியிருந்தால், மக்கள் வரிசையிலே நின்றும் பணத்தை அதிகமாகக் கொடுத்தும் தங்களுக்குத் தேவையான பொருட்களைப் பெறமுடியாத சூழ்நிலை உருவாகாமல் தடுத்திருந்தால், இந்த மக்கள் போராட்டம் - අරගළ என்பது உருவாகியிருக்காது. இந்த மக்கள் போராட்டத்தையும் அவர்களுடைய குரல்களையும் குறைத்து மதிப்பிட்டு, அவர்களுக்கான உரிமையை மறுப்பதற்கு எவரேனும் குரல் கொடுப்பாராக இருந்தால், நிச்சயமாக அது முற்றுமுழுதாக எதிர்க்கப்படவேண்டிய ஒரு குரல் என்பதிலே மாற்றுக் கருத்தில்லை; அதனை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். அதேபோல், இவ்வாறான மக்கள் போராட்டத்தை யாரேனும் கொச்சைப்படுத்துவார்களாக இருந்தால், அவர்களை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். அதேசமயத்தில், இந்த மக்கள் போராட்டம் சரியானதொரு திசையை நோக்கிச் சென்றதா? அல்லது அப்போராட்டத்தினூடாக system change நடைபெற்றதா? என்று பார்க்கின்றபோது மிகவும் கவலையாக இருக்கிறது. சுதந்திரத்துக்குப் பின்னர் இந்த நாட்டில் ஓர் அரசியல்சார் மாற்றம் அல்லது சமூகங்களுக்கிடையிலும் அரசியல்வாதிகளுக்கிடையிலும் ஓர் உணர்வுசார் மாற்றம் ஏற்படக்கூடிய சாத்தியம் இந்த අරගළ மூலம் உருவாகி இருந்தாலும், தற்பொழுது அது வேறொரு திசையை நோக்கிச் சென்றுவிட்டது என்ற ஏக்கத்துடனேயே நான் இந்த இடத்தில் பேசவிழைகின்றேன்.

இந்த மக்கள் போராட்டம் தொடங்கியபோது, மக்களின் குரலாகவே மக்கள் பிரதிநிதிகளாகிய நாமும் இருந்தோம். பாராளுமன்ற உறுப்பினர்கள் என்றால், வானத்திலிருந்து குதித்தவர்கள் அல்லர். மக்களுடைய பிரச்சினைகள் வேறு; பாராளுமன்ற உறுப்பினர்கள் வேறு என்று சித்தரிக்கின்ற நிலை மாறவேண்டும். இந்தப் பாராளுமன்றத்திற்குள் ஆளும் கட்சி, எதிர்க்கட்சி என்ற இரண்டு நிலைப்பாடுகளைத்தான் நான் எப்போதும் பார்க்கின்றேனே அல்லாமல், ஆளும் கட்சியில் இருப்பவர்கள் அல்லது எதிர்க்கட்சியில் இருப்பவர் களுக்கு இடையே தெரிவு அடிப்படையிலே எந்தப் பக்கம் செல்லலாம் என்பதற்கான 100 சதவீதமான திருப்தி எமக்கு வருவதாக இல்லை. அதனை நான் வெளிப்படையாகச் சொல்லியே ஆகவேண்டும்.

இந்த අරගළය எவ்வாறு மாற்றம்பெற்றது என்பதைப் பார்ப்போம். முஸ்லிம்களுடைய ஜனாஸாக்கள் எரிக்கப்பட்ட போது, அதனை நிறுத்துங்கள் என்று அப்போது அரசின் உயர்மட்டங்களில் இருந்தவர்களிடம் சென்று காலைப் பிடித்துக் கெஞ்சிக் கேட்டபோது, அதற்குத் தடையாக இருந்த சில அதிகாரிகள் இந்த අරගළයஇலே "Gota go home" என்றார்கள். அதேபோல், இந்த நாட்டிற்கு அரபு தேசத்திலிருந்து மசகு எண்ணெய் கொண்டுவரக்கூடாது; அரசாங்கத்தில் இருக்கின்ற முஸ்லிம் அமைச்சர்கள் எல்லோரும் பதவி விலகவேண்டும் என்று கூறி உண்ணாவிரதம் இருந்த சங்கைக்குரிய கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஒருவர், අරගළයஇல் தானும் ஓர் அங்கத்தவன் என்றும் ஈரான் அரசாங்கத்துடன் பேசியிருப்பதாகவும் விரைவில் மசகு எண்ணெய்யைப் பெற்றுத் தருவேன் என்றும் இன்று சொல்கிறார். தற்பொழுது, அவர் இச்சபையில் இல்லை. இந்த மக்கள் போராட்டத்தில் யார் எந்தப் பக்கம் இருக்கிறார்கள் என்பது மிகப் பெரியதொரு கேள்வியாக மாறியிருக்கிறது. இந்த மக்கள் போராட்டமானது உண்மையிலே ஓர் அரசியல் மாற்றத்தை உருவாக்கி இருக்குமாக இருந்தால், புதிய சனாதிபதி தெரிவின்போது அல்லது புதிய பிரதமர் நியமனத்தின்போது சிறுபான்மைச் சமூகத்தைச் சேர்ந்த ஒருவரை நியமிக்க ஆவன செய்யக்கூடிய ஒரு சூழல் இங்கு உருவாகியிருக்கும்.

நிச்சயமாக இங்கிருக்கின்ற அரசியல் முறைமை என்பது அப்படியான ஒன்றல்ல. அந்த உறுப்பினருக்கு இத்தனை கோடி ரூபாய் வழங்கப்பட்டது; இந்த உறுப்பினருக்கு இத்தனை கோடி ரூபாய் வழங்கப்பட்டது என்று சொல்கின்ற நிலைமையை நாங்கள் பாராளுமன்றத்திற்குள்ளேயே பார்க்கின்றோம். அவ்வாறு சொன்ன ஒருவரிடம், மில்லியன் கணக்கில் பணம் கொடுக்கப்பட்டதாகச் சொன்னீர்களே, என்ன அர்த்தத்தில் சொன்னீர்களென்று நான் கேட்டேன். "අපිත් දේශපාලනය කරන්න එපායැ" - நாங்களும் அரசியல் செய்யத்தானே வேண்டும் என்று அவரிடமிருந்து பதில் வந்தது. சினிமாவில் 'கிசு கிசு' செய்திகளைச் சொல்லி மக்களை உற்சாகமூட்டுவதுபோல, வெளியே இருக்கின்ற மக்களுக்குப்

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

பாராளுமன்றத்திற்குள் இருந்து பொய்யான செய்திகளைச் சொல்வதனால்தான் அவர்கள் 225 உறுப்பினர்களும் வெளியே செல்லவேண்டும் என்ற கோரிக்கையை முன்வைக்கிறார்கள். எனவே, இங்குள்ள 225 உறுப்பினர்களுடைய கௌரவத்தையும் பாதுகாக்கவேண்டிய பொறுப்பு அதே 225 பேருக்கும்தான் இருக்கிறது. இவர்களில் யாராவது தவறிழைத்தால், யாராவது ஊழல் புரிந்தால், அவருடைய பெயரைக் குறிப்பிட்டு அதை ஆதாரத்தோடு வெளிப்படுத்துங்கள்! அதற்கு மாறாக, பொதுவான அபிப்பிராயங்களை உருவாக்கியதால் இன்று ஒட்டுமொத்தப் பாராளுமன்ற உறுப்பினர்களும் வேண்டாம் என்கின்ற நிலை ஏற்பட்டிருக்கிறது. அதன் விளைவாகத்தான் இந்த மக்கள் போராட்டம் வேறொரு திசையை நோக்கிச் சென்றிருக்கிறது என்றுகூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.42]

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට අපි ඉන්නේ බරපතළ අර්බුදකාරී තත්ත්වයකයි කියා අපි දන්නවා. මේ රටේ අරගළයක් තිබුණා. මගේ මිත්‍රයෝත්, මට ඡන්දය දීපු සමහර අයත් ඒ අරගළයට ගියා. අරගළයට ගිය පානදුරේ මගේ මිත්‍රයෝ අරගළය තුළ ඉඳගෙන මේ රජය විවේචනය කළා. අවසානයේ ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රට දාලා ගියාට පස්සේ මගේ මිත්‍රයකු වූ සුජීවගෙන් මම ඇහුවා, "මොකද කියන්නේ, දැන් වැඩේ හරිද?" කියලා. එතකොට ඔහු මට කිව්වේ මොකක්ද? "අනුප අපි බලාපොරොත්තු වුණේ ගෝඨාභය රාජපක්ෂ මේ රට දාලා යන එක නොවෙයි; මේක මහා නින්දාවක්. ඔහු ඉතාම අවංක පුද්ගලයෙක්. ඔහුගේ තීරණවල යම් යම් වැරදි තිබුණු නිසා -ඔවුන් දකින විධියට, අපි දකින විධියට නොවෙයි.- තමයි අපි යන්න කිව්වේ. ගෙදර යන්නයි කිව්වේ, රට දාලා යන්න කිව්වේ නැහැ. අපි දැක්කේ නැහැ, මේක තුළ තිබෙන කුමන්ත්‍රණය. අපි දැක්කේ නැහැ, මේක තුළ තිබෙන ඩයස්පෝරාවේ ක්‍රියාකාරිත්වය. අපි දැක්කේ නැහැ, මේක තුළ තිබෙන අන්තවාදීන්ගේ ක්‍රියාදාමය. මට ඊයේ රෑ නින්ද ගියේ නැහැ, මම ඇඬුවා. ගෝඨාභය රාජපක්ෂ රට දාලා ගිය එක, එතුමා සිංගප්පූරුවේ ඉන්න එක අපට නින්දාවක් නොවෙයිද?" කියා මගෙන් ඇහුවා; "ත්‍රස්තවාදය අවසන් කරමින් සිංහළ, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට සාමය ලබා දීමේදී ආරක්ෂක ලේකම් විධියට අතිප්‍රබල කාර්ය භාරයක් ඉෂ්ට කළ ඒ නායකයා වෙනත් රටක ඉන්න එක නින්දාවක් නොවෙයිද?" කියලා මගේ මිත්‍රයා ඇහුවා. දැන් එළියට බැහැලා කාටවත් අඬන්න බැහැ. ඇඬුවොත්, ඒකට විරෝධය දැක්වුවොත් ගෙවල් ගිනි තියන්න, පහර දෙන්න, -ගහන්න- මරන්න බලාගෙන ඉන්න පිරිසක් ඉන්නවා. සත්‍ය වශයෙන්ම තමන්ගේ හදවතේ තිබෙන දෙය ප්‍රකාශ කරන්න බැරි, නිහඬ හඬක් මේ රට තුළ තිබෙනවා. අන්න ඒ නිසා තමයි නීතිය හා සාමය ආරක්ෂා කළ යුත්තේ. අන්න ඒ නිසා තමයි හදිසි නීතිය ගෙන ආ යුත්තේ. එහෙම නැතිව හදිසි නීතිය ගේන්නේ ඝාතනයටවත්, තර්ජනයටවත්, මර්දනයටවත් නොවෙයි. මේ රට සාමකාමී තත්ත්වයට ගෙනෙන්න හදිසි නීතිය අවශ්‍යයි.

මම විශ්වවිද්‍යාල තරුණයෙක්ව සිටියදී අරගළය නිසා මමත් එක්ක හිටි 60,000ක් තරුණයෝ ඝාතනය වුණා. එවැනි ඝාතනයකට නොවෙයි මේ සූදානම් වෙන්නේ. අම්මලා තාත්තලාට, දරුවන්ට සත්‍යය කියා දීලා, නීතිය බලගන්වා, සාමය බලගන්වා මේ රටේ ජනතාවට සාමකාමී දේශපාලන තත්ත්වයක් නිර්මාණය කිරීමයි අපේ අරමුණ. ඒ නිසා මම මේ රටේ භික්ෂූන් වහන්සේලා ඇතුළු සියලු ජනතාවගෙන් ඉල්ලා සිටිනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මේ මව් බිම තුළ නිදහසේ ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම සඳහා පෙරමුණ ගන්න කියලා. එතුමා පිට රටක සිටීම අපට මහා නින්දාවක්; නිච නින්දාවක්. එතුමා පිට රටක ඉන්න අවශ්‍ය නැහැ. ත්‍රස්තවාදයට විරුද්ධව කළ අරගළය තුළ දැවැන්ත මෙහෙවරක් කළ සියලු දෙනාටත් මේක නින්දාවක්. මේ ගරු සභාව තුළ ඉන්න පක්ෂ ගණනාවක් නියෝජනය කරමින් හැටනව ලක්ෂයක ජනතාවක් එතුමාට ඡන්දය දුන්නා.

එතුමා අතින් වරදක් සිදු වුණා නම්, රජය අතින් වරදක් සිදු වුණා නම් මා ද ඇතුළුව ඡන්දය දීපු සියලුදෙනා ඊට වග කියන්න ඕනෑ. ඒ වගකීම අප සියලුදෙනා භාරගන්න ඕනෑ. එක්කෙනෙකුට පමණක් එය භාර දිය නොහැකියි. අප නිවැරදි වෙනවා නම් සියලුදෙනා එකතු වෙලා නිවැරදි වෙන්න ඕනෑ. මම ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ මව් බිමට නැවත ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩයනා ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මගේ සුබ පැතුම් එකතු කරන්න කැමැතියි, අපේ නව ජනාධිපතිතුමාටත්, අපේ නව අගමැතිතුමාට සහ සභානායකතුමාටත්. ඇත්ත වශයෙන්ම මේ රටේ සිදු වෙච්ච දේවල් එක්ක, මේ පවතින තත්ත්වයත් එක්ක බැලුවාම අද දවසේ හදිසි නීතිය සම්බන්ධ කාරණාවට වඩා වැඩි දෙයක් මට කියන්න තිබෙනවා.

මම පළමුවෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. "Go home, Gota!" කියලා අරගළ කරද්දී අපේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා **ජනාධිපති** මන්දිරය භාර දීලා ගියා. එතුමා මේ රටින් පිට වෙන්න හදපු වෙලාවේ Immigration and Emigration Department එකේ ආගමන හා විගමන නිලධාරින් හැසිරිච්ච විධිය බලන්න! ඒ වන කොටත් මේ රටේ ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමායි. මේ රටේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරින් සම්පූර්ණයෙන් නීති විරෝධි විධියටයි ඒ වෙලාවේ හැසිරුණේ. එතුමාගේ passport එක stamp කරන්න බැහැ කියලා, එතුමාට රටින් පිට වෙන්න දෙන්න බැහැ කියලා ඒ අය එතුමාව refuse කළා. මේ රටේ නායකයා හැටියට එතුමාට ඒ වන කොටත් diplomatic rights තිබුණා.

ඒ නිසා ඒ ක්‍රියාව සම්පූර්ණයෙන් වැරැදියි. ඒ ගොල්ලෝ ඒ දවසේත් මේ රටේ නීතිය අතට ගත්තා. එහෙම නීතිය අතට ගන්න බැහැ. මේ රටේ ඒ නිලධාරින් බැඳී සිටිනවා, ඒ ගොල්ලන්ගේ

රාජකාරියට. එහෙම නම්, එදා එහෙම වුණේ කොහොමද? විෂය භාර ගරු ඇමතිතුමාට සහ ගරු කථානායකතුමාට මම යෝජනා කර සිටිනවා, මේ ගැන අනිවාර්යයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුයි, ඒ නිලධාරීන් හඳුනාගත යුතුයි කියලා. ඒ නිලධාරීන් තමන්ගේ රාජකාරිය නීති විරෝධීව කළේ ඇයි කියන එක අපට දැන ගන්නට අවශ්‍යයි.

ඊළඟට මම කියන්න ඕනෑ, මේ රටේ අරගළ කරන මේ දරුවන් එක්ක, මේ අම්මලා තාත්තලා එක්ක, මේ සහෝදර සහෝදරියන් එක්ක අපිත් එකඟ බව. ඔව්, නිර්පාක්ෂික අරගළයට අපිත් එකඟයි! රටක ප්‍රශ්න ඇති වුණාම රටේ ජනතාව පාරට බහිනවා. ඒක වළක්වන්න අපට බැහැ. නමුත්, කාටවත් රටේ නීතිය අතට ගන්නට බැහැ. රටේ නීතිය අතට අරගෙන මේ විධියට හැසිරෙන්න ඉඩ දෙන්න අපට බැහැ. මේ රට තුළ බියෙන් ජීවත් වෙන්න අපට බැහැ. ඒ හින්දා අපි නීතිය නැවතත් අපේ පාලනය යටතට ගත යුතුයි. මම විශ්වාස කරනවා, හදිසි නීතිය මේ රටේ වැඩි කාලයක් පවත්වන්න අවශ්‍ය වන එකක් නැහැ කියලා. එහෙම කළ යුතුත් නැහැ කියා මම කියා සිටිනවා. හදිසි නීතිය යටතේ රට පවත්වාගෙන යන්න අපට අවශ්‍යතාවක් නැහැ. නමුත් මේ කාලය තුළ මේ රටේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්න ඕනෑ. ඒ වාගේම තමයි, අපි නැවත මේ රට තුළ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කළ යුතුයි.

Sir, I would like to refer to the actions of the US Ambassador, Her Excellency Julie Chung, in English. I think she has been interfering with the internal affairs of this country. We know what happened in the past when former US Ambassador to Sri Lanka, His Excellency Robert O. Blake, interfered with the internal affairs of this country. And also, we know what happened in 1991 during the regime of President R. Premadasa. The British High Commissioner to Sri Lanka got expelled. Those were internal affairs which had to be dealt with internally. Recently, US Ambassador Julie Chung has been lecturing the President of Sri Lanka about the aspirations of the Sri Lankans. How on earth can Her Excellency Julie Chung lecture the President, who has lived all 73 years of his life in this country, about the aspirations of the Sri Lankan people, of which he knows much better? So, I request to the international community to understand the situation in this country: there is no law and order at the moment and we all are living in fear. We cannot carry on this way, with the riots; we cannot go on without law and order. Everything in this country has to be done under the law. So, there should be law and order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
Okay, Sir, I will wind up.

විපක්ෂය කිව්වා, "මේක දැන් කාලකණ්ණි ආණ්ඩුවක්" කියලා. මම ඡන්දය දුන්නේ කාටද කියන එක අදාළ නැහැ. නමුත්, ඩලස් අලහප්පෙරුම මැතිතුමා ජනාධිපති වෙලා අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා අගමැති වුණා නම්? එතකොට මේක හොඳ ආණ්ඩුවක් වෙයිද? එතකොට මේ ආණ්ඩුව කාලකණ්ණි වෙන්නේ නැද්ද? එතකොට ඩොලර් එන්නේ කොහොමද? අපට කවුරු හරි කියන්න, එතකොට ඩොලර් එන විධිය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්. භාෂා දෙකෙන්ම කිව්වා, දැන්.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
හොඳයි, මම කථාව අවසන් කරන්නම්. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) සරත් වීරසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. අපි මේ හදිසි නීති විවාදය පවත්වන්නේ ඇයි? අපි දන්නවා, 1983 දී පැනවූ හදිසි නීතිය අවුරුදු 28ක් මේ රට තුළ පැවැති බව. එහෙම කළේ ත්‍රස්තවාදය පැවැති නිසා බව අපි දන්නවා. 2011 අගෝස්තු මාසයේදී තමයි එය ඉවත් කළේ. එදා පැවැති ත්‍රස්තවාදය සහ රණ විරුවාගේ භූමිකාව අද වන විට අමතක වීම ගැන අපි ඇත්ත වශයෙන්ම කනගාටු වෙනවා.

රටට යම්කිසි තර්ජනයක් තිබෙනවා නම්, රටට යම්කිසි අනතුරක් තිබෙනවා නම්, ඉදිරියේදී රට යම්කිසි ආපදාවකට මුහුණ දෙනවා කියා හිතනවා නම්, ඒ තත්ත්වය පොලිසියට පාලනය කරන්න බැරි නම්, ඒ තත්ත්වය පාලනය කරන්න හමුදාව අවශ්‍යයි කියා හිතෙනවා නම්, අන්න ඒ වෙලාවට තමයි හදිසි නීතිය කියන එක ගෙන එන්නේ. එය ගෙන එන්නේ මහජන ආරක්ෂක ආඥාපනත යටතේයි. එය කරන්නේ දේශපාලනඥයන්ගේ ආරක්ෂාව උදෙසා නොවෙයි. සම්පූර්ණයෙන්ම ජනතාව ආරක්ෂා කරන්නයි; ජනතාවගේ පෞද්ගලික දේපළ -නිවාස, ජනතාවගේ වෙළෙඳ සැල්- වාගේම රාජ්‍ය දේපළ ආරක්ෂා කරන්නයි මේ විධියට හදිසි නීතිය පනවන්නේ. හදිසි නීති රෙගුලාසි සාමාන්‍ය නීතිය අභිභවා යනවා. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අභිභවා යන්නේ නැහැ. ඒ යටතේ ඕනෑම වෙලාවක හමුදාව කැඳවන්න පුළුවන්. ඒ වාගේම, අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් කරන්න පුළුවන්. ජනාධිපතිතුමාට පුළුවන්, හදිසි නීතිය පනවන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා හදිසි නීතිය පනවා දින 14ක් තුළ මේ පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා එය ඉදිරිපත් කරනවා. මේ පාර්ලිමේන්තුව අද රැස් වෙලා තිබෙන්නේ ඒකයි.

අපි වර්තමානයේ හදිසි නීතිය පනවන්නේ ඇයි? අපි දන්නවා, මේ අරගළය ආරම්භ වුණේ සාධාරණ හේතුවක් නිසා බව. ඒකේ කිසි වරදක් නැහැ. යහපත් අරමුණක් සාක්ෂාත් කරගන්න තමයි එම උද්ඝෝෂණ පැවැත්වූවේ. අපි ඒක දන්නවා. මිනිස්සු වාහනවලට ඉන්ධන නැතිව සිටියා, විදුලිය නැතිව සිටියා, භූමි තෙල් නැතිව සිටියා, ගෑස් නැතිව කෑම උයාගන්න බැරිව සිටියා. ගමනාගමනයට ප්‍රශ්න ඇති වුණා, පාසල් වසා තිබුණා, රැකියා නැති වුණා, ආදායම් මාර්ග අහිමි වුණා. ඒ නිසා ජනතාවගේ අසහනය ඇත්ත වශයෙන් ඉතාම සාධාරණයි.

ජනතාවගේ පීඩනය සාධාරණයි. ජනතාවට සාධාරණ කෝපයක් තිබුණා, සාධාරණ ද්වේෂයක් ඇති වුණා. උද්ඝෝෂණ පෙළපාළි සහ විරෝධතා පෙළපාළි කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ඒක කාටවත් "නැහැ" කියන්න බැහැ. ඒකේ සුජාතභාවය ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් ඊට පසුව ක්‍රමක්‍රමයෙන් ජනතා පීඩනය, ජනතාව තුළ තිබුණු ද්වේෂය ඇතුළට බංකොලොත්භාවයට පත් වූ දේශපාලන පක්ෂවල ඉන්න මැරයෝ අන්තර්ගත වෙලා ඒක ප්‍රචණ්ඩත්වය කරා ගෙන ගියා. රජය පෙරළන්න හැදුවා; ජනතා පරමාධිපත්‍යයෙන් පත් වූ ව්‍යවස්ථානුකූල රජය පෙරළන්න හැදුවා. ඇත්ත වශයෙන්ම ඒක ඉතාම වැරදි වැඩක් බව අපි දන්නවා. ජනාධිපති නීතිඥ ටිරන්ත වලලියද්ද මහත්මයා ඉතා හොඳ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වූවා. එතුමා කිව්වා, "ඕනෑම උද්ඝෝෂණයක් පවත්වන්න ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තිබෙනවා. රජයට බණින්න පුළුවන්, දේශපාලනඥයන්ට බණින්න පුළුවන්, "හොරා" කියන්න පුළුවන්, "තක්කඩියා" කියන්න පුළුවන්, "ස්ත්‍රී දූෂකයා" කියන්න පුළුවන්, නමුත් රජයක් පෙරළන්න ඔවුන්ට උද්ඝෝෂණය කරන්න බැහැ, ඒ වාගේම ජනාධිපති එළවන්න, ජනාධිපති මරන්න උද්ඝෝෂණය කරන්න බැහැ. එහෙම කළොත් ඒක රාජ්‍ය විරෝධී කැරැල්ලක් වෙනවා. එතකොට දණ්ඩ නීති සංග්‍රහයේ 198 වැනි වගන්තිය යටතේ මරණීය දණ්ඩනය වුණත් දෙන්න පුළුවන්" කියලා. ඒ කියන්නේ ව්‍යවස්ථානුකූලව පත් වූ රජයක් කැරැල්ලකින් පෙරළන එක ඉතාම බරපතළ වරදක්. ඒකට තමයි පසුගිය කාලයේ මැර කණ්ඩායම්, දේශපාලන පක්ෂ එකතු වෙලා උත්සාහ කළේ. ජනතා පීඩනය, අසහනය උපයෝගි කරගෙන පොදු දේපළවලට හානි කරන්න, ගිනි අවි සොරකම් කරන්න, මිනී මරන්න මැර කණ්ඩායම්වලට පුළුවන්ද?

කුමාර වෙල්ගම මැතිතුමා අද කිව්වා, එතුමාට පහර දුන්නේ කොහොමද කියලා. තව විනාඩි දෙකක් ගත වුණා නම් එතුමාගේ ජීප් එක ඇතුළේම එතුමා දැවී අළු වී යන්න තිබුණා. ඉතින් ඔවුන්ට සමාව දෙන්න පුළුවන්ද? පාකිස්තානයේදී අන්තවාදීන් විසින් අපේ සිංහල තරුණයෙක් මරා දැම්මේ කොහොමද කියලා අපි දැක්කා. ලංකාව පමණක් නොවෙයි, මුළු ලෝකයම එය පිළිකුල් කළා. නමුත් අපේ මේ බෞද්ධ රටේ අමරකීර්ති අතුකෝරළ කියන අපේ හිටපු අහිංසක මන්ත්‍රීවරයාට සහ එතුමාගේ ආරක්ෂක නිලධාරියාට ම්ලේච්ඡ විධියට ගහලා, ඒ අය පණ අදිනකොට තට්ටු හතරක් පඩිපෙළ දිගේ ඇදගෙන ආපු හැටි අපි දැක්කා. තිරිසන් විධියට තමයි මරා දැම්මේ. ඒක මුළු රටටම අපහාසයක්. කවුද මැරුවේ? කවදාවත් ඒ මන්ත්‍රීතුමා දැකලා නැති පුද්ගලයෝ තමයි ඒ මන්ත්‍රීතුමා මරා දැම්මේ, ගරු කථානායකතුමනි. එය කාගේ කීමටද කළේ, එය සැලසුම් කළේ කවුද කියලා දැන් අපි දන්නවා. අපි ඔක්කොම හොයාගෙන යනවා. අද වනකොට තිස්අටදෙනෙකු අත්අඩංගුවේ ඉන්නවා. අපි තවත් අය අත්අඩංගුවට ගන්නවා. ඒ පරීක්ෂණ දිගටම කරගෙන යනවා. අරගළය මුවාවෙන් මනුෂ්‍යයන් ඝාතනය කරනවා නම්, බේරේ වැවේ ගිල්වනවා නම්, බස් ගිනි තියනවා නම්, නිවාස ගිනි තියනවා නම්, මන්ත්‍රීවරුන්ට ගහනවා නම් අන්න ඒ ම්ලේච්ඡත්වය නැති කරන්න, ඉදිරියේදී එහෙම වෙනවාය කියලා බුද්ධි අංශ අපට කියන නිසා තමයි අපි ඇත්ත වශයෙන්ම හදිසි නීතිය පනවන්නේ. අරගළය ප්‍රචණ්ඩත්වය කරා ගෙන යන්න නීතිඥ සංගමයත් ආරම්භයේදී යම් කිසි උත්තේජනයක් ලබා දුන්නා. ඒ ගැනත් අපි ඉතා කනගාටුවෙන් යුතුව මේ අවස්ථාවේදී සිහි කරනවා. නීතිඥවරුන්ට අපරාධකරුවන් වෙනුවෙන් සල්ලිවලට පෙනී සිටින්න පුළුවන්; ස්ත්‍රී දූෂකයන් වෙනුවෙන් මුදල්වලට පෙනී සිටින්න පුළුවන්; කුඩුකාරයන් වෙනුවෙන් මුදල්වලට පෙනී සිටින්න පුළුවන්. නමුත් ඔවුන්ට අපරාධ කරන්න අනුබල දෙන්න බැහැ. එදා හිටපු ජනාධිපතිතුමාගේ මිරිහානේ නිවසට ජනයා එන්න හදනකොට, බස් පුච්චලා අපරාධ කරනකොට, උසාවියට ගිහිල්ලා ඔවුන් වෙනුවෙන් නීතිඥයන් නොමිලේ පෙනී සිටියා. එසේ පෙනී ඉඳලා ඔවුන්ට ඇප ලැබිලා එළියට එනකොට, මල් මාලා දමලා අත්පොඩි ගහලා පිළිගත්තා. එදා ඉතාම වැරදි පූර්වාදර්ශයක් තමයි නීතිඥ සංගමයෙන් ඒ දුන්නේ. අද කී දෙනෙක් ඒ සිද්ධිවලට අදාළව අත්අඩංගුවේ ඉන්නවාද? අද කවුරුවත් ඔවුන් වෙනුවෙන් නොමිලේ පෙනී සිටින්නේ නැහැ.

අපි දන්නවා, එදා පාර්ලිමේන්තුව අත්පත් කර ගත්තා නම් මොකද වෙන්නේ කියලා. එදා අපේ හමුදාව එකතු වෙලා පාර්ලිමේන්තුව අත්පත් කර ගන්න එක සම්පූර්ණයෙන්ම නැවැත්වූවා. එදා පාර්ලිමේන්තුව අත්පත් කර ගත්තා නම්, අපි අද මේ පාර්ලිමේන්තුවේ නැහැ. පාර්ලිමේන්තුව අත්පත් කර ගත්තා නම් අද වනකොට ඇත්ත වශයෙන්ම ඔවුන් අධිකරණ පද්ධතියටත් බලපෑම් කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණයට, අනෙක් උසාවිවලට බලපෑම් කරලා, විනිශ්චයකාරවරුන්ටත් තර්ජනය කරන තත්ත්වයක් ඇති වෙන්න තිබුණා. අන්න ඒ තත්ත්වය පාලනය කරන්න තමයි, ඉදිරියේදී ඒ වාගේ තත්ත්වයක් ඇති වෙනවාය කියලා කියන නිසා තමයි ඇත්ත වශයෙන්ම මේ හදිසි නීතිය පනවන්නේ. ගරු කථානායකතුමනි, හදිසි නීතියට ඇත්ත වශයෙන්ම බය වෙන්න ඕනෑ මැර කණ්ඩායම්, මැර දේශපාලන පක්ෂ හා කඩාකප්පල්කාරීන් පමණයි. මේ තුළදීත් සාමකාමී උද්ඝෝෂණ සහ සාමකාමී විරෝධතා දිගටම පවත්වන්න පුළුවන්. හදිසි නීතිය උපයෝගි කරගෙන ඒවා වළක්වනවා නම්, අපි ඒකටත් විරුද්ධ වෙන බව මේ අවස්ථාවේදී මා කියනවා.

ඒ වාගේම, නොමඟ යන, ප්‍රචණ්ඩත්වයට යොමු වන තරුණ පිරිසට වැඩිහිටියෙකු හැටියට මම උපදෙසක් දෙන්න කැමැතියි. මොකද, තමන් කළ දේට නඩු වැටෙන්න පටන් ගත්තාම තමන්ව උසි ගැන්වූ කිසිම නායකයෙක් තමන්ගේ පස්සෙන් එන්නේ නැහැ. එතකොට තමන්ට වෙන්නේ, තමන්ගේ වතු පිටි, නැත්නම් අම්මාගේ, භාර්යාවගේ කන-කර බඩු උකස් තියලා නීතිඥවරුන්ට ගෙවලා නඩු වෙනුවෙන් පෙනී සිටින්නයි. අපි දැක්කා, ජාතික රූපවාහිනීයට බලෙන් ඇතුළු වුණු පුද්ගලයා ඩුබායි යන්න යනකොට ගුවන් යානය තුළදී අත්අඩංගුවට ගත්තා. ඔහු වෙනුවෙන් නොමිලයේ පෙනී සිටින නීතිඥවරයා කවුද කියලා මම අහන්න කැමැතියි.

අපි දන්නවා, Scene of Crime Officersලා - SOCOs - ජනාධිපති මන්දිරයට ගිහිල්ලා, අගමැති කාර්යාලයට ගිහිල්ලා ඇඟිලි සලකුණු ගන්නවා. එසේ ලබා ගන්නා සියලු ඇඟිලි සලකුණු ගුවන් තොටුපළට යවනවා. එතකොට ඔවුන්ට කවදාවත් රටින් පිටවෙන්න බැහැ. ඔවුන්ට නඩු දමනවා. නඩු දමලා ඔවුන් වැරදිකරුවන් වුණොත් ඔවුන්ට කවදාවත් පොලිස් වාර්තාවක්

හම්බවෙන්නේ නැහැ. ඒ අය රජයේ රැකියාවකට යනකොට, උදාහරණයක් හැටියට හමුදාවට, පොලීසියට බැඳෙනකොට තමන්ගේ අයියලා, මල්ලිලා, මාමලා, බාප්පලා විතරක් නොවෙයි, දුර ඥාතියෙක් හෝ වරදක් කරලා දඬුවම් ලබා තිබෙනවා නම් ඔහුට ඒ රැකියාව ලැබෙන්නේ නැහැ කියලා අපි දන්නවා, ගරු කථානායකතුමනි. එම නිසා අපි මේ තරුණයන්ට දෙන අවවාදය තමයි, තමන්ට ඒ වාගේ දෙයක් වුණොත්, ඒ කියන්නේ තමන් වැරදිකාරයා වෙලා උසාවියෙන් දඬුවම් කළොත්, ඔහුගේ පරම්පරාවේ කිසිම කෙනෙකුට රජයේ රැකියාවකට, විශේෂයෙන්ම හමුදාව සහ පොලීසිය ඇතුළු රජයේ විශේෂ රැකියාවලට කවදාවත් යන්න ලැබෙන්නේ නැහැ කියන එක.

ඊළඟට, අධිකරණ නියෝගයක් අරගෙන පොලීසිය ගිහිල්ලා නියම විධියට, විනයානුකූලව පිරිසක් ඉවත් කරන්න යනකොට පොලීසියට "හූ" කියලා, ඔවුන්ට මොන තරම් අපහාස කළාද කියලා අපි දැක්කා. ඇත්ත වශයෙන්ම නීතිය ගරු කරන කිසිම කෙනෙක් ඒක හොඳයි කියලා අනුමත කරන්නේ නැහැ. ඉතින්, ඒ අන්දමට තමයි අද කනේ කරාබු දාලා, පච්ච කොටාගෙන අරගළයේ සිටින මැර කල්ලිය හැසිරෙන්නේ.

ගරු කථානායකතුමනි, අද සමහර ටියුෂන් ගුරුවරු කියලා තිබෙනවා, හමුදාවේ සහ පොලීසියේ නිලධාරින්ගේ දරුවන්ට උගන්වන්නේ නැහැ කියලා. ඒ ටියුෂන් පන්ති කරන ටියුෂන් මාස්ටර්ලාගේ සියලුම පන්ති අපි තහනම් කළ යුතුයි කියලා මම කියනවා, ගරු කථානායකතුමනි. මේ අය මොන තරම් ගුණමකු, මොන තරම් කුහක ජාතියක්ද කියන එක ඇත්ත වශයෙන්ම ඒ ප්‍රකාශයෙන් ඔප්පු වෙනවා.

අපි අවුරුදු 30ක් පුරාවට ත්‍රස්තවාදයෙන් බැට කෑවා. බස්වල, දුම්රියවල බෝම්බ පිපිරුවා. මරාගෙන මැරෙන කොටි නිසා සිදු වුණු විනාශය අපි දැක්කා. ඒ කාලයේ අම්මයි, තාත්තයි එකම බස් එකේ, එකම දුම්රියේ ගියේ නැහැ. මොකද, දෙදෙනාම මැරුණොත් දරුවන් බලාගන්න කෙනෙක් නැති වන නිසා. අපේ හමුදාව සහ පොලීසිය තමයි ඒ භීෂණය නැති කළේ. අපේ විරුවන් 29,000ක් මැරුණා, 14,000ක් දෙනා ආබාධිත වුණා. එහෙව් හමුදා සාමාජිකයන්ගේ දරුවන්ට උගන්වන්න බැහැයි කියනවා නම් ඒක තිරිසන් ගතියක් කියලා මම කියනවා. ගරු කථානායකතුමනි, අපි දන්නා ශ්ලෝකයක් තිබෙනවා, මෙන්න මෙහෙම:

> ආහාර නිද්‍රා භය මෛථුනංච
>
> සාමාන්‍යමෙතත් පශුභිර්නාරානාම්
>
> ධර්මෝහි තේෂාමධිකො විශේෂෝ
>
> ධර්මේන හීනා පශුභිං සමානාං

ආහාර, භය, නින්ද සහ මෛථුන - සංසර්ගය - කියන හතරම මනුෂ්‍යයාටයි, තිරිසනාටයි පොදුයි. නමුත්, මනුෂ්‍යයාට පමණයි තමන් උපන් භූමියට ආදරය කරන්න පුළුවන්. මනුෂ්‍යයා තිරිසනාගෙන් වෙනස් වෙන්නේ අන්න ඒ ගුණාංගයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please wind up now.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
එසේ නොවන කවුරුන් හෝ කෙනෙක් ඉන්නවා නම්, ඔහු සහ තිරිසනා අතර කිසි වෙනසක් නැහැයි කියන එකත් මම කියන්නට ඕනෑ. කවියකුත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

> මගේ රට ජාතිය
>
> ආගම සමඟ නීතිය
>
> රකිමි හැර භීතිය
>
> එයම වේවා මගේ ප්‍රීතිය...

අපි භීතිය ඇති කරන්න ඕනෑ මැරයන්ට. ඒ භීතිය ඇති කරන්න නම්, හදිසි නීතිය පවතින්න ඕනෑ.

ස්තුතියි

[අ.භා. 5.03]

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
විශේෂයෙන්ම අලුතින් තේරී පත්වී සිටින අගමැතිතුමාට සහ ජනාධිපතිතුමාට මම මේ අවස්ථාවේ සුබ පතනවා, එතුමන්ලාගේ කාර්ය භාරය සාර්ථකව කරගන්න ඉඩ ලැබෙන්න කියලා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ගත්තාම, ඉතිහාසයේ ජනතාවට ලංකාව හරි තැනට ගෙනයන්න බොහෝ අවස්ථා ලැබී තිබෙනවා. 1948 ඉඳලා නොයෙක් අවස්ථාවල ශ්‍රී ලංකාව තුළ හරි දේ කරන්න ඒ නායකයන්ට අවස්ථාව ලැබී තිබෙනවා. හැබැයි අවාසනාවකට, ඒ කිසිදු නායකයෙක් ශ්‍රී ලංකාවට හරි දේ ඉටු නොකිරීම නිසා තමයි අද ශ්‍රී ලංකාව මේ ආර්ථික සහ දේශපාලන අර්බුදයට මුහුණ දෙමින් සිටින්නේ. ඉතාම ජ්‍යෙෂ්ඨ නායකයන් දෙදෙනෙක්; අවුරුදු 50ක් විතර එකට දේශපාලනය කරපු නායකයන් දෙදෙනෙක් ජනාධිපති සහ අගමැති හැටියට සිටින අවස්ථාවක නැවත ඒ වැරැද්දම කරන්නේ නැතුව මේ අවස්ථාව හරි විධියට භාවිත කරයි කියා මම බලාපොරොත්තු වෙනවා.

මෑත ඉතිහාසය ගත්තාම, 2015 දී යහ පාලන ආණ්ඩුව තුළින්, ඊට කලින් 2010 යුද්ධය අවසන් වුණු කාලයේ, ඒ වාගේම 2020 දී තුනෙන් දෙකක බලයක් තිබුණු කාලයේ පවා මේ රට හරි තැනට ගෙනයන්න අවස්ථාව තිබුණා. හැබැයි, ඒ නායකයෝ ඒ දේ කරන්න අසමත් වුණා. ඒ නිසා මේ අවස්ථාවේ හෝ හරි දේ කරලා ලංකාවේ ජනතාවට හොඳ අනාගතයක් උදා කරන්න ඔවුන් වැඩ කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ නායකයෝ දෙදෙනාම දන්නවා, අද තිබෙන ආර්ථික ප්‍රශ්නයට ප්‍රධානම හේතුව දෙමළ ජනතාවගේ නොවිසඳුණු ගැටලු කියලා. මේ national crisis එක, නැත්නම් national ethnic conflict එක විසඳුණේ නැති නිසා තමයි අද වෙනකොට මෙච්චර ලොකු ආර්ථික ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙන්නේ කියන එක අවුරුදු 50ක් දේශපාලනය කරපු මේ නායකයෝ දෙදෙනා දන්නවා.

විශේෂයෙන්ම මම මේ නායකයන්ගෙන් ඉල්ලා සිටිනවා, ද්‍රවිඩ ජනතාවගේ දේශපාලන ගැටලු විසඳීමට ප්‍රමුඛත්වය ලබා දෙන්න කියලා. ඒ තුළින් මේ රටේ ආර්ථික ප්‍රශ්න විසඳන්න අපට අවස්ථාවක් ලැබෙයි. ඔබතුමන්ලාට පුළුවන් නම්, උතුර-නැඟෙනහිර වෙසෙන දෙමළ ජනතාවගේ ගැටලු, දේශපාලන සිරකරුවන්ගේ ගැටලු, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ගැටලු, ඉඩම් සම්බන්ධ ගැටලු අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළින් නිරාකරණය කර දෙන්න. උතුර-නැඟෙනහිර විශේෂිත වූ ආර්ථික කලාපයක් ඇති කිරීම තුළින් ලංකාවට ආයෝජන ගේන්න පුළුවන්. මොකද, අද IMF එකෙනුත් ආධාර ලබාගෙන මොන විධියක programme එකක් කළත්, ලංකාවේ තිබෙන තෙල් පෝලිම්, ගෑස් පෝලිම් නවත්වන්න අපට විශාල ඩොලර්

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

සංචිතයක්, එහෙම නැත්නම් cash infusion එකක් අවශ්‍යයි. දෙමළ ජනතාවගේ ඉල්ලීම් ඉටු කළොත් දෙමළ ජනතාව නියෝජනය කරන අපට ආයෝජන වැඩි කරන්න දායක වෙන්න පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ අවස්ථාවේදී ඒකට වැඩ පිළිවෙළක් යොදන්න කියලා. හැබැයි, අද ඒ දේ කරන්නේ නැතිව Emergency law එක ගෙනැල්ලා මේ නායකයෝ දෙදෙනාත් ඉතිහාසයේ සිටි නායකයන් වාගේම වැරදි පැත්තේ සිටින නායකයන් බවට පත්වන්න හේතුවන පළමුවෙනි කටයුත්ත තමයි මේ කරන්නේ කියලා මට කියන්න පුළුවන්. මොකද, අද මේ අරගළය කරන පිරිස මේ අරගළ භූමියෙන් ඉවත් කරන්න ඕනෑ නම් මේ අරගළය සහමුලින්ම නවත්වන්න ඕනෑ. මේ අරගළය ඉවරයක් කරන්න නම් කළ යුතුව තිබෙන එකම දේ තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න කියලා ඒ ගොල්ලන් ඉල්ලන සංශෝධන, ඒ reforms ගෙන ඒම. ඒ සඳහා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න.

විධායක ජනාධිපතිවරයාට තිබෙන බලය නිසා ලංකාවට ලියුමක් එනකම් ලංකාවේ සිටින මිලියන 22ක පමණ ජනතාවට ප්‍රාණ ඇපකරුවන් විධියට දවස් දෙකක් ඉන්න සිද්ධ වුණා. එම නිසා මේ විධායක බලතල සහිත ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න වැඩ කටයුතු කරන්න ඕනෑ. මම හිතන විධියට එහෙම වුණොත් අරගළකරුවනුත් ගෙදර යයි. මේ ආර්ථික අර්බුදය විසඳීම සඳහා කළ යුතු reforms අපේ Constitution එකටත් ගේන්න. එතකොට මේ අරගළය අවසන් වෙයි. එහෙම නැතිව, හදිසි නීතිය දාලා අරගළය අවසන් කරන්න හැදුවොත් මම හිතන්නේ මේ නායකයෝ දෙදෙනාත් ඉතිහාසයේ හිටපු නායකයන් වාගේ අසමත් නායකයන් බවට පත්වෙයි. හැබැයි, අරගළ කරලා ජනාධිපති මාරු කරලා, අගමැතිවරු මාරු කරලා, ආණ්ඩු මාරු කරලා තිබෙන සමහර රටවලට ස්ථාවර ආණ්ඩුවක් පවත්වාගෙන යන්න අවස්ථාව ලැබිලා නැහැ. ඒ ආණ්ඩු දිගින් දිගටම මාරු වෙනවා. සමහර විට මාස හයෙන් හයට ඒක වෙන්න පුළුවන්. හැබැයි, ලංකාවේ නායකයන්ට පුළුවන් ඉතිහාසගත වෙන්න. සාමකාමී උද්ඝෝෂණ තුළින් රටක අගමැති හා ජනාධිපති වෙනස් කරලා, රට ස්ථාවරභාවයකට ගෙනැල්ලා රට සාර්ථක තැනකට ගෙනයෑමේ අවස්ථාවක් මේ නායකයන් දෙදෙනාට අද ලැබී තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා, තරුණ පරම්පරාව වෙනුවෙන් ඒ දේ කරන්න කියලා. හදිසි නීතිය දාලා මේ අරගළයේ ඉන්න අය arrest කරන්න කලින් ඒ අරගළකරුවන් බලාපොරොත්තු වුණු දේ කරන්න. Arrest කරන්න ඕනෑ අය තව ඉන්නවා. අපි දැක්කා, plane එකකට ගිහිල්ලා පුද්ගලයෙක්ව arrest කරනවා. ලංකාවේ තිබුණු ඩොලර් සංචිතය විනාශ කරලා, ලංකාවේ ආර්ථිකය විනාශ කරලා, මිනිස්සු පාරට ඇදලා දාලා ඩොලරය රුපියල් 380 දක්වා ඉහළට ගෙනාපු අය arrest කරන්න ඇයි අපට බැරි? පුළුවන් නම්, ඒ ගොල්ලන්ව arrest කරන්න. තරුණ අරගළකරුවන් arrest කරන එකේ ඒ ගොල්ලන්ව arrest කරන්න. මහ බැංකුව කොල්ලකාපු අය arrest කරන්න. පාස්කු ප්‍රහාරයේ පිටුපස හිටපු අය arrest කරන්න. සීනි වංචාවේ පිටුපස හිටපු අය arrest කරන්න. ඒ සියලුදෙනා arrest කරන්න. මන්ත්‍රීවරුන්ගේ ගෙවල් ගිනි තියපු අය arrest කරන්න. අගමැතිතුමාගේ ගෙදර ගිනි තියපු අය arrest කරන්න. මොකද, එවැනි ක්‍රියා අපි තරයේ හෙළා දකිනවා. මම හිතන්නේ නැහැ, සාමකාමී අරගළකරුවන් ඒවා කළා කියලා. ඒ දේවල් පිටුපස යම් සංවිධායක කල්ලි හිටියා නම්, ඒ කල්ලි arrest කරන්න. හැබැයි, ඒ ගොල්ලන්ව නොවෙයි arrest කරන්නේ. මම දැක්කා, සුදු වෑන් එකක දා ගෙන ගිහිල්ලා ඇන්තනී වේරංග පුෂ්පික කියන මාධ්‍යවේදී සහෝදරයා arrest කරලා තිබෙන බව.

දෙමළ ජනතාවට මේ හදිසි නීතියයි, සුදු වෑන්වලින් ඇවිල්ලා arrest කරන එකයි, police intimidation එකයි අලුත් දේවල් නොවෙයි. උතුරු-නැගෙනහිර දිගින් දිගටම මේවා වෙනවා. උද්ඝෝෂණ කරනකොට arrest කරන එක සාමාන්‍ය දෙයක්. මේ හදිසි නීතිය ගැනත් අපි දිගින් දිගටම කිව්වා. අපි මේවා පාර්ලිමේන්තුවේදී කියනකොට සිංහල ජනතාව ඒවාට සවන් දුන්නේ නැහැ. මේ හදිසි නීතිය යටතේ අද සිංහල ජනතාවත් අත්අඩංගුවට ගන්න පටන් අරගෙන තිබෙනවා. ඉදිරියේදී තවත් අය අත්අඩංගුවට ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලාත් අපට ආරංචි ලැබී තිබෙනවා. හැබැයි කරන්න ඕනෑ, ගෙවල් ගිනි තියපු අය arrest කරන එකයි. අගමැතිතුමාගේ ගෙදර ගිනි තියපු අය arrest කරලා ඒ ගොල්ලන්ට දඬුවම් දෙන්න. හැබැයි, සාමකාමී අරගළකරුවන් arrest කිරීම තුළින්, සුදු වෑන්වලින් අරගෙන යෑම් තුළින් මේ අරගළය නවත්වන්න පුළුවන් කියලා හිතන්න එපා. මේක ආපහු කැරකිලා එනවා. මමත් කැමැති නැහැ, මේ අරගළය දිගින් දිගටම ගිහිල්ලා රට අස්ථාවර වෙනවාට. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාව අයින් කළොත්, ඊළඟට දිනේෂ් ගුණවර්ධන අගමැතිතුමා ජනාධිපතිතුමා වශයෙන් පත් වෙයි. ඊට පස්සේ එතුමාව ජනාධිපතිකමෙන් අයින් කළොත් ඊට පස්සේ ඉන්න කෙනා ජනාධිපතිතුමා වශයෙන් පත් වෙයි. අපට අවශ්‍ය මේ ජනාධිපති තනතුරට ඔළු මාරු කරන එක නොවෙයි. අපට අවශ්‍ය ලංකාව හරි තැනට ගෙනයන එකයි. ලංකාවේ ආර්ථිකය ආපහු හදන එකයි. ලංකාවේ ආර්ථිකය ආපහු හදන්න නම් ප්‍රධාන වශයෙන්ම දෙමළ ජනතාවගේ ගැටලු විසඳන්න ඕනෑ. ඒ ගැන දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දන්නවා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අපි එතුමාව ඕනෑ තරම් හමු වෙලා තිබෙනවා. එතුමා විදේශ ඇමති ලෙස කටයුතු කරනකොට මේ ගැටලු විසඳලා දෙන්න කියලා එතුමා හමු වෙලා අපි කියලා තිබෙනවා. දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම පිළිබඳව එතුමා අපිත් එක්ක වෙනමම සාකච්ඡාවක් පවා කළා. ඒ නිසා මම අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කරලා ලංකාවට මේ ගැටලුවෙන් එළියට එන්න උදව් කරන්න කියලා.

මම දැක්කා, ඩයස්පෝරාවෙන් අරගළයට උදව් කළා කියලා කියනවා. ඩයස්පෝරාවට ලංකාවේ ආර්ථිකය හදන්න උදව් කරන්නත් පුළුවන්. ඒ උදව් ලබා ගන්න අවශ්‍ය ක්‍රමවේදය හදා ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over. Please wind up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I am winding up in a minute.

සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදා ගන්නේ නැතිව ඒ ක්‍රමවේදය හදා ගන්න හිතුවොත්, ඒක හරියන්නේ නැහැ. පොහොට්ටුවේ මන්ත්‍රීවරු 134දෙනාගෙන් අපි ජනාධිපති ධුරය ගත්තා, අපට පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන නිසා ඉදිරියට යන්න පුළුවන් කියලා හිතනවා නම්, එතැනදි වරදිනවා. සියලු දෙනාම එකතු කරගෙන සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදන්න බලන්න. ඒ සර්ව පාක්ෂික ආණ්ඩුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු වැඩිපුර දාගෙන, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තමයි මේකේ බලය තියාගෙන ඉන්නේ කියලා පෙන්වන්න ගියොත්, ජූලි 09වැනි දා වාගේ අගෝස්තු 09 ද, සැප්තැම්බර් 09 ද, ඔක්තෝබර් 09 ද, නොවැම්බර් 09 ද දන්නේ නැහැ, කොහේ හරි තැනක 09වැනි දා

දවසක ආපහු රැල්ලක් හැදේවි. ඒ රැල්ල හැදිලා මේ විධියට රට ඉදිරියට යන්න ඉඩ තියන්න එපා. මම කාරුණිකව ඉල්ලන්නේ ඒකයි. මොකද අපිත් ආසා නැහැ, උද්ඝෝෂණ කරන්න. අපිත් ආසා නැහැ, තෙල් පෝලිම්වල ඉන්න. අපිත් ආසයි, අපට හොඳ අනාගතයක් හදා ගන්න. ඒ දේ කරලා දෙන්න කියලායි මේ ඉල්ලන්නේ. හැබැයි, මේ reforms ගේන්නේ නැතිව, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න උනන්දු වෙන්නේ නැතිව, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත වහාම ගේන්න කටයුතු කරන්නේ නැතිව, මේ අරගළකරුවන්ව හදිසි නීතියෙන් arrest කරලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා හිතනවා නම්, ජනාධිපතිතුමායි, අගමැතිතුමායි ඉතිහාසයේ ජේල් වෙච්ච අනෙක් නායකයන්ගේ කණ්ඩායමටම වැටෙයි. ඒක වෙනවා දකින්න මගේ බලාපොරොත්තුවක් නැහැ. ඒක නිසා කරුණාකරලා රටට හොඳ දේ කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.10]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச் சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු කථානායකතුමනි, හදිසි නීති රෙගුලාසි සම්මත කර ගැනීම සම්බන්ධයෙන් අද දිනයේ ඉතාම දීර්ඝ වාද විවාද පැවැත්වුණා. මේ සභාවේ ගෞරවනීය මන්ත්‍රීවරු, ඇමතිවරු සියලුදෙනා පිළිගනීවි, 1948න් පස්සේ ඉතිහාසයේ අමාරුම කාලයක තමයි වර්තමාන ගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් ආණ්ඩුව බාර ගත්තේ කියලා. අපි මේ ආණ්ඩුව හැදුවේ කුමන පසුබිමක් මත ද කියන එකත් මේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා දන්නා කාරණයක්. ගරු කථානායකතුමාත් දන්නවා, ජනතාව මහ මඟට බහින්න කලින් සර්ව පාක්ෂික අන්තර්වාර ආණ්ඩුවක් හදන්න ඕනෑ කියලා යෝජනාවක් මම ඉදිරිපත් කළ බව. නමුත්, ඒ යෝජනාව පිළිගන්න මේ පාර්ලිමේන්තුවේ කිසිදු දේශපාලන පක්ෂයක් සූදානම් වුණේ නැහැ. ඔබතුමා මට ආපහු ඒක බාර දුන්නා. ඊට පස්සේ අපිත් යම් යම් තීන්දු ගත්තා. මමත්, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාත් විපක්ෂයේ හිටියේ තමුන්නාන්සේලාත් එක්කයි. අපි යෝජනා කළා, සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදමු කියලා. මේ පිළිබඳව සුජාත අයිතියක් තිබෙන නායකයෙක් විධියට වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු ක්‍රමය තුළ අපි විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට ඒ සඳහා ආරාධනා කළා. අපේ ආරාධනාවෙන් ආණ්ඩු හදන්න බැරි බව දන්නවා. ඒක නිසා ගරු විමල් වීරවංශ මැතිතුමා, මහාචාර්ය ගරු තිස්ස විතාරණ මැතිතුමා ඇතුළු අපි 41 දෙනෙකුගේ කණ්ඩායමක් ගිහිල්ලා හිටපු ජනාධිපතිතුමාට කියලා, සජිත් ප්‍රේමදාස මැතිතුමාට ආරාධනා කළා, කරුණාකරලා මේ ආණ්ඩුව බාර ගන්න කියලා. හැබැයි, එදා විපක්ෂය දිගින් දිගටම මේක බාර ගත්තේ නැහැ. සති 3ක් අපි ඉවසලා හිටියා. ඒ ඉවසලා ඉඳලා තමයි අපි ගිහිල්ලා හිටපු ජනාධිපතිතුමාට කිව්වේ, "විපක්ෂය මේ වගකීම බාර ගන්නේ නැහැ. විපක්ෂය කුමන හෝ හේතුවකට මේකෙන් කර අරින නිසා ඔබතුමා කැමැති කෙනෙකුට අගමැතිකම දෙන්න, මේ බර කර ගහන්න අපි ඉදිරිපත් වෙනවා" කියලා. අපි දන්නවා, මේක කොච්චර අමාරු වුණත් මහජන නියෝජිතයෝ විධියට අමාරු වෙලාවේ පැනලා යන එක නොවෙයි අපේ වගකීම කියලා. අපේ වගකීම වන්නේ අපේ යුතුකම ඉෂ්ට කරන එකයි. ඒ අනුව තමයි මේ ආණ්ඩුව හැදුවේ. ඒක නිසා අපි කවුරුත් කටයුතු කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවයි. සමහර ගරු මන්ත්‍රීතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තේරීමට ඡන්දය පාවිච්චි කරන ගමන්ම එළියට ගිහිල්ලා කියනවා නම්, අපිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති වැඩක් නැහැ කියලා, කොහාටද අපි මේ යන්නේ? කොහේද, ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ? පාර්ලිමේන්තුවකින් තොර ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්න පුළුවන්ද?

ගරු කථානායකතුමනි, අපිත් මේ හදිසි නීතිය කැමැත්තෙන් ගේන්නේ නැහැ. අලුත් ආණ්ඩුවේ පළමුවැනි යෝජනාව විධියට අපි අද සතුටින් නොවෙයි මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ගරු කථානායකතුමනි, හැබැයි අපි කවුරුත් පිළිගන්න ඕනෑ, අපි කාටත් අද ආරක්ෂාව ලැබිලා තිබෙන්නේ, අපි සියලු දෙනාම රෑට නිදා ගන්නේ මේ රටේ පොලීසියයි, ත්‍රිවිධ හමුදාවයි අවදියෙන් සිටින නිසාය කියලා. ඒ ගොල්ලන් ඒ කරන කැප කිරීම නිසා තමයි අපි කවුරුත් රෑට නිදහසේ නිදා ගන්නේ. මේ රටේ සියලු ජනතාවට ආරක්ෂාව ලබා දෙන්නේ පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව. තමන්ට ආරක්ෂාව දෙන පොලීසියට, ත්‍රිවිධ හමුදාවට ඉතා ම්ලේච්ඡ ලෙස, කෲර ලෙස, කැත විධියට ආමන්ත්‍රණය කරනවා නම්, යකඩ පොලුවලින් ගහලා ඒ උදවියගේ ඔළුගෙඩි පළා රෝහල්ගත කරන විධියට වැඩකටයුතු කරනවා නම්, ඒ ගොල්ලන්ගෙන් අපි සේවයක් බලාපොරොත්තු වන්නේ කොහොමද? ඒ උදවියත් කරන්නේ ගෞරවනීය සේවයක්. ඒක නිසා රටේ නීතියේ ආධිපත්‍යය බිඳ වැටුණොත් ඔබතුමන්ලා විපක්ෂයේ ද, අපි ආණ්ඩු පක්ෂයේ ද කියන එක වැදගත් නැහැ. එතකොට කාගේවත් ජීවිතයකට ආරක්ෂාව දෙන්න බැරි වනවා.

ඒ නිසා මේක ඉතාම සංවේදී කාරණයක්. මේක මේ රටේ ජාතික අවශ්‍යතාවක් විධියට හිතලා අපි කටයුතු කරන්න ඕනෑ. ඔළු ගෙඩි මාරු කිරීම හරහා මේ රටේ දේශපාලන සන්දර්භය වෙනස් කරන්න අපි උත්සාහ කරන්නේ නැහැ. අපි වෛරයෙන් වෛරය පිරිමහන්න උත්සාහ කරන්නේත් නැහැ. අපි වෛරය ජයග්‍රහණය කරන්න උත්සාහ කරන්නේ මෛත්‍රියෙන්. අපි කියන්නේ නැහැ අපට 134ක බහුතරයක් තිබුණ නිසා අපි විසින්ම තීන්දු අරගෙන මේ කටයුතු කරන්න ඕනෑ කියලා. අපි එහෙම මතයක නැහැ. මේ පාර්ලිමේන්තුවේ අපි 225දෙනාටම තිබෙන වගකීම එකයි. අපි ආණ්ඩු පක්ෂයේද, විරුද්ධ පක්ෂයේද කියන එක නොවෙයි වැදගත්. ජනතාව මේ හැම කෙනෙකුටම බලයක් දීලා පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ මේ රටේ ජාතික ආරක්ෂාව හදන්න; මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න. අද ආර්ථික අර්බුදයක් සහ ඒ තුළින් නිර්මාණය වෙච්ච දේශපාලන අර්බුදයකුත් ඇති වෙලා තිබෙනවා. ඔළු ගෙඩි මාරු කරලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා අපිත් විශ්වාස කරන්නේ නැහැ. ඒ වෙනුවට මේ තිබෙන ක්‍රමවේද වෙනස් වෙන්න ඕනෑ. ඒ නිසා තමයි අපි විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනාවේ. අපි ඒක සූදානම් කරලා තිබුණා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඒ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට ඇතුළු කරපු යම් යම් අතුරු විධාන පිළිබඳව කාගේත් විවේචන තිබුණා, විරෝධතා තිබුණා කියලා. ඒ නිසා අපි ඒවා ඉවත් කරලා තිබෙනවා. ඒවා ඉවත් කරලා, ඊළඟ අමාත්‍ය මණ්ඩලයේදී ඒක සම්මත කරගෙන, මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න, ඒ වාගේම පාර්ලිමේන්තුවෙන් පිටත ඉන්න සියලු දේශපාලන පක්ෂවල නායකයෝ එකඟ වෙච්ච විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත අපි ලබන සතිය වෙනකොට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා.

අපි එතැනින් නතර වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කළ

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

වහාම මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලා, හැමෝම කියන විධියට, කාගේත් ප්‍රශ්න විසඳන්න පුළුවන් ආකාරයට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න ඕනෑය කියලා. ඒක අපි විතරක් හදනවා කියලා නොවෙයි කියන්නේ. ඒක අපි ඔක්කෝම එකට එකතු වෙලා හදන්න ඕනෑ. ඒක මේ රටේ ජනතාවගේ අපේක්ෂා ජයග්‍රහණය කරන්න පුළුවන් විධියට, ජාතික සමගිය ඇති වෙන ආකාරයට හදන්න ඕනෑ.

අපි පිළිගන්නවා, දීර්ඝ කාලයක් තිස්සේ උතුර, නැඟෙනහිර ජනතාවට යම් යම් ප්‍රශ්න තිබුණා කියලා. අධිකරණ ඇමතිවරයා විධියට 2015 පටන් ඒවා විසඳන්න මම විශාල වශයෙන් කටයුතු කරලා තිබෙනවා. ඔබතුමන්ලාට මතක ඇති, අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක් අපි ඇති කළා. ඒක ගමන් කරපු වේගය හරි අඩුයි. ඒ නිසා දැන් සති කිහිපයකට කලින් මම උතුරු පළාතට ගිහිල්ලා ඒ ක්‍රමය ඉක්මන් කරලා, ඒ කටයුතු අවසන් කරන්න පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම වන්දි ගෙවීමේ ක්‍රියාවලිය අපි කර ගෙන යනවා. එදාත් අපි යම් ප්‍රමාණයකට වන්දි ලබා දුන්නා. ඒ වාගේම, සංහිඳියා කාර්යාලය - Office for National Unity and Reconciliation - අපි ක්‍රියාත්මක කරනවා. ආණ්ඩුවක් තනිවම ඒක ක්‍රියාත්මක කළාට හොඳ ප්‍රතිඵල ලබා ගන්න බැහැ. ඒකට සියලු ජන කොටස්වල දායකත්වය ලැබෙන්න ඕනෑ.

ඩයස්පෝරාව ගැන ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් කථා කළා. ගරු කථානායකතුමනි, මහජන නියෝජිතයෝ විධියට විතරක් නොවෙයි, මේ ශ්‍රී ලංකාවේ පුරවැසියෝ විධියට අපි කවදාවත් දෙමළ ජනතාව වෙනම ජන කොටසක් විධියට සලකන්නේ නැහැ; මුස්ලිම් ජනතාව වෙනම ජන කොටසක් විධියට සලකන්නේ නැහැ. අපි ඔක්කෝම එකම ජන කොටසක්. අපි ඔක්කෝම ශ්‍රී ලංකා මාතාවගේ දූ දරුවෝ. ඒ නිසා අපට කිසිම හේතුවක් නැහැ ඔවුන් වෙන් කරලා සලකන්න. එහෙම වෙන් කරලා සලකන්න අපේ හෘද සාක්ෂිය අපට ඉඩ දෙන්නේත් නැහැ. ඩයස්පෝරාවේ යම් යම් නායකවරු මම මුණ ගැහුණා. ඒ ගොල්ලන් කිව්වා රහසිගතව කථා කරන්න ඕනෑ කියලා. මම කිව්වා, රහස් ඕනෑ නැහැ අපි විවෘතව කථා කරමු කියලා. ඒ උදවිය ලංකාවේ පුරවැසියෝ. යම් යම් හේතු නිසා ඔවුන් අද විදේශගත වෙලා ඉන්නවා. ඒ ගොල්ලන්ටත් ගැටලු තිබෙනවා; තරහමරහ තිබෙනවා. අතීතයේ අපි හැමෝගෙන්ම වැරදි වුණා. හැබැයි, අපි ඒ ගැනම කථා කර කර ඉඳලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා කවුරුහරි හිතනවා නම් ඒක මහා මිථ්‍යාවක් නේ. හෙට උපදින දරුවන්ට -අනාගතයේ- මේ ප්‍රශ්න ඉතුරු කරන්න එපා. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමනි, මම ඔබතුමන්ලාට කියනවා. මේ ප්‍රශ්නය අපි තමයි විසඳන්න ඕනෑ. ඒක අපේ වගකීම. මේ ප්‍රශ්නය තව කවුරුහරි විසඳා දෙනතුරු බලාගෙන ඉන්න එපා. මම ඩයස්පෝරාවේ නායකවරුන්ට විවෘතව ආරාධනා කළා, එන්න අපේ සාකච්ඡා මේසයට කියලා. අපි ඒ වගකීම ගන්නවා. මේ රටේ පුරවැසියෝ විධියට ඉදිරියටත් අපි එකට එකතු වෙලා මේ රට හදමු; මේ රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කරමු; මේ රටේ ජනතාවට ලෝකයේ ඕනෑම රටකට ගිහිල්ලා අභිමානයෙන් යුතුව "ශ්‍රී ලාංකිකයෙක්" කියලා කියන්න පුළුවන් විධියේ වාතාවරණයක් අපි හදමු. අද අපට ලෝකයට ගිහිල්ලා කියන්න ලජ්ජයි "අපි ශ්‍රී ලාංකිකයෝ" කියලා. ලෝකයේ හැම තැනකම සිටින ශ්‍රී ලාංකිකයෝ අද අපට දුරකතනවලින් කථා කරනවා. ඒ ගොල්ලන් කියනවා, "ලංකාවේ වෙන දේවල් දිහා බලලා අපට කාර්යාලවලට ගිහිල්ලා වැඩ කරන්න බැහැ, සමාජයේ මිත්‍රයන් ආශ්‍රය කරන්න බැහැ, ශ්‍රී ලංකාවේ තිබෙන්නේ මහා ගෝත්‍රික, ම්ලේච්ඡ ක්‍රමවේද නේද?" කියලා.

පසුගිය දවස්වල සිද්ධවුණු දේවල් ගැන, කාගේ කාගේ අතින් හෝ වෙච්ච දේවල් ගැන එහෙම තමයි ලෝකය කථා කරන්නේ. ඒවා BBC එකේ, CNN එකේ පැය ගණන් පෙන්නුවා. ඒ නිසා අපේ සමස්ත ශ්‍රී ලංකීය ජනතාවගේ අභිමානය අද කෙලෙසිලා තිබෙනවා; බිමට කඩා වැටිලා තිබෙනවා. අපි ඒක ගොඩ ගන්න ඕනෑ. අපි මේ ආර්ථිකය ගොඩ ගන්න ගමන් ජාතික සංහිඳියාවත් ගොඩ නඟන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලාම කිව්වා, හදිසි නීතිය වුණත් අපරාධකාරයන්ට විරුද්ධව ක්‍රියාත්මක කිරීම ගැන විරෝධතාවක් නැහැ කියලා. ඒ නිසා අපි තමුන්නාන්සේලාට කියනවා කිසිදු අහිංසක කෙනෙකුට එරෙහිව මේ හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ කියලා. හැබැයි, අපරාධකරුවන් වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීම අපි වළක්වනවා නම්, ඒත් අපි කරන්නේ නීති විරෝධී වැඩක්. රටක වැදගත්ම දේ තමයි නීතියේ ආධිපත්‍යය. අද ලෝකයේ දියුණු වූ කුමන හෝ රටක් තිබෙනවා නම් ඒ රටවල නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා. ඇයි, අද සිංගප්පූරුව මෙච්චර දියුණු වුණේ? කෙනෙකුට කියන්න පුළුවන් අපට වැඩිය පහළ තිබුණු සිංගප්පූරුව දියුණු වුණේ ඒ ගොල්ලන්ගේ ආර්ථිකය දියුණු වුණු නිසා, කර්මාන්ත වැඩි වුණු නිසා, සේවා පුළුල් වුණු නිසා කියලා. නැහැ. ඒ හැම දෙයක්ම වුණේ ඒ රටේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කළ නිසායි. ඒ රටේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කළේ නැත්නම් කිසිම ආයෝජකයෙක් ඩොලර් එකක් අරගෙන ඒ රටට එන්නේ නැහැ. ඒ නිසා රටක් ඉදිරියට යන්න ඕනෑ නම්, රටක් ආර්ථික වශයෙන් දියුණු කරන්න ඕනෑ නම් පළමුවෙන්ම සමගිය තිබෙන්න ඕනෑ. දෙවනුව ඒ රටේ නීතියේ ආධිපත්‍යය තිබෙන්න ඕනෑ. ඒ නිසා මම මේ වෙලාවේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට ගෞරවනීය ලෙස ආරාධනා කරනවා, පක්ෂ භේදයකින් තොරව අපිත් එක්ක එකතු වෙන්න කියලා. අපිත් එක්ක එකතු වෙලා මේ රටේ සුවහසක් ජනතාව සුවපත් කිරීම සඳහා අපේ පූර්ණ කැපවීම අපි කරමු. ඒ සඳහා අපි අලුත් ක්‍රම හදලා දෙමු. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා අනාගත පරම්පරාවට, තරුණ පරම්පරාවට, මේ රටේ කාන්තාවන්ට මේ පාර්ලිමේන්තුවේ නියෝජනය සාධාරණ ලෙස ඇති කර දීලා මේ රට ඉදිරියට ගන්න එක් වෙන්න කියන ගෞරවනීය ආරාධනය කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතයට සභාව එකඟද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අපි විරුද්ධයි. බෙදීමක් ඉල්ලා සිටිනවා.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின்-*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන්, ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්දය ප්‍රකාශ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, තමන්ගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකුට ඡන්දය පාවිච්චි කරන්න බැරි වුණා ද? *[බාධා කිරීමක්]* ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා, How do you propose to vote?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Yes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ආණ්ඩු පක්ෂයේ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවා ද? Hon. Dhammika Perera, how do you propose to vote?

**ගරු ධම්මික පෙරේරා මහතා**
(மாண்புமிகு தம்மிக்க பெரேரா)
(The Hon. Dhammika Perera)
Yes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is there any other Member from the Government side who could not vote? Hon. Jayantha Weerasinghe, how do you propose to vote?

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு (சனாதிபதி சட்டத்தரணி) ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
Yes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Kabir Hashim, how do you propose to vote?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Dr.) V. Radhakrishnan, how do you propose to vote?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Dilip Wedaarachchi, how do you propose to vote?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු සිටිනවා ද?

කවුරුවත් නැති බවයි පෙනෙන්නේ. එහෙම නම් ඡන්දය ප්‍රකාශ කිරීම දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 117; විරුද්ධව 60; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 117; எதிராக 60; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 117; Noes 60; Abstain 0.*

| | |
|---|---|
| G 002. Douglas Devananda | Yes |
| G 003. Chamal Rajapaksa | Yes |
| G 004. Mahinda Rajapaksa | Yes |
| G 005. Prasanna Ranatunga | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Bandula Gunawardana | Yes |
| G 011. Mahinda Amaraweera | Yes |
| G 012. Wijeyadasa Rajapakshe | Yes |
| G 013. Harin Fernando | Yes |
| G 014. Ramesh Pathirana | Yes |
| G 015. M.U.M. Ali Sabry | Yes |
| G 016. Vidura Wickramanayaka | Yes |
| G 017. Kanchana Wijesekera | Yes |
| G 018. Naseer Ahamed | Yes |
| G 019. Manusha Nanayakkara | Yes |
| G 020. Tiran Alles | Yes |
| G 021. Ajith Rajapakse | Yes |
| G 022. Nalin Fernando | Yes |
| G 023. Roshan Ranasinghe | Yes |
| G 024. Nimal Siripala De Silva | Yes |
| G 025. Johnston Fernando | Yes |
| G 026. S. B. Dissanayake | Yes |
| G 027. G.L. Peiris | No |

| | |
|---|---|
| G 028. Pavithradevi Wanniarachchi | Yes |
| G 029. Gamini Lokuge | Yes |
| G 030. Vajira Abeywardena | Yes |
| G 031. Janaka Bandara Thennakoon | Yes |
| G 032. C. B. Rathnayake | Yes |
| G 033. Dilan Perera | No |
| G 034. Dullas Alahapperuma | No |
| G 035. S. M. Chandrasena | Yes |
| G 036. Mahindananda Aluthgamage | Yes |
| G 037. Rohitha Abeygunawardhana | Yes |
| G 038. Namal Rajapaksa | Yes |
| G 039. Sarath Weerasekera | Yes |
| G 040. Dilum Amunugama | Yes |
| G 042. Mohan Priyadarshana De Silva | Yes |
| G 043. Janaka Wakkumbura | Yes |
| G 044. Shehan Semasinghe | Yes |
| G 045. Kanaka Herath | Yes |
| G 046. Thenuka Vidanagamage | Yes |
| G 047. Nalaka Godahewa | No |
| G 049. Premitha Bandara Tennakoon | Yes |
| G 051. Rohana Dissanayaka | Yes |
| G 052. Premalal Jayasekara | Yes |
| G 053. Arundika Fernando | Yes |
| G 055. Lohan Ratwaththe | Yes |
| G 056. Sanath Nishantha | Yes |
| G 057. Tharaka Balasuriya | Yes |
| G 058. Indika Anuruddha Herath | Yes |
| G 059. Siripala Gamalath | Yes |
| G 061. S. Viyalanderan | Yes |
| G 062. D. V. Chanaka | Yes |
| G 063. Sisira Jayakody | Yes |
| G 064. Piyal Nishantha De Silva | Yes |
| G 065. Prasanna Ranaweera | Yes |
| G 066. D. B. Herath | Yes |
| G 067. Shasheendra Rajapaksa | Yes |
| G 068. Seetha Arambepola | Yes |
| G 069. Shantha Bandara | Yes |
| G 070. K. Kader Masthan | Yes |
| G 071. Ashoka Priyantha | Yes |
| G 072. A. Aravindh Kumar | Yes |
| G 073. Kapila Athukorala | Yes |
| G 074. Geetha Samanmale Kumarasinghe | Yes |
| G 075. Gayashan Nawananda | Yes |
| G 077. Suren Raghavan | Yes |
| G 078. Diana Gamage | Yes |
| G 080. S. M. M. Muszhaaraff | Yes |
| G 081. Jayantha Ketagoda | Yes |
| G 082. Sampath Athukorala | Yes |
| G 083. Thisakutti Arachchi | Yes |
| G 084. U. K. Sumith Udukumbura | Yes |
| G 085. Pradeep Undugoda | Yes |
| G 086. Sanjeeva Edirimanna | Yes |
| G 087. Akila Ellawala | Yes |
| G 089. Udayana Kirindigoda | No |
| G 090. Jagath Kumara Sumithraarachchi | Yes |
| G 093. Nalaka Bandara Kottegoda | Yes |
| G 095. Udayakantha Gunathilaka | Yes |
| G 096. Kokila Gunawardene | Yes |
| G 097. Milan Jayathilake | Yes |
| G 098. Kulasingam Dhileeban | Yes |
| G 099. Sudarshana Denipitiya | Yes |
| G 100. Isuru Dodangoda | Yes |
| G 101. Premnath C. Dolawatte | Yes |
| G 102. H. Nandasena | Yes |
| G 103. Anupa Pasqual | Yes |
| G 104. Muditha Prishanthi | Yes |
| G 105. Sudath Manjula | Yes |
| G 106. Mayadunna Chinthaka Amal | Yes |
| G 107. Wasantha Yapabandara | No |
| G 108. Nipuna Ranawaka | Yes |
| G 110. Gunathilaka Rajapaksha | Yes |
| G 112. Upul Mahendra Rajapaksha | Yes |
| G 113. Rajika Wickramasinghe | Yes |
| G 114. M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 115. Madhura Withanage | Yes |
| G 116. Sagara Kariyawasam | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 002. Rajitha Senarathne | No |
| O 004. Tissa Attanayake | No |
| O 005. Rauff Hakeem | No |
| O 006. Gayantha Karunatilleka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 010. Patali Champika Ranawaka | No |
| O 011. Palany Thigambaram | No |
| O 012. Mano Ganesan | No |
| O 015. Selvam Adaikkalanathan | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. A. L. M. Athaullah | Yes |
| O 018. G. G. Ponnambalam | No |
| O 022. Thalatha Athukorala | No |
| O 023. Abdul Haleem | No |
| O 024. Sarath Fonseka | No |
| O 025. Harsha De Silva | No |
| O 028. R. M. Ranjith Madduma Bandara | No |
| O 029. Niroshan Perera | No |
| O 030. Eran Wickramaratne | No |
| O 031. J. C. Alawathuwala | No |
| O 032. Vadivel Suresh | No |
| O 033. Wimal Weerawansa | Yes |
| O 034. John Seneviratne | Yes |
| O 037. Vijitha Herath | No |
| O 038. Selvarajah Kajendren | No |
| O 040. Ali Sabri Raheem | Yes |
| O 042. Ashok Abeysinghe | No |
| O 043. Ajith Mannapperuma | No |
| O 044. Buddhika Pathirana | No |
| O 045. Nalin Bandara Jayamaha | No |
| O 046. Hector Appuhamy | No |
| O 047. Thushara Indunil Amarasena | No |
| O 048. Velu Kumar | No |
| O 049. Kavinda Heshan Jayawardhana | No |
| O 050. Mayantha Dissanayake | No |
| O 051. K. Sujith Sanjaya Perera | No |
| O 052. S. M. Marikkar | No |
| O 057. Harini Amarasuriya | No |
| O 060. Sivagnanam Shritharan | No |
| O 061. Imran Maharoof | No |
| O 062. Mujibur Rahuman | No |
| O 063. Harshana Rajakaruna | No |
| O 064. Rohini Kumari Wijerathna | No |

| | |
|---|---|
| O 065. Chaminda Wijesiri | No |
| O 066. Waruna Liyanage | No |
| O 067. M. Udayakumar | No |
| O 068. Hesha Withanage | No |
| O 069. W. H. M. Dharmasena | No |
| O 070. Kins Nelson | No |
| O 071. Rohana Bandara | No |
| O 073. Jayarathna Herath | Yes |
| O 077. M. A. Sumanthiran | No |
| O 078. Charles Nirmalanathan | No |
| O 079. S. Rajaputhiran Rasamanickam | No |
| O 080. Thavaraja Kalai Arasan | No |
| O 082. M. S. Thowfeek | No |
| O 083. Ishak Rahuman | No |
| O 088. Nimal Lanza | Yes |
| O 090. Jeevan Thondaman | Yes |
| O 092. Mohomad Muzammil | Yes |
| O 094. Asanka Navarathna | Yes |
| O 095. Nimal Piyathissa | Yes |
| O 096. Uddika Premarathne | Yes |
| O 097. M. Rameshwaran | Yes |
| O 098. Gamini Waleboda | Yes |
| O 100. Gevindu Cumaratunga | Yes |
| O 101. D. Weerasingha | Yes |
| O 102. Samanpriya Herath | Yes |
| O 103. Yadamini Gunawardena | Yes |
| O 104. Manjula Dissanayake | Yes |
| O 105. Ranjith Bandara | Yes |
| O 108. Marjan Faleel | Yes |
| O 109. Lalith Varna Kumara | Yes |
| O 110. S. Jagath Samarawickrama | Yes |
| O 113. Chamara Sampath Dasanayake | Yes |

*Electronic Voting Results*

| | |
|---|---|
| Yes | 117 |
| No | 60 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 117යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව පක්ෂව මුළු ඡන්ද සංඛ්‍යාව 120යි.

විද්‍යුත් ඡන්ද විමසීම අනුව විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 60යි; නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව විරුද්ධව මුළු ඡන්ද සංඛ්‍යාව 63යි.

මේ අනුව, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව සම්මතයි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 4.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.35ට, 2022 අගෝස්තු 09වන අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 4.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.35க்கு, பாராளுமன்றம் 2022 ஓகஸ்ட் 09, செவ்வாய்க்கிழமை மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 4.30 p.m.,* THE HON. SPEAKER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.35 p.m. until 10.00 a.m. on Tuesday, 09th August, 2022.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.